271 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 271 - இல. 9
Volume 271 - No. 9

2019 මැයි 23වන බ්‍රහස්පතින්දා
2019 மே 23, வியாழக்கிழமை
Thursday, 23rd May, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
වරප්‍රසාද : 2019 මැයි 01 දින "ඩේලිමිරර්" පුවත් පතේ පළ වූ අපහාසාත්මක ප්‍රකාශන
2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විදේශ විනිමය පනත:**
නියෝගය

**විසර්ජන පනත:**
යෝජනා

**කල් තැබීමේ යෝජනාව:**
2019 අප්‍රේල් 21 වන දින ප්‍රහාරයට පෙර හා පසු එළඹ ඇති ගිවිසුම්

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சிறப்புரிமை: 2019 மே 01ஆம் தேதிய "டெய்லி மிரர்" பத்திரிகையில் வெளியான அவதூறான பிரசுரம்
2019 ஏப்பிரல் 21ஆம் திகதி இலங்கையின் பல்வேறு இடங்களில் இடம்பெற்ற பயங்கரவாதத் தாக்குதல்கள் பற்றி ஆராய்ந்து பாராளுமன்றத்திற்கு அறிக்கையிடுவதற்கான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**வெளிநாட்டுச் செலாவணிச் சட்டம் :**
ஒழுங்குவிதி

**ஒதுக்கீட்டுச் சட்டம்:**
தீர்மானங்கள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
2019 ஏப்பிரல் 21ஆம் திகதிய தாக்குதலுக்கு முன்னரும் பின்னரும் செய்யப்பட்ட உடன்படிக்கைகள்

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Privilege: Defamatory Publications in "Daily Mirror" Newspaper of 1st May, 2019
Select Committee to Look into and Report to Parliament on the Terrorist Attacks that Took Place in Different Places in Sri Lanka on 21st April 2019: Nomination of Members

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

FOREIGN EXCHANGE ACT:
Regulation

APPROPRIATION ACT:
Resolutions

ADJOURNMENT MOTION:
Agreements Entered into Before and After the Attack on 21st April, 2019

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019* මැයි 23වන බ්‍රහස්පතින්දා**
*2019 மே 23, வியாழக்கிழமை*
*Thursday, 23rd May, 2019*

**පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### වරප්‍රසාද : 2019 මැයි 01 දින "ඩේලිමිරර්" පුවත් පතේ පළ වූ අපහාසාත්මක ප්‍රකාශන
### சிறப்புரிமை: 2019 மே 01ஆம் தேதிய "டெய்லி மிரர்" பத்திரிகையில் வெளியான அவதூறான பிரசுரம்
### PRIVILEGE: DEFAMATORY PUBLICATIONS IN "DAILY MIRROR" NEWSPAPER OF 1ST MAY, 2019

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින් 2019 මැයි 09 දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධ යෝජනාවක් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීමට හැකි බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

### II

### 2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
### 2019 ஏப்பிரல் 21ஆம் திகதி இலங்கையின் பல்வேறு இடங்களில் இடம்பெற்ற பயங்கரவாதத் தாக்குதல்கள் பற்றி ஆராய்ந்து பாராளுமன்றத்திற்கு அறிக்கையிடுவதற்கான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்
### SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE TERRORIST ATTACKS THAT TOOK PLACE IN DIFFERENT PLACES IN SRI LANKA ON 21ST APRIL 2019 : NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101, 103 විධිවිධාන සහ 2019 මැයි 22වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව 2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේ සේවය කිරීම සඳහා නියෝජ්‍ය කථානායක ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් ම'විසින් පත් කරනු ලැබ ඇති බවට දන්වනු කැමැත්තෙමි.

ගරු රවුෆ් හකීම් මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

### III

### සම්බන්ධීකරණ කාරක සභා රැස්වීම
### இணைப்புக் குழுக் கூட்டம்
### MEETING OF LIAISON COMMITTEE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සම්බන්ධීකරණ කාරක සභාවේ රැස්වීමක් 2019 මැයි මස 23වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.30ට බත්තරමුල්ල රජමල්වත්ත පාරේ පිහිටි පාර්ලිමේන්තු කාරක සභා සංකීර්ණයේදී -කලින් ගොවිජන මන්දිරයේදී- පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2018 වර්ෂය සඳහා කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම, 2018 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
### அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
### PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද, "2017 අංක 30 දරන විසර්ජන පනත යටතේ යෝජනා" සහ "2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
### மனுக்கள்
### PETITIONS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහනුවර, අරුප්පල, ධර්මාශෝක මාවත, අංක 95/බී දරන ස්ථානයේ පදිංචි යූ.එම්.කේ.පී.කේ. අබේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனு பொதுமனுக் குழுவுக்குச்சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

### කුරුවිට සතිපොළ: සංවර්ධනය
குருவிட்ட வாராந்தச் சந்தை: அபிவிருத்தி
WEEKLY FAIR IN KURUWITA : DEVELOPMENT

35/'18

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්මාන රැසක ජනතාව තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා කුරුවිට සතිපොළට පැමිණෙන බවත්;

(ii) කිසිදු පහසුකමකින් තොරව වෙනත් ස්ථානයක පවත්වාගෙන යන එම සතිපොළ වැසිදාට එකම මඩවගුරක් බවට පත්වන බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම සතිපොළ සංවර්ධනයට අමාත්‍යාංශය ගනු ලබන පියවර එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல கிராமங்களைச் சேர்ந்த மக்கள் தமது தேவைகளை நிறைவேற்றிக் கொள்வதற்காக குருவிட்ட வாராந்தச் சந்தைக்கு வருகின்றார்கள் என்பதையும்;

(ii) எவ்வித வசதிகளுமின்றி பிறிதொரு இடத்தில் நடாத்தப்படுகின்ற மேற்படி வாராந்தச் சந்தை மழை நாட்களில் சேறும் சகதியும் நிறைந்த இடமாக மாறி விடுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், மேற்படி வாராந்தச் சந்தையை அபிவிருத்தி செய்வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Is he aware that-

(i) people from many villages come to the weekly fair in Kuruwita to get their needs fulfilled; and

(ii) the aforesaid weekly fair that is being run in another location without any facilities turn into a quagmire on rainy days?

(b) If so, will he inform this House of the measures that will be taken by the Ministry to develop the aforesaid weekly fair?

(c) If not, why?

**ගරු ජේ.සී. අලවතුවල මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Internal and Home Affairs, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) කුරුවිට සතිපොළ සතියකට වරක් සෙනසුරාදා දිනයේදී පැවැත්වෙන අතර, කුරුවිට අවට ගම් ප්‍රදේශවල ජනතාව බොහෝ පිරිසක් තම අවශ්‍යතා සඳහා මෙම පොළ වෙත පිවිසේ. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක අවම පහසුකම් සහිතව තාවකාලිකව පොළ පවත්වාගෙන යන අතර, වර්ෂාව අධික සමයේදී ජලය එක් රැස් වී වෙළෙන්දන් හා මහජනතාව යන දෙපාර්ශ්වයම අපහසුතාවට පත් වේ.

(ආ) සතිපොළ සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නම්, ඒ පිළිබඳව සලකා බැලිය හැකිය.
මේ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කළොත්, අපට පුළුවන් ඒ ගැන සලකා බලන්න.

(ඇ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට යොමු කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලසීමාව පුරාම පුවත් පත්වල පවා පළ වුණා, කුරුවිට සතිපොළ සංවර්ධනය කරලා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මේ වන විට පොඩි ගැටලුවක් තිබෙනවා. පළාත් පාලන ආයතන බොහොමයක බලය වර්තමාන ආණ්ඩුවට නැති නිසා, පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා ආණ්ඩුව අතර තිබිය යුතු සම්බන්ධතාව නැති නිසා, ඒ පළාත් පාලන ආයතන යටතේ සිටින ප්‍රදේශවාසීන්ට ලොකු අසාධාරණයක් වෙනවා.

මට දැනෙන විධියට මේ වාගේ පොදු ආයතනවල සංවර්ධනයට රජය මැදිහත්වීමක් වෙන්නෙත් නැහැ, පළාත් පාලන ආයතනවල කැමැත්තකුත් නැහැ. උදාහරණයක් විධියට කියනවා නම්, මා නියෝජනය කරන රක්වාන ආසනයේ ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට අයිති ක්‍රීඩාංගනය පිළිසකර කිරීමට ක්‍රීඩා අමාත්‍යතුමා මුදල් ප්‍රතිපාදන වෙන්කළා. නමුත් ඒකට ප්‍රාදේශීය සභාවේ කැමැත්තක් නැහැ. මේ වෙනකොට ඒක යටපත් වෙමින් තිබෙනවා. කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මෙම සතිපොළ හදන්න ඕනෑය කියන එක ගැන ධනාත්මකව සිතනවා. මම ඒ ගැන සතුටු වෙනවා. එතුමා තමන්ගේ දේශපාලන නායකයන් දෙන උපදෙස්වලට පිටින් ගිහිල්ලා ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න ඕනෑය කියන ධනාත්මක තැනක ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, මේ සඳහා අවශ්‍ය සහයෝගය පළාත් සභා හා පළාත් පාලන ආයතනය විධියට ලබා දෙන්න කියලා. කඩිනමින් මේ කටයුත්ත ආරම්භ කිරීම සඳහා ඒ වෙනුවෙන් ගත හැකි නිශ්චිත ක්‍රමවේදය මොකක්ද?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා විශේෂයෙන්ම මැදිහත් වෙලා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා දෙන්න හැකියාව අපට තිබෙනවා. නමුත්, ගැටලු දෙකක් තිබෙනවා. එකක් තමයි, මේ සතිපොළ පවත්වන ස්ථානය දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩමක් වීම. පළමුවෙනි කාරණාව විධියට ඒක නිරවුල් කර ගැනීම අවශ්‍යයි. දෙවැනි කාරණාව තමයි ඔබතුමාත් මැදිහත් වෙලා ප්‍රාදේශීය සභාව විසින් ඒ අවශ්‍යතාව ඉල්ලීමක් හැටියට අපට ඉදිරිපත් කරනවා නම් ඒ සඳහා උදව් දෙන්න අපි ලෑහැස්තියි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රටේ ආණ්ඩුව මොන පැත්තේ තිබුණත්, පළාත් පාලන ආයතනය, පළාත් සභාව මොන විධියට තිබුණත් මුදල් ලබා දීම පිළිබඳ විනිවිදභාවයක් තිබෙන්නට ඕනෑ; ක්‍රමවේදයක් තිබෙන්නට ඕනෑ. මොකද, පළාත් පාලන ආයතනයේ හිටපු සභාපතිවරයෙක් විධියට මමත් දන්නවා, පළාත් පාලන ආයතනයට මුදල් ආවේ නැහැයි කියන එක. එමඟින් බලපෑමක් වෙන්නේ එහි සභාපතිවරයාට හෝ මන්ත්‍රීවරයාට නොවෙයි, ප්‍රදේශයේ ජනතාවටයි. දැනට අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. ඒ නිසා මම අහනවා, ඒවායෙන් ලබා දෙන්න ඕනෑ සේවය ජනතාවට ලබා දෙන්න පුළුවන් නිසි ක්‍රමවේදයක් හදන්න අමාත්‍යාංශය මේ වන කොට පියවර ගෙන තිබෙනවාද කියලා.

එහෙම නිසි ක්‍රමවේදයක් නැති බව අපට දැනෙනවා. සමහරුන් ඇඟේ හයියට වැඩ කරන්න යාමත් මේකට හේතු වෙලා තිබෙනවා. නමුත් පළාත් පාලන ආයතන අකර්මණ්‍ය නොවී ඒවායෙන් ලබා දෙන්න ඕනෑ සේවය ජනතාවට ලබා දෙන්න පුළුවන් නිසි ක්‍රමවේදයක් හදන්න අවශ්‍යයි. අඩු තරමින් රජයෙන් වෙන් කරන මුදල් ටික යොදවලා, පළාත් පාලන ආයතනය සම්බන්ධ වෙලා, පාරක් හදා ගන්න බැරි සමහර දිස්ත්‍රික්ක තිබෙන බව මම දන්නවා. මේ වෙනුවෙන් පළාත් පාලන ආයතනය සහ ඔබ අමාත්‍යාංශය සම්බන්ධීකරණය කළ යම් වැඩසටහනක් තිබෙනවාද, නැත්නම් මේ විධියටම ඉස්සරහට යනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, අපේ අමාත්‍යාංශය පළාත් පාලන ආයතන සඳහා එන යෝජනා හා ව්‍යාපෘති අනුව පැහැදිලිවම මුදල්

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

වෙන් කරලා තිබෙනවා. වාර්ෂිකව මේ වෙනුවෙන් අපි මුදල් වෙන් කළාම, ඒ කටයුතු ක්‍රියාත්මක කරලා, හොයා බලන්නේ පළාත් සභාවේ තිබෙන පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහායි. පළාත් පාලන කොමසාරිස් හරහා තමයි ඒවා අධීක්ෂණය කරන්නේ. ඒ අනුව මේ වසරේත් පළාත් පාලන ආයතන ගණනාවකට අපි නොයෙකුත් ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඉදිරියේ දීත් ඒ අවශ්‍යතා අනුව කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතන මේ සම්බන්ධයෙන් උනන්දු වනවා නම් තමයි අපට කටයුතු කරන්න පුළුවන් වන්නේ. පළාත් පාලන ආයතන උනන්දුවෙන් එවන යෝජනාවලට අපි ප්‍රතිපාදන වෙන් කරනවා. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

## ජයසුධීර් ජයරාම් ඇතුළු තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම : විස්තර
ஜயசுதீர் ஜெயராம் உட்பட மூவரது கைது: விபரம்
ARREST OF THREE PERSONS INCUDING JAYASUDHEER JAYARAM : DETAILS

74/'18

**2. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2016 නොවැම්බර් මස දිනයක ක්වාලාලාම්පූර් බලා විදේශගත වීමට සිටි මැලේසියානු ව්‍යාපාරික ජයසුධීර් ජයරාම් ඇතුළු තිදෙනෙක් මෙරටින් මුදල් අපහරණය කිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඔවුන් අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ ඔවුන් සන්තකයේ තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඔවුන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අත්අඩංගුවට ගත් පුද්ගලයන් අදාළ පරීක්ෂණ අවසන් වීමට පෙර ක්වාලාලාම්පූර් බලා යෑමට නිදහස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(iii) ඒ සඳහා වූ පරීක්ෂණ එම පුද්ගලයන් නොමැතිව සිදු කර තිබේද;

(iv) මේ වනවිට අදාළ ලිපි ගොනු මුදල් අමාත්‍යාංශය සතුව පවතීද;

(v) අත්අඩංගුවට ගත් මුදල් නැවතත් එම පුද්ගලයන් වෙත මුදා හැර තිබේද;

(vi) නොඑසේ නම්, මේ වනවිට එම මුදල් තැන්පත් කර ඇති ආයතනය කවරේද;

(vii) මෙම පරීක්ෂණය සඳහා දායක වූ රේගු නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 நவம்பர் மாதத்தில் ஒரு தினம் கோலாலம்பூரை நோக்கிச் செல்லவிருந்த மலேசிய வர்த்தகர் ஜயசுதீர் ஜெயராம் உட்பட மூவர் இந்த நாட்டிலிருந்து பணத்தை எடுத்துச் சென்றதன் காரணமாக இலங்கைச் சுங்கப் பிரிவினரால் கைதுசெய்யப்பட்டனரா?

(ii) அவ்வாறாயின், இவர்கள் கைதுசெய்யப்பட்ட போது இவர்களின் உடைமையிலிருந்த பணம் எவ்வளவு;

(iii) மேற்படி நபர்களுக்கு எதிராக எடுக்கப்பட்ட சட்ட நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) கைதுசெய்யப்பட்ட நபர்கள், சம்பந்தப்பட்ட விசாரணைகள் முடிவடையுமுன்னர் கோலாலம்பூர் நோக்கிச் செல்ல அனுமதிக்கப் பட்டுள்ளனரா;

(ii) அவ்வாறாயின், அதற்கான அனுமதி யாரால் வழங்கப்பட்டது;

(iii) அது சம்பந்தப்பட்ட விசாரணைகள் மேற்படி நபர்கள் இன்றி முன்னெடுக்கப்பட்டுள்ளதா;

(iv) நிதி அமைச்சில் அது சம்பந்தப்பட்ட கோப்புகள் இன்றளவில் உள்ளனவா;

(v) கைப்பற்றப்பட்ட பணம் மீண்டும் குறித்த நபர்களிடம் ஒப்படைக்கப்பட்டுள்ளதா;

(vi) இன்றேல், குறித்த பணம் இன்றளவில் வைப்புச் செய்யப்பட்டுள்ள நிறுவனம் யாது;

(vii) இந்த விசாரணையில் ஈடுபட்ட சுங்கப் பிரிவு அலுவலர்களுக்கு பணப்பரிசு வழங்கப் பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) whether the Sri Lanka Customs arrested three persons including Malaysian businessman Jayasudheer Jayaram, who were Kuala Lumpur bound on a day in November, 2016 on the charges of smuggling money out of the country;

(ii) if so, the amount of money that was in their possession while the arrest was made; and

(iii) the legal action taken against them?

(b) Will he also inform this House-

(i) whether the arrested persons were released even before the investigations were over allowing them to travel to Kuala Lumpur;

(ii) if so, who gave permission in this regard;

(iii) whether the relevant investigation has been carried out without the presence of those persons;

(iv) whether the relevant files are with the Ministry of Finance at present;

(v) whether the seized money has been released to those persons;

(vi) if not, in which institution the money has been deposited; and

(vii) whether the Customs officials involved in this investigation have been awarded cash prizes?

(c) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2016 නොවැම්බර් මස එවැනි සිදුවීමක් වාර්තා වී නැත.

ජයසුධීර් ජයරාම් නැමැත්තෙක් සහ තවත් මගියෙක් ඇතුළු දෙදෙනෙක් 2017 නොවැම්බර් මස 10 දින ශ්‍රී ලංකා රේගුවට විධිමත් ප්‍රකාශ කිරීමකින් තොරව විදේශ මුදල් මෙරටින් රැගෙන යාමට තැත් කිරීම මත වැඩිදුර රේගු විමර්ශනය සඳහා රඳවාගෙන තිබේ.

(ii) ජයසුධීර් ජයරාම් යන අය සතුව ඇමරිකානු ඩොලර් 50,000ක් සහ ටී. කියෝන්ග් මින්ග් යන අය සතුව ඇමරිකානු ඩොලර් 58,000ක් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත වාර්තා නොකර රැගෙන යාමට තැත් කර ඇති බව ශ්‍රී ලංකා රේගුව විසින් සොයාගෙන ඇත.

(iii) රේගු ආඥා පනතේ 8 (i) වගන්තිය අනුව කරන ලද පරීක්ෂණයෙන් පසුව ඉහත නම් සඳහන් මගීන් දෙදෙනා සන්තකයේ තිබූ රේගුවට ප්‍රකාශ නොකළ ඇමරිකානු ඩොලර් 108,000ක් වූ මුදල 2017.11.23 දින රාජසන්තක කොට ඇත.

(ආ) (i) ඉහත නම් සඳහන් මගීන් දෙදෙනාගෙන් ජයසුධීර් ජයරාම් යන අය පරීක්ෂණ අවසන් වීමට පෙර ගුවන්ගත වීමට මුදා හැර තිබේ.

(ii) ඉහත මගීන් දෙදෙනාගෙන් ජයසුධීර් ජයරාම් යන අය අත්‍යවශ්‍ය ව්‍යාපාරික හමුවකට සහභාගී වීම සඳහා බැංකොක් බලා යාමට අවසර දෙන ලෙස ප්‍රකාශයක් මඟින් රේගුවෙන් අවසර පතා ඇත. මෙම ඉල්ලීම එදින ගුවන් තොටුපොළ සේවයේ නියුතු අධීක්ෂණ නිලධාරි විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (පළාත්) වෙත දැනුම් දී තිබේ. ජයසුධීර් ජයරාම් යන අයගේ එම අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව එම මගියාට ගුවන්ගත වීමට අවසර දෙන ලෙස රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (පළාත්) විසින් ගුවන් තොටුපොළ සේවයේ නියුතු අධීක්ෂණ නිලධාරි වෙත දුරකථනයෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ජයසුධීර් ජයරාම් යන අයට ගුවන්ගත වීමට අවසර ලබා දී ඇත.

(iii) ඒ සඳහා වූ රේගු පරීක්ෂණය ටී. කියෝන්ග් මින්ග් යන අය ඉදිරියේ සිදු කර තිබේ.

(iv) අදාළ ලිපිගොනුව රේගු දෙපාර්තමේන්තුව භාරයේ පවතී.

(v) නැත.

අත් අඩංගුවට ගත් මුදල් රාජසන්තක කර ගිණුම්ගත කර තිබේ.

(vi) එම මුදල් මේ වන විට රේගු දෙපාර්තමේන්තුවේ ගිණුමට බැර කර ඇත.

(vii) මේ සඳහා දායක වූ රේගු නිලධාරින්ට නුදුරේදීම එම ත්‍යාග ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් නොවෙයි මම මේ අහන්නේ. මේ මුදල කොපමණද කියලා හරියටම කියන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඒ ප්‍රමාණය ඩොලර් දෙලක්ෂ අටදහසක් නොවෙයිද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

නැහැ. ඩොලර් එක්ලක්ෂ අටදහස් ගණනක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ නේ. ඩොලර් දෙලක්ෂ අටදහසක්. රුපියල්වලින් ගත්තොත්, මිලියන 39ක්.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

නැහැ. පිළිතුරේ ලබා දී තිබෙන විස්තර අනුව එක්කෙනෙකුට ඩොලර් 50,000යි. අනෙක් පුද්ගලයාට ඩොලර් 58,000යි. ඔක්කොම ඩොලර් එක්ලක්ෂ අටදහසයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකාවේ නීතිය අනුව, ලංකාවෙන් පිටට යනකොට ගුවන් තොටුපළෙන් ගෙන යා හැකි මුදල් ප්‍රමාණයට වැඩි මුදල් ප්‍රමාණයක් -ඩොලර් එක්ලක්ෂ අටදහසක්- අරගෙන ගුවන් තොටුපළෙන් පිටව යද්දී හසු වුණාම, හදිසි වැඩක් තිබෙන නිසා එක්කෙනෙක්ව තියලා තව කෙනෙකුට යන්න දුන්නාය කියා මේ ඉතිහාසයේ මම නම් අහලා නැහැ. මේ තීන්දුව ගත්තේ කවුද කියා මම දැනගන්න කැමැතියි. මේක වැරැදි තීන්දුවක් කියලා ඔබතුමාට හිතෙන්නේ නැද්ද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

රේගු ආඥා පනතේ ඒ ගොල්ලන්ගේ ක්‍රියා පටිපාටිය තුළයි මේ තීන්දුව ගෙන තිබෙන්නේ. ඒ නිසා, ඒ තීන්දුව නීතිමය

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

වශයෙන් වැරැදියි කියා මට කියන්න බැහැ. කෙසේ වෙතත්, ඔබතුමා බොහොම වැදගත් ප්‍රශ්නයක් තමයි ඇහුවේ. නීතිය එහෙම වුණත්, ඔබතුමා අහන ප්‍රශ්නය වන්නේ, "ඇත්තටම මෙය කළ යුතු දෙයක්ද?" කියන එකයි. මේ සම්බන්ධයෙන් මීට වඩා ගැටලුවක්, ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ වගකීම ශ්‍රී ලංකා රේගුව භාර ගන්නවා. අනික් කාරණය, කවුරුන් හෝ මොකක් හෝ රේගුව හරහා හොරකම් කරගෙන යනවා නම්, එය රාජසන්තක කළාය කියා එතැනින් ඒ ප්‍රශ්නය අවසන් කරන්න බැහැ නේ. ප්‍රශ්නය ඊට වඩා ගැඹුරු වෙන්න පුළුවන්. ඒක ශ්‍රී ලංකා රේගුවට සොයන්න බැහැ. ශ්‍රී ලංකා රේගුව කියන්නේ පොලීසියවත්, CID එකවත් නොවෙයි නේ. එතකොට ප්‍රශ්නයක් තිබෙනවා; නීතියේ ප්‍රශ්නයක් තිබෙනවා. මෙවැනි දේවල් සිදු වනවිට පොලීසියට, CID එකට දැනුම් දෙන එක සුදුසුයි කියා හිතෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙය සම්පූර්ණයෙන්ම වැරැදියි කියන එක තමයි මට ඉස්සර වෙලාම කියන්න වෙන්නේ. දෙවන කාරණය මේකයි. මේ පුද්ගලයා විදේශගත වුණාට පස්සේ ආපසු එනවාද, නැද්ද කියන එක ගැන කිසිදු කෙනකුට විශ්වාසයක් නැහැ. රේගු නිලධාරින්ට කියන්න බැහැ, ඔහු ආපසු එනවාද, නැද්ද කියලා. ඒ පිළිබඳව රේගු නිලධාරින්ට විශ්වාස කරන්න බැහැ. මේ පුද්ගලයා විශාල හොරෙකු නම්, මං කොල්ලකාරයකු නම් මෙවැනි වෙලාවක ඔහුව නිදහස් කළේ කොහොමද? ඔහුට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්න කටයුතු කරනවාද?

මේ පුද්ගලයන් තමයි, අද වනකොට මේ රටේ යම් රූපවාහිනී ආයතනයක් මිලදී ගන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් ශ්‍රී ලංකා මහ බැංකුව හරහා සකස් කර තිබෙන්නේ. මේ පුද්ගලයා ලංකාවට නැවත එනවා. හැබැයි ඔහු ඒ මුදල් අතින් අරගෙන එනවාද කියලා කියා මා දන්නේ නැහැ. නමුත් ඒ මුදල්වලින් තමයි ලංකාවේ රූපවාහිනී ආයතනයක් මිලදී ගන්න අවශ්‍ය කරන කටයුතු කරන්නේ.

මේක ඇත්තටම smuggling වාගේ, තනිකරම හොර සල්ලි ලංකාවෙන් අරගෙන යන වැඩ පිළිවෙළක්; කළු සල්ලි සුදු කිරීමේ ව්‍යාපාරයක්. එතකොට මේ වාගේ අයටද, ඔබතුමන්ලා මේ රටේ මහ බැංකුව හරහා රූපවාහිනී ආයතනයක් මිලදී ගන්න අවශ්‍ය කරන කටයුතු ටික කරන්න උදවු කරන්නේ කියා මම අහන්න කැමැතියි. මොකද, එම රූපවාහිනී ආයතනය මිලදී ගන්නා වැඩ පිළිවෙළට මේ පුද්ගලයාගේ නමත් සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඔහුත් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් වෙලා තිබුණා. ඔබතුමා මේ ගැන දන්නවාද, මේ අය සම්බන්ධයෙන් ගන්න පුළුවන් පියවර මොකක්ද, එහෙම නැත්නම් අදාළ රේගු නිලධාරින්ට විරුද්ධව මොකක් හෝ ක්‍රියා මාර්ගයක් ගන්න පුළුවන්ද කියා මම අහන්න කැමැතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමනි, එම පුද්ගලයා ගැන මට සඳහන් කරන්නට බැහැ. එතුමා මොනවාද, ගන්න යන්නේ; මොනවාද, නොගන්නේ කියන එක හෝ එම පුද්ගලයාමද, මේ පුද්ගලයා කියන එකත් මට කියන්න බැහැ. දන්නේ නැති ඒවා ගැන මට කියන්න බැහැ. නමුත් නීතියේ සීමාවක් තිබෙනවා. ඔබතුමාට ඒ කාරණය තේරුණා නේද? අපි එම නීතිය තද කළ යුතුයි කියන එක මම පිළිගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම අහන්න කැමැතියි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා නේ. දැන් පැහැදිලි කරගැනීමක් විතරක් කරගන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමකට තමයි මේ අහන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ කවුද කියා ඔබතුමා දන්නේ නැහැය කියා දැන් කිව්වා. මහ බැංකුව යටතේ තිබුණු රූපවාහිනී ආයතනයක් සම්බන්ධව තිබුණු මිලදී ගැනීමකට මේ අය සම්බන්ධද, නැද්ද කියා සොයා බලා, කරුණාකර ඒ අයගේ නමත් එක්ක පාර්ලිමේන්තුවට දන්වන්නය කියා මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගැන සොයා බලන්න.

## බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පළාත් පාලන ආයතන: ආදායම සහ වියදම
## பதுளை மாவட்ட உள்ளூராட்சி நிறுவனங்கள்: வரவு மற்றும் செலவு
## LOCAL AUTHORITIES IN BADULLA DISTRICT : INCOME AND EXPENDITURE

139/'18

3. **ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පළාත් පාලන ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයේ, පළාත් පාලන අරමුදලේ තත්ත්වය 2010 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කාලසීමාවට අදාළව, සභා අරමුදලේ අය සහ වැය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී කාලසීමාව තුළ බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සතු සභා අරමුදල ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගත් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாவட்டத்திலுள்ள உள்ளூராட்சி நிறுவனங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினதும் உள்ளூ ராட்சி நிதிய நிலைமை 2010 ஆம் ஆண்டு முதல் இற்றை வரை ஆண்டு வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி காலகட்டத்திற்கு ஏற்புடையதாக, சபை நிதியத்தின் வரவு மற்றும் செலவைத் தனித் தனியாகச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) குறிப்பிட்ட காலகட்டத்தினுள் பதுளை மாவட் டத்தின் உள்ளூராட்சி நிறுவனங்களுக்குச் சொந்தமான சபை நிதியத்தை வலுப்படுத்த அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the names of the local authorities within the Badulla District;

(ii) separately, the situation of the Local Authority Fund of each of the aforementioned local authorities on each year from 2010 to the present;

(iii) whether he will submit separately the income and expenditure of each of the Local Authority Funds with respect to the time period mentioned above; and

(iv) the steps taken by the Ministry to strengthen the Local Authority Funds of the Badulla District during the aforementioned period?

(b) If not, why?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 01. බදුල්ල මහනගර සභාව
02. බණ්ඩාරවෙල මහනගර සභාව
03. හපුතලේ නගර සභාව
04. මහියංගනය ප්‍රාදේශීය සභාව
05. රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව
06. සොරණාතොට ප්‍රාදේශීය සභාව
07. මීගහකිවුල ප්‍රාදේශීය සභාව
08. කන්දකැටිය ප්‍රාදේශීය සභාව
09. පස්සර ප්‍රාදේශීය සභාව
10. ලුණුගල ප්‍රාදේශීය සභාව
11. බදුල්ල ප්‍රාදේශීය සභාව
12. හාලිඇල ප්‍රාදේශීය සභාව
13. ඌව-පරණගම ප්‍රාදේශීය සභාව
14. වැලිමඩ ප්‍රාදේශීය සභාව
15. බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව
16. ඇල්ල ප්‍රාදේශීය සභාව
17. හපුතලේ ප්‍රාදේශීය සභාව
18. හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

(ii) ඇමුණුම 01* මඟින් දක්වා ඇත.

(iii) ඇමුණුම 02* මඟින් දක්වා ඇත.

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවල අරමුදල් ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2010 වර්ෂයේ සිට මේ දක්වා පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන) ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 572.78ක් වටිනා ව්‍යාපෘති බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘති මඟින් සෘජු හා වක්‍ර වශයෙන් අදාළ පළාතේ පළාත් පාලන ආයතනවල අරමුදල් ශක්තිමත් කිරීමට මෙම අමාත්‍යාංශය මඟින් දායකත්වයක් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, පිළිතුරු සැපයීම වෙනුවෙන් රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පළාත් පාලන ආයතන තමයි අපේ රටේ පුංචි ආණ්ඩුව. ඒ පුංචි ආණ්ඩුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙකු හැටියට මම දන්නවා, සභා අරමුදල තර කිරීම සඳහා ගත් පියවර කියා එවා තිබෙන්නේ රේඛීය අමාත්‍යාංශයෙන් දුන් මුදල් බව. මේ මුදල් කර්මාන්තවලටයි දීලා තිබෙන්නේ. "සභා අරමුදල" කියන්නේ සභා ස්වයං උත්පාදනය තුළින් ගොඩ නඟන අරමුදල කියා අපි දන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මෙම ආයතන නියෝජනය කරපු නිසා දන්නවා, සභා අරමුදල තර කිරීමේ අවශ්‍යතාව තිබෙන්නේ අපට තනියෙන් පළාත් පාලන ආයතනය තුළ වැඩ පිළිවෙළ කර ගන්න කියා.

අපි දන්නවා, දැන් පළාත් සභාවට අත පාන්න වෙන බව. ඒ මුද්දර ගාස්තු ටික, දඩ මුදල් ටික දුන්නේ නැත්නම් වැඩ කටයුතු කරන්න බැහැ. රේඛීය අමාත්‍යාංශයේ මේ මුදල නොලැබුණොත් වැඩ ටික කරන්න බැහැ. මුදල දුන්නත් සමහර වෙලාවට වෙන වැඩවලට තමයි යන්නේ. අපි දන්නවා ලෝකයේ දියුණු රටවල පළාත් පාලන ආයතනවලට ස්වයංපෝෂිතව තමන්ගේ බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු කරන්න පුළුවන් ආදායම් උත්පාදන වැඩ පිළිවෙළක් තිබෙන බව. ඒ සඳහා අතුරු ව්‍යවස්ථාව තුළ නීතිමය රාමු හදලා තිබෙනවා. මම කියන්න උත්සාහ දරන්නේ මේකයි. මේ අතුරු ව්‍යවස්ථා කොපමණ තිබුණත් ප්‍රායෝගිකව මේවා පළාත් සභාව විසින් සම්මත කර, අනුමත කර දෙන්නේ නැහැ. RDA එකට අයත් පාරවල් අයිනේ අද ත්‍රී වීලර් නවත්වා තිබෙනවා. ප්‍රාදේශීය සභාව ගිහිල්ලා ඒවායෙන් ගාස්තුවක් අය කරනවා. ඒක නීති විරෝධියි. නීති විරෝධී මුදලක් තමයි ඒ අය කර ගන්නේ. ඒක මම පැහැදිලිවම කියනවා. එහෙම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

නීති විරෝධී විධියට අය කර ගන්න බැහැ. නමුත්, සභාවේ අරමුදල වෙනුවෙන් ඒ නීති විරෝධී කටයුත්ත සභාව කරනවා. අතුරු ව්‍යවස්ථාවේ සම්මත වෙලා තිබෙන විධියට ගන්න පුළුවන් අවම ගණන රුපියල් 1,000යි. හැබැයි, සමහරු රුපියල් 5,000, 6,000, 10,000 ගන්නවා. ඒ නිසා අමාත්‍යාංශය විසින් පළාත් සභාවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථා අලුත් කර, ඒ අතුරු ව්‍යවස්ථා අනුව මේ සභා අරමුදල් තර කරන්න පුළුවන් කඩිනම් වැඩ පිළිවෙළවල් හදන්න කටයුතු කරනවාද? ඒ සඳහා ඔබ අමාත්‍යාංශය මේ වන විට ගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියා දැන ගන්න කැමැතියි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මේ වන විට අපි විශේෂයෙන්ම අඩු ආදායම් ලබන එහෙම නැත්නම් ආදායම, අරමුදල ශක්තිමත් නැති පළාත් පාලන ආයතනවලට "පුරනැගුම" ව්‍යාපෘතිය යටතේ මුදල් වෙන් කර, ලබා දී තිබෙනවා. සමහර පළාත් පාලන ආයතන ඉතාම අඩු අරමුදලක් තිබෙන ඒවා. විශේෂ ඒවා තිබෙනවා නම් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යෝජනා කරන්න. අපි ඒ සඳහා මේ වර්ෂයේ ප්‍රතිපාදනවලින් මුදල් වෙන් කර දෙන්න කැමැතියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රතිපාදන පිළිබඳ ප්‍රශ්නය නොවෙයි, මෙතැන තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. මෙතැන නීතිමය වශයෙන් අතුරු ව්‍යවස්ථාව පනවා සභාවට ආදායම් එකතු කර ගන්න පුළුවන් ක්‍රමවේද දීලා තිබෙනවා. ඒ අනුව යම් යම් කර්මාන්ත ආරම්භ කිරීමේ හැකියාවත් අපට තිබෙනවා. හැබැයි, ඒ සඳහා නීතිමය අවකාශය ලබා දීමේ අයිතිය පළාත් සභාව සතුවයි තිබෙන්නේ. මොකද, අර හදන අතුරු ව්‍යවස්ථාව සම්මත කරන්න ඕනෑ. ගාස්තු අය කර ගැනීම සඳහා අනුමැතිය ගරු ඇමතිතුමනි, පළාත් සභාව තුළින් තමයි ලැබෙන්නේ. අන්න ඒ බාධාව දිගින් දිගටම පැවතුණා. බාධා පැවතීම තුළ තමයි පුංචි ආණ්ඩු, සමහර ඉහළ දේශපාලන නායකත්වයන්ගේ අතකොළු බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ. ඒ නිසා මොන පක්ෂයේ කෙනෙක් සභාපතිවරයා හැටියට පත් වුණත් ස්වාධීනව වැඩ කරන්න පුළුවන් වන විධියට මේ අරමුදලට අවශ්‍ය කරන නීතිමය අවකාශය හදා දීමේ වැඩ පිළිවෙළ සකස් කරන්න. අපි පළාත් පාලන ආයතන නියෝජනය කළ වකවානුව තුළ මේ ගැන ඒ පළාතේ සිටින පළාත් ප්‍රධාන ඇමතිවරුන්ට කිව්වා. හැබැයි, ඒ අයගේ අරමුදල් තර කර ගත්තා හැරෙන්නට ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය සඳහා වූ වැඩ පිළිවෙළක් ඇති කළේ නැහැ. මම කියනවා, ඔබතුමා පළාත් පාලන ආයතන නියෝජනය කළ කෙනෙක් නිසා මේ පහළ මට්ටමේ තිබෙන පුංචි ආණ්ඩු ගොඩ නඟන්න පුළුවන් වන අතුරු ව්‍යවස්ථා වැඩ පිළිවෙළ හදලා දෙන්න කියා. මොකද, ඔවුන්ට කර්මාන්ත කරන්න පුළුවන්; ස්වයං රැකියා කරන්න පුළුවන්; වෙනත් කටයුතුවලට යන්න පුළුවන්. හැබැයි, නීතියෙන් බාධාවක් තිබෙනවා. එහෙම යන්න ඉඩ අවකාශය හදලා දෙන වැඩ පිළිවෙළ කඩිනම් කරන්න කියා තමයි මම දෙවන අතුරු ප්‍රශ්නය තුළිනුත් මතු කරන්නේ. ඕනෑම ආණ්ඩුවක් මුදල් දෙනවා. දීලා ඒක හිර කරනවා. සමහර ඒවා අද පළාත් පාලන ආයතනවලට කරන්න දෙන්නෙත් නැහැ. ගරු ඇමතිතුමනි, ස්වාධීනව කරන්න පුළුවන් වැඩ පිළිවෙළ අමාත්‍යාංශය තුළ තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියා තමයි මම ඉල්ලන්නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රශ්නය ගත්තොත්, මම හිතන්නේ එතුමා කියන්නේ පළාත් පාලන ආයතනවලට තමන්ගේ වැඩ කටයුතු කරගෙන යාමට තිබෙන බාධා ඉවත් කර ඒ සඳහා සහාය දෙන්න කියන එකයි. විශේෂයෙන්ම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවට තමයි මේ විෂය විමධ්‍යගත වෙලා තිබෙන්නේ. අපේ අමාත්‍යාංශය මඟින් ඒක අධීක්ෂණය කර, තමන්ගේ ආදායම අඩු ප්‍රාදේශීය සභාවලට යම් මට්ටමක උදවු උපකාරයක් හැටියට තමයි පළාත් පාලන කොමසාරිස් හරහා මේ ක්‍රියාමාර්ගය ගන්නේ.

නමුත්, එතුමාගේ අදහස අනුව අපට පුළුවන් වෙනවා, යම්තාක් දුරකට පළාත් සභා ආයතනත්, පළාත් පාලන ආයතනත් සම්බන්ධ කරගෙන මෙවැනි ප්‍රාදේශීය සභා සහ නගර සභාවලට මෙවැනි වැඩ පිළිවෙළවල් සඳහා නීති සකස් කර ගැනීමට උදවු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 4 -222/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පුරාවිද්‍යාත්මක ස්ථාන : මොණරාගල දිස්ත්‍රික්කය
### தொல்பொருளியல் இடங்கள்: மொனராகல மாவட்டம்
### ARCHAEOLOGICAL SITES: MONARAGALA DISTRICT

250/'18

5. **ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව කොපමණද; ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகல மாவட்டத்தின் மொனராகல பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள அடையாளம் காணப்பட்ட தொல்பொருளியல் இடங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை;

(ii) அப்பிரிவில் அகழ்வுகள் மேற்கொள்ளப்படாத எனினும், அடையாளம் காணப்பட்ட தொல் பொருளியல் இடங்கள் அமைந்துள்ளனவா;

(iii) ஆமெனில், அவை யாவை;

(iv) மேற்படி பிரிவில் அமைந்துள்ள தொல் பொருளியல் முக்கியத்துவம் வாய்ந்த ரஜமகா விகாரைகளின் எண்ணிக்கை எவ்வளவு; அது பற்றிய அறிக்கையொன்றைச் சமர்ப்பிப்பாரா;

(v) மேற்படி தொல்பொருளியல் இடங்களின் பேணல் நடவடிக்கைகளுக்காக ஒதுக்கப் பட்டுள்ள ஏற்பாடுகள் பற்றிய முழுமையான அறிக்கையொன்றை இச்சபைக்கு சமர்ப் பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the number of archaeological sites that have been identified in Monaragala Divisional Secretary's Division in Monaragala District, along with their names;

(ii) whether there are any archaeological sites in the aforesaid Division, which have been identified but excavations have not been done in them;

(iii) if so, the aforesaid archaeological sites;

(iv) the number of Rajamaha Viharas in the aforesaid Division, which have an archaeological value; whether a report of them will be submitted; and

(v) whether a detailed report of the allocations made for the conservation activities of the aforesaid archaeological sites will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ස්ථාන 16යි.

ස්ථානීය නාමාවලිය ඇමුණුම 01හි දැක්වේ. ඇමුණුම 1 **සභාගත*** කරමි.

(ii) ඔව්.

(iii) ඇමුණුම 02හි දැක්වේ. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(iv) එවැනි ස්ථාන 1යි. ඇමුණුම 03හි දැක්වේ. ඇමුණුම 03 **සභාගත*** කරමි.

(v) ඔව්.

සංරක්ෂණ අවශ්‍යතා මතු වන අවස්ථාවලදී ඒ සඳහා මැදිහත්ව සංරක්ෂණ කටයුතු සිදු කරනු ලබන අතර, මෙම ස්ථාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කලාප භාර නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ නඩත්තු කටයුතු සිදු කරමින් පවත්වාගෙන යනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

අතුරු ප්‍රශ්න අදාළ අමාත්‍යතුමාට යොමු කළ හැකියි.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම් අංක 01

හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ස්ථානයේ නම |
|---|---|---|
| 1 | මොණරාගල | මුප්පනේ රජමහා විහාර භූමිය |
| 2 | මොණරාගල | බුදුගල්ගේ පුරාණ විහාර භූමිය |
| 3 | මොණරාගල | මයුරගිරිය පුරාණ විහාර භූමිය |
| 4 | මොණරාගල | ගලබැද්ද පොකුණ |
| 5 | මොණරාගල | කච්ඩාව පුරාණ විහාර ප්‍රතිමා ගෘහය |
| 6 | මොණරාගල | ගණුල්පොත පුරාණ විහාරය කටාරං කෙටූ ලෙන්, බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන්, පැරණි දාගැබ, පියගැටපෙළ, පහන්වැටවල් සහිත ගල් තලාව |
| 7 | මොණරාගල | වෙහෙරගල පුරාණ විහාරය (පැරණි දාගැබ, මල් ආසනය හා පඩිපෙළ ) |
| 8 | මොණරාගල | බුදුගල්ලෙන පුරාණ විහාරය ( කටාරං හා සෙල්ලිපි සහිත ලෙන්, ප්‍රතිමා ගෘහය, පියගැටපෙළ, ගල් කනු සහිත ස්ථාන) |
| 9 | මොණරාගල | තිස්ලෙන් විහාරය ( ශිලා ලිපි හා කටාරං කොටන ලද ලෙන් සංකීර්ණය) |
| 10 | මොණරාගල | සීතාකන්ද ආරණ්‍ය සේනාසනය ( ශිලා ලිපි හා කටාරං ලෙන්) |
| 11 | මොණරාගල | මාරාව කනපද්ද උල්පත |
| 12 | මොණරාගල | වැලියාය උඩුම්දොර පුරාණ විහාරය |
| 13 | මොණරාගල | ගුරුහෙල ලෝල්ලේහෙල |
| 14 | මොණරාගල | වැලියාය ආරණ්‍ය |
| 15 | මොණරාගල | විහාරමුල්ල පත්තිනි තැන්න |
| 16 | මොණරාගල | වැලියාය සිරිගල කන්දන පුරාවිද්‍යා ස්මාරක |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඇමුණුම් අංක 02

කැණීම් නොකරන ලද, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ස්ථානයේ නම |
|---|---|---|
| 1 | මොණරාගල | මුප්පනේ රජමහා විහාර භූමිය |
| 2 | මොණරාගල | බුදුගල්ගේ පුරාණ විහාර භූමිය |
| 3 | මොණරාගල | මයූරගිරිය පුරාණ විහාර භූමිය |
| 4 | මොණරාගල | ගලබැද්ද පොකුණ |
| 5 | මොණරාගල | කච්ඩාව පුරාණ විහාර ප්‍රතිමා ගෘහය |
| 6 | මොණරාගල | ගණුල්පොත පුරාණ විහාරය කටාරං කෙටූ ලෙන්, බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන්, පැරණි දාගැබ, පියගැටපෙළ, පහන්වැටවල් සහිත ගල් තලාව |
| 7 | මොණරාගල | වෙහෙරගල පුරාණ විහාරය (පැරණි දාගැබ, මල් ආසනය හා පඩිපෙළ ) |
| 8 | මොණරාගල | බුදුගල්ලෙන පුරාණ විහාරය ( කටාරං හා සෙල්ලිපි සහිත ලෙන්, ප්‍රතිමා ගෘහය, පියගැටපෙළ, ගල් කනු සහිත ස්ථාන) |
| 9 | මොණරාගල | තිස්ලෙන් විහාරය ( ශිලා ලිපි හා කටාරං කොටන ලද ලෙන් සංකීර්ණය) |
| 10 | මොණරාගල | සීතාකන්ද ආරණ්‍ය සේනාසනය ( ශිලා ලිපි හා කටාරං ලෙන්) |
| 11 | මොණරාගල | මාරාව කනපද්ද උල්පත |
| 12 | මොණරාගල | වැලියාය උඩුම්දොර පූරණ විහාරය |
| 13 | මොණරාගල | ගුරුහෙල ලෝල්ලේහෙල |
| 14 | මොණරාගල | වැලියාය ආරණ්‍ය |
| 15 | මොණරාගල | විහාරමුල්ල පත්තිනි තැන්න |
| 16 | මොණරාගල | වැලියාය සිරිගල කන්දන පූරාවිද්‍යා ස්මාරක |

ඇමුණුම් අංක 03

රජමහා විහාරය

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | රජමහා විහාරය |
|---|---|---|
| 1 | මොණරාගල | මුප්පනේ රජමහා විහාරය |

** මෙම ඇමුණුම් පුස්තකාලයේ ද තබා ඇත.*
** இந்த இணைப்புக்கள் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.*
** [These annexes are also placed in the Library.]*

එය කිසිම ජාතියකට, ආගමකට කියලා වෙන් කරන්න බැහැ. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරද්දී, බොහෝ විට වග කිවයුතු උත්තර අපට ලැබුණේ නැහැ. ඔබතුමාම දන්නවා, සමහර වෙලාවට වාර දෙක, තුන මේ ප්‍රශ්නයට පිළිතුරු නොදී ඉඳලා තිබෙනවා කියලා. ඒක එහෙම නොවුණාම මමම ඒ ගැන ප්‍රශ්න කරලා තිබෙනවා. එයට වග කිවයුතු පිළිතුරක් නොලැබුණු වෙලාවේ, සම්පන්දන් මන්ත්‍රීතුමා මේ කරන ප්‍රකාශය ගැන මම අතිශය පිළිකුල් සහගතව හෙළා දකිනවා. ඒ විතරක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය මොකක්ද?

**ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමන්ලා කියන්න, මේ සම්පන්දන් මන්ත්‍රිවරයා කියන විධියට මේ රටේ පුරාවිද්‍යා උරුමයන් විනාශ වෙලා තිබෙන්නේ, සංස්කෘතික උරුමයන් විනාශ වෙලා තිබෙන්නේ මේ රටේ භික්ෂූන් වහන්සේ අතින්ද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා උත්තර දෙන්න.

**ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
එහෙම නොවෙයි. මගේ ප්‍රශ්නයට උත්තරයක් ඕනෑ. සම්පන්දන් මන්ත්‍රීතුමා කියන කථාව ගැන අද බැරි නම් ළඟදී දිනයක ඔබතුමන්ලාගෙන් වග කිවයුතු උත්තරයක් ඕනෑ. දැන් එක එක්කෙනා මේ කාරණය කියන්න පටන් අරගෙන තිබෙනවා. එක වෙලාවකට එක්කෙනෙක් කියයි; තව වෙලාවකට තව එක්කෙනෙක් කියයි. මේ රටේ උරුමයන් සම්බන්ධ ප්‍රශ්නයක් දැන් උද්ගත වෙලා තිබෙන්නේ. මේ රටේ බුද්ධ ශාසන අමාත්‍යවරයාගෙන්, මේ රටේ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගෙන් මේ පිළිබඳව වග කිව යුතු උත්තරයක් ඕනෑ. අපේ මහනායක ස්වාමීන් වහන්සේලා මේක අහනවා. උතුරු, නැගෙනහිර භික්ෂූන් වහන්සේලා අපට මේ කාරණය කිව්වා. මේ ඉලක්ක කරන්නේ අරිසිමලේ නායක හාමුදුරුවන්ව. උන්වහන්සේ සිංහයෙක් වාගේ, ඒ ප්‍රදේශවල ජීවත් වෙන දෙමළ, සිංහල, මුස්ලිම් සහෝදරත්වය වෙනුවෙන් කැපවෙන හාමුදුරුනමක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අද පුළුවන් නම්, ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න. නැත්නම් අදාළ අමාත්‍යවරයාට යොමු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමා හරහා අපි ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 6 - 334/'18 - (2), ගරු ඉෂාක් රහුමාන් මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 - 364'18 - (1), ගරු වේලු කුමාර් මැතිතුමා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)
Sir, I ask for three months' time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 440/'19 - (1), ගරු ජයන්ත සමරවීර මැතිතුමා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 9 - 475/'19 - (1), ගරු මුහම්මදු නසීර් මැතිතුමා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 10 - 494/'19 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මැතිතුමා - [සභා ගර්භය තුළ නැත.]

## චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහ ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්: විස්තර

### சீனாவிலுள்ள இலங்கைத் தூதரகம் மற்றும் அவுஸ்திரேலியாவிலுள்ள இலங்கை உயர்ஸ்தானிகராலயத்தின் அலுவலர்கள்: விபரம்

### OFFICERS OF SRI LANKAN EMBASSY IN CHINA AND HIGH COMMISSION IN AUSTRALIA: DETAILS

542/'19

**11.** ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2008 වර්ෂයේ සිට 2018.06.30 දක්වා චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහ ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සේවය කළ හා දැනට සේවය කරන නිලධාරීන්ගේ නම් හා ඔවුන්ගේ තනතුරු කවරේද;

(ii) ඒ සඳහා තානාපති කාර්යාල නිලධාරීන් නොවන රජයේ දෙපාර්තමේන්තුවල හා අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් පත් කර තිබේද;

(iii) එසේ නම්, ඒ අයගේ නම් හා ඔවුන්ගේ තනතුරු කවරේද;

(iv) මේ අය අතරින් රාජතාන්ත්‍රික ගමන් බලපත් නිකුත් කර තිබූ අයගේ නම් කවරේද;

(v) එම බලපත්‍රවල අංක කවරේද;

(vi) එම නිලධාරීන්ට රාජතාන්ත්‍රික ගමන් බලපත්‍ර ලබා දීමට සුදුසු බවට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ කරන ලද්දේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008 ஆம் ஆண்டு முதல் 2018.06.30 ஆம் திகதி வரை சீனாவிலுள்ள இலங்கைத் தூதரகம் மற்றும் அவுஸ்திரேலியாவிலுள்ள இலங்கை உயர்ஸ் தானிகராலயத்தில் சேவையாற்றிய மற்றும் தற்போது சேவையாற்றி வருகின்ற அலுவலர் களின் பெயர்கள் மற்றும் அவர்களின் பதவிகள் யாவை என்பதையும்;

(ii) அதற்காக தூதரக அலுவலர்கள் அல்லாத அரசாங்க திணைக்களங்கள் மற்றும் பகுதியளவிலான அரசாங்க நிறுவனங்களின் அலுவலர்கள் நியமனம் செய்யப்பட்டுள்ளார்களா என்பதையும்;

(iii) ஆமெனில், அவர்களின் பெயர்கள் மற்றும் அவர்களின் பதவிகள் யாவை என்பதையும்;

(iv) இவர்களில் இராஜதந்திர கடவுச்சீட்டு விநியோகிக்கப்பட்டிருந்தவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(v) மேற்படி கடவுச்சீட்டுக்களின் இலக்கங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி அலுவலர்களுக்கு இராஜதந்திர கடவுச்சீட்டுக்களை வழங்குவது உகந்தது என்று குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களத்திற்கு சிபாரிசு செய்துள்ளவர்கள் யாவர் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform the House-

(i) the names and designations of the officers who had been serving at the Sri Lankan Embassy in China and the Sri Lankan High Commission in Australia from the year 2008 up to 30.06.2018 and of the officers who are serving at these missions at present;

(ii) whether officers belonging to Departments and semi government institutions who are not officers of diplomatic missions have been appointed to such posts;

(iii) if so, what their names and designations are;

(iv) which officers out of those referred to above had been issued with diplomatic passports;

(v) the numbers of those passports; and

(vi) who had recommended to the Department of Immigration and Emigration that the officers concerned are eligible to be provided with diplomatic passports?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

ඕස්ට්‍රේලියා -කැන්බරා -ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය

| නම | කාලය | තනතුර |
|---|---|---|
| එස්.සී.බී. වල්ගම්පාය මැතිතුමා | 2008 - 2010 | |
| අද්මිරාල් ටී.එස්.ජී. සමරසිංහ මැතිතුමා | 2011 - 2014 | මහකොමසාරිස් |
| එස්. ස්කන්ධකුමාර් මැතිතුමා | 2015 - 2019 | |
| ඒ.එල්. රත්නපාල මැතිතුමා | 2011 - 2013 | |
| එල්.ඩී.බී. හුලුගල්ල මැතිතුමා | 2014 | |
| එච්.එස්.ඒ. සේරසිංහ මිය | 2015 - 2018 | නියෝජ්‍ය මහකොමසාරිස් |
| ඩී.ඩී.එම්.එස්.බී. දිසානායක මිය | 2019 - අද දක්වා | |
| ජී.ඩී.සී. ගුණපාල මහතා | 2015 - 2018 | |
| පී. සෙල්වරාජ් මහතා | 2012 - 2015 | |
| ඩබ්ලිව්.එම්. ධර්මපාල මහතා | 2019 - අද දක්වා | අමාත්‍ය |
| කේ.ඒ.පී. ද සිල්වා මිය | 2019 - අද දක්වා | |
| සශිකලා ප්‍රේමවර්ධන මිය | 2008 - 2011 | |
| දයානි මෙන්ඩිස් මිය | 2008 - 2010 | |
| ඩබ්ලිව්.එස්.එම්.එස්. විජේසුන්දර මහතා | 2011 - 2013 | අමාත්‍ය උපදේශක |
| ඩී.ජී.එන්. රඹුක්වැල්ල මහතා | 2011 - 2014 | |
| ඩබ්ලිව්.කේ.සී. වීරසේන මහතා | 2015 - 2018 | |
| ටී.කේ.සී. ෂලේන්ද්‍රි මිය | 2014 | දෙවැනි ලේකම් |
| රත්නා රණවීර මිය | 2013 - 2014 | තෙවැනි ලේකම් |
| ඒ.ඒ.ඩී.රත්නලතා මැණිකේ මිය | 2008 - 2010 | |
| ඩබ්ලිව්.ඩී.කේ. අසෝකා මිය | 2008 - 2009 | |
| ටී.සී. සේරම් මිය | 2010 - 2013 | විශේෂ කාර්ය භාර නිලධාරි |
| ඒ.ඩී.එම්.ඩී. අමරසිංහ මිය | 2013 - 2017 | |
| ජේ.ඒ.ඩී.එච්. ජයසූරිය මිය | 2017 - අද දක්වා | |
| එම්.එස්. මනම්පේරි මහතා | 2010 - 2013 | ලිපිකරු |
| එච්.ටී.කේ. ගුණරත්න මිය | 2008 | |
| සී. ඇපාසිංහ මිය | 2009 - 2013 | තොරතුරු තාක්ෂණ නිලධාරි |
| ආර්.අයි. ලියනාරච්චි මිය | 2014 - 2018 | |
| එම්.එම්.කුමාරගේ මහතා | 2019 - අද දක්වා | |
| ජී.බීකේ. අබේකෝන් මිය | 2014 - 2017 | ගිණුම් නිලධාරි |
| කේ.වයි.ජී.කල්දේරා මිය | 2018 - අද දක්වා | |
| ටී.ඒ. හෙන්දුක් මිය | 2008 - 2009 | |
| ඩී.ඒ.පී.කේ ද සිල්වා මිය | 2009 - 2012 | |
| එච්.එන්. ඉෆ්තිකාර් මිය | 2013 - 2016 | පෞද්ගලික සහකාර |
| කේ.ඒ.ඩී.ආර්. කුරුප්පු මිය | 2017 - අද දක්වා | |

චීනය -බීජිං- ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

| නම | කාලය | තනතුර |
|---|---|---|
| කේ. අමුණුගම මැතිතුමා | 2008 - 2010 | |
| රන්ජිත් උයන්ගොඩ මැතිතුමා | 2011 - 2014 | තානාපති |
| ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා | 2015 - අද දක්වා | |
| ඩී.පී.සී.ඩබ්ලිව්. කරුණාරත්න මහත්මිය | 2016 - අද දක්වා | නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානි/අමාත්‍ය |
| ඩබ්ලිව්.පී.ඒ.එෆ්. ගුණසේකර මහත්මිය | 2008 - 2010 | අමාත්‍ය (වාණිජ) |
| එස්.කේ.ගුණසේකර මහත්මිය | 2008 - 2010 | |
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා | 2008 - 2011 | අමාත්‍ය උපදේශක |
| කේ.ඒ. විමලේන්තිරාජා මහතා | 2012 - 2013 | |
| ඩී.එම්.එස්. දිසානායක මහතා | 2008 - 2010 | |
| බ්‍රිගේඩියර් ඩබ්ලිව්.ඒ. මහින්ද වීරසූරිය | 2011 - 2012 | |
| බ්‍රිගේඩියර් ඒ.ඩබ්.එම්.ඒ.ඩබ්ලිව්.එන්. රණවන | 2013 | අමාත්‍ය උපදේශක (ආරක්ෂක) |
| බ්‍රිගේඩියර් ටී.එස්. බන්සජයාහ් | 2015 - 2016 | |
| බ්‍රිගේඩියර් ටී.ඩී. වීරකෝන් | 2017 - 2018 | |
| රේබා ගුණසේකර මිය | 2011 - 2014 | උපදේශක |
| ශිරානි ආරියරත්න මිය | 2011 - 2014 | උපදේශක (වාණිජ) |
| රුවන්ති ආරියරත්න මිය | 2015 - 2018 | |
| බ්‍රිගේඩියර් පී.එස්.කේ. සන්ජීව මහතා | 2019 - අද දක්වා | උපදේශක (ආරක්ෂක) |
| පූර්ණිමා ගුණසේකර මිය | 2011 - 2012 | පළමු ලේකම් |
| මනේෂා තුඩාවේවත්ත මිය | 2013 - 2014 | |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

| | | |
|---|---|---|
| [illegible] | 2013 - 2014 | |
| එම්.පී. සමරසේකර මිය | 2008 - 2010 | දෙවැනි ලේකම් |
| එල්.ඩී. දම්මුල්ලගේ මිය | 2014 - 2016 | |
| ඩබ්ලිව්. ඉනෝකා වීරසිංහ මිය | 2017 - අද දක්වා | |
| ජී.ආර්.ටී.ඩී. ගුණරත්න මිය | 2018 - අද දක්වා | |
| ඒ.එච්.ටී.එස්. ද සිල්වා මිය | 2008 - 2013 | විශේෂ කාර්ය භාර නිලධාරී |
| ඒ. වික්‍රමසිංහ මිය | 2015 - 2018 | |
| වයි.ඩී.පී. ජයරත්න මිය | 2017 - අද දක්වා | |
| ජී.එච්.පී. චාන්දනී කුමාරි මිය | 2008 - 2011 | කළමනාකරණ සහකාර |
| ජේ.ඒ.ඩීඑච්. ජයසූරිය මිය | 2008 - 2010 | |
| කේ.ජී.එම්.ඩී. නානායක්කාර මිය | 2008 - 2009 | |
| මලින්ද උදයකුමාර මහතා | 2011 - 2016 | |
| ඩී.එම්. ප්‍රියන්ගනී දිසානායක මිය | 2012 - 2014 | |
| ඩී.එම්.එස්.ඩී.ජේ.කේ. ජයසිංහ මිය | 2013 - 2016 | |
| ආර්.කේ.පී. දිල්රුක් මහතා | 2017 | |
| ඩබ්ලිව්.ඩී.ඩී.ටී. ගුණතිලක මිය | 2019 - අද දක්වා | |
| ඩී.එල්. මානපෙරුම මහතා | 2017 - අද දක්වා | |
| ඩී. පියදිගම මිය | 2008 - 2011 | |
| කේ.ඒ.ආර්.එල්. පෙරේරා මිය | 2009 - 2011 | පුද්ගලික සහකාර |
| මාලා සේනාරත්න මිය | 2011 - 2014 | |
| රමනි පෙරේරා මිය | 2012 | |
| ප්‍රීතිමාලි ඒකනායක මිය | 2013 - 2014 | |
| ආර්. සී. ජිනාන්ජලී මිය | 2015 - 2018 | |
| ටී.පී. ඒකනායක මිය | 2015 - 2016 | |
| පී.එස්. අසලගේ මිය | 2017 - අද දක්වා | |
| එස්.එම්.ඒ. රසාන්ගිකා මිය | 2019 - අද දක්වා | |

(ii) ඔව්.

(iii)

| නම | තනතුර |
|---|---|
| බ්‍රිගේඩියර් ඩබ්ලිව්.ඒ. මහින්ද වීරසූරිය | අමාත්‍ය උපදේශක (ආරක්ෂක) |
| බ්‍රිගේඩියර් ඒ.ඩබ්ලිව්.එම්.ඒ.ඩබ්ලිව්.එන්. රණවන | අමාත්‍ය උපදේශක (ආරක්ෂක) |
| බ්‍රිගේඩියර් ටී.එස්. බන්සාජයාහ් | අමාත්‍ය උපදේශක (ආරක්ෂක) |
| බ්‍රිගේඩියර් ටී.ඩී. වීරකෝන් | අමාත්‍ය උපදේශක (ආරක්ෂක) |
| බ්‍රිගේඩියර් ඩී.එම්.එස්. දිසානායක | අමාත්‍ය උපදේශක (ආරක්ෂක) |
| බ්‍රිගේඩියර් පී.එස්.කේ. සන්ජීව මහතා | උපදේශක (ආරක්ෂක) |
| ඩබ්ලිව්.පී.ඒ.එෆ්. ගුණසේකර මහතා | අමාත්‍ය (වාණිජ) |
| ශිරානි ආරියරත්න මිය | උපදේශක (වාණිජ) |
| රුවන්ති ආරියරත්න මිය | උපදේශක (වාණිජ) |
| කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | අමාත්‍ය උපදේශක (ශ්‍රී ලංකා පරිපාලන සේවය) |
| කේ.ඩී.එස්. රුවන්වන්ද්‍ර මහතා | අමාත්‍ය උපදේශක (ශ්‍රී ලංකා පරිපාලන සේවය) |

(iv) ඉහත සියලුම නිලධාරින් සඳහා.

ඔබතුමා අහලා තිබෙන්නේ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බල පත්‍ර නිකුත් කළ අයගේ නම්. ඒ සියලුම දෙනාට ලබාදීලා තිබෙනවා.

(v)

| නම | විදේශ ගමන් බලපත්‍ර අංකය |
|---|---|
| බ්‍රිගේඩියර් ඩබ්ලිව්.ඒ. මහින්ද වීරසූරිය | D3642777 |
| බ්‍රිගේඩියර් ඒ.ඩබ්ලිව්.එම්.ඒ.ඩබ්ලිව්.එන්. රණවන | D3643384 |
| බ්‍රිගේඩියර් ටී.එස්. බන්සාජයාහ් | D3643857 |
| බ්‍රිගේඩියර් ටී.ඩී. වීරකෝන් | D3644806 |
| බ්‍රිගේඩියර් ඩී.එම්.එස්. දිසානායක | D3642267 |
| බ්‍රිගේඩියර් පී.එස්.කේ. සන්ජීව | D5658059 |
| ඩබ්ලිව්.පී.ඒ.එෆ්. ගුණසේකර | D3643279 |
| ශිරානි ආරියරත්න මිය | D1943428 |
| රුවන්ති ආරියරත්න මිය | D5657725 |
| කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | D3643279 |
| කේ.ඩී.එස්. රුවන්වන්ද්‍ර මහතා | D3642112 |

(vi) ලේකම්/විදේශ කටයුතු.

(ආ) අදාළ නොවේ.

** මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.*
** இந்தப் பதில் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.*
** [This answer is also placed in the Library.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් ලෙස නොවෙයි, පිළිතුරේ කියැවුණේ නැති නිසා මම දැන ගන්නට කැමැති කාරණයක් තිබෙනවා.

(අ) (i) පිළිතුරට අදාළ නම් අතර දූලාන් ආසිරි හෙට්ටිආරච්චි නමැත්තෙකුගේ නමක් තිබෙනවාද? මොකද, ඔහුට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් නිකුත් කරලා තිබෙනවා 2018.05.14 දින. ඔහු ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයේ Public Relations Officer කෙනෙක් විධියට පත් කරලා තිබෙනවා; චීන තානාපති කාර්යාලයේ Trade Promotion Officer කෙනෙක් විධියටත් පත් කරලා තිබෙනවා. ඔහුට diplomatic passport එකක් තිබෙනවා. එහි අංකය D 5657962.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ලැයිස්තුවේ හෙට්ටිආරච්චි කියලා නමක් නම් සොයා ගන්නට අමාරුයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. දූලාන් ආසිරි හෙට්ටිආරච්චි නමැත්තා පසුගිය රජය කාලයේ ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තනතුරකට - Public Relations Officer කියලා තනතුරක් හදලා - දේශපාලන පත්වීමක් මත යවලා තිබෙනවා.

ඒ පුද්ගලයාගේ වැරැදි හැසිරීම මත - misconduct - සේවයෙන් පහ කරනු ලබනවා. සේවයෙන් පහ කළාට පසුව, 2018දී නැවත ඔහු චීනයේ බීජිංවල තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ Trade Promotion Officer කෙනකු හැටියට යවනවා. ගරු කථානායකතුමනි, මේ පුද්ගලයා විදේශ අමාත්‍යාංශයේ letterhead එකක් හොරකම් කරලා, ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගේ අත්සන හොරට යොදාගෙන රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් ලබාගෙන තමයි චීනයට යන්නේ. එය හෙළිදරව් වෙලා විදේශ අමාත්‍යාංශයෙන් ඒ ගැන පැමිණිලි කළාට පස්සේ, අපි දන්නා තරමින් මාස කීපයකට පස්සේ නැවත ඔහු ලංකාවට එවලා තිබෙනවා.

දැන් මේ පුද්ගලයා කරලා තිබෙන්නේ බරපතළ වැරැද්දක්. මොහු එක වතාවක් තානාපති කාර්යාලයකින් එළවපු පුද්ගලයෙක්. එහෙම තිබියදී ඊළඟ අවස්ථාවක ඔහු චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට යවනවා. ඒ යවන්නේ වැරැදි කරලා තිබෙන පුද්ගලයෙක්. මම ඒ සම්බන්ධ ලේඛන දෙකම **සභාගත*** කරනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට දැනගන්න කැමැතියි, ඒ පුද්ගලයා සම්බන්ධව විදේශ අමාත්‍යාංශයෙන් කළ පරීක්ෂණයේ වාර්තාව ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා ද කියලා. මොකද, එහෙම පරීක්ෂණයක් කරලා තිබෙන නිසා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මේ සම්බන්ධ පරීක්ෂණ කටයුතු අතරමගදී CID එකට බාර දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ පුද්ගලයා ජනාධිපති ලේකම් කාර්යාලයට සම්බන්ධ විවිධ පුද්ගලයන් භාවිත කරමින් එක පැත්තකින් වෙනත් තනතුරු ලබා ගන්නත්, අනෙක් පැත්තෙන් විදේශ අමාත්‍යාංශයේ නිලධාරින්ට බලපෑම් කරන්නත් කටයුතු කරමින් ඉන්නවා තමන් විශාල බලගතු පුද්ගලයෙක් කියලා පෙන්වමින්. මගේ ජංගම දුරකථනයෙන් ඔබතුමාට ඒ තොරතුරු පෙන්වන්න පුළුවන්. කොළඹ සමහර තැන්වල ඔහු විශාල cutouts දාලා තිබෙනවා, ජනාධිපතිතුමාගේ දුම්වැටි විරෝධී ව්‍යාපෘතියේ නියෝජිතයකු විධියට සඳහන් කරලා. ඒ පුද්ගලයා සම්බන්ධ CID සහ පොලිස් පරීක්ෂණවල ප්‍රගතිය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට වාර්තා කරනවා ද කියලා මා අහන්න කැමැතියි. මම ඔහුගේ හොර පාස්පෝට් එකේ පිටපතක් සහ ඒ සම්බන්ධව කෙරෙන පරීක්ෂණයට අදාළ ලියකියැවිලිවල කොටසකුත් ඔබතුමාගේ අවසරය මත **සභාගත*** කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ඒ කාරණය අදාළ ඇමතිතුමාට යොමු කරලා පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රශ්න අංක 12-553/'19-(1), ගරු එස්. ශ්‍රීතරන් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන: වැය කළ මුදල

## தேசிய சுற்றாடல் பாதுகாப்பு நிகழ்ச்சித்திட்டம்: செலவிடப்பட்ட பணம்

## NATIONAL ENVIRONMENTAL CONSERVATION PROGRAMME : MONEY SPENT

581/'19

**13.** **ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2016 අය වැයෙහි අංක 174 යෝජනාවට අනුව, ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන යටතේ අමතර වැඩසටහන් සඳහා වෙන්කළ රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන 2016 වර්ෂය තුළදී වැය කළ ආකාරය පැහැදිලි කරන්නේද;

(ii) උක්ත යෝජනාව අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් "අමතර වැඩසටහන්" කවරේද;

(iii) මෙම අමතර වැඩසටහන් සඳහා වගකීම දරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) උක්ත අය වැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී,

(i) පාරිසරික සමතුලිත බව ආරක්ෂා කිරීම;

(ii) තිරසර ඉඩම් කළමනාකරණය;

(iii) ජීව සම්පත් සංරක්ෂණය;

(iv) පරිසර දූෂණය පාලනය;

(v) වන සම්පත ආරක්ෂා කිරීම;

සඳහා වැය කර ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016 வரவு செலவுத்திட்டத்தின் 174 ஆம் முன்மொழிவின் பிரகாரம், தேசிய சுற்றாடல் பாதுகாப்பு நிகழ்ச்சித்திட்டத்தின் கீழ் மேலதிக நிகழ்ச்சித்திட்டங் களுக்கு ஒதுக்கப்பட்ட ரூபா 2000 மில்லியன் நிதி ஏற்பாடு 2016 ஆம் ஆண்டில் செலவிடப்பட்ட முறையை தெளிவுபடுத்துவாரா என்பதையும்;

(ii) மேற்படி முன்மொழிவின் பிரகாரம், நிதி ஏற்பாடுகள் வழங்கப்பட்ட "மேலதிக நிகழ்ச்சித் திட்டங்கள்" யாவை என்பதையும்;

(iii) மேற்படி மேலதிக நிகழ்ச்சித்திட்டங்களுக்குப் பொறுப்பான நிறுவனங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி வரவு செலவுத்திட்ட முன்மொழிவின் பிரகாரம், 2016 ஆம் ஆண்டில்,

(i) சுற்றாடல் சமநிலைமை பாதுகாத்தல்;

(ii) நிலைபேறான காணி முகாமைத்துவம்;

(iii) உயிர் வளங்களின் பாதுகாப்பு;

(iv) சுற்றாடல் மாசடைவதைக் கட்டுப்படுத்தல்;

(v) வன வளங்களின் பாதுகாப்பு;

ஆகியவற்றுக்கு செலவிடப்பட்ட பணத் தொகைகள் தனித்தனியே யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House -

(i) in terms of Proposal No. 174 of the Budget 2016, whether he explains of the manner in which Rs. 2000 million that was allocated for supplementary programmes under National Environmental Conservation Programme, was spent in year 2016 ;

(ii) the "supplementary programmes" for which financial allocations were made, in terms of the aforesaid proposal; and

(iii) the institutions which held the responsibility in aforesaid supplementary programmes?

(b) Will he also inform this House in terms of aforesaid Budget Proposal, separately, of the amount of money spent on-

(i) protection of environmental equilibrium,

(ii) sustainable land management;

(iii) conservation of biological resources;

(iv) environmental pollution control; and

(v) protection of forest resources?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(i) ඔව්.

2016 අය වැයෙහි 174 යෝජනාවට අනුව පරිසර සංරක්ෂණය, මත්ද්‍රව්‍ය නිවාරණය, කෘෂිකර්මය, දරුවන් සුරැකීම යන සියලු ක්ෂේත්‍ර සඳහා රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන වෙන් කළද, මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 1,400ක් පමණක් ලබා දී ඇත. එම මුදලින් රුපියල් මිලියන 1,256ක මුදලක් වියදම් කර ඇත. **ඇමුණුම*** 01හි දක්වා ඇත.

(ii) 1. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන

2. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

3. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන

4. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන

(iii) **ඇමුණුම** 02 හි දක්වා ඇත.

(ආ) (i), (ii), (iii), (iv), (v) සඳහා පිළිතුර, ඔව්. **ඇමුණුම** 03හි දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ජාතික වශයෙන් ඉතා වැදගත්කමක් තිබෙන වැඩසටහනකට - ජාතික පරිසර වැඩසටහන- රාජ්‍ය අය වැය ලේඛනයෙන් වෙන් වෙන මුදල්වලින් කොටසක් මහා භාණ්ඩාගාරය විසින් මුදා හැරියේ නැහැයි කියලා ඒ වැඩසටහන් නතර කිරීම අපරාධයක්. එය පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. ඒ නිසා ජාතික වශයෙන් වැදගත්කමක් තිබෙන අමාත්‍යාංශවල නිලධාරි මහත්වරුන්ට, එහෙම නැත්නම් ලේකම්වරුන්ට ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා දෙන්න බැරි නම්, ඒ මුදල් වෙන් කරන්න එපා කියන තත්ත්වයට පත් වුණොත් අය වැය කළමනාකරණය අකාර්යක්ෂම වෙයි.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ විශේෂ අවධානයට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව යොමු කරන්න කැමතියි. මෙවර ඉදිරිපත් කළ 2019 අය වැය ලේඛනයෙන් පාර්ලිමේන්තුව නොමඟ යැවීම්, පාර්ලිමේන්තුවට වැරදි තොරතුරු සැපයීම් යනාදිය නිසා, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පාර්ලිමේන්තුවට වාර්තා ලබා ගන්න කියලා ඒ කාරක සභාව නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. මුදල් පිළිබඳ සම්පූර්ණ බලය පාර්ලිමේන්තුවට තමයි පැවරිලා තිබෙන්නේ. නමුත්, පාර්ලිමේන්තුවත් නොමඟ යවනවාය කියනවා නම්, පාර්ලිමේන්තුවට අසත්‍ය තොරතුරු සපයනවාය කියනවා නම්, ඒ බව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වාර්තා කරලා තිබෙනවා නම්, ඔබතුමාගේත් යුතුකමක් හා වගකීමක් වෙනවා මහ බැංකුවට කියලා ඒ වාර්තා ගෙන්වා ගැනීම. දැන් 2019 අය වැය ලේඛනය සම්පූර්ණයෙන්ම වැරදිලායි තිබෙන්නේ. එහි ප්‍රතිඵලය සමස්ත ලංකාවේම ජනතාවට බලපානවා. ඒ නිසා මේ සඳහා ඔබතුමාත් මැදිහත් වෙන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්න කැමතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම අසත්‍ය තොරතුරු තිබෙනවා නම් දැනුවත් කරන්න. එතකොට දන්වන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

කියලා තිබෙන්නේ අපෙන් නොවෙයි, ශ්‍රී ලංකා මහ බැංකුවෙන්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මට යොමු කරන්න පුළුවන්. අපට ඕනෑ සත්‍ය වාර්තාවක් නේ. ඒ ගැන මා දැනුවත් කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

අය වැය නොමඟ යැවීම් පිළිබඳ වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගන්න කියලා නිර්දේශ කරලා තිබෙනවා. 2019 අය වැයෙන් පාර්ලිමේන්තුව නොමඟ යැවීම් කරලා තිබෙනවා නම් ඒ මොනවාද කියන එක පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා ඔබතුමා ශ්‍රී ලංකා මහ බැංකුවට දැනුම් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මහ ලේකම්තුමා, ඒ අනුව අපි ක්‍රියා කරන්න ඕනෑ.

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

විශේෂයෙන්ම මේ ජාතික ආපදා අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ අපි කැඳවලා ඔබතුමා මූලාසනයේ සිටිමින් විවිධ අදහස්, යෝජනා ලබා ගැනීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. එහිදී, අපි හැමෝම මේ නතර වෙලා තිබෙන ආර්ථිකය යළි පණගැන්වීම සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කළා. ඒ අනුව, ලක්ෂ 44ක දරුවන් පාසල් යෑම පිළිබඳ කාරණයේ හොඳ ප්‍රවණතාවක් මේ වනවිට ඇති වෙලා තිබෙනවා. නමුත් අවාසනාවකට වාගේ විනිවිද පෙනෙන ආකාරයේ බෑග් - transparent bags - දරුවන්ට අවශ්‍යයි කියලා සමහර පාසල් විසින් නියම කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන ඊයේ කථා කළා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා අවශ්‍ය පියවර ගන්නවා කියලා කිව්වා. අද උදේත් මම අධ්‍යාපන ඇමතිතුමාට කථා කළා අපි ඉස්කෝලේ ගිය කාලයේ මේ විධියට බෑග් අරගෙන ගියේ නැහැ, දවසේ පොත් විතරයි අරගෙන ගියේ. අපි දවසේ පොත් විතරයි අරගෙන ගියේ. ඔක්කෝම පොත් අරගෙන ගියේ නැහැ. එහි practicality බව බලන්න කියලාත් මම කිව්වා. මේ කාරණය සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, පියවර ගන්නවා කියලාත් කිව්වා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මෙය බොර දියේ මාළු බාන්න ජාවාරම්කරුවන් විසින් හදා ගත්ත ව්‍යාපාරයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ඒක ඇත්ත.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මොකද, පසු ගිය ජනවාරි මාසයේ අලුත් බෑග් ගත්ත දරුවන් රුපියල් 3,500ක්, රුපියල් 4,000ක් වියදම් කරලා නැවතත් බෑග් ගන්න ගියොත් ඒක දරා ගන්න අමාරුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පැහැදිලි කරන්න circular එකක් එවනවාය කිව්වා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ නිසා කිසිසේත්ම දරුවන්ට එවැනි බල කිරීමක් නොකළ යුතුමයි. බෑග් අවශ්‍ය නම් රජයේ අරමුදල්වලින් හෝ අර Tabs ගන්න තිබෙන සල්ලිවලින් ඒවා අරගෙන දුන්නාට කිසිම ප්‍රශ්නයක් නැහැ.

## කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ පවුල්: විදුලිබලය සැපයීම
### கிளிநொச்சி மாவட்டத்தில் மீள்குடியேற்றப்பட்ட குடும்பங்கள்: மின்சார இணைப்பு வழங்கல்
### RESETTLED FAMILIES IN KILINOCHCHI DISTRICT: PROVISION OF ELECTRICITY

663/'18

**14. ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දැනට පවුල් 43,818ක් පමණ ජීවත් වන බවත්;

(ii) මෙම පවුල් අතරින් පවුල් 4,039කට නැවත පදිංචි කළ පසු මෙතෙක් විදුලි සම්බන්ධතා ලබා දී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම පවුල් සඳහා විදුලි සම්බන්ධතා ලබා දීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்பொழுது கிளிநொச்சி மாவட்டத்தில் கிட்டத்தட்ட 43,818 குடும்பங்கள் வசிக்கின்றன என்பதனையும்;

(ii) மீள்குடியேற்றப்பட்டதன் பின்னர் இதுவரையில் 4,039 குடும்பங்களுக்கு மின்சார இணைப்பு வழங்கப்படவில்லை என்பதனையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இக்குடும்பங்களுக்கு மின்சார இணைப்பு வழங்குவதற்கு துரிதமான நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதனையும்;

(ii) ஆமெனில், எந்த திகதியன்று இது வழங்கப்படும் என்பதனையும்;

(iii) அவ்வாறில்லையாயின், என்ன காரணங்களுக்காக என்பதனையும்

இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Enterprise Development:

(a) Is he aware that-

(i) around 43,818 families live in Kilinochchi District at present; and

(ii) 4,039 of such families have not been provided with electricity connections so far after resettlement?

(b) Will he inform the House-

(i) whether measures will be taken expeditiously to give electricity connections to these families;

(ii) if so, on which date it will be done; and

(iii) if not, for what reasons?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) මෙම අමාත්‍යාංශය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහාය ඇතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා 2016 වසරේ සිදු කරන ලද සමීක්ෂණය මගින් විදුලි සේවාව ලබා ගෙන න◌ොාමැති නිවාස ඒකක 200,000ක් පමණ පවතින බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ "රටම එළියයි - අඳුර දුරලයි" ජාතික වැඩසටහන යටතේ ඉහත නිවාස සඳහා විදුලි සේවාව ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. (ඇමුණුම 01)

ඇමුණුම 01 **සභාගත*** කරමි.

මෙම වැඩසටහන යටතේ,

* විදුලි සේවාව ලබාගෙන නොමැති සියලු නිවාස ඒකක වෙත එම නිවාස තතැදුම් කිරීමට හා විදුලි සේවා සම්බන්ධතාව ලබා ගැනීමට රුපියල්

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

40,000ක උපරිමයකට යටත්ව සහන ණයක් ලබා දෙන ලදී. සියයට 7ක වාර්ෂික පොලී අනුපාතයක් මත ගණනය කරන ලද සමාන මාසික වාරික 72කින් විදුලි පරිභෝජන ගාස්තුව සමඟ එම ණය මුදල අය කරනු ලැබේ.

* නිවසේ හෝ එහි ඉඩමේ අයිතිය පිළිබඳව සැලකිල්ලට නොගෙන, අදාළ නිවසේ අයදුම්කරුගේ පදිංචිය විදුලි සම්බන්ධතාව ලබා දීමේ නිර්ණායකය ලෙස සලකා කටයුතු කිරීමට අදාළව චක්‍රලේඛය නිකුත් කරන ලදී.

* නිවාස ඒකක තතැදුම් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන සුදුසුකම් සහිත විදුලි කාර්මික ලේඛනයේ ලියා පදිංචි වී ඇති විදුලි කාර්මිකයන්ගේ සහාය ලබාදෙන ලදී.

පැවති යුද වාතාවරණ අවසන් වීමෙන් අනතුරුව "උතුරු වසන්තය" වැඩසටහන යටතේ භාණ්ඩාගාර අරමුදල් යොදවා ගාස්තු රහිතව නිවාස සඳහා විදුලි සම්බන්ධතා ලබා දුන් අතර, කිලිනොච්චි දිස්ත්‍රික්කය ද ඇතුළුව පළාතේ පදිංචි සමහර පවුල් ඒකක ඉහත වැඩසටහන යටතේ විදුලි සම්බන්ධතා ලබා ගැනීමට කැමැත්තක් නොදැක්විය.

එයට අතිරේකව, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක නැවත පදිංචි කිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා වූ සංවර්ධන වැඩසටහන යටතේ දිසාපතිවරයා විසින් වෙන් කරන ලද අරමුදල් යොදවා 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙළින් පවුල් ඒකක 532ක් හා 427ක් සඳහා විදුලි සම්බන්ධතා ලබා දෙන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වාසය කරනු ලබන සියලු පවුල් සඳහා විදුලි ප්‍රවේශය පවතී.

(ආ) (i) විදුලි අවශ්‍යතාව ඇති පවුල් ඒකක සඳහා විදුලිය ලබා දීමට මෙම අමාත්‍යාංශය සූදානම්ව පවතී. "ගම්පෙරළිය" වැඩසටහන යටතේ සෑම දිස්ත්‍රික්කයකම විදුලි සේවා නොමැති පවුල් ඒකක අදාළ දිසාපතිවරුන් මඟින් හඳුනාගෙන එම තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් ඉල්ලා ඇත. ඇමුණුම 02 යටතේ තවදුරටත් විස්තර තිබෙනවා. ඇමුණුම 02 මම **සභාගත*** කරනවා.

ඉහත තොරතුරු කිලිනොච්චිය දිස්ත්‍රික්කය වෙතින් මෙම අමාත්‍යාංශය වෙත මෙතෙක් ලැබී නොමැත.

(ii) කිලිනොච්චි දිසාපතිවරයා වෙතින් ඉහත තොරතුරු ලැබුණු වහාම, 2016 වසරේ ක්‍රියාත්මක කළ වැඩසටහනට -(අ) (ii) පිළිතුරෙහි සඳහන් ලෙස- සමාන වූ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මඟින් විදුලිය නොමැති නිවාස සඳහා විදුලිය ලබා දීමට කටයුතු කරනු ඇත.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, மீள்குடியேற்றப் பட்டவர்கள் பெரும்பாலும் பொருளாதார ரீதியாக வறுமைக் கோட்டுக்கு உட்பட்டவர்கள். கடந்த காலத்தில் மீள்குடி யேற்றப்பட்டபோது பலருக்கு இலவசமாக மின்சார இணைப்பு வழங்கப்பட்டது. அவ்வாறான ஒரு திட்டத்தை ஏன் தொடரமுடியாது? என்ற ஒரு கேள்வியை நான் முன்வைக்க விரும்புகின்றேன்.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එහෙම කරන්න බැරිකමක් නැහැ. මේ පිළිතුරෙත් ඒ පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. "ගම්පෙරළිය" වැඩසටහන යටතේත් විදුලිය නැති නිවාසවලට විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Then, your second Supplementary Question, please.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நன்றி. ஏற்கெனவே சொல்லப்பட்ட பதிலில் புள்ளிவிபரங்களில் குறைபாடுகள் இருப்பதாக நினைக்கின்றேன். 4,039 குடும்பங்களுக்கு மின்சார இணைப்புத் தேவையென்பது அந்த மாவட்டத்தின் அரசாங்க அதிபருடைய அறிக்கையிலிருந்து தெரிய வந்திருக்கின்றது. ஆனபடியால், தயவுசெய்து அதனைக் கருத்திலெடுத்து, கௌரவ அமைச்சரிடம் தெரிவித்து, விரைவாக அதனைச் செய்யுமாறு கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කිලිනොච්චිය දිසාපතිවරයාගෙන් තොරතුරු ලැබුණු වහාම, එය ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 15 -695/'19- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවැනි වටය.

ප්‍රශ්න අංක 6- 334/'18(2), ගරු ඉෂාක් රහුමාන් මහතා. ආණ්ඩු පක්ෂයෙන් ඉෂාක් රහුමාන් මහතාගේ ප්‍රශ්නය අහනවාද?

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් : විස්තර
## வீதி விஸ்தரிப்புக்கள் மற்றும் மேம்படுத்தல்கள்: விபரம்
## EXPANSION AND IMPROVEMENT OF ROADS : DETAILS

440/'19

**8. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු ජයන්ත සමරවීර මහතා මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Jayantha Samaraweera)

මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2015.12.31 දිනට අවසන් කිරීමට නියමිතව තිබූ මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති පිහිටි දිස්ත්‍රික්කය, ව්‍යාපෘතියේ නම හා ඇස්තමේන්තු මුදල කොපමණද;

(iii) 2016.12.31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති පිහිටි දිස්ත්‍රික්කය, ව්‍යාපෘතියේ නම හා ඇස්තමේන්තු මුදල කොපමණද;

(iv) 2017.12.31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති පිහිටි දිස්ත්‍රික්කය, ව්‍යාපෘතියේ නම හා ඇස්තමේන්තු මුදල කොපමණද;

(v) සමස්ත ප්‍රගතිය ශුන්‍ය වූ කොන්ත්‍රාත් සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත ප්‍රගතිය ශුන්‍ය වීමට හේතු වූ කරුණු කවරේද;

(vii) ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி மற்றும் பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபையினால் 2015.1 2.3 1 ஆம் திகதியில் முடிவுறுத்தப்படுவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள வீதி விஸ்தரிப்புக்கள் மற்றும் மேம்படுத்தல்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இக்கருத்திட்டங்கள் அமைந்துள்ள மாவட்டம், கருத்திட்டத்தின் பெயர் மற்றும் மதிப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) 2016.12.31 ஆம் திகதியில் முடிவுறுத்தப்படுவதற்கு உத்தேசிக்கப்பட்டிருந்த கருத்திட்டங்கள் அமைந்திருந்த மாவட்டம், கருத்திட்டத்தின் பெயர் மற்றும் மதிப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(iv) 2017.12.31 ஆம் திகதியில் முடிவுறுத்தப்படுவதற்கு உத்தேசிக்கப்பட்டிருந்த கருத்திட்டங்கள் அமைந்திருந்த மாவட்டம், கருத்திட்டத்தின் பெயர் மற்றும் மதிப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(v) ஒட்டுமொத்தமான முன்னேற்றம் சூனியமாக அமைந்த ஒப்பந்தங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(vi) ஒட்டுமொத்த முன்னேற்றமானது சூனியமாக அமைவதற்குக் காரணமான விடயங்கள் யாவை என்பதையும்;

(vii) அது தொடர்பாக அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Road Development and Petroleum Resources Development:

(a) Will he inform this House-

(i) the number of road expansions and improvements to be completed as at 31.12.2015 by the Road Development Authority;

(ii) the district wherein the said projects were located, the name of the project and the estimated amount;

(iii) the district wherein the projects to be completed as at 31.12.2016 were located, the name of the project and the estimated amount;

(iv) the district wherein the projects to be completed as at 31.12.2017 were located, the name of the project and the estimated amount;

(v) the number of contracts of which the overall progress became zero;

(vi) the reasons for overall progress becoming zero; and

(vii) the measures to be taken in that regard by the Ministry?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ව්‍යාපෘති 432කි.

(ii) ඇමුණුම 1** මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඇමුණුම 2** මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) ඇමුණුම 3** මඟින් ඉදිරිපත් කර ඇත.

(v) 2015 - ව්‍යාපෘති 80

2016 - ව්‍යාපෘති 112 (මින් ව්‍යාපෘති 4ක් අවලංගු කර ඇත.)

2017 - ව්‍යාපෘති 181 (මින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග ව්‍යාපෘති 114ක් අවලංගු කර ඇත.

(vi) ක්‍රියාකාරී සැලැස්මේ යෝජනාවලට අතිරේකව වර්ෂය ඇතුළතදී කාලගුණික තත්ත්වයන් හේතුවෙන් (due to flood damage) ඇති වූ මහජන ඉල්ලීම් සහ නව යෝජනා සඳහා ප්‍රමුඛතා ලබා දීම සිදුවිය. එම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් යෝජනා අදාළ වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

(vii) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාව ලබා දී ඉදිරි වර්ෂයේදී ප්‍රතිපාදන තුළින් මෙම ව්‍යාපෘති සම්පූර්ණ කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

## අ/බමුණුගම මුස්ලිම් මහා විද්‍යාලය : නව ගොඩනැඟිල්ලක් ලබා දීම

### அ/பமுனுகம முஸ்லிம் மகா வித்தியாலயம்: புதிய கட்டிடமொன்றைப் பெற்றுக்கொடுத்தல்

### A/ BAMUNUGAMA MUSLIM MAHA VIDYALAYA: PROVISION OF NEW BUILDING

475/'19

**9. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු ඒ.එල්.එම්. නසීර් මහතා වෙනුවට)**

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு ஏ.எல்.எம். நசீர் சார்பாக)

(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. A.L.M. Nazeer)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, ඌත්තුපිටිය, මුරියාකඩවල ලිපිනයේ පිහිටි අ/බමුණුගම මුස්ලිම් මහා විද්‍යාලය, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට අයත් බව දන්නේද;

(ii) අ.පො.ස. උසස් පෙළ දක්වා පන්ති පැවැත්වෙන එම පාසලේ ඉඩකඩ සම්බන්ධයෙන් පවතින ගැටලුව විසඳීම සඳහා 2017 හෝ 2018 වර්ෂවලදී හෝ පන්ති කාමර සහිත පාසල් ගොඩනැඟිලි ලබා නොදීමට හේතුව කවරේද;

(iii) එම පාසලට නව පාසල් ගොඩනැඟිල්ලක් නොපමාව ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தின் ஊத்துப்பிட்டி, முரியாகடவல எனும் முகவரியில் அமைந்துள்ள அ/பமுனுகம முஸ்லிம் மகா வித்தியாலயமானது "அண்மித்த பாடசாலை சிறந்த பாடசாலை" எனும் கருத்திட்டத்தில் உள்வாங்கப்பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) க.பொ.த.(உயர்தரம்) வரையிலான வகுப்புக்கள் நடத்தப்படுகின்ற மேற்படி பாடசாலையில் இடவசதிகள் தொடர்பாக காணப்படுகின்ற பிரச்சினையைத் தீர்ப்பதற்காக 2017 அல்லது 2018 ஆம் ஆண்டுகளில் வகுப்பறைகளுடன் கூடிய பாடசாலைக் கட்டிடங்கள் வழங்கப் படாமைக்கான காரணம் யாதென்பதையும்;

(iii) மேற்படி பாடசாலைக்கு புதிய பாடசாலைக் கட்டிடமொன்றை துரிதமாகப் பெற்றுத் தருவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) whether he is aware that A/Bamunugama Muslim Maha Vidyalaya of Uththupitiya, Muriyakadawala of Anuradhapura District has been included in the project "Nearest School is the Best School";

(ii) the reasons for not providing school buildings with class rooms in 2017 or 2018, as a remedy for the space issue that is prevalent in aforesaid school, in which the classes are held up to G.C.E. Advanced Level; and

(iii) whether action will be taken to provide a new school building for aforesaid school without delay?

(b) If not why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්. "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියේ "බී" ව්‍යාපෘතියට අයත්ව ඇත.

(ii) අ/බමුණුගම මුස්ලිම් විද්‍යාලයේ පවතින ගොඩනැඟිලිවල ප්‍රමාණයන් හා ඒ තුළ පවත්වා ගෙන යන පන්ති කාමරවල

***** පුස්තකාලයේ තබා ඇත.***

*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

*** Placed in the Library.*

සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ වාර්තාව ඇමුණුම 01හිදක්වා ඇත.

ඒ අනුව දැනට පවතින පන්ති සඳහා තිබෙන ඉඩකඩ ප්‍රමාණවත් වන අතර, 2 ශ්‍රේණිය සඳහා පමණක් පන්ති කාමරයක අවශ්‍යතාව පවතී. පන්ති පැවැත්වීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවන බවට බමුණුගම මුස්ලිම් මහා විද්‍යාලයේ විදුහල්පති විසින් මෙතෙක් වාර්තා කර නැත.

(iii) 2019-2023 කලාප ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මෙහි 2019 වර්ෂය සඳහා අඩි 60x20 පන්ති කාමර ගොඩනැගිල්ලක් මෙම පාසලට ලබා දීමට යෝජිතව ඇත.

(ආ) අදාළ නොවේ.

**ඇමුණුම 01**

| ශ්‍රේණිය | සමාන්තර පන්ති ගණන | ලේඛන ගත ශිෂ්‍ය සංඛ්‍යාව | පාසලේ ගොඩනැගිලි ඉඩ පන්ති අනුව වෙන් කර ඇති ආකාරය |
|---|---|---|---|
| 1 | 2 | 40 | අඩි 20x20 පන්ති කාමර 2ක පවත්වයි |
| 2 | 1 | 32 | පාසල් භූමිය තුළ පිහිටි පල්ලිය තුළ පවත්වයි |
| 3 | 2 | 42 | අඩි 20x20 පන්ති කාමර 2ක පවත්වයි |
| 4 | 2 | 45 | අඩි 20x20 පන්ති කාමර 2ක පවත්වයි |
| 5 | 1 | 30 | අඩි 20x20 පන්ති කාමර 1ක පවත්වයි |
| 6 | 2 | 47 | අඩි 20x20 පන්ති කාමර 2ක පවත්වයි |
| 7 | 1 | 36 | අඩි 20x20 පන්ති කාමර 1ක පවත්වයි |
| 8 | 1 | 25 | අඩි 80x20 ප්‍රධාන ශාලාවේ වේදිකාව මත පවත්වයි. |
| 9 | 1 | 33 | අඩි 80x20 ප්‍රධාන ශාලාවේ - විවෘත |
| 10 | 2 | 42 | අඩි 20x30 පන්ති කාමර 1ක පවත්වයි |
| 11 | 1 | 30 | අඩි 20x20 පන්ති කාමර 1ක පවත්වයි |
| 12 | 1 | 13 | අඩි 80x20 ප්‍රධාන ශාලාවේ - විවෘත |
| 13 | 1 | 7 | අඩි 80x20 ප්‍රධාන ශාලාවේ - විවෘත |

## මහනුවර දිස්ත්‍රික්කයේ ඇති සතිපොළ : විස්තර
## கண்டி மாவட்டத்திலுள்ள வாராந்தச் சந்தைகள்: விபரம்
## WEEKLY FAIRS IN KANDY DISTRICT: DETAILS

494/'19

**10. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු ආනන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு ஆனந்த அலுத்கமகே சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Ananda Aluthgamage)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති සතිපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම සතිපොළවල නම් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සංවර්ධනය කරන ලද සතිපොළ සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(v) සෙසු සතිපොළ සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில் அமைந்துள்ள வாராந்தச் சந்தைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவ்வாராந்த சந்தைகளின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த திகதி தொடக்கம் மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சுக்கான ஒதுக்கீடுகளைப் பயன்படுத்தி அபிவிருத்தி செய்யப்பட்ட வாராந்தச் சந்தைகளின் எண்ணிக்கை எத்தனையென் பதையும்;

(iv) அதற்காக செலவிடப்பட்ட தொகை எவ்வள வென்பதையும்;

(v) ஏனைய வாராந்தச் சந்தைகளை அபிவிருத்தி செய்வதற்காக அமைச்சினால் மேற்கொள்ளப் படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the number of weekly fairs in the Kandy District;

(ii) the names of those weekly fairs;

(iii) the number of weekly fairs that have been developed under the funds of the Ministry of Provincial Councils and Local Government after the Good Governance Government came into power;

(iv) the amount that has been spent on those development activities; and

(v) the steps that will be taken by the Ministry to develop the other weekly fairs?

(b) If not, why ?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ සතිපොළ සංඛ්‍යාව 37කි.

(ii) ඒවායෙහි නම් ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) යහ පාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව මහනුවර දිස්ත්‍රික්කයේ සතිපොළවල් 04ක් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අරමුදල් යොදවා සංවර්ධනය කර ඇත.

(iv) රුපියල් 4,425,000.00කි.

(v) ප්‍රමුඛතාවය හා අත්‍යවශ්‍ය බව අනුව ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා පවතින ප්‍රතිපාදන තත්ත්වය මත ක්‍රියාත්මක කිරීම පිළිබඳව සලකා බැලිය හැකිය.

(ආ) අදාළ නැත.

ඇමුණුම 01

මහනුවර දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යනු ලබන සතිපොළවල් පිළිබඳ විස්තර.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | සතිපොළේ නම |
|---|---|---|
| 01 | ගම්පොළ නගර සභාව | නිදහස් මාවත සතිපොළ |
| 02 | කඩුගන්නාව නගර සභාව | කඩුගන්නාව සතිපොළ |
| 03 | | පිළිමතලාව සතිපොළ |
| 04 | තුම්පනේ ප්‍රාදේශීය සභාව | හතරලියද්ද සතිපොළ |
| 05 | උඩුදුම්බර ප්‍රාදේශීය සභාව | හුන්නස්ගිරිය සතිපොළ |
| 06 | පන්විල ප්‍රාදේශීය සභාව | හුළුගඟ සතිපොළ |
| 07 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කුරුඳුවත්ත සතිපොළ |
| 08 | | ඇත්ගාල සතිපොළ |
| 09 | පූජාපිටිය ප්‍රාදේශීය සභාව | පූජාපිටිය නගරයේ සතිපොළ |
| 10 | | අංකුඹුර සතිපොළ |
| 11 | | බොක්කාවල නගරයේ සතිපොළ |
| 12 | පාතදුම්බර ප්‍රාදේශීය සභාව | සමුද්ධි සතිපොළ |
| 13 | | මීගම්මන බටහිර සමුද්ධි සතිපොළ |
| 14 | | අළුත්ගම සමුද්ධි සතිපොළ |
| 15 | | මීගම්මන සමුද්ධි සතිපොළ |
| 16 | | කහල්ල සමුද්ධි සතිපොළ |
| 17 | | හාමින්දාගොඩ සමුද්ධි සතිපොළ |
| 18 | | අඹසිංගම සමුද්ධි සතිපොළ |
| 19 | | පොල්ගොල්ල සමුද්ධි සතිපොළ |
| 20 | | ගිරාකඩුව සමුද්ධි සතිපොළ |
| 21 | | ගලදෙණිය සමුද්ධි සතිපොළ |
| 22 | | මූණමලේ සමුද්ධි සතිපොළ |
| 23 | | මණ්දණ්ඩාවෙල සමුද්ධි සතිපොළ |
| 24 | | උඩුරාවණ සමුද්ධි සතිපොළ |
| 25 | හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව | ගොහාගොඩ සතිපොළ |
| 26 | මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව | පේරාදෙණිය සතිපොළ |
| 27 | මැදදුම්බර ප්‍රාදේශීය සභාව | මැද මහනුවර සතිපොළ |
| 28 | | උඩිස්පත්තුව සතිපොළ |
| 29 | නාවලපිටිය නගර සභාව | නාවලපිටිය නගර සභා ඉරිදා සතිපොළ |
| 30 | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව | රජරුප අසල සතිපොළ |
| 31 | අකුරණ ප්‍රාදේශීය සභාව | අකුරණ සතිපොළ |
| 32 | යටිනුවර ප්‍රාදේශීය සභාව | දන්තුරේ සතිපොළ |
| 33 | මහනුවර නගර සභාව | මහනුවර නාගරික සතිපොළ |
| 34 | මිණිපේ ප්‍රාදේශීය සභාව | හසලක සතිපොළ |
| 35 | | කොළොංගොඩ සතිපොළ |
| 36 | | අඹගහපැළැස්ස සතිපොළ |
| 37 | | උඩවෙල සතිපොළ |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 553/'19-(1), ගරු එස්. ශ්‍රීතරන් මහතා.

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)
Sir, on behalf of the Hon. S. Shritharan, I ask that Question.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 - 695/'19-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස හයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 8 of the Parliament, the hours of Sitting of Parliament on this day shall be 10.30 a.m. to 7.30 p.m. At 4.00 p.m. Standing Order 8(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඊයේ ඔබතුමා මේ සභාවට දැනුම් දුන්නා, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට විරුද්ධව තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳව විවාද කිරීම සඳහා දින නියම කරලා අපට දැනුම් දෙනවාය කියලා. දැන් අපට ආරංචිවෙලා තිබෙනවා,

විවාදය සඳහා දින නියම කළාය කියලා. මේ සම්බන්ධයෙන් නිවේදන යටතේ ඔබතුමාගෙන් මේ සභාවට දැනුම් දීමක් විය යුතුයි කියා මා විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, ඒ යෝජනාව ලැබුණු හැටියේම වහාම ක්‍රියාත්මකවෙලා අපි ඒ යෝජනාව පිළිගත්තා. ඊට පස්සේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළා. ඊට පස්සේ අවශ්‍ය විධියට මහ ලේකම්වරයා විසින් නීත්‍යානුකූලව කටයුතු කරලා අපි පක්ෂ නායකයින්ගේ රැස්වීමක් කැඳෙව්වා. මගේ ඉල්ලීම වුණේ, මේ සම්බන්ධයෙන් විවාදය සඳහා ඉතා ඉක්මනින් දිනයක් දෙන්න කියලායි. ඒ අනුව ඊයේ ගරු අගමැතිතුමාත්, විපක්ෂ නායකතුමාත් සමඟත් සාකච්ඡා කළා. මා මුල ඉඳලාම සිටියේ, "මෙය විවාදයට ලක් කළ යුතුයි, හැකිතාක් ඉක්මනින් විවාදයට ගත යුතුයි" කියන මතයේයි. එය ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක්. මෙම අවස්ථාවේ දී ගරු අගමැතිතුමාත් මේ සභාවේ ඉන්නවා. අගමැතිතුමාත් කිව්වා, ඉක්මනින් දිනයක් දෙන්න කියලා. අද දින පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගත්තා, ජුනි මාසයේ දිනයක් දෙන්න. ගරු අගමැතිතුමා මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs.)

ගරු කථානායකතුමනි, මා ඉල්ලීම් දෙකක් කරලා තිබෙනවා. එක ඉල්ලීමක් තමයි, රිසාඩ් බදියුදීන් ඇමතිතුමා ගැන සති දෙකක් යන්න ඉස්සෙල්ලා අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. ඊයේ මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, පක්ෂ නායකයින් සමඟ සාකච්ඡා කරලා දිනයක් නියම කරන්නය කියලා. ඒක Committee on Parliamentary Business එකේ වැඩ කටයුත්තක්. ඒ අය එක්ක කථා කරලා ඔබතුමා තීරණයක් ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඉස්සෙල්ලා එක් දිනයයි දෙන්න හැදුවේ. ඊට පස්සේ අපේ ඉල්ලීම අනුව දින දෙකක් දෙන්න සභානායකතුමා එකඟ වුණා. සභානායකතුමනි, දිනය පිළිබඳව ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ජුනි 18 දින සහ ජුනි 19 දින විවාදයට අපි සූදානම්. We are ready for the debate on the 18th and 19th of June.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. [බාධා කිරීමක්] අපි අද දින මේ පිළිබඳව සාකච්ඡා කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා වාගේ මේ විශ්වාස භංග යෝජනාව ප්‍රමුඛත්වය දීලා ඉක්මනින් සාකච්ඡා කළ යුතු වැදගත් කාරණයක්. එම කාරණය ඔබතුමා අද උදේත්, දැනුත් ප්‍රකාශ කළා. මීට පස්සේ එන පළමුවන පාර්ලිමේන්තු සතිය වන්නේ ජුනි 04 වන දිනෙන් පටන් ගන්නා පාර්ලිමේන්තු සතියයි. ජුනි 04 වන දා පටන් ගන්නා පාර්ලිමේන්තු සතියේ 06 සහ 07 කියන දවස් දෙකේ න්‍යාය පත්‍රයේ සඳහන් ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන අණ පනත් සියල්ල 04 වන දා සාකච්ඡා කරලා සම්මත කර ගනිමු, 06 සහ 07 යන දවස් දෙක මේ විවාදය සඳහා දෙන්නය කියලා මමත්, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාත් ඇතුළුව අපි සියලුදෙනාම යෝජනා කළා. ආණ්ඩු පක්ෂය ඉතා තදින් සිටියා, "පළමුවන සතිය දෙන්න බැහැ. අපි දෙන්නේ 18 සහ 19 යන දින දෙක කියලා. ඒ නිසා අවසාන තීරණයක් නැතුව තමයි අද දිනයේත් පක්ෂ නායක රැස්වීම අවසන් වුණේ. අපි දැනුත් ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙයයි. අගමැතිතුමාත් කියනවා, දිනය තීරණය කරන්න ඔබතුමාට බලය තිබෙනවාය කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ. එතුමා කිව්වේ, අගමැතිතුමාත්, සභානායකතුමාත් අද උදේ සාකච්ඡා කරලා තමයි 18 සහ 19 දින ගත්තේ කියන එකයි. ඒක මගේ ඇඟ උඩට දමන්න එපා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

අපි කියන්නේ මේක තවත් කල් දමන්න එපා කියලායි, මේක ජුනි මාසයේ අගට කල් දමන්න එපා කියලායි. ඒ නිසා කරුණාකරලා මේක -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මගේ නම සඳහන් කළ නිසා යමක් කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, මම කිව්වේ සම්ප්‍රදාය හැටියට Committee on Parliamentary Business එකේදී සාකච්ඡා කරලා තමයි ඔබතුමා තීරණය කරන්නේ කියන එකයි. මේ සතියේත් තීරණය කළේ, Committee on Parliamentary Business එකත් එක්ක කථා කරලායි. ගිය සතියේ කළේත් ඒකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා, ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡා කරලා අද උදේ මට කිව්වා, ඒ දවස්වලදී තවත් පනත් කෙටුම්පත් වගයක්

[ගරු කථානායකතුමා]

ගෙනෙන්න තිබෙනවා, ඊට අමතරව අධිකරණ ඇමතිතුමියගේ කටයුතු කිහිපයක් තිබෙනවා, ඒ නිසා මෙය විවාදයට ගැනීම අනිවාර්යයෙන්ම ජූලි මාසයට යොදා ගනිමු කියලා. මම කිව්වා ජූලි මාසය වෙනකම් ඉන්න බැහැ කියලා. ඒ නිසා අපි අවසානයේ දී ජුනි 18 සහ 19 කියන දින දෙක යොදා ගත්තා. එම දින දෙක තමයි අවසානයේ යොදා ගත්තේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කොච්චර කිව්වත් එම දිනය වෙනස් කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ජුනි 18 සහ 19 කියන දින දෙක යොදා ගෙන තිබෙනවා, ඒක පිළිගන්න. [බාධා කිරීම්] 18 සහ 19 කියන දින දෙක පිළිගන්න. එතැනින් එහාට යන්න බැහැ. [බාධා කිරීම්] මේ කියන්නේ අවසාන තීරණය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, විනාඩියක් දෙන්නම්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධ විවාදය ජුනි 18 සහ 19 දින දෙකට යොදා ගන්නවා කියන්නේ, තවදුරටත් මේ විවාදය කල් දැමීමක්. ඒ වාගේම දැන් අගමැතිතුමාගෙන් කියැවුණා, සති දෙකක් ඇතුළත තේරීම් කාරක සභාවෙන් රිසාඩ් බදියුදීන් ඇමතිතුමා ගැන මොකක්ද අතුරු වාර්තාවක් ඉල්ලනවාය කියලා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ දෙක වෙනස්. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ, අතුරු වාර්තාවෙන් ශුද්ධ පවිත්‍ර කරලා අරගෙන තමයි මේ අත ඔසවාගන්න පොට පාදා ගන්න යන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ වංචාවට අපි එකඟ නැහැ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, ජුනි 6 සහ 7 කියන දවස් දෙක මේ විවාදයට දෙන්න කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාට කරුණු පැහැදිලි කළා. මම මේ සභාවේ ඉන්නම්. මොනවා හෝ සම්බන්ධව පැහැදිලි කරගැනීමක් ඔබතුමාට අවශ්‍ය නම් මම පැහැදිලි කරන්නම්. නමුත් විපක්ෂ නායකතුමාත් නැති තැන වෙන මොනවාද කියන්නේ? මේක විපක්ෂනායකතුමාත්, සභානායකතුමාත්, ඔබතුමාත් කථා කරන්න ඕනෑ දෙයක්. වෙන අය මේ ගැන කථා කරනවා. ඉතින් මමත් වාඩි වෙලා - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ දවස පුරාම මම සැම - [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එහෙම නම් මම කියනවා, පිටුපස සිටින [බාධා කිරීම්] මන්ත්‍රීතුමාට තීරණය කරන්න කියලා. මම මොනවා කියන්නද? [බාධා කිරීම්] සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාට - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. වාඩිවෙන්න. Order, please! ඊයේ දවස පුරාම මම ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පැය ගණන් කථා කරන්න අවස්ථාව දුන්නා. දැන් මේ ගැන අවසාන තීරණයක් ගෙන තිබෙනවා. මේ සභාවේ සිටින මහජන නියෝජිතයින් අපට යුතුකමක් තිබෙනවා, මේ වැඩ කටයුතු කරගෙන යන්න. ජුනි 18 සහ 19 යන දින දෙකේ දී එම විවාදය පවත්වන්න ඕනෑ. ජූලි වෙනකම් කල් දෙන්න බැහැ. ජුනි මාසයේ එය අවසන් කරන්න ඕනෑ. ඒ වාගේම අනෙක් කරුණු දෙක වෙනයි. තේරීම් කාරක සභාව වෙනයි, විශ්වාස භංග යෝජනාව -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව දින නියම කරන්නේ ආණ්ඩුව. විපක්ෂයට දින නියම කරන්න බැහැ. අපියි, ආණ්ඩුව. [බාධා කිරීම්] ඒක තේරුම් ගන්න ඕනෑ. අපියි, ආණ්ඩුව. දින නියම කරන්නේ අපි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන කථා කරලා ඉවරයි. [බාධා කිරීම්]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගේ ප්‍රකාශය අනුව අපට තේරුණේ, මේ තේරීම් කාරක සභාවේ ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා සම්බන්ධ කාරණය පිළිබඳව විභාග කරනවා කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, කරුණු දෙකක්.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අපි ඔබතුමාට කියන්න කැමැතියි, අපි මතු කරලා තිබෙන කරුණු එහි සාකච්ඡා කරන්න අපි එන්නේ නැහැ කියන එක. ඒ නිසා එම කරුණු ජූනි 18, 19 පැවැත්වෙන විවාදයේ දී අපි සාකච්ඡා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සහභාගි වෙන්නේ නැහැ?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත වැඩකටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 9 දක්වා අනුමත කිරීමට.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මෙතැන තව කාරණයක් තිබෙනවා. විශ්වාසභංගයකට දිනය දෙන්නේ ආණ්ඩුවයි. ආණ්ඩුව දිනය දෙන්නම්. හැබැයි, "අර්ස්කින් මේ" ගේ පාර්ලිමේන්තු සම්ප්‍රදායේ නම් තිබෙන්නේ,ඇමතිවරයකුට විරුද්ධව තිබෙන විශ්වාසභංගයට කලින්, ආණ්ඩුවට විරුද්ධව තිබෙන විශ්වාසභංගයට ප්‍රමුඛත්වය දෙන්න ඕනෑය කියන එකයි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We are proceeding. ගරු මංගල සමරවීර ඇමතිතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පළමුවැනි කාරණය තමයි, මේ තේරීම් කාරක සභාවත්, විශ්වාසභංග යෝජනාවත් කිසිසේත්ම පටලවා ගත යුතු නැහැය කියන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අද උදේ ඒක තීරණය කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නම්, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් ඉන්න.

තේරීම් කාරක සභාවේ කාර්ය භාරය වෙනස් එකක්. විශ්වාසභංගවල කාර්ය භාරය වෙනස් එකක්. රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධ විශ්වාසභංග යෝජනාව පළමුකොට ඉදිරිපත් කර තිබෙනවා. දෙවනුව තමයි, ආණ්ඩුවට විරුද්ධව විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේදීත්, පක්ෂ නායක රැස්වීම්වලදීත් දිගටම ඉල්ලමින් තිබෙන්නේ, රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට එරෙහිව ඉදිරිපත් කර තිබෙන විශ්වාසභංග යෝජනාව කලින් විවාදයට ගන්න කියායි. එයයි ප්‍රමුඛ කාරණය වන්නේ. ඊට පසුව තමයි ආණ්ඩුවට විරුද්ධ විශ්වාසභංග යෝජනාව විවාදයට ගත යුත්තේ. ගරු කථානායකතුමනි, එසේ නැතිව අග්‍රාමාත්‍යතුමාගේ ඔළුවේ තිබෙන වෙන වෙන හිතලුවලට අනුව යමින් තම තමන්ට ඕනෑ විධියට වැඩ කරන්නට බැහැ. පළමුව ඉදිරිපත් කර තිබෙන්නේ රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධ විශ්වාසභංග යෝජනාවයි. එයින් පසුව තමයි ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් වී ඇති විශ්වාසභංග යෝජනාව විවාදයට ගත යුත්තේ. එම නිසා තමයි, ආණ්ඩුවට විරුද්ධ විශ්වාසභංග යෝජනාව විවාදය සඳහා අපි තවම දින නියමයක් ඉල්ලන්නේ නැත්තේ. රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන විශ්වාසභංග යෝජනාවට දින නියම වුණාට පසුව තමයි අපි ආණ්ඩුවට විරුද්ධ විශ්වාසභංග යෝජනාවට දින නියමයක් ඉල්ලන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මුදල් ඇමතිතුමා.

## විදේශ විනිමය පනත : නියෝගය
## வெளிநாட்டுச் செலாவணிச் சட்டம் : ஒழுங்குவிதி
## FOREIGN EXCHANGE ACT: REGULATION

[11.28 a.m.]

**ගරු මංගල සමරවීර මහතා (මුදල් අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance)
Hon. Speaker, I move,

"That the Regulation made by the Minister of Finance under Section 29 read with Section 7 of the Foreign Exchange Act, No. 12 of 2017 relating to International Sovereign Bonds and published in the Gazette Extraordinary No. 2112/17 of 27th February 2019, which was presented on 04.04.2019, be approved.

(Cabinet approval signified.)"

ගරු කථානායකතුමනි, විදේශ විනිමය පනත යටතේ, අංක 2112/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය සහ විසර්ජන පනත යටතේ යෝජනා සම්බන්ධයෙන් වූ මෙම විවාදය ආරම්භ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා.

අපේ මුළු රටම ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ විශාල ප්‍රහාරයකට මුහුණ දී, අතිශයින්ම අමිහිරි ඛේදවාචකයකින් අහිංසක සිවිල් වැසියන් ගණනාවක් නිරපරාදේ ඝාතනයට ලක් වෙලා මාසයක් සම්පූර්ණ වෙන වෙලාවක් මේ. එදා ඒ ඛේදවාචකය සිදු වුණු වෙලාවේ ඇති වුණු ශෝකය තවමත් අපි සියලුදෙනාගේම සිත් තුළ පවතිනවා. කෙසේ නමුත්, මුදල් ඇමතිවරයා ලෙස මෙහිදී මගේ වගකීම වන්නේ රට තුළ කලකෝලාහල ඇවිළීම නොවෙයි. යම් කැළඹීමක් ඇත්නම්, රටේ පූර්ණ ආර්ථික ස්ථාවරත්වය, දේශපාලන සංහිඳියාව නැවත ශක්තිමත් කිරීමේ දිගු කාලීන ජාතික අවශ්‍යතාවට ප්‍රමුඛතාව දීමයි අපගේ යුතුකම වන්නේ. වග කිවයුතු රජයක් විධියට, ඒ සඳහා අවශ්‍ය සියලුම පියවර මේ වන විට අපි අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, වර්ෂ ගණනාවක යුද්ධයෙන් පස්සේ මේ රටට නැවත වතාවක් සාමය සමගිය උදා වුණා. රටේ ආර්ථික ස්ථාවරත්වය ඇති වුණේ 2015 ජනවාරි මාසයෙන් පසුව බව ඔබතුමා දන්නවා. අප රට ශීලාචාර, නීතියට ගරු කරන ප්‍රජාතන්ත්‍රවාදී රටක් විධියට ජාත්‍යන්තර ප්‍රජාව තුළ ඉමහත් වූ පිළිගැනීමකට ලක් වුණේ මෙම කෙටි කාලය තුළදීයි කියන එක අපි මතක් කරන්නට ඕනෑ. මේ නිසාම අපිට ආර්ථික ස්ථාවරත්වය ඇති කර ගන්නට පුළුවන් වුණා. දේශපාලන ස්ථාවරත්වය ඇති කර ගන්නට පුළුවන් වුණා. ඒ තුළින් යළිත් වතාවක් මේ රට විධිමත්, ක්‍රමවත් සංවර්ධ මාවතකට යොමු වෙලායි තිබුණේ. නමුත් අවාසනාවකට වාගේ, මෑත කාලීනව රටේ සංවර්ධනයට ප්‍රධාන බාධා දෙකක් ඇති වුණා. එක පැත්තකින්, ස්වභාව ධර්මයෙන්ම බාධා දෙකක් ඇති කළා. 2016-2107 වර්ෂ තුළ මහා නියඟයක් හා ගංවතුරක් ඇති වුණා.

නමුත් අපිම නිර්මාණය කළ අනික් බාධාව තමයි, පසුගිය ඔක්තෝබර් 26වන දා ඇති කළ ව්‍යවස්ථා කුමන්ත්‍රණය. තමුන්නාන්සේලාට හොඳට මතකයි, ඒ වාගේම තමුන්නාන්සේලා හොඳින් දන්නවා, දින 51ක් පුරා රට අස්ථාවර කරමින් නීති විරෝධී ආණ්ඩුවක් පත්කර රටේ ආර්ථිකයට මරු පහරක් එල්ල කළ වෙලාවක අපේ අධිකරණය ඉතාම ස්වාධීන තීරණ ලබා දුන් බව. ඒ වාගේම අපේ ව්‍යවස්ථාදායකය වූ මේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා වන ඔබතුමා ඉතාම ස්වාධීන, එඩිතර තීරණ ලබා දීම තුළින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය යළිත් වතාවක් විශාල වශයෙන් ශක්තිමත් වුණා. ඒ බව අද මුළුමහත් ලෝකයම පිළිගන්නවා.

ඔක්තෝබර් කුමන්ත්‍රණය කාලයේ අපේ රටේ ආර්ථිකයට මරු පහරක් වැදුණා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, අප්‍රේල් 21වන දා ප්‍රහාරයෙන් එල්ල වුණු ඒ මරු පහරට සමාන හෝ ඊටත් වඩා භයානක මරු පහරක් ඒකෙන් අපට එල්ල වුණා. ඒ දින පණස්එකේ ආණ්ඩුව පිහිටවපු වෙලාවේ, රට අස්ථාවර තත්ත්වයකට පත්වෙලා, සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා, රටේ ප්‍රධාන ආදායම් මාර්ග ඇහිරෙමින් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල ලංකාවේ ආයෝජන විභවතාව ඉතා පහළ තත්ත්වයකට වැටුණා. IMF එක ලංකාව සමඟ තිබුණු ගිවිසුම් අවලංගු කළා. ඒ වාගේම අපට ලැබෙන්න තිබුණු ආධාර සහ තවත් දේවල් විශාල වශයෙන් අපට අහිමි වුණා. නමුත්, අපි ඒ හැම දෙයක්ම යළිත් වතාවක් ලබාගෙන ජයග්‍රාහී මාවතකට යොමු වෙලා තිබුණු මොහොතක තමයි, අප්‍රේල් 21වන දින -පාස්කු ඉරිදා- එල්ල වූ බෝම්බයෙන් යළිත් වතාවක් මේ රට ආපස්සට ඇද දමන්න මේ කණ්ඩායම් කටයුතු කළේ.

එදා ඒ කුමන්ත්‍රණය කළ අයට රට පිළිබඳව හෝ රටේ සංවර්ධනය පිළිබඳව අල්ප මාත්‍ර කැක්කුමක් තිබුණේ නැතිවා වාගේම, ඔක්තෝබර් 26වන දා විප්ලවය ඇති කළ ඒ ත්‍රස්තවාදින්ටත් ඇත්ත වශයෙන්ම එවැනි කැක්කුමක් තිබුණේ නැහැය කියා මම කියනවා. එහිදී බලය පිළිබඳ ඔවුන්ගේ අසීමිත තණ්හාව ඉදිරියට ආවා. නමුත්, මේ රටේ ජනතාව තමන්ගේ අයිතිවාසිකම් නැවත දිනා ගත්තා. ඒ දේශපාලන බලවේගවල අන්තවාදී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාකාරකම් තවම සම්පූර්ණයෙන්ම නැවතිලා නැහැ.

සියලු බාධක මැද අපි දෙසැම්බර් 20වන දා නීත්‍යනුකූල ආණ්ඩුවක් නැවත පිහිටෙව්වා. ඒ සමඟ නැවත වතාවක් රටේ ආර්ථිකය ස්ථාවර වෙලා, සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා, විදේශ ආයෝජන ඉහළ යමින් දිගු කාලීන ආර්ථික වෘද්ධියක් අත් කර ගැනීමේ ස්ථාවර පදනම රට තුළ ශක්තිමත් වුණා.

විශාල වශයෙන් ඇද වැටුණු රුපියල යළිත් වතාවක් ශක්තිමත් වුණා, ස්ථාවර වුණා විතරක් නොවෙයි, මේ කාලය තුළදී සියයට 4.6කින් වර්ධනය වීමකුත් අපි දැක්කා. නමුත්, රටේ දියුණුවට ඇති වූ බාධා එතෙකින් අවසන් වුණේ නැහැ. පසුගිය අප්‍රේල් 21වන දා රට තුළ ඇති වූ ජාත්‍යන්තර අන්තවාදී ත්‍රස්ත ක්‍රියා නිසා ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශ වුණා. මේ දෙවැනි බාධාව නිසා නැවත වතාවක් රටේ ආර්ථික ස්ථාවරභාවයට දැඩි තර්ජනයක් එල්ල වුණා.

නමුත්, මේ සියලු බාධා මැද අපේ සාර්ව ආර්ථිකය ශක්තිමත්ව, නොසැලී පවත්වා ගැනීමට අවශ්‍ය පදනම අපි 2015 ජනවාරි මාසයේ ඉඳලා රට තුළ ඇති කර තිබුණු නිසා, පාස්කු ඉරිදා ඇති වුණු බෝම්බ ප්‍රහාරයටත් අපේ ආර්ථිකයට මුහුණ දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ හේතුවෙන්, ත්‍රස්තවාදී ක්‍රියා මධ්‍යයේ වුණත් අද වනකොට රටේ මූලික ආර්ථික දර්ශක ස්ථාවරව පවතින බව මම කියන්න කැමැතියි.

අද රටේ ආර්ථික වර්ධනය නොවෙනස්ව පවතිනවා. ඒ වාගේම විදෙස් සංචිත ශක්තිමත්. සේවා වියුක්තිය අවම තත්ත්වයක තිබෙනවා. ආර්ථික වර්ධන පුරෝකථන නොවෙනස්ව පවතිනවා.

මේ දර්ශක කිසිවක් විශාල විචල්‍යතාවක් පෙන්වන්නේ නැහැ. ඒ සඳහා මම උදාහරණයක් කියන්නම්. මේ ත්‍රස්තවාදී ක්‍රියාවලින් පසුවත් ලංකාවේ ආර්ථික වර්ධනය නොවෙනස්ව පවතින බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලංකාව පිළිබඳ කණ්ඩායමේ නායිකාව පසුගිය සතියේ ප්‍රකාශ කළා. ඒ වාගේම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලංකාවට ලබා දෙන ණය වාරිකයේ පස්වැනි කොටස වන ඇමෙරිකානු ඩොලර් මිලියන 164.1ක මුදල මැයි 13වන දා ප්‍රදානය කළා. මේ වනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2016 වසරේ මැද භාගයේ සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.1ක්, එහෙම නැත්නම් මිලියන 1,155ක් ලබා දීලා තිබෙනවා.

ආර්ථික මූල්‍ය අංශයන්ට බාධාවක් ඇති නොවුණත්, සංචාරක ව්‍යාපාරය යම් පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. මේ අංශය 2018 වර්ෂයේදී රටට ඩොලර් බිලියන හතරහමාරක මුදලක් ලබා දුන්නා. සංචාරක අංශයට ත්‍රස්තවාදී ක්‍රියා නිසා ඇති වූ බලපෑම රජයක් විධියට අපි හොඳින් තේරුම් ගෙන, මේ වනවිට සහන රාශියක් ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මුදල් ඇමතිතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා කථාව අවසන් කළාට පස්සේ ඔබතුමාගේ කාරණය කියන්න, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි. Hon. Minister, you go ahead.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Mike එක දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ කථාව අවසානයේදී අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා, මම කථා කළාට පසුව අහන්න. මම උත්තර දෙන්නම්.

ඔබතුමාගේ කථාවේදී අහන්න. මම අපේ රාජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී ඒකට පිළිතුරක් සපයන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ දවස පුරාම බාධා වුණා. අපි ජනතාවට වග කියන්න ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
හෝටල් හිමියන්ගේ ණය ගෙවීම වසරකින් ප්‍රමාද කළා. [බාධා කිරීමක්] ඒ වාගේම සංචාරක අංශයට, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, මට එතුමාට පිළිතුරක් දෙන්න ඕනෑ. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමා ඊයේ පාර්ලිමේන්තුව වටලන්න තර්ජනය කළා. අද ඔබතුමා පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී පාර්ලිමේන්තුව වටලන්න තර්ජනය කළා. ඒ නිසා ඔබතුමාට අවස්ථාව නොදී ඉන්න මට අයිතියක් තිබෙනවා. ඔබතුමා ඉඳගන්න. තර්ජනය කර ඔබතුමාට අවස්ථාව ගන්න බැහැ.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] ඒ සම්බන්ධයෙන් අපි මෙතුමාට චෝදනා කර වැඩක් නැහැ. මෙතුමාගේ ජානවලම ඒක තිබෙනවා. [බාධා කිරීමක්] එතුමාගේ මස්සිනා තමයි පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවේ. ඒ නිසා ඕක අලුත් දෙයක් නොවෙයි. පවුලේ ලේවල තිබෙන වරදක්. [බාධා කිරීමක්] හෝටල් හිමියන්ගේ ණය ගෙවීම වසරකින් ප්‍රමාද කළා. ඒ වාගේම සංචාරක අංශය ආශ්‍රිත ආයතනවලට ආරක්ෂක මෙවලම් ලබා ගන්න බදු සහන ලබා දුන්නා. එකතු කළ අගය මත බද්ද - VAT - සියයට 5 දක්වා අඩු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අදාළ සංශෝධනය පාර්ලිමේන්තුවට අපි ඉතා ඉක්මනින් ගෙනෙනවා. සංචාරක ව්‍යාපාරය යළි ගොඩනැඟීමට අමාත්‍ය අනු කමිටුවක් මේ වෙනකොටත් පත් කර අදාළ පියවර ගනිමින් සිටිනවා. ඒ වාගේම සංචාරක අංශයට සමහර රටවල් දැනට පනවා තිබෙන අනතුරු ඇඟවීම් ඉවත් කර ගැනීමට ක්‍රියා කරමින් සිටිනවා. සංචාරකයන් පැමිණෙන රටවල ප්‍රවර්ධන කටයුතු රාශියක් සිදු කරන්නට ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම තව එක කාරණයක් කියන්න ඕනෑ. මම පෙරේදා අපේ තානාපතිවරු කිහිප දෙනෙක් හමුවෙලා කිව්වා, "කරුණාකර දැන් පුළුවන් නම් travel advisory එක ඉවත් කර ගන්න." කියා. මොකද, සඳුදා වෙනකොට පාසල්වල ළමයි පිරිලා; අද මේ රට යථා තත්ත්වයට පැමිණ තිබෙනවා. එතකොට ඒ තානාපතිවරු දෙදෙනා කිව්වා, "ඒ සම්බන්ධයෙන් ඒ අයගේ අවධානය යොමු කර පුළුවන් තරම් ඉක්මනින් ඒ තීන්දුව අරගන්නවා." කියා. එහෙම කියා එක තානාපතිවරයෙක් හිනාවෙලා මට කියනවා, "හැබැයි, අපේ Head Office එක, තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමා සිටින විධිය දැක්කොත්, ඒ ගොල්ලන් මේක ඉවත් කරන්න ඕනෑ නැහැ." කියයි කියා. මොකද, විජේරාම මාවත barricade කරගෙන සම්පූර්ණයෙන්ම වටේ වහගෙන ඉන්නේ. අපේ අගමැතිතුමාගේ ගෙදරට ගිහිල්ලා බලන්න. එතුමා 5th Lane එක වහගෙන නැහැ. [බාධා කිරීමක්] අපේ ජනාධිපතිතුමා සාමාන්‍ය පුද්ගලයෙක් වාගේ සිටිනවා. ගරු කථානායකතුමනි, ඒ තානාපතිවරයා කිව්වා, "එතුමා සිටින හැටි දැක්කොත් මගෙන් අහයි, තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකවරයා ගෙදරින් එළියට බහින්න ඔච්චර බය නම්, ඇයි අපේ සංචාරකයන් තමුන්නාන්සේලාගේ රටට එවන්නේ." කියා.

කෙසේ වෙතත් ඒ ඇති වූ අනපේක්ෂිත ජාත්‍යන්තර ත්‍රස්තවාදී ප්‍රහාර ඉතා කෙටි කාලයක් තුළ මැඩ පැවැත්වීමට අපේ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය සමත් වුණා. ඒ වාගේම අපේ මිත්‍ර රටවල් ලබා දුන් සුවිශාල ජාත්‍යන්තර සහයෝගය නිසා එම ත්‍රස්තවාදී තර්ජනයට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය ශක්තිය අපේ ත්‍රිවිධ හමුදාවට ලැබුණා. මෙවැනි තර්ජන ඇති වූ බොහෝ රටවලට වඩා ඉක්මනින් අපේ රට තුළ ඇති වූ අස්ථාවර තත්ත්වය පාලනය කිරීමටත්, ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමටත් අපේ රජයට හැකි වුණා.

ගරු කථානායකතුමනි, අපේ රටේ පවතින ජාත්‍යන්තර ත්‍රස්තවාදය අපි මේ වන විට පාලනය කර තිබුණත්, මේ රටේ

[ගරු මංගල සමරවීර මහතා]

සිටින බංකොලොත් වුණු දේශපාලන කණ්ඩායම්, බංකොලොත් වුණු දේශපාලන පක්ෂ උත්සාහ කරනවා, යළි වතාවක් මේ රට තුළ කළු ජූලියක් ඇති කරන්න. ඒ අය උත්සාහ කරනවා, යළි වතාවක් මේ රට තුළ සිංහල, මුස්ලිම් ජනතාව අතර මහා ප්‍රශ්නයක් ඇති කරන්න. ඒ අය උත්සාහ කරනවා, මේ රටේ සියලුම මුස්ලිම් ජනතාව ත්‍රස්තවාදීන් හැටියට හංවඩු ගහන්න. හමුදාවෙන් අහන්න, හමුදාවට මේ තරම් ඉක්මනින් ලංකාව තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදීන්ව පාලනය කරන්න -මැඩ පවත්වන්න- පුළුවන් වුණේ, අනෙක් රටවල වාගේ නොව ලංකාවේ සිටින මුස්ලිම් ජනතාව ලබා දුන් තොරතුරු නිසයි. ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගෙන් සියයට 90කටත් වැඩි පිරිසක් අපිත් සමඟ ඉන්න කැමැතියි, ඒ අය බොහොම සාධාරණව ඉන්න කැමැතියි. එම නිසා අපි මේ වෙලාවේ සමස්ත මුස්ලිම් ජනතාවට අපගේ ස්තුතිය පුද කරනවා. නමුත්, යළි වතාවක් මේ රට සොහොන කරා ඇදගෙන යන්න බලාපොරොත්තු වන මහසෝන් බලකාය වාගේ ළිං ගෙම්බන්ගේ කල්ලි මේ රට තුළ විශාල ආර්ථික අස්ථාවරත්වයක් ඇති කරන්න කටයුතු කරනවා. අපි දැක්කා, මිනුවන්ගොඩදී,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා. ඔබතුමා ඊට වැඩියෙන් කාලය ගන්නවා නම් දැනුවත් කරන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු කථානායකතුමනි, ඒ විනාඩි 3ට අමතරව මට තව විනාඩි 5ක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමනි, මේ දේශප්‍රේමීන් එදා පැස්ටා ෆැක්ටරියක් විනාශ කළා. නමුත්, ඒ ෆැක්ටරියේ අයිතිකාරයා ශ්‍රී ලාංකීය මුස්ලිම්වරයෙක් නොවෙයි. ඒ ෆැක්ටරියේ වැඩ කරපු අයගෙන් සියයට 95ක්ම සිංහල අය. මට ආරංචි විධියට මුස්ලිම් සේවකයෝ තුන්දෙනයි සිටියේ.

ඒ පැස්ටා ෆැක්ටරියේ සිටි අනිත් ඔක්කෝම සේවකයන් සිංහල අයයි. අද ඒ සිංහල සේවකයන් රැකියාවක් නැතිව ගෙවල්වලට වෙලා සිටිනවා. ඇත්ත වශයෙන්ම මේක බෝම්බ පුපුරවනවා වාගේම භයානක ත්‍රස්තවාදයක්.

ගරු කථානායකතුමනි, මේ රටේ ප්‍රධාන මුස්ලිම් ආයතන දෙස බලන්න. බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයෝ 48,000ක් සිටිනවා. ඒ සේවකයන් 48,000න් සියයට 75ක්ම සිංහල අයයි. හමීඩියාස් ආයතනයේ සේවකයෝ 1,200ක් සිටිනවා. ඒ අයගෙන් සියයට 80ක් සිංහල අයයි. ටයිමෙක්ස් ගාමන්ට්ස් එකේ සේවකයෝ 10,000ක් සිටිනවා. ඒ අයගෙන් සියයට 90ක් සිංහල අයයි. මැලිබන් ගාමන්ට්ස් එකේ සේවකයෝ 10000ක් සිටිනවා. ඒ අයගෙනුත් සියයට 90ක් සිංහල අයයි. එමරල්ඩ් ආයතනයේ සේවකයෝ 1,200යි. මේ විධියට තවත් කියාගෙන යන්න මට පුළුවන්. විශේෂයෙන්ම මුස්ලිම්වරුන්ට අයිති businessesවලින් විතරක් අපේ රටට වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් බිලියන 3කටත් වඩා ආදායමක් ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. "Ceylon Tea" කියන නමින් ලංකාවේ තේ පිට රටවලට යවන්නෙත් මුස්ලිම් සමාගමක්. ඒ වාගේම, එමරල්ඩ් වැනි shirtsවල brand ambassadorsලා තමයි අපේ ක්‍රීඩා වීරයන් වන කුමාර සංගක්කාර, මහේල ජයවර්ධන. මා මේ කියපු, මුස්ලිම් garment factoriesවල විතරක් ලක්ෂයකට වඩා වැඩි සේවක සංඛ්‍යාවක් වැඩ කරනවා. අප මේවා කියනකොට සමහරුන්ට රිදෙනවා. ඇත්ත කියනකොට සමහරු කියනවා, "මෙයා බෞද්ධ විරෝධියෙක්." කියා. නමුත් මිත්‍රවරුනි, මා යළි වතාවක් මේ කාරණය කියන්න කැමැතියි. මේ බෞද්ධ විරෝධියා යටතේ තමයි ලංකා ඉතිහාසයේ මුදල් අමාත්‍යාංශයෙන් වැඩිම මුදලක් බුද්ධ ශාසනය වෙනුවෙන් වෙන් කර තිබෙන්නේ. මා උදාහරණයක් කියන්නම්. මේ අවුරුද්දේ මේ මාස 4ට විතරක් "ගම්පෙරළිය" වැඩසටහන හරහා බෞද්ධ විහාරස්ථානවලට රුපියල් මිලියන 2,090.945ක් දී තිබෙනවා. මේ වනකොට බෞද්ධ ව්‍යාපෘති 4,124ක් ක්‍රියාත්මක වනවා. අපි කතෝලික ආගමික ස්ථාන 778කට රුපියල් මිලියන 393ක් මේ වනකොට දී තිබෙනවා. අපි කෝවිල්වලට රුපියල් මිලියන 1,076ක් දී තිබෙනවා. ව්‍යාපෘති 2,095 යි. අපි මුස්ලිම් පල්ලි 1,241කට මුදල් දී තිබෙනවා. නමුත්, ඒ සියල්ලටම වඩා වැඩියෙන් මුදල් දී තිබෙන්නේ මේ රටේ බහුතරයකගේ ආගම වන බෞද්ධ ආගමේ විහාරස්ථාන වෙනුවෙන් කියන එක මට සන්තෝෂයෙන් කියන්න පුළුවන්. ඕනෑ නම්, මා මේ ලිය කියවිලි දිස්ත්‍රික් වශයෙන් වෙන් කර ඉදිරිපත් කරන්නම්.

නමුත්, දැන් කියන්න පුළුවන් කුණුහරුප ඔක්කොම කියනවා, මම යථාර්ථය කිව්වාම. මම කිව්වාම මේක සිංහල-බෞද්ධ රටක් නොවෙයි, මේක සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ රටක් කියලා, මට කුණුහරුපයෙන් බැන්නා. මේගොල්ලන්ගේ websites දිහා බලපුවාම ඒ බව පේනවා. මම යළි වතාවක් කියනවා, "මේ රටේ බහුතරය බෞද්ධ බව ඇත්ත. නමුත් මේ රට සියලු ශ්‍රී ලාංකිකයන්ට අයිතියි" කියලා.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් කියලා කථාව අවසන් කරනවා ගරු කථානායකතුමනි. ඔබතුමා ඉතාම හොඳට බෞද්ධ දර්ශනය දන්නා කෙනෙක්. අපි බුද්ධාගම කියලා කිව්වාට ඒක වැරැදියි. මම නම් අදහන්නේ බෞද්ධ දර්ශනය. බෞද්ධ දර්ශනය කියන්නේ ආගමක් නොවෙයි. ඇත්ත වශයෙන්ම බුදුරජාණන් වහන්සේ දේශනා කළ බෞද්ධ දර්ශනය රටකට, ආගමකට, ජාතියකට, කුලයකට සීමා වුණු එකක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඒක මේ ලෝකයට සීමා වුණු දර්ශනයකුත් නොවෙයි. මේක මුළු විශ්වය ගැනම කථා කරන ධර්මයක්. ඇත්ත වශයෙන්ම විශ්ව නීතිය ගැන කථා කරන දර්ශනයකට තමයි අපි බෞද්ධාගම කියලා කියන්නේ. බෞද්ධයන් හැටියට අද අපි ලජ්ජා වෙන්නට ඕනෑ. සමහර චීවරධාරීන් බෞද්ධාගම කියලා නමක් හදාගෙන මේ රටේ අපේ උතුම් වූ බෞද්ධ දර්ශනය වවාගෙන කන්න හදනවා. බෞද්ධ දර්ශනය නිසා ශ්‍රී ලංකාවේ සංස්කෘතිය පෝෂණය වුණා. බෞද්ධ දර්ශනය නිසා ශ්‍රී ලංකාවේ කලාව පෝෂණය වුණා. බෞද්ධ දර්ශනය නිසා ශ්‍රී ලංකාවේ සාහිත්‍යය පෝෂණය වුණා. නමුත් අනෙකුත් ආගම් නිසාත් ඒ වාගේමයි. හින්දු ආගම නිසා අපේ රටේ සංස්කෘතිය පෝෂණය වුණා. ඉස්ලාම් ආගම කියන්නේ මහා භයානක ආගමක් කියලා අද කිව්වත්, -මම නම් කුරානය කියවලා නැහැ, තැනින් තැන දන්නවා.- ඒකෙන් කථා කරන්නේත් සාමය ගැන; ඒකෙත් කථා කරන්නේත් අපි කථා කරන දේවල්මයි. මන්ත්‍රීවරුනි, අද තමුන්නාන්සේලාගේ මුස්ලිම් විරෝධය එක පුද්ගලයකු එල්ල කරගෙන නොවෙයි ක්‍රියාත්මක කරන්නේ. මේ විරෝධය රිසාඩ් බදියුදීන්ට විරුද්ධව නොවෙයි ගේන්නේ. රිසාඩ් බදියුදීන්ට විරුද්ධව නොවෙයි සියලු මුස්ලිම් ජනතාවට විරුද්ධව මේ විරෝධය ගේන්නේ. ඒ විතරක් නොවෙයි, යළි වතාවක් මුස්ලිම් ජනතාවට අපේ ආණ්ඩුවත් එක්ක ඉන්න බැරි තත්ත්වයක් ඇති කරන්න බලාගෙනයි මේ අය මේ විරෝධය ගේන්නේ. මොකද, මේ අය දන්නවා, මේ රටේ ශ්‍රී ලාංකිකයන් සියලුදෙනාම එකතුවෙලා එකට ඉන්නකම් කවුරු මොන සිහින දැක්කත් අපේ ආණ්ඩුව පරද්දන්නට බැහැයි කියන කාරණය. ඒ බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ආචාර්ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. ගරු විමල් වීරවංශ මැතිතුමාගේ පැහැදිලි කිරීමකට පිළිතුරු දෙන්නට පුළුවන්ද ගරු මංගල සමරවීර ඇමතිතුමනි?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ ප්‍රශ්නයේ හැටියට මම කියන්නම් පුළුවන්ද, බැරිද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කැමැත්ත අනුව තමයි මට අවස්ථාව දිය හැක්කේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නයක්.

ගරු ඇමතිතුමනි, මේ රටේ වෙසක් එකට තොරණ හදන මිනිස්සු ඉන්නවා. ඒ අය පාරම්පරිකව කරගෙන එන්නේ ඒක. පසුගිය වෙසක් සමයේ වුණු අර්බුදය නිසා ඒ මිනිස්සු ණය වෙලා හදපු තොරණ විකුණා ගන්න විධියක් නැතිව අසරණවෙලා ඉන්නවා. මුදල් ඇමතිවරයා ලෙස ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, -රටේ ඒ කර්මාන්තයේ මහා පරිමාණයෙන් යෙදෙන විශාල පිරිසක් නැහැ.- කරුණාකරලා ඒ කර්මාන්තයේ යෙදන අයව කැඳවලා ඒ අයට යම් සහනදායක වැඩ පිළිවෙළක් හදන්න කියලා. මොකද, ඒගොල්ල හදපු තොරණ විකුණා ගන්න බැරිව දැන් අසරණවෙලා ඉන්නේ. ඒ කාරණය කියන්නයි මම අවස්ථාව ඉල්ලුවේ.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ අයට කියන්න. මුදල් ඇමතිවරයා හැටියට මගෙන් ඉල්ලීමක් කළොත් සාකච්ඡා කරලා බලන්න පුළුවන්, මොකක්ද කරන්න පුළුවන් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු විමල් වීරවංශ මැතිතුමා. "හොඳයි" කියන්නේ ඔබතුමාට ගරු කරලා. ඊයේ "හොඳයි" කියනවාට ඔබතුමා කැමැති වුණේ නැහැ. "හොඳයි" කියන්නේ ඉතාමත් උතුම් වචනයක්. එහෙම නැත්නම් "ඇයි යකෝ"කියන්න පුළුවන් නේ. නමුත් මම එහෙම කියන්නේ නැහැ. එම නිසා ගරුත්වයක් වශයෙනුයි "හොඳයි" කියලා කියන්නේ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ අද "දිවයින" පත්‍රයේ වාර්තා කරලා තිබෙන කාරණයක් ගැනයි. එහි මෙසේ සඳහන් වනවා:

"සිසේරියන් සැත්කම්වලින් පසු
තව්හිද් ජමාත් දොස්තර සිංහල බෞද්ධ මවුවරුන් හාරදහසක් වඳ කරලා
සාක්ෂි සහිතව තොරතුරු හෙළි වේ
දොස්තර අල්ලන්න පුළුල් පරීක්ෂණ"

කියලා එහි සඳහන් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පැහැදිලි කරන්නද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියනකම් ඉන්න ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් මේක දිහා බලපුවාම පේනවා මේක සත්‍යය නම්, අතිශය බරපතළයි කියලා. ඒ කියන්නේ අන් කවරක්වත් නොවෙයි. දැන් අනෙක් ජාතිකත්වයන් නියෝජනය කරන කණ්ඩායම් මුස්ලිම් වෛද්‍යවරයෙක් ගාවටවත් නොයා ඉන්නට ඉඩ තිබෙනවා, මේ තත්ත්වය අනුව. ඒ වාගේම මේක ජනතාව අතර විශාල ගැටුමක් ඇති කළ හැකි, සැකයක් ඇති කළ හැකි තත්ත්වයක්. සමහර රෝහල්වල මුස්ලිම් ජාතිකත්වය නියෝජනය කරන වෛද්‍යවරුන් දිහා සැකයෙන් බලන, පලවා හරින තත්ත්වයන් පවා නිර්මාණය විය හැකියි.

ඒ නිසා මම රජයෙන් ඉල්ලා සිටිනවා, වහාම මේ ගැන සොයා බලන්න කියලා. ඒ කියන්නේ, මේක සරල නැහැ නේ. සිසේරියන් සැත්කම්වලින් පසු තවුහිද් ජමාත් දොස්තර සිංහල බෞද්ධ මව්වරුන් හාරදහසක් වඳ කරලා කියලා කියන්නේ. ඒ විතරක් නොවෙයි, ඒ දොස්තර මහත්මයා සිසේරියන් සැත්කම් 7,000ක් විතර කරලා තිබෙනවා ලු. මම දන්නේ නැහැ, එයාගේ සේවා කාලය කොච්චරද කියලා. ඒ 7,000න් සිංහල මව්වරු 4,000ක් ම මේ වඳ කිරීමට භාජන කරලා තිබෙනවා කියලා කියනවා. ඒ නිසා රජය හැටියට තමුන්නාන්සේලා සොයා බලන්න ඕනෑ, මේ කාරණය සත්‍යයද; මේ පිළිබඳව තොරතුරු වාර්තා වෙලා තිබෙනවාද; අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් කරනවා ද කියලා. එසේ නැතිනම්, මෙවැනි ජාතිවාදී මතයන් වැපිරීම පිළිබඳව තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරනවාද කියලා දැනගන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය අහපු එක හොඳයි. මම අද උදේ පාන්දර මේ විස්තරය දැකපු හැටියේ පොලිස්පතිතුමාටත් කථා

[ගරු කථානායකතුමා]

කළා; බුද්ධි අංශයේ ප්‍රධානීන්ටත් කථා කළා. මොකද, ඒකේ සඳහන් වන්නේ පොලිස් වාර්තා අනුව කියලා. ඒ අය කිව්වා, ඔවුන් එවැනි කිසිම දැනුවත්වීමක් වෙලා නැහැ කියලා. ඔබතුමා කියපු පරිදි ඒකේ බැරෑරුම්කම පොලිස්පතිතුමාටත්, අනෙකුත් නිලධාරින්ටත් තේරුම් ගිය නිසා වහාම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනවා.

ඊට අමතරව පුවත් පතක අද පළ වෙලා තිබුණා, පාර්ලිමේන්තුවේ තවත් තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයෙක් ඉන්නවා කියලා. ඒකත් මම හොයලා බැලුවා. එහෙම එකක් නැහැ. නමුත්, ඒ දෙකම ගැන පරීක්ෂණ කරන්න රහස් පොලිසියට බාර දුන්නයි කියලා තමයි මට කිව්වේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා පැහැදිලි කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා,-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභානායකතුමනි, මට කථාව අවසන් කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, ඔබතුමා කථා කරලා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේක විතරක් නොවෙයි. මේ පුවත් පත් දැන්වීමේ මෙන්න මේ විධියටත් කියලා තිබෙනවා. "දොස්තර අල්ලන්න පුළුල් පරීක්ෂණ".

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැබැයි, ඒ අය දන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් පරීක්ෂණයකුත් යනවා ලු මේ දොස්තර අල්ලන්න. මේවා තමයි වාර්තා කරලා තිබෙන්නේ. ඔබතුමා කියන විධියට මේ පරීක්ෂණ කෙරෙන්නේ පොලිස් දෙපාර්තමේන්තුවෙන් නොවෙයි නම්, මේ පරීක්ෂණය කරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ ආයතනවලින් නොවෙයි නම්, මේ පරීක්ෂණය කරන්නේ පුවත් පත් අයිතිකාරයන්ගේ ගෙවල් අස්සේද, ඒවාට දායකත්වය සපයන අනෙක් කණ්ඩායම් අස්සේද කියලා අපි දැන ගන්න කැමැතියි. ඒ නිසා ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවට මේ පිළිබඳව පිළිතුරක් ලබා දිය යුතුයි. එවැනි එකක් සිදුවී තිබෙනවා ද, සිදුවී තිබෙනවා නම් කවර ආකාරයට ද, සිදුවී තිබෙන්නේ කොතැනද, මේ ක්‍රියාව සිදු කොට තිබෙන්නේ කුමන දොස්තර ද කියලා මේ පාර්ලිමේන්තුව දැන ගන්න අවශ්‍යයි. නමුත්, මෙහි පළාතක් සඳහන් වෙලා නැහැ; දොස්තරවරයා කවුද කියලා සඳහන් වෙලා නැහැ. මෙහෙමයි වාර්තා කරලා තිබෙන්නේ. පරීක්ෂණත් සිද්ධ වෙනවා කියලා කියනවා. හැබැයි, 7,000ක් සිසේරියන් කරපු බවත් හොයා ගෙන තිබෙනවා, 4,000ක් වඳ කරලා කියලත් දන්නවා, ඒ වෛද්‍යවරයා මුස්ලිම් කියලත් දන්නවා, ඔහු තවුහිද් ජමාත් සාමාජිකයෙක් කියලාත් දන්නවා, වඳ කරපු මව්වරු 4,000ම සිංහල කියලත් දන්නවා. හැබැයි, දොස්තරගේ නම කියන්නෙත් නැහැ; ඉස්පිරිතාලේ නම කියන්නෙත් නැහැ; පළාත කියන්නෙත් නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ පිළිබඳව පැහැදිලි විස්තරයක් හෙට දිනයේදී මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව පාර්ලිමේන්තුවට වාර්තාවක් කැඳවන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම අද ඒ ගැන කිව්වා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩුවට විශාල අපහාසයක් මේක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද Security Council රැස්වීමේදීත් මේ ගැන සාකච්ඡා කරනවා කියලා කිව්වා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වහාම පාර්ලිමේන්තුවට වාර්තාවක් කැඳවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒක කැඳවන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගෙනුත් විමසලා මේ පාර්ලිමේන්තුවට හෙට දිනයේදී අඩුම තරමේ මේ කරුණු ටිකවත්

ලබා දෙන්න. "සැත්කම් 7,000ක් කරලා තිබෙනවා. 4,000ක් වඳ කරලා තිබෙනවා. 4,000ම සිංහල මව්වරු. මේ ගැන පරීක්ෂණ පවත්වමින් තිබෙනවා මොහුව අල්ලන්න." අන්න ඒ පිළිබඳව ඇත්ත ද, නැත්ත ද කියලා වාර්තාවක් ලබා දෙන්න කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම වාචිකව ඉල්ලුවා. එවැනි වාර්තාවක් මම ලිඛිතවත් ඉල්ලන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා හෙට පාර්ලිමේන්තුවට ඒ ගැන කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ තව පුද්ගලයෙක් ගැන වාර්තා වෙලා තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැනත් මම වාර්තාවක් ඉල්ලුවා. පොලිස්පතිතුමාවත්, බුද්ධි අංශයවත් ඒ ගැන දන්නේ නැහැ. ඒ වාගේම, අද තවත් වැදගත් ප්‍රශ්නයක් ගරු විමල් වීරවංශ මැතිතුමා ඇහුවා. එතුමා ඇහුවා, මාතලේ chemicals සිද්ධියක් සම්බන්ධයෙන්. ඒකත් මම හොයලා බැලුවා. ඒ නඩුවෙන් ඒ ගොල්ලන් නිදහස්. ඒ පුද්ගලයා Rifle Association එකේ සභාපති. ඊට පස්සේ නඩුව ඉවත් කළා. ඒකත් එතැනට අදාළ නැහැ. එතැනත් බොරු ප්‍රචාරයක් ගිහිල්ලා තිබෙන්නේ.

මීළඟට, ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා. ඊට අමතරව ගරු නිමල් ලන්සා මන්ත්‍රීතුමාගේ විනාඩි 8කුත් තිබෙනවා. එතකොට විනාඩි 18ක කාලයක් ඔබතුමාට තිබෙනවා.

[පූ.භා.11.55]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු නිමල් ලන්සා මන්ත්‍රීතුමාගේ කාලය මට ලබාදීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මුදල් ඇමතිතුමා මේ සභාවේ ඉන්න අවස්ථාවේදී මම එතුමාගේ විශේෂ අවධානයට යොමු කරන්න කැමැතියි,- ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා මේ සභාවේ ඉන්න අවස්ථාවේදී විශේෂ කාරණයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මුදල් අමාත්‍යාංශය විසින් හෝටල් කර්මාන්තයට සිද්ධ වෙච්ච ණයතුරුස් පියවීම හා වාරික ගෙවීම් සම්බන්ධයෙන් වර්ෂයක සහනදායී කාලයක් ලබා දුන්නා කියලා ප්‍රකාශයට පත් කළා. එය ඒ ආකාරයෙන් සෑහෙන්න පිරිසකට ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත් ඔබතුමා දන්නවා, සංචාරක හෝටල් කර්මාන්තය ආශ්‍රිතව සංචාරකයන්ට සේවා සැපයීම සඳහා මෝටර් වාහන, වෑන්, කාර් සහ අනෙක් දේවල් සඳහා finance, leasingවල නිශ්චිත දිනයට වාරික ගෙව්වේ නැත්නම්, ස්වයංක්‍රියව පරිගණකය හරහා විශාල දඩ මුදලක් එකතු වෙන බව. එතකොට ඊට අතිරේකව මේ සංචාරක ක්ෂේත්‍රයට විවිධ භාණ්ඩ සපයන සැපයුම්කරුවෝ ඉන්නවා, ගරු ඇමතිතුමනි.

එළවලු සපයන අය ඉන්නවා. බිත්තර සපයන අය ඉන්නවා. මස්, මාළු සපයන අය ඉන්නවා. මල් සපයන අය ඉන්නවා. විවිධ සැපයුම්කරුවන් ඉන්නවා. ඒ අයට දැන් ස්වයං රැකියා ආදායම් මාර්ගය සම්පූර්ණයෙන්ම අහිමි වෙලා තිබෙනවා. ඊළඟට මේ පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා විමල් වීරවංශ මැතිතුමා සඳහන් කළ පරිදි තොරණ්කරුවන් වාගේම, අපි නොදකින විවිධ ක්ෂේත්‍ර වල අයට ආදායම් මාර්ගය අහිමි වෙලා තිබෙනවා. සමහර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත තිබෙනවා. ඒවායේ නියමිත දිනයට විදුලි බිල ගෙව්වේ නැත්නම් විදුලිය කපනවා. ඒ විදුලිය කපන කෙනාට මේ අර්බුදය පිළිබඳ හැඟීමකුත් නැහැ; එහෙම නියෝගයක් ක්‍රියාත්මක කරන්නත් බැහැ. පසුගිය මැයි මාසයේ 15වෙනි දා ආදායම් බදුවල අවසන් වාරිකය ගෙවන්න ඕනෑ. වාරිකය ගෙව්වේ නැත්නම් දඩ පනවනවා දේශීය,-

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, මට තවත් සාකච්ඡාවකට යන්න තිබෙන නිසා මෙතුමාට මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ඔය සංචාරක ව්‍යාපාරයට අදාළ බොහෝ කාරණා සියල්ලම වාගේ අපි අනුමත කරලා, මේ වෙනකොට සමහර ආයතනවලට circulars පවා ගිහිල්ලා තිබෙනවා. නමුත්, අපි මේ සම්බන්ධයෙන් දැන් කථාකර ගත්තා. තමුන්නාන්සේට ඒ ගැන සම්පූර්ණ විස්තරයක් අපේ රාජ්‍ය අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගේ කථාවේදී ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
බැංකුවලට එවැනි චක්‍රලේඛනයක් ඇවිල්ලා නැහැයි කියන එක තමයි බැංකුකරුවන් කියන්නේ. චක්‍රලේඛනයක් බැංකුවට එන්න ඕනෑ. චක්‍රලේඛනයක් බැංකුවට එවීම සඳහා කටයුතු කරන්න. මුදල් අමාත්‍යාංශයයි, ශ්‍රී ලංකා මහ බැංකුවයි එක් වී අනෙක් අංශ පිළිබඳවත් කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරන්න මැදිහත් වෙන්න කියන එක ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරලා තිබෙන්නේ විදේශ විනිමය පනත යටතේ නියෝගයක්. ගරු කථානායකතුමනි, අපේ රටේ 1953 අංක 24 දරන විනිමය පාලන පනත තිබුණා. දීර්ඝ කාලයක් තිස්සේ -1953 සිට- මේ රජය බලයට පැමිණෙන තෙක් රටට විදේශ විනිමය ගලා ඒම හා රටින් පිටට විදේශ විනිමය ගලා යෑම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් විවිධ විධි විධාන සකස් කරලා ක්‍රමානුකූලව පරීක්ෂණයක්, අධීක්ෂණයක් යටතේ තමයි විනිමය ගනුදෙනු සිද්ධ වුණේ. තමුන්නාන්සේලාගේ ලිබරල්කරණ ප්‍රතිපත්තිය යටතේ මේ සියල්ල වක්කඩ කැඩුවා සේ විවෘත කිරීම සඳහා විනිමය පාලන පනත අහෝසි කරන්න කටයුතු කළා. ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේදී විපක්ෂය වෙනුවෙන් විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ හා පක්ෂ නායකයන්ගේ මගපෙන්වීම යටතේ මම ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් අරගෙන ගියා. "විනිමය පාලන පනත මෙලෙසින් ලිහිල්කරණය කිරීම තුළින් අපේ රටට විශාල අගතියක් වෙන්න පුළුවන්. විනිමය විශාල වශයෙන් නිදහසේ රටින් පිටතට ගෙන යාමේ තත්ත්වය ඇති වුණොත්, තායිලන්තය වාගේ මැලේසියාව වාගේ අපේ රටේත් දැවැන්ත අර්බුදයක් හට ගන්නවා. ඒ නිසා ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන ගිණුම මෙලෙසින් විවෘත කරන්න දෙන්න එපා. මේ තුළ අපට විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද, ත්‍රස්තවාදී ව්‍යාපාරවලට මුදල් ගලා ඒම වැළැක්වීම සඳහා විනිමය පාලනයක් තිබිය යුතුයි" කියා මම එහිදී සඳහන් කළා. අන්තවාදය හෝ ත්‍රස්තවාදය හෝ පැතිරීම සඳහා අත්‍යවශ්‍ය මූල සාධකයක් තමයි විදේශීය මුදල්. ලෝකයේ රටවල් අතර ත්‍රස්තවාදීන්ට මුදල්

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

හුවමාරු වෙන්නේ නැත්නම්, මාළුන්ට වතුර නැතිව ජීවත් වෙන්න බැරිවා වාගේම ත්‍රස්තවාදියාට මුදල් නැතිව ජීවත් වෙන්න බැහැ. ඒ නිසා මෙය වැළැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම සඳහා මහින්ද රාජපක්ෂ යුගයේදී 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතක් සම්මත කළා. ඒ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ Financial Intelligence Unit කියන මූල්‍ය බුද්ධි ඒකකයක් පිහිටුවා, එමඟින් හැම අවුරුද්දේම විමර්ශන රාශියක් කරගෙන ආවා. නමුත් අවාසනාවකට වාගේ මේ රජය බලයට පත් වූ වහාම වෛරී චේතනාවෙන් නියම කරනු ලැබුවේ, මහින්ද රාජපක්ෂ පවුලේ හා රාජපක්ෂ හිතවාදීන්ගේ මූල්‍ය ගනුදෙනු තිබෙනවා නම් හොයන්න කියලායි. ඒකට තමයි මුළු කාලයම ගත වුණේ. ඒ අතරතුර 2016දී සිද්ධියක් සිද්ධ වුණා. මේ සඳහා අන්තර්ජාතික වශයෙන් රටවල් 155ක් එකතු වුණා. බුද්ධි අංශවල එග්මොන්ට් කියලා කණ්ඩායමක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ එග්මොන්ට් කණ්ඩායම යටතේ මූල්‍ය කාර්ය සාධන බලකාය රැස් වෙලා 2016දී අපේ රට සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වුවා. එහිදී සමූල ඝාතන මිනිස් අවි සඳහා මුදල් සැපයීමට සම්බාධක පැනවීම ඇතුළු කරුණු හතරක් සම්බන්ධයෙන් ලංකාව නිසි ලෙස ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගත්තාය කියලා විමර්ශනයක් කළා.

ඒ විමර්ශනයෙන් පස්සේ 2017 අවුරුද්දේදී ආර්ජන්ටිනාවේදී රැස්වෙලා, ලංකාව Black List එකට ඇතුළු කළා. Black List එකට එතැන කියන්නේ "අළු ලේඛනය" - Grey List - කියලායි. අළු ලේඛනයට අපිව ඇතුළු කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, මේ රටට ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා මුදල් ඒම වළක්වන්න අවශ්‍ය විධිවිධාන යොදන්න ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. අපි එය පිළිගන්න ඕනෑ. ඒ නිසා අපිට ජාත්‍යන්තරව දඬුවමක් ලැබිලා තිබෙනවා. ජාත්‍යන්තරව ලැබිලා තිබෙන දඬුවම තමයි, ලංකාව Grey List එකට ඇතුළු කිරීම.

ගරු කථානායකතුමනි, ඒකෙන් මිදීම සඳහා අපි අනුගමනය කළ යුතු වැඩසටහනක් නියම කරලා තිබෙනවා. ඒ වැඩසටහන අනුව මේ පාර්ලිමේන්තුව පනත් කෙටුම්පත් දෙකක් සම්මත කරලා තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුව වාර්තා තුනක් යවලා තිබෙනවා. තවම අපිට අළු ලේඛනයෙන් පිටතට එන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා රටක් වශයෙන්, ජාතියක් වශයෙන් රජය නිසි වගකීමකින් තොරව ක්‍රියාත්මක වීම නිසා අන්තර්ජාතික වශයෙන් ත්‍රස්තවාදය රට ඇතුළේ පෝෂණය වෙන්න අවශ්‍ය මුදල් සම්පත් ලබා දෙන්නට ඉඩකඩ සැලසුණා කියන කාරණය අපි අකැමැත්තෙන් වුණත් පිළිගත යුතු වනවා. මෙවැනි දේවල් පිළිබඳව තමයි අපි ජාතියක් වශයෙන් මේ පාර්ලිමේන්තුව තුළ සංවාද කළ යුත්තේ. 2017දී අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. අපේ උගත් නීතිඥයන් අධිකරණයට කරුණු ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුතුමන්ලා අපේ උගත් නීතිඥවරුන්ගෙන් ඇහුවා, "විපක්ෂය රට ඇතුළට මුදල් එනවාට විරුද්ධ වෙන්නේ ඇයි?" කියලා. අපි කිව්වා, "නැහැ, නැහැ. රට ඇතුළට ඕනෑ තරම් විදේශ විනිමය එනවාට අපි කැමතියි. නමුත් මේ තුළින් ඇති වෙන්න පුළුවන් අන්තරාය පිළිබඳව සලකා පාලනය කරන්න" කියලා. තිලක් මාරපන අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් රැස් වුණු අධීක්ෂණ කාරක සභාවේදී මමත්, වාසුදේව නානායක්කාර මැතිතුමාත් මේ පිළිබඳව දිගින් දිගටම තර්ක කළා. විනිමය පාලන පනත අහෝසි කර විනිමය පාලන දෙපාර්තමේන්තුවත් අහෝසි කරන්න යනකොට අපි අඩු තරමින් "විදේශ විනිමය දෙපාර්තමේන්තුව" කියලා මේ දෙපාර්තමේන්තුව තියා ගත්තා. එයින් ලිහිල්කරණය සඳහා මුදල් ඇමතිතුමාට විශාල බලයක් ලැබුණා. අද වනකොට විදේශ විනිමය ගනුදෙනු කරන්න බලය ලත් වෙළෙන්දන් - foreign exchange dealersලා - 28 දෙනෙකු ඉන්නවා. ඊළඟට, ඕනෑ කෙනෙකුට විදේශ විනිමය ගනුදෙනු කිරීම සඳහා බලය දෙන්න මුදල් ඇමතිතුමාට පුළුවන් වන විධියේ ක්‍රමයක් අලුතින් ඇති කළා. එහෙම 83 දෙනෙකුට බලය ලබා දීලා තිබෙනවා. දැන් විනිමය ගනුදෙනු කරන බලය ලත් නියෝජිතයන් 28 දෙනෙකු ඉන්නවා; සීමිත වෙළෙන්දන් 83යි; 111ක් විදේශ විනිමය ගනුදෙනු වෙනුවෙන් නිල වශයෙන් ඉන්නවා.

ගරු කථානායකතුමනි, පිටකොටුවේ ජනාධිපති මන්දිරය ඉස්සරහා, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙහා පැත්තෙන්, ඔර්ලෝසු කණුවට එහා පැත්තෙන්, වැල්ලවත්ත ආදී ස්ථානවලින් කෝටි-ප්‍රකෝටි සංඛ්‍යාත විදේශ විනිමය ප්‍රමාණයක් උණ්ඩි හා වෙනත් ක්‍රමයට -නිල නොවන ආකාරයට- ජාත්‍යන්තරයට යනවා. ඕනෑම ව්‍යාපාරිකයෙකුට ඩොලර් පවුම්, ඩොයිෂ් මාර්ක්, ප්‍රංශ ප්‍රෑන්ක්, ජපන් යෙන් ආදී වශයෙන් ඕනෑ දෙයක්, ඕනෑම රටකින්, කිසිම තැනක සටහන් නොවී ගෙනි යන්න ඉතා විශාල ඉඩක් හදා දීලා තිබෙනවා. මේ පිළිබඳව ජාතික වශයෙන් අවධානයක් යොමු නොකළොත් ත්‍රස්තවාදීන්ට ආයුධ ගන්න, ත්‍රස්තවාදීන්ට දේශන පවත්වන්න, ත්‍රස්තවාදීන්ට වෙනත් විවිධ ක්‍රියාවන් කරන්න මුදල් ගලා එනවා. ඒ නිසා තමයි, එල්ටීටීඊ සංවිධානය ඉතාම දරුණුව තිබෙන අවධිය තුළදී මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් මූල්‍ය බුද්ධි ඒකකය ශක්තිමත් කරලා, ඉතාම විශාල ලෙස මේ පිළිබඳව පාලනයක් ඇති කළේ. අද වනකොට අපේ රට ගෝලීය ත්‍රස්තවාදයට මුහුණ දීලා තිබෙනවාය කියලා අපි කියනවා. විදේශ විනිමය සඳහා වූ පනත දැන් ලිහිල් කරලා අවසානයි. අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියත්, තමුන්නාන්සේලා ඒ පනත වෙනුවට 2017දී නව පනත් කෙටුම්පතක් සම්මත කර ගත්තා. අද වනවිට ඇත්ත ප්‍රශ්නය අපිට පෙනෙන්නේ නැත්තේ ඇයි, ගරු කථානායකතුමනි? "අපිට දැන් ණය කන්දක් තිබෙනවා. එදිනෙදා විදේශ ණය වාරික ගෙවා ගන්න මුදල් නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ" කියලා දැන් අපි බොරුවක් කියනවා. මේක සම්පූර්ණයෙන්ම සාවද්‍ය කරුණක්. මම වගකීමකින් යුතුව ඔබතුමාට මේ කරුණු ඉදිරිපත් කරන්න කැමතියි. අපේ රටින් සල්ලි පිටතට යන ප්‍රධාන කරුණු දෙකයි තිබෙන්නේ. පළමුවැනි කරුණ හැටියට විදේශ ණය වාරික හා පොලී ගෙවන්න - debt servicing කරන්න - ඕනෑ. දෙවැනි කරුණ හැටියට අපි ඛනිජ තෙල් බිල ගෙවන්න ඕනෑ.

මේ තමයි, රටින් පිටතට විදේශ විනිමය යන ප්‍රධාන මූල දෙක; වියදම් දෙක. අපේ ආණ්ඩු කාලයේ 2011දී මේ වියදම් දෙක සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8ක් ගියා. 2010දී ඇමෙරිකානු ඩොලර් බිලියන 7.7ක් ගියා. 2013දී ඇමෙරිකානු ඩොලර් බිලියන 8.3ක් ගියා. 2014දී ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2ක් ගියා. ඒ කියන්නේ, ගත්ත විදේශ ණයවලට ණයවාරික හා පොලී ගෙවන්නත්, ඛනිජ තෙල් ලංකාවට ආනයනය කරන්නත් මහින්ද රාජපක්ෂ යුගයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2 හෝ 8.3ක් ගිහින් තිබෙනවා. මේ දෙක තමයි මේ රටේ ප්‍රධාන වියදම් වර්ග දෙක. තමුන්නාන්සේලාගේ රජය බලයට පත් වුණාට පස්සේ ණය වාරික, පොලී වැඩි වුණාට, ඊට වඩා වැඩි වේගයකින් ඛනිජ තෙල් මිල අසාමාන්‍ය ලෙස අඩු වුණා. ඒ නිසා 2015දී මේ වියදම් වර්ග දෙක සඳහා ගියේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 7.4යි; වියදම අඩු වුණා. 2016 වර්ෂයේදී ගියේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 6.9යි; තවත් අඩු වුණා. 2017 වර්ෂයේදී ගියේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 7.9යි. තවමත් මහින්ද රාජපක්ෂ යුගයේ තරම් විදේශ විනිමය පිට රටවලට ගෙවන්නේ නැහැ. මේක තමයි ඇත්ත.

2018 අවුරුද්දේ තෙල් මිල වැඩි වුණා. තෙල් මිල වැඩි වෙච්ච නිසා ඒ වියදම වැඩි වුණා, ඇමෙරිකානු ඩොලර් මිලියන 10,018 දක්වා. හැබැයි, අපේ ආණ්ඩු කාලයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 8.3ක් හෝ 8.4ක් ගෙවමින් තිබුණේ. ඒ ප්‍රමාණය

පැහැදිලිව අඩු වුණා. දැන් මේ අවුරුදු හතරම ගත්තොත් ගරු කථානායකතුමනි, මම ඉලක්කමක් කියනවා. ඕනෑ කෙනෙකුට ඒක වැරදි නම් නිවැරදි කරන්න පුළුවන්. 2011, 2012, 2013 හා 2014 කියන අවුරුදු හතරේම, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ අග භාගයේදී මේ ප්‍රධාන වියදම් දෙක සඳහා ගියේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 30,892යි. ලංකාවට තෙල් ගෙනෙන්නයි, පිට රටින් ගත්ත ණයවල වාරික හා පොලී ගෙවන්නයි ඒ අවුරුදු හතරට ගියේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 30,892යි. නමුත් මේ රජයේ අවුරුදු හතරට, ඒ ගණන ඇමෙරිකානු ඩොලර් මිලියන 32,396යි. ඒ අනුව වැඩිපුර ගිහිල්ලා තිබෙන්නේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,504යි. ඒ වැඩිපුර ගිය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,504න්, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක් හම්බන්තොට වරාය වික්කාම ලැබුණා. ඇත්ත ඉලක්කම් එක්ක බැලුවොත්, මොකුත් ප්‍රශ්නයක් තිබිලා නැහැ. නමුත් ඇත්ත ඉලක්කම් ගැන කවදාවත් මේ පාර්ලිමේන්තුවේ කථා වෙන්නේ නැහැ; විග්‍රහයක් වෙන්නේ නැහැ. ඒ නිසා අපට මුල, මැද හා අග හඳුනා ගන්න බැහැ. අද අර්බුදය ඇති වෙලා තිබෙන්නේ ඒ නිසා නොවෙයි. මේ නියෝගය ඉදිරිපත් කර තිබෙන්නේ, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සම්බන්ධයෙන්. ස්වෛරීත්ව බැඳුම්කර කියන්නේ, අපට වෙන ක්‍රමයකින් විදේශ ණය ගන්න බැරි වුණාම ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා ගිනි පොලියට ණය ගැනීමයි. ගිනි පොලියට ණය ගන්න වුණා, යුද්ධය ඉවර කරන්න. මහින්ද රාජපක්ෂ යුගයේ පළමුවෙන් ස්වෛරීත්ව බැඳුම්කර හඳුන්වා දුන්නේ, 2007දී. 2007දී ගත්තා ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක්. ඊට පස්සේ 2009දී ගත්තා, ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක්. 2010දී ගත්තා, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක්. 2011දී ගත්තා, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක්. 2012දී ගත්තා, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක්. ඊට පස්සේ 2014දී ගත්තා, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක්. අවුරුදු අටක් තුළදී මහින්ද රාජපක්ෂ රජය ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරලා ලබා ගත්තා, ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5ක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට තව තිබෙන්නේ විනාඩි තුනක් පමණයි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳමයි.

ස්වෛරීත්ව බැඳුම්කරවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 5,500ක් ලබා ගත්තා; බිලියනවලින්, 5.5යි. මහින්ද රාජපක්ෂ ආණ්ඩු කාලය තුළම ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරලා ලබා ගත්තේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5යි. යුද්ධය තිබුණු කාලයේ, ලෝක ඛනිජ තෙල් අර්බුදය තිබුණු කාලයේ, ලෝක ආහාර අර්බුදය තිබුණු කාලයේ, ලෝක මූල්‍ය අර්බුදය තිබුණු කාලයේ, ඒ සියලු අර්බුද යටතේ අපි ස්වෛරීත්ව බැඳුම්කරවලින් ගත්තේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5යි. තමුන්නාන්සේලා මේ ගැන අසීමිත ලෙස බැණ අඬගහලා, තමුන්නාන්සේලා බලයට ආවාට පස්සේ මොකද වුණේ? 2015දී, යූ එස් ඩොලර් මිලියන 2,150යි. 2016දී, යූ එස් ඩොලර් මිලියන 1,500යි. 2017දී, යූ එස් ඩොලර් මිලියන 1,500යි. 2018දී, යූ එස් ඩොලර් මිලියන 2,500යි. 2019 -මේ අවුරුද්දේ- මාර්තු මාසයේ යූ එස් ඩොලර් මිලියන 2,400යි. තමුන්නාන්සේලා දැනට අරගෙන තිබෙනවා, යූ එස් ඩොලර් මිලියන 10,050ක්. අවුරුදු අටකට මහින්ද රාජපක්ෂ යුගයේදී ස්වෛරීත්ව බැඳුම්කරවලින් ගත්තේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5යි. අවුරුදු පහක් යනකොට මේ රජය ලබාගෙන තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක්.

මේ වෙලා තිබෙන්නේ මොකක්ද කියන එක තමුන්නාන්සේලාට තේරෙන්නේත් නැහැ, රටට තේරෙන්නේත් නැහැ. අපේ මාධ්‍ය හිතවතුන්ටත් මේ තිබෙන අර්බුදයේ ස්වභාවය තේරුම් ගන්නත් අමාරුයි. එහි ප්‍රතිඵලය ලෙස වෙලා තිබෙන්නේ, දිගින් දිගටම රුපියල කඩා වැටීමත්, රටේ ආර්ථිකයේ ස්ථායීතාව ආරක්ෂා කරන්න බැරි වීමත්. රුපියල කඩා වැටීම කරනකොටගෙන ලංකා ඉතිහාසයේ අලුත් වාර්තාවක් පිහිටුවා තිබෙනවා. නිදහසින් පස්සේ ලංකා ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයකින් රුපියල කඩා වැටුණු ආණ්ඩු කාලය ලෙස තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලය ඉතිහාසයට එකතුවෙලා තිබෙනවා. රුපියල කඩා වැටීම නිසා පමණක් රටේ රාජ්‍ය ණය වැඩිවෙලා තිබෙනවා. රුපියල කඩා වැටීම නිසා 2015දී රාජ්‍ය ණය රුපියල් බිලියන 285.1යි; 2016දී රුපියල් බිලියන 186.6යි; 2017දී රුපියල් බිලියන 275.2යි; 2018දී රුපියල් බිලියන 1,063.2යි. රුපියල් බිලියන 1,760කින් ජාතියේ ණය බර වැඩිවෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, රුපියල බාල්දු වීම නිසා පමණක් රුපියල් බිලියන 1,760කින් ණය බර වැඩිවෙලා තිබෙනවා. හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ, AirLanka සමාගම, Mihin Air සමාගම, අකුරේගොඩ ආරක්ෂක සංකීර්ණය, නෙළුම් කුලුන, හම්බන්තොට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, හම්බන්තොට තාක්ෂණික උද්‍යානය යන මේ සියල්ලටම වැයවෙලා තිබෙන්නේ රුපියල් බිලියන 300යි. රුපියල බාල්දු වීම නිසා විතරක් රුපියල් බිලියන 1,760යි. මේ විනාශය නිසා පටාචාර ආර්ථිකයක් ඇතිවෙලා තිබෙනවා. පාස්කු ඉරිදා බෝම්බ පිපිරෙන්න කලින් මේ පාලනය හා මේ කළමනාකරණය යටතේ මේ රට සම්පූර්ණයෙන් අගාධයට ගෙන ගිහින් ඉවරයි. ඒ නිසා තමයි අපි ඔබතුමාගෙනුත් ඉල්ලා සිටියේ, 2019 අය වැය පිළිබඳව හා මේ කඩා වැටීම් පිළිබඳ වාර්තාවක් කැඳවන්නය කියලා. එසේ වාර්තාවක් කැඳවා, ආර්ථික සහන පැකේජයක් දීලා මේ රටේ ජනතාවට හුස්ම ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න කටයුතු කරන්නය කියමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට ගරු නවීන් දිසානායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.13]

**ගරු නවීන් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, මා මෙම විවාදයටම සීමා වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ඊයේ නොයෙක් අවස්ථාවල මේ සභාවේ

[ගරු නවීන් දිසානායක මහතා]

මගේ නම සඳහන් වුණා. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මා කැමැතියි.

කැබිනට් අමාත්‍යවරයකු වන රිසාඩ් බදියුදීන් මහතා පිළිබඳව පසුගිය දා මා කරන ලද සමහර ප්‍රකාශ ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති කිරීමට හේතු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, මා නිදහසේ සත්‍ය හඹා පියාසර කරන පක්ෂියෙක් වෙමි. - I am a free bird seeking after truth. මා දේශපාලනයෙන් ලබාගත් යම්කිසි කෘතහස්තභාවයක් ඇත්නම්, ඒ කෘතහස්තභාවයේ පදනම සත්‍යයයි. එම සත්‍ය ප්‍රිස්මය තුළින් මට පෙනෙන දේ මා භය නැතුව කියනවා. නමුත් මා එක දෙයක් කිව යුතුයි. අද අපේ රටේ ඇති වී තිබෙන ආන්දෝලනාත්මක අවිනිශ්චිතභාවයට එක් සාධකයක් නම්, දසලක්ෂ 22කට අධික ශ්‍රී ලාංකීය ජනතාව ඉතාම නීච ලෙස වර්ගීකරණය කිරීමයි. අපි සියලුදෙනාම ශ්‍රී ලාංකික ජාතින් ලෙස බලන්නේ, එක්කෝ සිංහල, එක්කෝ ද්‍රවිඩ, එහෙම නැත්නම් මුස්ලිම්, එහෙමත් නැත්නම් ක්‍රිස්තියානි හෝ කතෝලික ලෙසයි.

ගරු කථානායකතුමනි, සිංහලයකු වීම අපරාධයක් නොවෙයි. ද්‍රවිඩයකු වීම අපරාධයක් නොවෙයි. මුස්ලිම් ජාතිකයකු වීම අපරාධයක් නොවෙයි. නමුත් ත්‍රස්තයකු වීම අපරාධයක්. It is not a crime to be a Buddhist; it is not a crime to be a Tamil; it is not a crime to be a Muslim, Catholic or a Christian. But, it is a crime to be a terrorist. අප්‍රේල් 21 වන ඉරිදා ඇති වූ ම්ලේච්ඡ මිනිස් ඝාතනය ISIS නොහොත් Islamic State of Iraq and Syria නමැති ජාත්‍යන්තර ත්‍රස්තවාදී ව්‍යාපාරය විසින් හසුරුවනු ලැබූ ප්‍රහාරයක් බව අපි දන්නෙමු. ISIS කියන්නේ ජාත්‍යන්තර ත්‍රස්තවාදී ව්‍යාපාරයක්. ඔවුන් ඒ ත්‍රස්තවාදී ව්‍යාපාරය දියත් කරන්නේ ඉස්ලාම් ආගම තුළ මුවා වී ගෙනයි. ප්‍රභාකරන් ඔහුගේ ත්‍රස්තවාදය දියත් කළේ දෙමළ ජාතිවාදයේ හැංගිලායි. ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය අපි සම්පූර්ණයෙන්ම විනාශ කර පරාජය කළෙමු. විශේෂයෙන්ම ප්‍රභාකරන් කියන ඒ ම්ලේච්ඡ ත්‍රස්තයා ජනාධිපතිවරණයේදී මගේ පියා ගාමිණී දිසානායක මැතිතුමාත් ඝාතනය කළා.

ත්‍රස්තවාදයෙන් සිදු වෙන හානිය, ත්‍රස්තවාදයෙන් ඇති වන සංවේදී තත්ත්වය පුතෙක් වශයෙන් මම දන්නවා. මේ රටේ කාටවත් මට ඇඟිල්ල දිගු කරලා කියන්න බැහැ, මේ රටේ ත්‍රස්ත ක්‍රියාවකින් ඇති වුණු හානිය හා විනාශය ගැන මා දන්නේ නැහැ කියලා. අපි එදා පරාජය කළේ ද්‍රවිඩ ත්‍රස්තවාදය මිස ද්‍රවිඩ ජනතාව නොවෙයි. ද්‍රවිඩ ජාතිවාදයේ මුවාවෙන් ත්‍රස්තවාදයට පෙළඹුණේ නම් අපි ඒ අපරාධය මුලිනුපුටා දැමුවෙමු.

අපේ රටේ අප අතරම වෙසෙන කිසියම් මුස්ලිම් ජාතිකයෙක් විසින් මුස්ලිම් ආගමට මුවා වී ත්‍රස්තවාදය දියත් කළේ නම්, අපි ඔවුන්ව මුලිනුපුටා දැමිය යුතුයි. එය සර්ව සාධාරණ විශ්වාසයකි. මා නැවතත් කියන්නේ, අපරාධය වන්නේ යම් කිසි ජාතියක හෝ ආගමක උප්පැත්තිය ලැබීමෙන් නොව, ඒ ජාතිය හා ආගම මුවාවෙන් ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වීමයි.

කැබිනට් අමාත්‍ය රිසාඩ් බදියුදීන් මහතාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් මේ මැතිසබය තුළට පැමිණ තිබෙනවා. මේ අවස්ථාවේ රිසාඩ් බදියුදීන් මහතා සුද්ධ කිරීමට මට කිසිදු අවශ්‍යතාවක් නැත. නමුත් ඔහුට විරුද්ධව ඇති සියලු චෝදනා විමර්ශනයකොට එම විමර්ශනයේ ප්‍රතිඵලයක් හැටියට රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයා වැරැදිකරුවෙක් වේ නම්, සත්‍ය හඹා යන කුරුල්ලෙකු සේ මම ඔහුට දිය යුතු දඬුවම දිය යුතුයැයි පවසමි. විශේෂයෙන්ම රිසාඩ් බදියුදීන් මැතිතුමාට එල්ල වී ඇති චෝදනාවල යම් කිසි සත්‍යයක් තිබෙනවා නම්, යම් කිසි සාක්ෂියක් තිබෙනවා නම් එයට විරුද්ධව ඉස්සෙල්ලාම අත ඔසවන්නේ මම කියන එක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ වාගේම පුද්ගලයෙකුට විරුද්ධව ඒක පාක්ෂික ලෙස විනිශ්චයකරුවෙක්, ජූරි සභාවක් සහ වධකයා - judge, jury and executioner- වීමට ප්‍රයත්නයක් දරනවා නම්, මා තරයේ එම ප්‍රතිපත්තියට විරුද්ධ වන බව මේ අවස්ථාවේ කියන්න කැමැතියි. ශිෂ්ට සම්පන්න සමාජයක් එය පිළිගන්නේ නැහැ. විශේෂයෙන්ම නීතිඥවරයකු වශයෙන් හා නීති විශාරදයින්ගේ පරම්පරාවකින් එන පුද්ගලයෙක් වශයෙන් මම කියන්නේ, අපි සාක්ෂි සොයා ගෙන ඒ නිගමනවලට පැමිණිය යුතු බවයි.

ඒකයි අපේ මූලික නීතිය; ඒකයි අපේ ව්‍යවස්ථාව. මාගේ ප්‍රවෘත්ති footage එක එහි එක් සුළු අංගයක් පමණි. විශේෂයෙන්ම මේ මුළු සමාජයම එක් පුද්ගලයෙකුට වැරැද්ද පටවා, ඔහුව වැරදිකරු කිරීමට දරන උත්සාහය මම දැඩි ලෙස ප්‍රතික්ෂේප කරමි. එය ශිෂ්ටසම්පන්න සමාජයක කිසිසේත්ම පිළිගන්න බැරි ක්‍රියාවකි. බදියුදීන් ඇමතිතුමා වක්‍රව හෝ සක්‍රියව ත්‍රස්ත කල්ලිවලට අංශු මාත්‍රයක්වත් උදවු උපකාර කර ඇත්නම්, ඔහුට විරුද්ධව ප්‍රථමයෙන්ම අත ඔසවන්නේ මා බව මා නැවතත් පැහැදිලිව ප්‍රකාශ කරමි. එමනිසා අපට කරුණු ඉදිරිපත් කරන්න. අපි 18, 19 දිනවලදී මේ ගැන සාකච්ඡාවක් කරනවා; විවාදයක් කරනවා. ඒ වෙනකොට තමුන්නාන්සේලා ළඟ තිබෙන චෝදනා සාක්ෂි ඇතුව අපට ඉදිරිපත් කළොත්, අපි යම්කිසි ස්ථාවරවලට එන්න කැමැතියි කියන එක පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මෙම news item එකේ අන්තිමට මා සිනා වෙනවා පෙන්නුම් කරනවා. මම අන්තිමට කියන්නේ, "ඇත්තෙන්ම ජාතිවාදී දෙයක් එහෙම කරන එක" කියායි. එය කියන අතරේම මා හා මාධ්‍යවේදියා අතර ඉරියව්වලින් යම්කිසි පණිවුඩ හුවමාරුවක් සිද්ධ වුණා. මම ඒක පැහැදිලිවම ප්‍රකාශ කරනවා. අප දෙදෙනා අතර ඉරියව්වලින් යම්කිසි පණිවුඩ හුවමාරුවක් සිද්ධ වුණා. ඔහුගේ යම්කිසි ඉරියව්වකට මා සිනාසුණා මිස, පාස්කු ඉරිදා එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත් වූ අයට -අපේ ලාංකිකයන්ට හා සෙසු අයට- කිසිසේත්ම අගෞරව වන විධියට හෝ සමච්චල් වන විධියට මා ක්‍රියා කර නැති බව පැහැදිලිව කිව යුතුයි. මාගේ කථාවේ අර්ථය විකෘති කරනු පිණිස, එම දර්ශන ඉතාම සූක්ෂ්ම විධියට සංස්කරණය කර ඇති බව එය ප්‍රතිරූපණය කිරීමේදී ඕනෑම කෙනෙකුට දැකිය හැකියි. මෙය තත්පර ගණනක සංස්කරණ ප්‍රයෝගයක් වුවත්, තත්පර ගණනක විකෘතියකින් සමස්ත ජනතාව තුළම මා ගැන කලකිරීමක් ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳව ඔවුන් අනිවාර්යයෙන්ම දන්නවා. එම රූප රාමුවෙන් යම්කිසි පුද්ගලයෙකුට යම්කිසි කනගාටුවක් හෝ සිත් තැවිල්ලක් ඇති වූවා නම්, ඒ ගැන මා සමාව ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, අපගේ අසහාය ප්‍රවීණ ගායක, අල්හාජ් මොහිදීන් බෙග් මහතා ගැයූ ගීයක කොටසක් වන "සිනහවෙන් හෝ කථාවෙන් බෑ, මනින්නට මිනිසා" කියන එකයි අවසාන වශයෙන් මට කියන්නට තිබෙන්නේ. මගේ පියා වන දිවංගත ගාමිණී දිසානායක මැතිතුමා ඉතාම ප්‍රියමනාප, ලස්සන මුහුණක් තිබුණු, පිරිසිදු හදවතක් තිබුණු නායකයෙක්. නමුත් මගේ නුවරඑළියේ ජනතාව කියන්නේ මම වැඩිය හිනා වෙන්නේ නැහැ කියලායි. විශේෂයෙන්ම අද දින මාගේ හිනාවෙන් මාගේ චරිතය මනින එක දෛවෝපගත සිද්ධියක් බවට පත් වෙලා තිබෙන එක ගැන මා කනගාටු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු සීනිතම්බි යෝගේස්වරන් මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දහයක කාලයක් වෙන් කර තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට ලබා දී තිබෙන්නේ විනාඩි දහයද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, විනාඩි දහයයි.

[අ.භා.12.22]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, අද දින මේ විවාදයේ දී සාකච්ඡා කරන්නේ, විදේශ විනිමය පනත යටතේ නියෝගය ගැන වුණත්, මංගල සමරවීර මුදල් ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශ සම්බන්ධයෙන් යමක් කිව යුතුව තිබෙනවා. පළමුවෙන්ම ඔහු කියා තිබෙනවා, මේ ආණ්ඩුව කාලයේ දර්ශක ඉතා හොඳ තත්ත්වයක තිබෙනවාය කියලා. එතුමා මේ කථා කරන්නේ දර්ශක ගැනද, වෙන දෙයක් ගැනද කියලායි මම කල්පනා කළේ. මේ ලංකාව ගැන තිබෙන දූෂණ දර්ශකය මේ ආණ්ඩුව කාලයේ ඉහළ ගිහිල්ලා. දූෂණය වැඩියි. ඊළඟට, මානව සංවර්ධන දර්ශකය පහළ වැටිලා. ඊළඟට, රාජ්‍ය වර්ධන වේගය 2016න් පටන් ගෙන ක්‍රමයෙන් අඩු වෙලා අවසානයේ දී 3.2ට අඩු වෙලා තිබෙනවා. මෙම දර්ශක ගැනද මංගල සමරවීර මුදල් ඇමතිවරයා මේ කියන්නේ? ඇත්තෙන්ම මොහුගේ මුදල් ඇමතිකම පිටුපස සිටින නිලධාරීන්ට මම කියනවා, මීට වඩා හොඳ දර්ශක තොරතුරු ඇමතිතුමාට දෙන්න කියලා. එහෙම නැත්නම් මොහු විහිළුකාරයෙක් බවට පත් වෙයි.

ඊ ළඟට, මේ ආණ්ඩුව නීතිගරුක ලෙස, ශීලාචාර ලෙස ක්‍රියා කරන ආණ්ඩුවක් බව ලෝකයම පිළිගත්තාය කියලා කියනවා. 2015 දී ඇමෙරිකා එක්සත් ජනපදයට වහල්කමට ගිහිල්ලා ගිවිසුමක් අත්සන් කරපු මේ මුදල් ඇමතිවරයා එය කරණ කොටගෙන ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබුණා වූ නම්බුනාමය මේ රටට ලැබුණු විශිෂ්ට ගෞරවයක් හැටියට හුවා දැක්වීමෙන් ඔහු කරන්නේ සම්පූර්ණයෙන්ම මේ රටම නොමඟ යැවීමක්. ඇත්තටම ජිනීවාවලදී අත්සන් කර තිබුණු ගිවිසුම මේ රටේ ස්වෛරීභාවයට සහ අපේ නිදහසට තර්ජනයක්. නමුත්, එතුමා ගෞරවයක් හැටියට සලකන්නේත්, ශීලාචාර ලෝකයේ පිළිගැනීමක් හැටියට සලකන්නේත් ඒකම තමයි.

ඊ ළඟට, එතුමා මේ සියලුම දේවල් දින 51 සිද්ධියට ලඝු කළා. 2017 වර්ෂයේ ඉඳලා 2018 වර්ෂය දක්වාත්, 2018 වර්ෂය තුළත් ඇති වූ ආර්ථික වර්ධන වේගයේ අඩු වීම මේ දින 51ට ගණන් හදලා පෙන්වන්න කියලා මුදල් ඇමතිතුමා හැටියට එතුමාට අපි අභියෝග කරනවා. උත්තර දෙන්නේ එතුමා නොවෙයි නම්, උත්තර දෙන්නේ ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා නම්, එතුමා හෝ කරුණාකර 2018 වර්ෂය තුළ ආර්ථික වර්ධන වේගයේ පහත වැටීම කොපමණද කියලා මේ දින 51ට ගණන හදලා පෙන්වන්න. එසේ පෙන්වන්න බැරි වුණොත් ඔබගේ ප්‍රලාපවලට මේ රටේ කවුරුවත් රැවටෙන්නේ නැති බවත් මම කියන්න ඕනෑ. එම දින 51 දී මේ රටේ ඇති වූ දේශපාලන විපර්යාසය අපට අහිමි කරන්න, ජනතාවට අහිමි කරන්න, බටහිර තානාපති කාර්යාලත් එක්ක එකතු වෙලා එක්තරා විධියකට කුමන්ත්‍රණකාරීව ක්‍රියා කරපු පිරිස අද කුමන්ත්‍රණයක් ගැන නඟන චෝදනා සම්පූර්ණයෙන්ම හිස් කථා බව අප කිව යුතුව තිබෙනවා. පාස්කු ඉරිදා එල්ල වූ බෝම්බ ප්‍රහාරත් දැන් එක්තරා විධියකට ආණ්ඩුව තමන්ගේ ප්‍රයෝජනයට ගනිමින් සිටිනවා. මේ මුදල් ඇමතිවරයා කියනවා, "පාස්කු ඉරිදා එල්ල වූ බෝම්බවලිනුත් අපි අමාරුවේ වැටුණා, ගංවතුරෙනුත් අපි අමාරුවේ වැටුණා, නියඟයෙනුත් අපි අමාරුවේ වැටුණා, දින 51 සිද්ධිය නිසාත් අපි අමාරුවේ වැටුණා" කියලා. දැන් මේවා ඔක්කෝම එකතු කර බලා කරුණාකර අපට කියන්න, මේ ආණ්ඩුවේ මොන ප්‍රතිපත්තියද මේ රටේ ආර්ථික වර්ධන වේගයට උදව් වුණේ කියලා. අන්න එය අපට පැහැදිලිව කියනවා නම් මේ දින 51 සිද්ධියයි, පාස්කු ඉරු දින එල්ල වූ බෝම්බ ප්‍රහාරයි, නියඟයයි, ගංවතුරයි ගැන ඔය කියන කථා අපට තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට, මේ ආණ්ඩුව 1977 දී ආරම්භ කරපු ඒ, ඊනියා නිදහස් ආනයන ප්‍රතිපත්තිය, ඊනියා නිදහස් මුදල් වටිනාකම තීරණය කිරීමේ ප්‍රතිපත්තිය, ඊනියා නිදහස් මේ රටේ මිනිසුන්ට විදේශ විනිමය මේ රටින් බැහැර ගෙන යෑමට තිබෙන අයිතිය ගැන මම කියන්න කැමැතියි. මේවා තමයි නිදහසේ නාමයෙන් එදා නිදහස් ආර්ථිකයක් හැටියට නියම කළේ. ඒ, මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුවයි. දැන් බලන්න, අපි මොන වාගේ උගුලකටද අහු වෙලා තිබෙන්නේ කියලා. එක පැත්තකින් රුපියලේ වටිනාකම දිගටම වැටීගෙන යනවා, 77 ඉඳලාම. අනෙක් පැත්තෙන් ඒ ප්‍රමාණයට අපේ ණය බර වැඩිවනවා. තවත් පැත්තකින් අපේ නිදහස් ආනයන ප්‍රතිපත්තිය මත ඕනෑම දෙයක් මේ රටට ගෙන්වීමේ අයිතිය දීලා තිබෙනවා. එම නිසා මේ රටින් බැහැරව යන විශාල විදේශ විනිමය ප්‍රමාණය නිසා රුපියලේ වටිනාකම තවත් වැටෙනවා. රුපියලේ වටිනාකම තවත් වැටෙන ප්‍රමාණයට අපේ ණය බර තවත් වැඩිවනවා. ඒ වාගේම මේ රටේ ජනතාවගේ ජීවන මට්ටමත් කඩා වැටෙනවා. මෙන්න මෙබඳු වූ උගුලක අපව අසු කර තිබෙනවා, මේ ඊනියා නිදහස් ප්‍රතිපත්තිය තුළ. එම නිසා අද මේ ආණ්ඩුවට අවශ්‍යව තිබෙන්නේ ආපසු හැරී බලන්නයි. මේ ආර්ථික ප්‍රතිපත්ති නිසා මේ රටට අවසාන වශයෙන් ලැබුණු ප්‍රතිඵලය මොකක්ද? ප්‍රතිඵලයක් පෙන්වන්න බැරි නම්, ප්‍රතිපත්තියේ තිබෙන ලොකුකම කුමක්ද කියා මම අහන්න කැමැතියි.

ප්‍රතිපත්ති හොඳයි; දර්ශක හොඳයි. නමුත් මේ රටේ ජීවන මට්ටම පහළට එනවා, ජීවන වියදම ඉහළට යනවා. ඒ ඉහළ යන ජීවන වියදමට ප්‍රමාණවත් ආදායම් මේ රටේ ජනතාවට අහිමි වෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ මේ ආණ්ඩුව අනුගමනය කළ ප්‍රතිපත්තිවල මහඟු වටිනාකම කුමක්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you may continue.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශ සංචිතය යහපත් තත්ත්වයක තිබෙනවාය කියා මුදල් ඇමතිතුමා කිව්වා. විදේශ සංචිතය තිබෙන්නේ ණය උඩයි. ණය උඩ තිබෙන ඒ විදේශ සංචිතය, අද යහපත් කියලා කියන තරමට මුදල් ඇමතිතුමාට ලජ්ජාවක් නැහැය කියන කාරණය මම කිව යුතුයි.

මේ විදේශ මුදල් මොන මූලාශ්‍රවලින් එනවාද, ඒවා මොන තැන්වලට යනවාද, ඒවා කුමක් සඳහා පාවිච්චි වෙනවාද කියා බලන්න තමයි මේ රටේ විදේශ විනිමය ලැබීම, විදේශ විනිමය පිටවීම ගැන පාලනයක් තිබුණේ; නියාමනයක් තිබුණේ. ඒ නියාමනය, ඒ පාලනය ඉවත් කරලා තමුන්නාන්සේලා කළේ මේ රටේ පාස්කු ඉරිදා සිදුවුණු බෝම්බ පිපිරීමට උදවු කිරීමක්. ඒක දැනගෙන උදවු නොකළා වෙන්න පුළුවන්. නමුත් මේ විදේශ මුදල් පාස්කු දින සිදුවූ බෝම්බ පිපිරීමට සම්බන්ධයි කියා මේ වනවිට පෙනී යමින් තිබෙනවා. එහෙම නම්, මේ රෙගුලාසි ආපසු පැනවීම ගැන තමුන්නාන්සේලා නැවත හිතන්න ඕනෑ. මේ විදේශ විනිමය ලංකාවට එන මූලාශ්‍ර ගැන සොයා බලන්න ඕනෑ. ඒවා යන තැන් සෙවීම ගැන තමුන්නාන්සේලා නැවත හිතන්න ඕනෑ. ඒ වෙනුවෙන්, තමුන්නාන්සේලාගේ ඔය ඊනියා නිදහස් ප්‍රතිපත්තිය වෙනස් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි.

ස්විට්සර්ලන්තයේ බැංකුවක -HSBC බැංකුව හෝ වෙනත් බැංකුවක- මෙන්න මේ මේ අයට, මෙන්න මේ මේ මුදල් ප්‍රමාණයන් තිබෙනවාය කියා පුවත් පතක පළ වෙලා තිබුණු කාරණාවක් මම මේ ආණ්ඩුව බලයට ආ කාලයේම පෙන්වා දුන්නා. එවකට සිටි මුදල් ඇමතිතුමාට මේ කාරණය ඉදිරිපත් කරලා මම කිව්වා, මේ උදවියගේ මුදල් පිටරට මේ බැංකුවේ තිබෙන්නේ නීත්‍යනුකූලව රටින් බැහැර කරගෙන ගිහිල්ලාද, එහෙම නැත්නම් නීති විරෝධීව අරගෙන ගිහිල්ලාද, මේ මුදල්වල අයිතිකාරයන් මේ මුදල් ප්‍රමාණය අනුව ආදායම් බදු ගෙවා තිබෙනවාද කියා සොයා බලන්නය කියා. මේ මුදල් නිසියාකාරව ගෙනයන ලද මුදල් නොවෙයි නම්, මේවා කළු සල්ලි හැටියට මේ රටින් පිටට ගෙන ගිය අයථා ඉපැයීම් නම්, මේ මුදල් රාජසන්තක කරලා ආපසු රටට ගැනීමට ක්‍රියා කරන්නය කියාත් මම ඉල්ලා සිටියා. මම තුන්වැනි අවුරුද්දේ මේ ගැන නැවත ඇහුවා. එහිදීත් මුදල් ඇමතිවරයා ලෙස සිටි එක්කෙනා කිව්වා, "මේකට නීතියක් නැහැ" කියා. අපේ රටේ පුරවැසියෝ මේ රටින් කොයි විධියටද මේ මුදල් වෙනත් රටකට යැව්වේ, ඒවා කළු සල්ලිද, අයථා ඉපැයීම්ද, එහෙම නැත්නම් ඒවාට නිසි ආදායම් බදු ගෙව්වාද කියා සොයා බලන්න අපට නීතියක් නැහැය කියා කියන තරමට මේ ආණ්ඩුව ඇත්තටම නිර්ලජ්ජිත වෙලා තිබෙනවා.

එපමණක් නොවෙයි, මේ ආණ්ඩුවේ ඇත්ත කථාව තමයි ඉහළ පන්තියට; පොහොසත් පන්තියට හිතේ හැටියට වියදම් කරන්නට, ඒ මුදල් නිදහසේ පිටරට ගෙනියන්න ඉඩ දීලා තිබීම. ඇත්ත තමයි, ප්‍රධාන වියදම් රජයේ. නමුත් රජයේ වියදම් ඇරුණාම, විදේශ මුදල් වියදම්, මේ රටේ කළු සල්ලිකාරයන්ගේ, පොහොසතුන්ගේ ඒ වියදම්වල බරත් එන්නේ රුපියලටයි. රුපියලේ වටිනාකම තවත් පහළට වැටෙන හැම වෙලාවකම මේ රටේ පොදු ජනතාව අද කර මත තබාගෙන ඉන්නේ මේ රටේ පොහොසතුන්ගේ කළු සල්ලිකාරයන්ගේ වියදම් බව කියනවා. මේක කළු සල්ලිකාරයන්ගේ ආණ්ඩුවක්ය කියන කාරණය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු අශෝක් අබේසිංහ රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.33]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශ විනිමය පනත යටතේ නියෝගය සහ විසර්ජන පනත යටතේ යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අද මෙම විවාදය පැවැත්වෙන අවස්ථාවේදී වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආසියානු රටක් විධියට අපේ රටට අද විශේෂ දවසක්. අපේ අසල්වැසි ඉන්දියාවේ මෝදි අග්‍රාමාත්‍යතුමා මෙවර මැතිවරණයෙන් ආසන 300කට වැඩි ප්‍රමාණයක් ලබාගෙන විශිෂ්ට ජයග්‍රහණයක් ලබා තිබෙනවාය කියා අපට දැන ගන්න ලැබී තිබෙනවා. එතුමාට පෞද්ගලිකව සුබ පැතීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම අපේ ප්‍රධානම අසල්වැසි රාජ්‍යයේ ඒ ජයග්‍රහණය වෙනුවෙන් රජයක් වශයෙනුත් අපි සුබ පතන්න ඕනෑ.

විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමා මෙවර ඉතාම සමබර අය වැයක් ඉදිරිපත් කර තිබුණා. ඒ අය වැය ඉදිරිපත් කරලා සුළු කාලයක් ගත වුණු තැන, විශේෂයෙන් අපේ රටේ පසුගිය පාස්කු ඉරිදා ඇති වුණු ඛේදවාචකයත් සමඟ ආර්ථිකයට යම්කිසි බලපෑමක් ඇති වෙලා තිබෙනවාය කියා අපි කවුරුත් දන්නවා. අපේ රටේ ආදායමින් සියයට 43ක් ලැබෙන්නේ රේගුවෙනුයි. සියයට 37ක් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවා. සියයට 11.5ක් මත්පැන් සඳහා අයකරන බදුවලින් ලැබෙනවා. සියයට 8.5ක් රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතනවල ලාභය තුළින් ලැබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ අපේ රටට දිනපතා ලැබෙන ආදායමේ යම්කිසි අඩුවක් වෙලා ඇතිය කියා මම හිතනවා. විශේෂයෙන් මාසයක් තුළ ආනයනය සහ අපනයනය අඩු වීම නිසා අපට දිනපතා රේගුවෙන් ලැබෙන බිලියන තුනක මුදල වාගේම ආදායම් බදුවලින්, අනෙකුත් ආදායම්වලින් ලැබෙන මුදල්වල අඩු වීමක් වෙලා ඇති. ඒ කෙසේ වෙතත්, රජයක් වශයෙන් මුදල් ඇමතිතුමා තීන්දු කර තිබෙනවා, මෙවර අය වැයෙන් ඉදිරිපත් කළ "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහනත්, "ගම්පෙරළිය" වැඩසටහනත් අඛණ්ඩව ක්‍රියාත්මක කරන්න. ඒ තීන්දුව ගැනීම පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමාට අපි සුබ පතනවා. එම වැඩසටහන් දෙකම මේ අවස්ථාව වන විට දිවයින පුරා ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වන බවත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, රජය මෙම සංවර්ධන වැඩකටයුතු ක්‍රියාත්මක කරගෙන යන අතරතුර සහනාධාර ලබා දීමත් සිදු කරනවා. මෙවර රුපියල් බිලියන 430ක් -රුපියල් කෝටි 43,000ක්- සහනාධාරවලට වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම පොහොර සහනාධාරය, සමෘද්ධි සහනාධාරය වැනි සහනාධාරවලට මුදල් වෙන් කර තිබෙනවා. මෙවැනි ආර්ථික ප්‍රශ්නයක් ඇති වුණු අවස්ථාවේදී පවා ඒ සහනාධාරත් කප්පාදු නොකර, තවත් හය ලක්ෂයකට සමෘද්ධිය ලබා දීමේ වැඩසටහනත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි මුදල් අමාත්‍යවරයාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ රට ගෙන යන මේ ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක, ජාත්‍යන්තර මූල්‍ය අරමුල අපේ රට ණය ගෙවීමට මනා හැකියාවක් ඇති රටක් ලෙස තීන්දු කරලා, පසුගිය දින ඔවුන්ගේ අවසන් ණය වාරිකය නිදහස් කිරීමට තීන්දු කළා. එයත් අප රජය ලබා ගත් විශේෂ ජයග්‍රහණයක්. ඔවුන්ගේ අවසන් ණය වාරිකය මුදා හැර තිබෙනවා. ඒ වාගේම අපේ අවට රාජ්‍යයන් අපත් සමඟ ඉතා මිතුරු තත්ත්වයකින් සිටිනවා. ආසියාවේ ප්‍රධාන බලවතුන් වන ඉන්දියාව සහ චීනය විශේෂයෙන්ම අපේ රටේ ආර්ථික මිතුරන් ලෙස සලකන්න පුළුවන්. ඒ වාගේම අපට ලෝකයේ කිසිම ආර්ථික හතුරෙක් නැහැ. පසුගිය දින අතිගරු ජනාධිපතිතුමා චීනයේ සංචාරයේ යෙදුණා. මමත් ඒකට සහභාගි වුණා. ඒ සංචාරයේදී චීන ජනාධිපතිතුමා අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි, අපේ රටට ණය නොවන, ප්‍රදාන ලබා දෙන්න පොරොන්දු වුණා. එයත් අපි ලබා ගත් ජයග්‍රහණයක්. විශේෂයෙන්ම ඒ අවස්ථාවේදී යුවාන් මිලියන 100ක ක්ෂණික ආධාරයක් ලබා දෙන්න එතුමා පොරොන්දු වුණා. ඒ වාගේම පොලීසිය සඳහා ජීප් රථ සියයක් ලබා දෙන්නත්, අනෙක් අවශ්‍ය දේවල් ලබා දෙන්නත් පොරොන්දු වුණා. විශේෂයෙන්ම අපේ ආසියාවේ ප්‍රධාන රටවල් දෙක වන ඉන්දියාව සහ චීනය අපේ ආර්ථික මිතුරන් ලෙස අපට සලකන්න පුළුවන්. අපේ රටට ආර්ථික මිතුරන් මිස ආර්ථික සතුරන් නැති බවත් මම විශේෂයෙන්ම ප්‍රකාශ කරන්නට ඕනෑ.

අපි අය වැය ඉදිරිපත් කළාට, අතීතයේ ඉඳලා බලපුවාම අය වැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10ත් 15ත් අතර පමණ ප්‍රමාණයක් වසර අවසානයේ අපට ලැබෙන්නේ නැති බව පෙනෙනවා. එවැනි තත්ත්වයක් තුළත්, මෙවැනි ඛේදවාචකයක් සිදුවෙලා රටේ ආර්ථිකය පසුබාන තත්ත්වයක් තුළත් ජනතාවට සහනාධාර ලබාදෙමින්, අපි ආරම්භ කළ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමටත් මුදල් අමාත්‍යවරයා සහ මුදල් අමාත්‍යාංශය ගන්නා උත්සාහය ගැන විශේෂයෙන්ම අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

මම අද ලංකා බැංකුවේ සභාපතිවරයාට කථා කර ඇහුවා, "අප්‍රේල් මාසයේ, - මම පසු ගිය වසරේත් මේ ගැන සොයලා බැලුවා. - 01වෙනි දා සිට 15වෙනි දා දක්වා දින 15 තුළ ATM සහ CDM මඟින් මුදල් කොපමණ අරගෙන තිබෙනවාද, මුදල් කොපමණ තැන්පත් කර තිබෙනවාද?" කියා. මේක අපේ රටේ ජනතාව අතර මුදල් ගැවසෙනවා කියා කියන්න හොඳ උදාහරණයක්. විශේෂයෙන්ම මේ දින 15 තුළ, 2019 අප්‍රේල් 01වෙනි දා සිට අප්‍රේල් 15වෙනි දා දක්වා ලංකා බැංකුවෙන් පමණක් රුපියල් බිලියන 45.8ක මුදලක් ATMsවලින් ජනතාව ලබාගෙන තිබෙනවා. ඒ වාගේම රුපියල් බිලියන 27.1ක මුදලක් ඔවුන් තැන්පත් කර තිබෙනවා. ඒ කියන්නේ ATMsවලින් සහ CDMsවලින් මුදල් ලබා ගැනීම සහ තැන්පත් කිරීම හරහා රුපියල් කෝටි 7,300කට ආසන්න මුදලක් සංසරණයවෙලා තිබෙනවා. මෙය පසු ගිය වසරේ රුපියල් කෝටි 5,300යි තිබුණේ. ඒ රුපියල් කෝටි 5,300 තුළ මුදල් ලබා ගැනීම් තිබුණා රුපියල් කෝටි 2,100ක්. ඒ වාගේම මුදල් තැන්පත් කිරීම් විශාල වශයෙන් තිබුණා. රුපියල් කෝටි 5,300 වෙනුවට මේ වසරේ රුපියල් කෝටි 7,300ක මුදලක් ලංකා බැංකුවේ ATMs හරහා පමණක් ඒ දින 15 තුළ ගනු දෙනු වීම ඉතාම සාධනීය තත්ත්වයක්. ඒ අනුව පසු ගිය වසරට වඩා මේ වසරේ ජනතාවගේ ආර්ථිකය ඉහළ මට්ටමකට ගියා කියා අපට මේ අවස්ථාවේදී කියන්නට පුළුවන්.

විශේෂයෙන්ම අපි මෙවර ජනතා හිතකාමී අය වැයක් ඉදිරිපත් කළා. මෙවැනි ආර්ථික ප්‍රශ්නයක් තිබියදීත් දිගින් දිගටම ජනතාවට පහසුකම් සලසාගෙන ඉදිරියට යාමට මුදල් ඇමතිතුමා ගත් පියවර සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. ඒ වාගේම මෙවර අය වැයෙන් ණය ලබා ගැනීමේ සීමාව රුපියල් කෝටි 210,000ක් දක්වා අනුමත කරගෙන තිබෙනවා. මේ වසරේ රුපියල් කෝටි 210,000ක ණය ගන්නට ඕනෑ. ඒ වාගේම අපට රුපියල් කෝටි 215,000ක මුදලක් ණය ගෙවන්නට තිබෙනවා.

ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. දැනට අපේ රටේ ඇමෙරිකානු ඩොලර් බිලියන 8කට ආසන්න විදේශ සංචිත ප්‍රමාණයක් තිබෙනවා. එයින් මාස 5ත් 6ත් අතර කාලයක් භාණ්ඩ ආනයනය කිරීමේ හැකියාව තිබෙනවා. මම හිතන විධියට මෙවැනි තත්ත්වයක් තුළ රටේ ආර්ථිකය කළමනාකරණය කිරීමට ඒකත් විශේෂ උදවුවක් වෙනවා. විශේෂයෙන්ම පසු ගිය වසරේ අපේ ආනයනයට -පිට රටින් බඩු ගෙනෙන්නට- ඇමෙරිකානු ඩොලර් බිලියන 21.9ක් පමණ වියදම් වුණා. අපේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 11යි තිබුණේ. ඒ අනුව, ආනයන සහ අපනයන අතර විශාල පරතරයක් තිබෙනවා. අපේ රට නිදහස ලබා ගත්තාට පසුව මේ වසර 70 තුළ වසර 5ක් පමණයි ආනයන සහ අපනයන අතර පරතරය අපට වාසිදායක තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. 1950දී අපේ ආනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 246ක් තිබුණා. අපේ අපනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 296ක් තිබුණා. ඒ අනුව 1950දී ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක වාසිදායක තත්ත්වයක් තිබුණා. නමුත් මේ වසර වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක අවාසිසහගත තත්ත්වයක් අපේ ආනයන සහ අපනයන පරතරය තුළ තිබෙනවා. ඒ අනුව, රටේ ආදායම වාගේ දෙගුණයක වියදමක් තිබෙන තත්ත්වයක් තිබෙන්නේ.

පසු ගිය අවුරුද්දේ අපේ දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 88යි. ලෝකයේ පොහොසත්ම පුද්ගලයාගේ වත්කම ඇමෙරිකානු ඩොලර් බිලියන 106යි. ලෝකයේ පොහොසත්ම පුද්ගලයාට වඩා අඩු වත්කමක් තිබෙන රටක, ආදායම වාගේ දෙගුණයක වියදමක් තිබෙන රටක ආර්ථිකය සමබරව පවත්වාගෙන යාම සහ ජනතාවගේ ජන ජීවිතය සාර්ථකව පවත්වාගෙන යමින් ආර්ථිකය හැසිරවීම පිළිබඳව විශේෂයෙන් මුදල් ඇමතිතුමාටත්, රජයටත්, මුදල් අමාත්‍යාංශයටත් ස්තුතිය පුද කරන්නට ඕනෑ.

මේ වන විට අපේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000ක් බවට පත්වෙලා තිබෙනවා. මේක දියුණු තත්ත්වයකට ගන්න නම් අපි මේ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 12,000ට වැඩි ප්‍රමාණයකට ගෙනෙන්නට ඕනෑ. ඒ සඳහා රජය ගෙන යන වැඩ පිළිවෙළට සියලුම මන්ත්‍රීවරුන් ඇතුළු සාමාන්‍ය ජනතාව සහයෝගය ලබා දෙයි කියා විශේෂයෙන්ම මම බලාපොරොත්තු වෙනවා. මෙවැනි ආර්ථික තත්ත්වයක් තුළ ආර්ථිකය සමබරව පවත්වාගෙන යාමට මුදල් අමාත්‍යාංශයෙන් ගන්නා ලද විශේෂ වැඩ පිළිවෙළ සම්බන්ධව නැවත වරක් මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.43]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දිනයේදී ගැසට් නිවේදනයක් හැටියට 2019 අවුරුද්ද සඳහා

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සඳහා සහ එවැනි නිකුතුන් සම්බන්ධයෙන් අනේවාසික ආයෝජකයන් හට අදාළ යම් ගෙවීමක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට අවසර ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන මේ ගැසට් නිවේදනයත්, විසර්ජන පනත යටතේ යෝජනා කීපයකුත් පිළිබඳව කෙරෙන විවාදයට සම්බන්ධ වීමට ලැබීම සතුටු වෙනවා. මම මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී කිව්වා, අප්‍රේල් 21 ප්‍රහාරයට කලින් ඉඳලා රටේ ආර්ථිකය මෙහෙයවීම තිබුණේ යහපත් මට්ටමක නොවෙයි කියා. පසු ගිය කාලයේ අපේ රටේ කොටස් වෙළෙඳ පොළ ඉතාමත් අයහපත් අන්දමට කඩුගෙන වැටුණා, ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටුණා, කොටස් වෙළෙඳ පොළේ හිටපු ජාත්‍යන්තර ආයෝජකයින් රටෙන් මුදල් විශාල ප්‍රමාණයක් එළියට ගෙන ගියා. අද වෙනකොට අපි ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කර අපේ ණය අර්බුදය කළමනාකරණය කරන්න උත්සාහ කරනවා නම්, අපට විශ්වාසයක් තිබෙන්න ඕනෑ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවකදී අපි ඉල්ලන ණය වෙනුවෙන්, අපි ඉල්ලන බැඳුම්කර වෙනුවෙන් කවුද මේ රටට ආයෝජනය කරන්න ඉන්නේ කියා. මොකක්ද, ඒ ආයෝජකයින්ට අපි දෙන සහතිකය? අපි මරා ගන්නේ නැති, සහජීවනය තිබෙන, අපේ රටේ සිටින සියලු ජනතාව ජනතාව හැටියට පිළිගන්න රටක්ද? එහෙම නැත්නම්, මරාගන්න, යුද වදින, වර්ගවාදී, ජාතිවාදී, මානසිකත්වයෙන් පෙළෙන රටක්ද?

මොනම රටකටවත් අස්ථාවර දේශපාලන වටපිටාවක් ඇතුළේ, අස්ථාවර ආර්ථික වටපිටාවක් ඇතුළේ ආයෝජකයෝ හැටියට එන්න පුළුවන්කම තිබෙන්නේ කළු සල්ලි සුදු කරන උදවියට විතරයි. අනාවරණය කරන්න බැරි ඉපැයීම් ලංකාවේ ආර්ථිකයට එන්න පුළුවන් ඉඩකඩ වැඩියෙන්ම තිබෙනවා. පසු ගිය කාලයෙත් එහෙම ආපු ඒවා තිබෙනවා. නමුත් මේ තත්ත්වය යටතේ දැන් ලංකාවට එන්නේ එහෙම ආයෝජකයෝ මිසක පිරිසිදු, පිළිවෙළකට වැඩ කරන, ආයෝජන එන්නේ නැහැ. ඔබතුමන්ලා රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට ජාත්‍යන්තර ප්‍රජාවට හෝ, ජාතික ව්‍යාපාරිකයින්ට හෝ, ව්‍යවසායකයින්ට හෝ දීලා තිබෙන සහතිකය මොකක්ද, අපේ රටේ මේ ඇති වුණු තත්ත්වයත්, මීට කලින් ඇති වෙමින් තිබුණු තත්ත්වයත් නිසා ආයෝජනවලට, ව්‍යාපාරවලට ස්ථාවරභාවක් තිබෙනවා කියා. එහෙම එකක් නැහැ. මේ ආණ්ඩුව, ආණ්ඩුවක් හැටියට ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා වාගේම ලෝකයෙනුත් ප්‍රතික්ෂේප වෙලා ඉවරයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ.

අප්‍රිකානු මහාද්වීපයේ සමහර රටවල් මේ වර්ගවාදී, ගෝත්‍රවාදී විධියට මරා ගන්න, ගහ ගන්න හැටි අපි දුටුවා. රුවන්ඩාව උදාහරණයක්. හුටු - ටුට්සි ගෝත්‍රීන් මරා ගත්තා. අපට දිශාවන් දෙකක් තිබෙනවා. අපට ඕනෑ නම් සිංහල ජාතිය මහා ජාතිය කියා, මුස්ලිම් සුළු ජාතිය කියා, දෙමළ සුළු ජාතිය කියා, බර්ගර් - මැලේ සුළු ජාතිය කියා මරා ගන්න තැනට යන්නත් පුළුවන්. අපි ඒ මානසිකත්වයෙන් මිදිලා රටක්, ජනතාවක් හැටියට එකතු වෙලා ඉදිරියට යන්න ඕනෑ. මේ අපේ රට. මේක ශ්‍රී ලංකාව. ශ්‍රී ලංකාවේ අපි සියලු දෙනා මේ සංවර්ධනයට දායක වෙන්න ඕනෑ. මේ ආර්ථික අර්බුදය අපි කාගෙත් ජනතාවගේ දරුවන්ට අනාගතයේදී බලපානවා. අපි කවුරුත් මේකට එක්කෙනා වාගේ මුහුණ දෙමුද කියන ප්‍රශ්නයේදී අපි ඉන්නේ මොන අන්තයේද, මොන ස්ථාවරයේද, ආණ්ඩුව ඉන්නේ මොන ස්ථාවරයේද, විපක්ෂය ඉන්නේ මොන ස්ථාවරයේද?

ජනතාවට නායකත්වය දෙන අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ එකට සිටිනවාද, බෙදිලා සිටිනවාද කියන එක රටට පෙනෙන්න ඕනෑ. අපට බෙදෙන්න පුළුවන් අවස්ථා, වෙනත් ඕනෑතරම් උදාහරණ තිබෙනවා. අපිට විවෘත ආර්ථිකය ගැන ප්‍රතිපත්තිමය වශයෙන් බෙදෙන්න පුළුවන්. ආණ්ඩුව විවෘත ආර්ථිකය ගෙනාවා. අපි විවෘත ආර්ථිකයට විරුද්ධයි. ජනතා විමුක්ති පෙරමුණ පෞද්ගලීකරණයට එකඟ නැහැ. ආණ්ඩුව පෞද්ගලීකරණය කරනවා. අපි එයට එකඟ නැහැ. නාස්තිය - දූෂණය ගැනත් එහෙමයි. ආණ්ඩුව හොරු ආරක්ෂා කරනවා. අපි එකඟ නැහැ. ඒවා වෙනම කථා. මහ බැංකු බැඳුම්කර වංචාවේ චූදිත අර්ජුන් මහේන්ද්‍රන් දැන් පස්ස පැත්තෙනුත් හිනා වෙනවා, අධෝමුඛයෙනුත් හිනා වෙනවා. පාර්ලිමේන්තුවේ කවුරුවත් දැන් අර්ජුන් මහේන්ද්‍රන් ගැන කථා කරන්නේ නැහැ. ඒ ජනාධිපති කොමිසමේ වාර්තාව ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. සිංගප්පූරු ගිවිසුම ගහපු උදවිය දැන් හිනා වෙනවා. දැන් සිංගප්පූරු ගිවිසුම ගැන කථා කරන්නේ නැහැ. සිංගප්පූරු ගිවිසුමේ අහිතකර ප්‍රතිඵල ගැන කථා කරන්නේ නැහැ. ඒ වාගේ විශාල මාෆියාවලට සම්බන්ධ උදවිය දැන් හිනා වෙනවා. අපට පාතාලය විහිළු කරනවා. ඒ ගොල්ලෝ ගැන කථා කරන්නේ නැහැ.

මධුෂ් සම්බන්ධ දේවල් දැන් කතා කරන්නේ නැහැ. මධුෂ් ලංකාවට ගෙනාවා. ඔහු අනාවරණය කළ දේශපාලනඥයන් කවුද, ඔහු සල්ලි දුන් අය කවුද, මැතිවරණවලදී ඔහු එක්ක යාළු මිත්‍රයන් හැටියට කටයුතු කළේ කවුද කියන ඒවා ගැන දැන් කතා කරන්නේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන්ගේ අයත් දැන් බොහොම සන්තෝෂයෙන්. මධුෂ්ගේ අයත් දැන් බොහොම සන්තෝෂයෙන්. මාෆියාවල සිටින අයත් සන්තෝෂයෙන්. සිංගප්පූරු ගිවිසුම ගහලා රටේ ආර්ථිකය කම්බස් කරන්න හදපු අයත් සන්තෝෂයෙන්. මොකද, දැන් අපි, අපේ මුළු පාර්ලිමේන්තුවම, රටම තවම සහරාන්ගේ ප්‍රහාරයේ වේදනාවට පත් වෙලා ඉන්නවා. ඒක හරි. නමුත්, මා කියන්නේ දැන් ආර්ථිකය ගැන සිතනවා නම්, රටේ ස්ථාවරභාවය ගැන සිතනවා නම් මෙතැනින් එහාට යන්න ඕනෑ කියායි. හැබැයි, ආණ්ඩුවට එහෙම දශමයකින්වත් ඉස්සරහට යන්න සැලැස්මක්, වැඩ පිළිවෙළක්, උනන්දුවක්, වුවමනාවක් ඇත්තේ නැති බව දිනපතා, පැයෙන් පැය ඔප්පු කරමින් ඉන්නවා. මුදල් ඇමතිතුමා රටේ ආර්ථිකය ගැන කතා කළේ නැහැ. රටේ ආර්ථිකයේ තිබෙන ස්වභාවය ගැන එතුමා මේ පාර්ලිමේන්තුවට තවම කිව්වේ නැහැ. මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේත් උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. හැබැයි, රටේ ජනතාවගේ අතේ සල්ලි තිබිලා නොවෙයි උද්ධමනය වැඩි වෙලා තිබෙන්නේ. රටේ ජනතාව වියදම් කරලා උද්ධමනය වැඩි වුණා නම් අපට සතුටු වෙන්න පුළුවන්. නමුත්, මේක එහෙම තත්ත්වයක් නොවෙයි. මිල මට්ටම් හේතුවෙන් උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. මුදල් ඇමතිවරයා බැංකුවල තත්ත්වය ගැන පාර්ලිමේන්තුවට කියන්නේ නැහැ; රටේ ස්ථාවරත්වය ගැන පාර්ලිමේන්තුවට කියන්නේ නැහැ. මූල්‍ය ස්ථාවරත්වය ගැන නොවෙයි එතුමා පාර්ලිමේන්තුවට කියන්නේ. එතුමාත් කියන්නේ එතුමාගේ පෞද්ගලික ප්‍රතිපත්ති ගැනයි. මෙහෙම රටක් ඉස්සරහට යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඔබතුමාට උදාහරණයක් කියන්නම්. ආණ්ඩුව දැන් විශාල වශයෙන් කතා කරන දෙය තමයි, සංචාරක කර්මාන්තයේ සිටින අයට අවුරුද්දක සහන කාලයක් -grace period එකක්- දුන්නා කියන කාරණය. සංචාරක කර්මාන්තයේ සිටින අය කවුද? එකක්, තමයි ප්‍රධාන හෝටල්. කුඩා පරිමාණ, මහා පරිමාණ, මධ්‍ය පරිමාණ මට්ටමේ හෝටල් තිබෙනවා. ඒ වාගේම, අනෙක් වැදගත්ම එක තමයි කුඩා පරිමාණයෙන්, ගෙවල් මට්ටමින් පවත්වාගෙන යන homestay හෝටල්. ඒවායේ සේවකයන් විශාල පිරිසක් ඉන්නවා. ඔබතුමන්ලා දුන් සහනය ඒ සියල්ලටම අදාළ ද? අවුරුද්දක grace period එක -අවුරුද්දක් යන කල් ණය වාරික ගෙවන්න එපා කියන සහනය- මුළු ප්‍රජාවටම අදාළ ද? සංචාරක වෙළඳ සැල් - tourist shops- තිබෙනවා. ඒවා මේ හැම මට්ටමේ ම තිබෙනවා. ඒ වාගේම, මාර්ගෝපදේශකයෝ -tourist guides- ඉන්නවා. ජාතික මට්ටමේ මාර්ගෝපදේශකයෝ ඉන්නවා. ඒ වාගේම, sitesවල මාර්ගෝපදේශකයෝ ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණයත් කියා මං කතාව අවසන් කරන්නම්. සංචාරක මාර්ගෝපදේශකයෝ සීගිරියේ ඉන්නවා; හබරණ ඉන්නවා; පොළොන්නරුවේ ඉන්නවා. මේ සියලුදෙනාටම මේ සහනය අදාළ ද? සංචාරක නියෝජිත ආයතන -travel agencies- තිබෙනවා. ඒවා අතර මහා පරිමාණ ඒවාත් තිබෙනවා; Laptop එකක්, කොම්පියුටරයක් තියාගෙන පුංචියට ඒ කටයුතු කරන tourist agentsලාත් ඉන්නවා. කුලීරථ හිමියන් ඉන්නවා. සංචාරකයන් ප්‍රවාහනය කරන කුලී බස් රථ හිමියන්, tourist guidesලා ඉන්නවා. ඊට අමතරව, කුලී වාහන හිමියෝ ඉන්නවා. ඊටත් අමතරව, විදේශිකයන් මතම යැපෙන safari කරන අය ඉන්නවා. උඩවලව, හබරණ, සීගිරය ආදි තැන්වල safari කරන අය ඉන්නවා. ඒ අය පෞද්ගලික වාහනයක් තියාගෙන ඉන්න අයයි. ඒ අයගෙන් වැඩි දෙනෙක් ණයකාරයෝ; සල්ලි තිබෙන අය නොවෙයි. තැන්පතු ධනයක් ඒ කාටවත් නැහැ. තැන්පතු ධනයක් safari කරන අයට නැහැ; tourist guidesලාට නැහැ; homestay හෝටල් කරන අයට නැහැ, ඒවායේ සේවකයන්ට නැහැ. ඒ අයට තැන්පතු ධනයක් නැහැ. ඒ හුඟක් අය එදා වේලට ණයට අරගෙන වැඩ කරපු අයයි. මා කියන්නේ, ඒ සහනය ප්‍රධාන හෝටල් හිමියන්ට විතරක් දීලා වැඩක් නැහැ කියායි. මා හැම දාම කිව්වා වාගේ අදත් කියනවා, මේ grace period එක අඩු තරමින් safari කරන හැමෝටම දෙන්න කියා. Safari කරන අයටත් දැන් සංචාරකයන් නැහැ. හෝටලයට සංචාරකයන් එන්නේ නැහැ කියන්නේ, safari කරන වාහනයක් තිබෙන කෙනාටත් වැඩ නැහැ කියන එකයි; tourist guidesලාටත් වැඩ නැහැ කියන එකයි. මේ අය අතර නිවාස ණය ගත් අයත් ඉන්නවා. ඒ අයත් ණය අරගෙන තමයි ගේ හදා තිබෙන්නේ. Homestay හෝටල් කරන කෙනා ණයක් අරගෙන තමයි ගේ හදලා තිබෙන්නේ.

ගරු සාගල රත්නායක අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා, දකුණු පළාතේ සංචාරක කර්මාන්තයේ වැඩ කළ බොහෝ සේවකයන්ට අද පඩියෙන් භාගයයි දෙන්නේ කියා. මාස භාගයේ පඩියයි ඒ අයට දෙන්නේ. සමහරුන්ට ඒකත් නැහැ. වැලිගම පැත්තේ, දික්වැල්ල පැත්තේ බොහෝ සේවකයන්ට දැන් අයින් වෙන්න කියලායි තිබෙන්නේ. සිංහරාජය ආශ්‍රිත සංචාරක කර්මාන්තය අද බිඳ වැටිලා තිබෙන බව ඔබතුමා දන්නවා. ඒ කාටවත් වැඩක් කරන්න බැහැ. ඒ හින්දා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ක්ෂේත්‍රයක් හැටියට ගත්තොත්, මෙය team work එකක්. සංචාරක මණ්ඩලය දැන් කියා තිබෙනවා, ලියා පදිංචි අයට විතරයි මේ සහන දෙන්නේ කියා. මේ ණය සහන දෙන්නේ ලියා පදිංචි අයට විතර ලු. නමුත්, ප්‍රශ්නය මෙකයි. ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදය දුර්වලයි. Tourist guidesලා ලියා පදිංචි කරලා නැහැ, Homestay හෝටල් ලියා පදිංචි කරලා නැහැ, කුඩා කුඩා මට්ටමේ සංචාරක ආයතන ලියා පදිංචි කරලා නැහැ.

ඒක නිසා විශේෂයෙන්ම ඔබතුමාගෙන් මම මේ ඉල්ලීම කරනවා. ඔන්න දැන් සංචාරක සංවර්ධන ඇමතිට රාජකාරියක් තිබෙනවා. වෙළඳ ඇමතිට වාගේම මුදල් ඇමතිට වාගේම සංචාරක සංවර්ධන ඇමතිටත් දැන් කාර්යයක් තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු දෙනා එකතු වුණු ජාතික සංචාරකයන්ගේ වෘත්තීය සංගමයක් තිබෙනවා. ඒ වෘත්තීය සංගමය එකතු කරගෙන අහන්න, ඔය ගොල්ලන්ගේ ප්‍රශ්නය මොකක්ද කියලා. Media show එකට, "ඔන්න සංචාරකයන්ටත් අපි ලොකු සහනයක් දුන්නා" කියා කියලා වැඩක් නැහැ. මම මේ එක ක්ෂේත්‍රයක් ගැන විතරයි උදාහරණයට ගත්තේ. හැම ක්ෂේත්‍රයකම තත්ත්වය ඕක තමයි. කර්මාන්ත ඇමති ඉන්නවා, විශ්වාස භංගයට මුහුණ දීලා. මුදල් ඇමති ඉන්නවා, ඒක ආරක්ෂා කරලා. සංචාරක ඇමති ඉන්නවා, වෙන කොහේ හරි සංචාරයක් යන්න බලාගෙන. රට අගාධයට යනවා, ආර්ථිකය අගාධයට යනවා. ඔබතුමන්ලාට සැලැස්මක් නැහැයි කියන එක තමයි මේකෙනුත් ඔප්පු වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු විජිත බේරුගොඩ මහතා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා.12.54]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන විදේශ විනිමය පනත යටතේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නියෝගය සාකච්ඡා කරන මේ මොහොතේ, අද රටේ තිබෙන තත්ත්වය දිහා බැලුවාම අපට සතුටු වෙන්න පුළුවන් මට්ටමක නොවෙයි තිබෙන්නේ. මොකද, 21වැනි දා පාස්කු ඉරිදා දින ප්‍රහාරයත් එක්ක මේ රටේ මිනිස් ජීවිත වාගේම දේපළත් විශාල ප්‍රමාණයක් විනාශ වුණා. ඒකේ කම්පනය, ඒකේ තිගැස්ම මේ රටේ ජන ජීවිතයට විතරක් නොවෙයි, මේ රටේ ආර්ථිකයට, සමාජයට, සංස්කෘතියට මේ සියල්ලටම එල්ල වෙලා තිබෙනවා. එදා ඒ කම්පනයේ බරපතළකමෙන් අද තවමත් මේ රටේ ජනතාව වික්ෂිප්ත වෙලා ඉන්නවා.

පසුගිය අවුරුදු කිහිපය තුළම මේ රටේ ආර්ථිකය පිළිබඳව කරන විග්‍රහයන්වලදී සාර්ව ආර්ථික දත්ත දිහා බැලුවාම අපට සතුටු වෙන්න පුළුවන් මට්ටමක නොවෙයි තිබුණේ. පාස්කු ඉරිදා ප්‍රහාරයට කලිනුත් ආර්ථිකය මන්දගාමී තත්ත්වයකයි තිබුණේ. ආර්ථික වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ආර්ථිකය ඉස්සරහට යන ගමන්මහේ ආර්ථික දර්ශක මේ රටට අවාසිදායක තත්ත්වයකයි තිබුණේ. එවැනි තත්ත්වයක් තිබෙන අවස්ථාවක මේ ප්‍රහාරයත් සමඟ මිනිස් ජීවිත, වටිනා දේපළ විතරක් නොවෙයි, මේ රටේ ආර්ථිකය පිළිඳව අපට ඉතාමත්ම අවාසි සහගත තත්ත්වයක් උදාවෙනවා කියන කාරණය මේ වෙලාවේ සිහිපත් කරනවා.

විදේශ විනිමය උපයන්න නම්, අපට පැහැදිලි ආර්ථික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනැ. හැබැයි, ආර්ථික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. අපි දැක්කා, අය වැය ගණනාවක් ඉදිරිපත් කරන කොට, අය වැයෙන් බලාපොරොත්තු වුණු ඉලක්ක පිළිබඳව මුදල් ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ කරන කොට, ටික දවසකින් අගමැතිතුමා වෙනම ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කරනවා. මේවා අතර යම් යම් පරස්පරයන් තිබෙනවා.

ආර්ථික වර්ධනය දිහා බලන්න. ආර්ථික වර්ධනය ක්‍රමයෙන් අඩු වී ගෙන යනවා. ගිය අවුරුද්දේ 3.2කට තිබුණු ආර්ථික වර්ධන ප්‍රතිශතය 2019 වෙන කොට 4.2ක හෝ 4.5ක ආර්ථික වර්ධන මට්ටමකට ඒවිය කියා බලාපොරොත්තු වුණා. හැබැයි, මේ ප්‍රහාරයත් එක්ක මේ රටේ ආර්ථිකය ඇන හිටීම, නිෂ්පාදනය ඇන

[ගරු විජිත බේරුගොඩ මහතා]

හිටීම සහ දෛනික ක්‍රියාකාරිත්වය ඇන හිටීම හරහා බොහෝ වෙලාවට ආර්ථික වර්ධනය සෘණ අගයක් ගන්න පුළුවන් නැත්නම් ශූන්‍ය අගයක් ගන්න පුළුවන්. ඒ මට්ටමක තමයි දැනට තිබෙන්නේ.

හැබැයි ආණ්ඩුවට ඕනෑකමක් නැහැ, ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරන්න; විශේෂයෙන්ම ආර්ථිකයේ මේ තිගැස්වීම් පාලනය කරලා, ජාතික ආරක්ෂාව තහවුරු කරලා මේ රටේ මිනිසුන්ට විශ්වාසය ඇති කරන්න. සංචාරක කර්මාන්තය පිළිබඳව අපට හොඳ ප්‍රවණතාවක් ගොඩනැඟෙමින්නයි තිබුණේ. 2015 අවුරුද්දේ සංචාරකයන් ලක්ෂ 18ක් මේ රටට ආවා; 2016 වෙන කොට ලක්ෂ 20 දක්වා වැඩි වුණා; 2017 ලක්ෂ 21 දක්වා වැඩි වුණා; 2018 ලක්ෂ 23යි. රජය බලාපොරොත්තු වුණා, සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 30 දක්වා වැඩි කරලා සංචාරක ව්‍යාපාරය හරහා විදේශ විනිමය උපයා ගන්න. හැබැයි, මොකද වුණේ? ජාතික ආරක්ෂාව දුර්වල වුණු නිසා මේකේ හිඩැස්වලින් රිංගලා අන්තවාදී ආගමික උන්මත්තකයන් මේ විනාශය සිදු කළා. විදේශිකයන් ඉලක්ක කරගෙන, සංචාරක හෝටල් ඉලක්ක කරගෙන, කතෝලික පල්ලි ඉලක්ක කරගෙන ඒ බෝම්බ පිපිරීම් කරපු නිසා මේ තිගැස්ම ලංකාවට විතරක් නොවෙයි, ජාත්‍යන්තරයටත් බලපාලා තිබෙනවා.

අද ලෝකයේ රටවල් 37ක් නිවේදනය කරලා තිබෙනවා, මේ රටට සංචාරකයන් පැමිණීම අන්තරාදායකයි කියලා. එවැනි තත්ත්වයක් තුළ සංචාරකයන්ගේ පැමිණීම දුර්වලවීම නිසා, අපට ජාතික ආදායමෙන් සියයට 5ක දායකත්වය ලබා දෙන මේ සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන විදේශ විනිමය අපට නොලැබෙයි කියන තහවුරුව තිබෙනවා. හැබැයි, මේ තත්ත්වය වෙනස් කරන්න ආණ්ඩුව වැඩ පිළිවෙළක් සකස් කරන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ. 2018 අප්‍රේල් මාසයේ සහ 2019 අප්‍රේල් මාසයේ සංචාරකයන්ගේ පැමිණීම දිහා බැලුවාම, සියයට 7.5ක අඩුවීමක් තිබෙනවා. මේ තත්ත්වය සෘජුවම අපට බලපානවාට වඩා වක්‍රව බලපානවා. සංචාරක ව්‍යාපාරය නිසා වක්‍රව යැපෙන පිරිසක් ඉන්නවා. විශේෂයෙන්ම කුලී පදනම මත වාහන සපයන අය, සංචාරක මඟ පෙන්වන්නන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කරන අය, හෝටල් කාමර කුලියට දෙන අය, මහා පරිමාණ සංචාරක හෝටල්, ලැඟුම්හල් ආදී මේ සියලු දෙනාගේම ආදායම අහිමිවෙලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් බලන්න, මේ රටේ මිනිසුන්ගේ දෛනික වියදම ක්‍රමානුකූලව දිනෙන් දින වැඩි වෙනවා. ආදායම වැඩි වෙනවාද? නැහැ. මිනිසුන්ගේ නිෂ්පාදනවලට මිලක් නැහැ. ඒ නිෂ්පාදන සාධාරණ මිලකට ගන්න රජයේ මැදිහත්වීමක් සිද්ධ වෙන්නේ නැහැ. වෙළෙඳ පොළ ආර්ථිකය තුළ නිෂ්පාදකයා අධෛර්යවත් වෙනවා. නිෂ්පාදකයාගේ ආදායම අඩු වෙනකොට මොකද වෙන්නේ? ඒ අයට එදිනෙදා වියදම් කරන්න තිබෙන මුදල් අඩුවීම තුළ සංසරණය වන මුදල් ප්‍රමාණය අඩු වෙනවා. මිනිසුන්ගේ මිලදී ගැනීමේ හැකියාව -ක්‍රය ශක්තිය- අඩු වෙනවා. ඒ තුළ විශේෂයෙන්ම වෙළෙඳ ව්‍යාපාර කටයුතුවලට ආදායම අඩු වෙනවා. මේක චක්‍රයක් විධියට යනවා. මේකේ ප්‍රතිඵලය විධියට මොකක්ද වෙන්නේ? මේ රටේ නිෂ්පාදනය අඩුවෙනවා. කෘෂි කර්මාන්තයේ නිෂ්පාදනය වාගේම විදේශ රටවලට අපනයනය කරන භාණ්ඩ නිෂ්පාදනයත් අඩු වෙලා තිබෙනවා. අපේ රටේ අපනයන ආදායම දෙස බලන්න. අපනයන ආදායම ඩොලර් බිලියන 12යි. ආනයන වියදම කොච්චරද? ආනයන වියදම ඩොලර් බිලියන 22කට ආසන්න සංඛ්‍යාවක් වනවා. එහෙම බැලුවාම වෙළෙඳ හිඟය ඩොලර් බිලියන 10ක් විතර වනවා.

අපි උපයා ගන්නා විදේශ විනිමය අපට ප්‍රමාණවත් වෙනවාද? අපට ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අපට සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය අඩු වුණොත් මොකද වෙන්නේ? ඒ අඩුවීම මේ රටට දැනෙනවා. එක පැත්තකින් ඛනිජ තෙල් මිලදී ගැනීම සඳහා විශාල මුදලක් වැය වෙනවා. මේ සඳහා අපට විදේශ රටවල්වලින් ණය ගන්න සිද්ධ වෙනවා. දැන් ඒක පුද්ගල ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. විදේශවලට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේවා ගෙවීම සඳහා නැවත වතාවක් අපට මේ රටේ රාජ්‍ය දේපොළ විකුණන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, විදේශ ස්වෛරීත්ව බැඳුම්කර හරහා මුදල් උපයා ගන්න සිද්ධවෙලා තිබෙනවා. බන්දුල ගුණවර්ධන අපේ හිටපු ඇමතිතුමා සඳහන් කළා, මහින්ද රාජපක්ෂ යුගයේ අරගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 5.5යි කියලා. හැබැයි, මේ කාලයේ ඩොලර් බිලියන 10 දක්වා ණය අරගෙන තිබෙනවා. නමුත්, රටේ සංවර්ධනයක් වෙලා නැහැ. මම දැක්කා ඊයේ පත්තරේ තිබෙනවා, 2019 ඉලක්ක සම්පූර්ණ කරගන්න අය වැයෙන් වෙන් කරපු මුදල්, විශේෂයෙන්ම ප්‍රාග්ධන වියදම් සියයට 15කින් කපා හරින්න තීරණය කළා කියලා. සියයට 15කින් ප්‍රාග්ධන වියදම් කපා හැරියාම මේ ආර්ථිකය ඉස්සරහට යයිද? පුනරාවර්තන වියදම් කපා හරින්න බැහැ. නිරන්තරයෙන්ම ඒ වියදම් කරගෙන යන්න වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව සුළු කාලයක් ලබා දෙන්න. සාමාන්‍යයෙන් පසුගිය අවුරුදුවල අපි දැක්කා, අය වැයෙන් අමාත්‍යාංශවලට වෙන් කරන මුදල් ඒ ප්‍රමාණයම ලැබෙන්නේ නැති බව. මේ තත්ත්වය තුළ සියයට 15ක් ප්‍රාග්ධන වියදම් කපා හැරීම තුළ මේ රටේ නිෂ්පාදනය අඩු වෙනවා. මේක චක්‍රයක් විධියට යැව්වාම අපි දන්නවා, ආර්ථික වර්ධන වේගය අඩු වෙනවා කියලා. විදේශ වෙළෙඳ අනුපාතය සෘණ අගයක් ගන්නවා. මේ නිසා මිනිසුන්ගේ ජීවන තත්ත්වය කඩා වැටෙනවා. මේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මිනිස් ජීවිත සහ දේපොළ හානි වුණා වාගේ, අපේ ආර්ථිකයට හානි වෙන්න ඉඩ දෙන්න එපා කියන කාරණය අපි සිහිපත් කරනවා. ඒ නිසා ජාතික ආරක්ෂාව තහවුරු කරලා, මිනිසුන්ගේ දෛනික ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යන්න පුළුවන් විධියට ආරක්ෂාව තහවුරු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම අපි කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன் அவர்கள்!

[பி.ப. 1.03]

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற வெளிநாட்டுச் செலாவணிச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாத்தில்

கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். பொதுவாக வெளிநாட்டுச் செலாவணியைப் பெறவேண்டுமென்ற முயற்சி அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்டாலும், அண்மையில் நடைபெற்ற பயங்கரவாதத் தாக்குதலின் காரணமாக அந்நியச் செலாவணியைப் பெற்றுத் தருகின்ற ஒரு பகுதியான சுற்றுலாத்துறை வீழ்ச்சி கண்டிருக்கின்றது. நான் சுற்றுலாத் துறைப் பகுதியைச் சார்ந்த மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்தவன் என்ற ரீதியிலே அதனை நன்கு அறிவேன். பொதுவாக சுற்றுலா விடுதிகளில் நடாத்தப்பட்ட தற்கொலைக் குண்டுத்தாக்குதலின் காரணமாக சுற்றுலாத்துறையினர் இங்கு வருகைதர முடியாத சூழலால் இந்த அந்நியச் செலாவணி வருமானத்தில் பாரிய வீழ்ச்சி ஏற்பட்டு இருக்கின்றது. இதில் முக்கியமான பங்கு இந்த அரசாங்கத்திற்கு இருக்கின்றது. ஏனென்றால், முன்கூட்டியே இதுபற்றிய எச்சரிக்கைகள் விடுக்கப்பட்டிருந்தும் அதாவது, இவ்வாறான தீவிரவாதத் தாக்குதல்கள் நடைபெறச் சந்தர்ப்பம் இருக்கின்றது என்பதை அறிந்திருந்தும் அதனைத் தடுக்க அரசாங்கம் தவறியிருக்கிறது. குறிப்பாக, இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள் பாதுகாப்பு அமைச்சைத் தன்வசம் வைத்திருக்கின்றார்; சட்டமும் ஒழுங்கும் அமைச்சையும் வைத்திருக்கின்றார். அவர் சரியாகத் தன்னுடைய கடமையைச் செய்யவில்லை. அவ்வாறு செய்திருந்தால் இந்த நிலைமை ஏற்பட்டிருக்காது. கடந்த நான்காம் மாதம் இது சார்பான அறிவுறுத்தல் கிடைத்திருக் கின்றது. ஆனால், அவர்கள் அந்த அறிவுறுத்தலைச் சரியான முறையிலே கடைப்பிடிக்கவில்லை. அப்படிக் கடைப் பிடித்திருந்தால் இவ்வாறான பாரிய அழிவு ஏற்பட்டிருக்காது; இந்த நாட்டின் சுற்றுலாத்துறை வீழ்ச்சி கண்டிருக்கவும் முடியாது.

இன்று வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் இங்கு வருகை தருவதற்கு மிகவும் பயப்படுகின்றார்கள். ஏனென்றால், இந்த நாட்டிலே தீவிரவாதம் இருக்கின்றது; அடிக்கடி குண்டுகள் வெடிக்கின்றன என்ற நிலைமை இப்போது உருவாகிவிட்டது. தமிழீழ விடுதலைப் புலிகள் யுத்தம் நடத்திய காலத்தில் இங்கு வருகைதந்த வெளிநாட்டவர்கள் பெரும்பாலும் அவ்வாறு கருதவில்லை. ஆனால், இப்போது அவர்கள் பயப்படு கிறார்கள். காரணம், சுற்றுலா விடுதிகளில்கூட தாக்குதல் நடத்தப்படுகின்றது. ஆனால், அரசாங்கம் இன்னும் அது சம்பந்தமாகச் சரியான முடிவுகளை எடுக்கத் தவறிவருகின்றது. ஜனாதிபதி அவர்கள் தொடர்ந்தும் தான் ஜனாதிபதியாக இருக்க வேண்டும் என்பதில் கரிசனை காட்டிக் கொண்டிருக்கின்றார். பிரதமர் அவர்களும் தான் தொடர்ந்து பிரதமராக இருக்க வேண்டும் அல்லது அடுத்த ஜனாதிபதியாக வர வேண்டுமென்பதில் கரிசனை காட்டிக் கொண்டிருக் கின்றார். இந்த இரண்டு பேரையும் கவிழ்த்துவிட்டு தனது சகாக்கள் ஜனாதிபதியாக வரவேண்டும், அதன்மூலம் தான் பிரதமராக வரவேண்டுமென்ற ரீதியிலே எதிர்க்கட்சித் தலைவர் அவர்கள் கவனம் செலுத்திக் கொண்டிருக்கின்றார். இந்த நிலைமையைத்தான் நாங்கள் இங்கு காண்கின்றோம். ஆனால், இந்த விடயம் சார்பாக முற்றுமுழுதாக ஆராய்கின்ற தன்மை மிகக் குறைவாக இருக்கின்றது.

குறிப்பாக, காத்தான்குடியிலே சஹ்ரானின் நடவடிக்கைகள் பற்றி ஏற்கெனவே நாங்கள் சொல்லியிருந்தோம். 2017ஆம் ஆண்டு முஸ்லிம் மக்களே அது சார்பாக ஒரு விழிப்புணர்வை ஏற்படுத்தியிருக்கிறார்கள். ஆனால், காத்தான்குடிப் பொலிஸார் அது சார்பாகக் கவனம் செலுத்தாமல் இருந்திருக் கின்றார்கள். அந்தப் பகுதியில் இருந்த அமைச்சர் இதை அறியாமல் இருந்திருக்க முடியாது. இப்போது ஆளுநராக இருக்கின்ற ஹிஸ்புல்லாஹ் அவர்கள் நன்கு இதனை அறிந்திருக்கிறார். ஆனால், நடைபெற்ற குண்டுத்தாக்குதல் சார்பாக அவரை விசாரிப்பதற்கு இன்னும் ஜனாதிபதி அவர்கள் துணியவில்லை. இவ்வாறு இருந்தால் இந்த நாட்டை நம்பி எவ்வாறு வெளிநாட்டவர்கள் வர முடியும்? தங்களது அரசியல் செல்வாக்கைத் தொடர்ந்தும் வைத்திருக்க வேண்டும்; தங்களுக்கான ஆதரவை வைத்திருக்க வேண்டும்; தங்கள் ஆதரவாளர்களைக் காப்பாற்ற வேண்டுமென்பதில் அவர்கள் காட்டுகின்ற கரிசனையைவிட, இந்த நாட்டுக்கு அந்நியச் செலாவணியைப் பெற வேண்டும்; இந்த நாட்டு மக்களை வளப்படுத்த வேண்டும் என்பதில் காட்டுகின்ற அக்கறையானது குறைவாக இருக்கின்றது. நாங்கள் இதைப் புரிந்துகொள்ள வேண்டும்.

குறிப்பாக, 'ஜிஹாத்' பற்றி எல்லோருக்கும் தெரியும். முன்பு 'ஜிஹாத்' படை ஒன்று இருந்தது. 2009ஆம் ஆண்டு ஜூலை மாதம் அளவிலே ஹிஸ்புல்லாஹ் முன்னிலையிலே அவர்கள் தங்களுடைய ஆயுதங்களைக் காத்தான்குடியிலே வைத்துக் கையளித்தார்கள். 20 வருடங்களாக 'ஜிஹாத்' படை இருந்ததும் ஆயுதங்கள் இருந்ததும் தெரிந்திருந்ததென்பதை அந்த நேரம் ஹிஸ்புல்லாஹ் அவர்கள் தெளிவுபடுத்தினார். காத்தான் குடியில் சஹ்ரானின் குழு இருந்தது பற்றியும் அதுவொரு பயங்கரவாத அமைப்பு என்பதும் அவருக்குத் தெரியும். ஆனால், அவர் அதனை வெளிப்படுத்தவில்லை. சரியாக ஆராய்ந்தால் பல உண்மைகளை இந்த அரசாங்கம் கண்டிருக்க முடியும். மாறாக, அவ்வாறானவர்களைப் பாதுகாப்பதிலே அரசாங்கம் கரிசனை காட்டிக் கொண்டிருக்கின்றது.

அதுமாத்திரமல்ல, பல இஸ்லாமியப் பகுதிகளுக்கு வெளிநாட்டு நிதிகள் வந்திருக்கின்றன. அது எவ்வாறு வந்தது? எந்த வழியூடாக வந்தது? என்பதனை ஆராய்வதில் அரசாங்கத்தின் கரிசனை குறைவாக இருக்கின்றது. குறிப்பாக, ஓட்டமாவடியிலே அல்-ஹிக்மா என்கின்ற ஓர் அமைப்பு இருக்கின்றது. ஹாரூன் மௌலவி என்பவர் அதனை இயக்கிவருகின்றார். அவர்கள் குழாய்க்கிணறு அமைக்கின்ற செயற்பாட்டைச் செய்கின்றார்கள். அதிலே அரபுப் பாஷையில் எழுதுகிறார்கள்; பிறைச் சின்னத்தைப் பதிக்கிறார்கள். ஆனால், ஒரு வலிந்துதவு சமூக சேவா அமைப்பு சேவையாற்று கின்றபோது அதன் செயற்பாடுகள் பிரதேச செயலகத்தி னூடாக முன்னெடுக்கப்பட வேண்டும்; கிராம உத்தியோகத்தரூடாகக் கிராமத்தில் சேவையாற்ற வேண்டும். அவ்வாறான நிலைமை இருக்கின்றபோது, அவர் தற்றுணிபில் அவற்றைச் செய்கின்றார். இதுபற்றி நாங்கள் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களிலெல்லாம் கதைத்துப் பார்த்தோம். அவருக்கு அரசியல் செல்வாக்கு இருக்கின்றது. குறித்த சம்பவம் நடக்கும்போது அவர் அரபு நாட்டில் இருந்தார். அவர் திரும்பி வந்தபோது அவருக்கு எந்தவிதப் பிரச்சினையும் இருக்கவில்லை. காரணம், அவர் ஜனாதிபதியின் ஓர் இணைப்பாளராக இருக்கின்றார். அதனால் அவரைப் பற்றி ஆராயப்படுவதில்லை.

நான் ஓட்டமாவடிக்கு அருகாமையிலுள்ள கிராமத்தில் இருப்பவன். அவ்வாறான சம்பவங்களால் எனக்கும் ஆபத்து ஏற்பட இடமுண்டு. உண்மையிலே, மட்டக்களப்பு மாவட்டத்திலே இஸ்லாமியப் பகுதிகள் முற்றுமுழுதாக சுற்றிவளைப்புக்கு உட்படுத்தப்படவில்லை. அவ்வாறு உடனடியாகச் சுற்றிவளைப்புச் செய்யப்பட்டிருந்தால் பல விடயங்கள் தெரிந்திருக்கும், ஆயுதங்கள் கண்டுபிடிக்கப் பட்டிருக்கும், குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட்டிருப்பார்கள். நாங்கள் எவ்வளவு கத்தியும் பயனற்ற நிலையே காணப்படுகின்றது. அரசாங்கம் குற்றவாளிகளைக் காப்பாற்றுவதில் கரிசனை காட்டிக்கொண்டிருந்தால் எவ்வாறு வெளிநாட்டவர் இங்கு வரமுடியும்? எவ்வாறு அந்நியச் செலாவணியைப் பெறமுடியும்? சிந்தியுங்கள்!

[ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා]

குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! குறிப்பாக, இந்த அரசாங்கம் பதவிக்கு வந்து இவ்வளவு காலமாகியும் வடக்கு, கிழக்கிலேயிருந்த தொழிற்சாலைகள் இன்னும் திருத்தி யமைக்கப்படவில்லை. வாழைச்சேனைத் தேசிய கடதாசிக் கம்பனிக்கு நாங்கள் வெளிநாட்டு நிதிகளை, அதாவது நிதி வழங்குநர்களைக் கொண்டுவரத் தயாராக இருக்கின்றோம். ஆனால், அவற்றை முறையாகப் பெற்றுச் செயற்படுத்து வதற்குச் சம்பந்தப்பட்ட அமைச்சரோ அல்லது பிரதமரோ ஆக்க ஊக்கம் காட்டுவதாக இல்லை. நாங்கள் கொரிய நிதியைக் கொண்டுவந்தபோது அந்த நிதியைக்கொண்டு எம்பிலிப்பிட்டிய தொழிற்சாலையைக் கட்டுவதற்குக் காட்டிய அக்கறையை வாழைச்சேனைத் தேசிய கடதாசிக் கம்பனியைக் கட்டுவதற்குக் காட்டவில்லை. இப்போதும் நிதி வழங்குநர்கள் அதற்குத் தயாராக இருக்கிறார்கள். அவ்வாறு அந்தத் தொழிற்சாலையை இயக்கினால் அதன்மூலம் வருமானம் வரும். அதேநேரம், சுற்றுலாவுக்காகப் பாசிக்குடாவுக்கு வருபவர்கள் அந்தத் தொழிற்சாலையையும் பார்வையிடு வார்கள். அந்த வகையில், அந்நியச் செலாவணியைப் பெறுவதற்கேற்ற வழிமுறைகளுக்கு அது வழிவகுத்துக் கொடுக்கும். பல விடயங்களுக்கு அது உதவும். ஆனால், அவ்வாறு நடைபெறவில்லை.

இன்று மக்களின் வாழ்வாதாரம் எல்லா விடயத்திலும் பின்தங்கிய நிலையிலிருக்கின்றது. கிழக்கு மாகாண தொண்டர் ஆசிரியர் சம்பந்தமாக நாங்கள் நீண்ட காலமாக விடுத்த கோரிக்கையின் நிமித்தம் இன்றைய தினம் அவர்களுக்கான ஒரு நேர்முகப்பரீட்சை நடைபெறுகின்றது. அவ்வளவு பேருக்கும் நியமனம் கொடுக்கப்படும் என்று உறுதியளிக்கப் பட்டிருப்பதனால் எங்களது கோரிக்கையொன்று ஏற்றுக் கொள்ளப்பட்டிருக்கின்றது என்ற வகையில் நாங்கள் இந்த இடத்தில் அதற்காக மட்டும் நன்றியைத் தெரிவிக்க வேண்டியவர்களாக இருக்கின்றோம். இவ்வாறு அரசாங்கம் ஒவ்வொரு விடயத்திலும் கவனம் செலுத்த வேண்டிய நிலையில் இருந்துகொண்டிருக்கின்றது.

கல்குடா பகுதியிலே கும்புறுமூலை என்கின்ற இடத்திலே அர்ஜுன் அலோசியஸினால் 'எதனோல்' தொழிற்சாலை யொன்று உருவாக்கப்பட்டு, நடாத்தப்பட்டு வருகின்றது. "அது அந்த மக்களுக்குப் பொருத்தமற்றது. அதை மூடுங்கள்!" என்று சொன்னால், அதில் அரசாங்கம் அக்கறை காட்டுவதாக இல்லை. ஏனென்றால், அந்த மக்களின் வாழ்வாதாரத்தை அழிப்பதற்கு 'எதனோல்' தொழிற்சாலையும் வழிவகுக்கும் என்பதனால் அந்தத் தொழிற்சாலையைத் தொடர்ந்து வைத்திருப்பது அரசாங்கத்திற்குச் சந்தோசமாக இருக்கின்றது என்றே கருதவேண்டியிருக்கின்றது. "போதையற்ற நாட்டை உருவாக்குவோம்!" என்று கூறிய ஜனாதிபதிக்கு நாங்கள் அந்தத் தொழிற்சாலை தொடர்பான கடிதத்தைக் கையளித்தோம். அவர்கூட, இன்னும் அது சார்பாக நடவடிக்கை எடுக்கவில்லை. ஆகையால், நாங்கள் ஒட்டு மொத்தமாகப் பார்க்கும்போது, இன்று இந்த நாட்டிலே அந்நியச் செலாவணியைப் பெறுவதற்கேற்ற சரியான முயற்சித் திட்டங்கள் இல்லையென்பது தெரிகிறது. அரசாங்கத் திலுள்ளோர் தங்களது இருக்கைகளைக் காப்பாற்றுவதில்தான் அக்கறை காட்டிக்கொண்டிருக்கின்றார்கள். அதுதான் உண்மை!

இந்த நாட்டிலே வெளிநாட்டவர்களுக்கு ஏற்ற பொழுதுபோக்கு வசதி வாய்ப்புக்களை ஏற்பாடு செய்கின்ற தன்மை மிகக் குறைவாக இருக்கின்றது. நான் ஓமான், சீனா போன்ற பல நாடுகளுக்குப் போயிருந்தேன். அங்கிருக்கின்ற பொழுதுபோக்குச் சாதனங்களைப் பார்வையிட்டேன். அங்கு அந்நிய நாட்டவர்கள் வந்து எவ்வாறு தங்களது பொழுதைக் கழிக்கின்றார்கள் என்பதனை நன்றாகப் பார்வையிட்டேன். அவற்றோடு ஒப்பிடும்போது, இந்தச் சிறிய அழகான நாட்டில் அவ்வாறான செயற்பாடுகள், பொழுதைக் கழிக்கக்கூடிய சாதனங்கள் மிகக் குறைவாகவே இருக்கின்றன. அவ்வா றிருந்தால், எவ்வாறு அந்நியச் செலாவணியை இந்த நாட்டிற்குக் கொண்டுவர முடியும்? அவ்வாறு சிந்தித்து அவ்வாறான பொழுதுபோக்குச் சாதனங்களை ஏற்படுத்த அரசாங்கம் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும்.

அத்துடன், இப்பொழுது அரசாங்கம் முதல் வேலையாகச் செய்யவேண்டியது என்னவென்றால், வெளிநாடுகளிலிருந்து இலங்கைக்கு நிதிகளைக் கொண்டுவந்திருப்பவர்கள் தொடர்பில் ஆராய குழுக்களை நியமித்துப் பரிசோதனைகளை மேற்கொள்வதாகும். கிழக்கு மாகாண ஆளுநர் ஹிஸ்புல்லாஹ் அவர்கள் அவரது பல்கலைக்கழகத்துக்குத் தனது பெயரிலும் தனது மகனின் பெயரிலும் தன்னோடு சேர்ந்தவர்களின் பெயரிலும் பாரிய நிதியைக் கொண்டுவந்திருக்கின்றார். எனவே, அது சார்பாக ஆராயப்பட வேண்டுமென்று நாங்கள் கேட்டுக்கொண்டிருக்கின்றோம். அந்த நிதி எங்கிருந்து வந்தது? அதை யார் கொடுத்தார்கள்? என்பன ஆராயப்பட வேண்டும். இந்த நாட்டுக்குள் சட்ட ரீதியாக நிதிகள் கொண்டுவரப்பட வேண்டும். தமிழீழ விடுதலைப் புலிகளின் காலத்திலும் அதற்குப் பின்பும் தமிழ் மக்களின் வலிந்துதவு சமூக சேவை அமைப்புக்குச் சிறு நிதி வருவதென்றாலும் அது ஆராய்ச்சிக்கு உட்படுத்தப்பட்டது. ஆனால், இஸ்லாமிய மக்கள் மத்தியில் அவ்வாறான செயற்பாடு நடைபெறவில்லை. இனியாவது அரசாங்கம் அந்தச் செயற்பாட்டில் இறங்க வேண்டும். இலங்கைக்குப் பெருந்தொகையான நிதிகள் அரபு நாடுகளிலிருந்து வருகின்றன. அவ்வாறு வந்த நிதிகள்தான் இந்த நாட்டில் ISIS தீவிரவாதிகளை வளர்த்திருக்கின்றன. அந்த வளர்ச்சிதான் இன்று இந்த நாட்டிலே பாரிய அழிவை எங்களுக்குத் தந்திருக்கின்றது. இதை அரசாங்கம் உணர்ந்துகொள்ள வேண்டும். இன்றும் அந்தப் பயங்கர வாதத்துக்குத் துணை போகின்றவர்களைக் காப்பாற்றுவதற்கு அரசாங்கம் முனையக்கூடாது. தங்களது அரசியல் இருப்பினைப் பாதுகாக்க வேண்டும் என்பதற்காக இந்தத் தவறை விட்டு, அப்பாவி மக்களை அழிவுப் பாதைக்கு இட்டுச் செல்லக்கூடாது. எனவே, இந்த விடயத்திலே அரசாங்கம் மிகக் கவனமாக இருக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

கடந்த காலங்களில் மட்டக்களப்பு மாவட்டத்திலே தௌஹீத் ஜமாஅத் அமைப்பைச் சார்ந்தவர்களின் செயற்பாடு சம்பந்தமாக அங்கிருக்கின்ற பொலிசார் அறிந்திருந்தும் அவர்கள் அதிலே கவனம் செலுத்தாமல் இருந்திருக்கிறார்கள். அந்த வகையில் காத்தான்குடி, ஏறாவூர், வாழைச்சேனை ஆகிய பொலிஸ் நிலையங்களிலிருக்கின்ற பொலிஸ் அதிகாரிகள் அந்த மாவட்டத்திலிருந்து இடமாற்றப்பட வேண்டும்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

சரி. இந்த விடயத்துடன் முடித்துக்கொள்ளுகின்றேன்.

ஆகவே, புதிதாக தரமான, இன வேறுபாடின்றித் தங்களது கடமையைச் சரியாகச் செய்யக்கூடிய இலஞ்சம், ஊழல் அற்ற பொலிஸ் பொறுப்பதிகாரிகள் இந்த நிலையங்களில் நியமிக்கப் பட வேண்டுமென்று கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

[අ.භා.1.14]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன-நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම පාස්කු ඉරු දින ඇති වුණු බෝම්බ ප්‍රහාරය නිසා සංචාරක ව්‍යාපාරයට සිදු වුණු බලපෑම පිළිබඳවත්, ඒ වාගේම සංචාරක ව්‍යාපාරයට ඒ සම්බන්ධයෙන් ලබා දෙන සහන පිළිබඳවත් අද විපක්ෂයෙන් ප්‍රශ්න කිහිපයක් ඇහුවා. අප්‍රේල් මාසයේ 21වැනි පාස්කු ඉරු දින සිදු වූ හානිය පිළිබඳව මැයි මාසයේ 8වැනිදා මම පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයක් කළා. ඒ වාගේම අපි ලබා දෙන සහනාධාර පිළිබඳව මහ බැංකුවෙන් රෙගුලාසියක් නිකුත් වුණා, යම් කෙනෙක් සංචාරක ව්‍යාපාරයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වෙලා තිබෙනවා නම්, ඒ කියන්නේ සංචාරක ව්‍යාපාරයේ සැපයුම් ජාලයට ඇතුළත් නම්, ඒ හැමෝටම සහනාධාර ලබා ගන්න පුළුවන් කියලා. එම සහනාධාරවල මුලින්ම තිබෙන්නේ, ණය ලබාගෙන ඇති අය ගැනයි. ණය අරගෙන තිබෙනවා නම්, විශේෂයෙන්ම එම ණයට අදාළ පොලිය, ඒ වාගේම ප්‍රාග්ධන මුදල - interest and capital - ගෙවන්න තිබෙනවා.

පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය අඩු නම්, හෝටල්වල නවාතැන් ගන්නා, resortsවල නවාතැන් ගන්නා, නිවාසවල - homestayවල - නවාතැන් ගන්නා සංචාරකයන්ගේ ප්‍රමාණයත් අඩු වෙනවා. සමහර වෙලාවට සංචාරකයන්ට ආහාර සපයන ආපන ශාලා තිබෙනවා. එහෙම නැත්නම් ඒ අය භාණ්ඩ, තෑගි බෝග මිලදී ගන්නා ස්ථාන තිබෙනවා. ඒ ජාලයටම තමයි අපි මේ සහනාධාර ලබා දෙන්නේ. පළමුවැනි එක විධියට ඒ අයගේ ප්‍රාග්ධනය සහ පොලිය ගෙවීම 2020 මාර්තු මාසය වෙනකල් අත් හිටුවන්න පුළුවන්. ඒ අයට කරන්න තිබෙන්නේ ණය ගත් බැංකුවට ගිහිල්ලා සාකච්ඡා කරන එකයි. එතකොට ඒ moratorium එකෙන් ඔවුන්ට සහනයක් ලබා ගන්නට පුළුවන්. හැබැයි, ඔවුන් ණය ගත් බැංකුව සමඟ සාකච්ඡා කරලා, බැංකුව ඒක තීරණය කරන්නට ඕනෑ. ඒකට හේතුවක් තිබෙනවා. ඒ තමයි, බැංකුව ලබා දී තිබෙන්නේ තැන්පත්කරුවන්ගේ මුදල්. බැංකුවට වගකීමක් තිබෙනවා, තැන්පත්කරුවනුත් ආරක්ෂා කරන්න. එතකොට, මේ ලබා දෙන සහනාධාරය බැංකුවලට විතරක් සීමා වෙනවාද කියලා ප්‍රශ්නයක් පැනනැඟුණා. මැයි මාසයේ 8වැනිදා තමයි ඒ සහනාධාරය ලබා දුන්නේ. අද ප්‍රශ්නයක් ඇහුවා, සියලුම බැංකු දැනුවත් කර තිබෙනවාද කියලා. මම කථා කරන්නේ, නිකුත් කර තිබෙන චක්‍රලේඛවලින්. මේ චක්‍රලේඛවල දින සඳහන් කරන්නේත් ඒකයි.

ඊට පස්සේ මැයි මාසයේ 16වැනිදා "Interpretations for Circular No. 07 of 2019 on Concessions Granted to Tourism Industry" කියලා අර්ථ දැක්වීමේ චක්‍රලේඛයක් නැවත මහ බැංකුවෙන් ඉදිරිපත් කළා. මේ චක්‍රලේඛය ඉදිරිපත් කළේ, මේ සහනාධාර පිළිබඳව තවත් පැහැදිලි කරන්නයි. මෙම සහනාධාර දෙන්නේ ව්‍යාපාරවලට විතරක් නොවෙයි. කවුරු හරි කෙනෙක් හෝටලයක ස්ථිර රැකියවක් කරනවා නම්, ඔහු ඉඩමක් ගන්න, නිවසක් හදන්න ණයක් අරගෙන තිබෙනවා නම්, ඔහුටත් මේ සහනාධාරය ලැබෙනවා. මොකද, ඔහුගේ පඩිය රුපියල් 30,000ක් වෙනවා නම්, සේවා ගාස්තුවත් රුපියල් 30,000ක් ලැබෙනවා. සේවා ගාස්තුව - service charge එක - එම ව්‍යාපාරයට ලැබෙන ආදායමක්. සංචාරකයන් එන්නේ නැත්නම් ඒ, සේවා ගාස්තුව - service charge එක - කෙළින්ම පහළට යනවා. එතකොට රුපියල් 60,000ක වැටුපක් ගෙදර ගෙනයන පුද්ගලයාට ගෙනයන්න වෙන්නේ රුපියල් 30,000යි. ඔහු බැංකුවෙන් ණයක් අරගෙන තිබෙනවා නම්, ඔහුට ඒ capital එකයි, පොලියයි ගෙවා ගන්න බැරි වෙනවා. ඒ නිසා අපි ලබා දෙනවා කියලා සඳහන් කර තිබෙන සහන සංචාරක ව්‍යාපාරයට පමණක් නොවෙයි, සංචාරක ව්‍යාපාරයේ ස්ථිර රැකියා කරන හැම සේවකයෙකුටමත් ලැබෙනවා. ඔවුන්ට තමන්ගේ බැංකුවට ගිහිල්ලා සාකච්ඡා කර එම සහන ලබා ගන්න පුළුවන්. මැයි මාසයේ 16වැනිදා මේ අර්ථ දැක්වීමේ චක්‍රලේඛය නිකුත් කර තිබෙනවා. නමුත්, අදාළ ව්‍යාපාරය සංචාරක ව්‍යාපාරයට අයත් එකක්ද නැද්ද කියන එක සොයා ගන්න ඒ අය සංචාරක සංවර්ධන අධිකාරියේ හෝ ප්‍රචාරක කාර්යාංශයේ, නැත්නම් සමුළු කාර්යාංශයේ, එහෙම නැත්නම් හෝටල් කළමනාකරණ ආයතනයේ, එහෙමත් නැත්නම් හෝටල් සංගමයේ ලියා පදිංචි වෙන්නට ඕනෑ. එතකොට තමයි අදාළ ව්‍යාපාරය සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ එකක් කියලා ඒ අයට ඔප්පු කර ගන්න පුළුවන් වෙන්නේ.

අපි දන්නවා, සංචාරක ව්‍යාපාරය බස්නාහිර පළාතේ, නැඟෙනහිර පළාතේ, ඌව පළාතේ ඇල්ල ප්‍රදේශයේ, ඒ වාගේම හම්බන්තොට ප්‍රදේශයේත් තිබෙන බව.

මෙම ව්‍යාපාරයේ යෙදී සිටින බොහෝ අය අපි එක්ක සාකච්ඡා කර තිබෙනවා. ඒ, සමහර අය ප්‍රකාශ කරලා තිබෙනවා, ඒ අය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එක්ක ලියා පදිංචි වෙලා නැහැ කියලා. මේ වාගේ ව්‍යාපාරවල ඒ අය යෙදෙන බවට ප්‍රාදේශීය සභාවන් එක්ක, නගර සභාවන් එක්ක, මහ නගර සභාවන් එක්ක ලියා පදිංචි වෙලා තිබෙනවා. මේ චක්‍රලේඛය අනුව සංචාරක ව්‍යාපාරයක් හැටියට ලියා පදිංචි වෙලා තිබෙනවා නම්, මේ සහනාධාර ලබා ගන්න ඒ පිළිගැනීම ඇති කියලාත් සඳහන් කරන්නට අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අමතරව නැවතත් මැයි මාසයේ 21 වෙනිදා මහ බැංකුවෙන් චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. බැංකුවලින් විතරක් නොවෙයි, මේ අය ගිහිල්ලා බැංකු නොවන මූල්‍ය සමාගමකින්, ඒ කියන්නේ finance company එකකින්, එහෙම නැත්නම් specialized leasing company එකකින් සංචාරක ව්‍යාපාරයට යෙදවීම සඳහා වාහනයක් - කාර් එකක්, වෑන් එකක් - වැනි දෙයක් ලබා ගෙන තිබෙනවා නම්, ඒකටත් මේ සහනාධාරය ලබා ගන්නට පුළුවන්. මොකද, ඒකත් මේ ව්‍යාපාරයට සම්බන්ධ සැපයුම් ජාලය තුළයි තිබෙන්නේ. මැයි මාසයේ 21 වෙනිදා මහ බැංකුවෙන් නිකුත් කර තිබෙන චක්‍රලේඛයේ තිබෙනවා, ඒ අයටත් මේ සහනාධාර ලබා ගන්නට පුළුවන් කියලා. මම ඒ විස්තර සියල්ලක්ම මේ අවස්ථාවේ දී කියන්නට යන්නේ නැහැ. මම මෙතැන දී පැහැදිලි කිරීමක් පමණයි කළේ. එදා මේ ගැන කථා කරනකොට කිව්වා, "මෙහෙම කිව්වාට මේවා වෙනවාද, මේක බොරුවක්. මෙහෙම ඉක්මනට තීරණ ගන්නේ නැහැ" කියලා. මම එදත් කිව්වා, කියන දේ කරන මුදල් අමාත්‍යාංශයක් තිබෙන්නේ කියලා. අපි මේ ගැන එදාත් සඳහන් කළා. අද ඒක කරලා තිබෙනවා. ඒ වාගේම පැහැදිලි කිරීමකුත් කරලා තිබෙනවා. මේ රටේ සංචාරක ව්‍යාපාරය නඟාසිටුවීම සඳහායි අපි මේ කටයුතු කරන්නේ.

මම මේ සතියේ අඟහරුවාදා ලංකාවේ ආයෝජනයන් කරන සිංගප්පූරු ආයෝජකයන් හමුවෙන්නට ගියා. මහබැංකු අධිපතිවරයාත්, මමත් එතැනට ගියා. ඒ අවස්ථාවේ මේ බෝම්බ ප්‍රහාරයන් ගැනත් ඒ අය අපෙන් ඇහුවා. අපි මේ ගැන ඔවුන් සමඟ කථා කළා. ඒ අයගේ මතය අනුව අපට වැටහුණේ මේ බෝම්බ ප්‍රහාරයන් ඒ අයට එච්චර ගැටලුවක් නොවෙයි කියන එකයි. ඒකට

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

හේතුවක් තිබෙනවා. මේක ජාත්‍යන්තර ත්‍රස්තවාදය. මේ ත්‍රස්තවාදී ක්‍රියාවන් ලෝකයේ අනෙක් රටවලත් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා එම ආයෝජකයන්ට මෙවැනි ත්‍රස්තවාදයන් හුරුපුරුදුයි. මේක අප විසින් ඇති කරපු දෙයක් නොවෙයි. මේක අපට බාහිරව ඇති වුණු ප්‍රහාරයක්. ඒ නිසා ඒ අයගෙන් හොඳ ධන ප්‍රතිචාරයක් තිබෙනවා කියන එකත් සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තව එක් කාරණයක් පැහැදිලි කරන්න කැමැතියි. මේක කරන අතරේදී ලංකාවට ආධාර දෙන ආයතන දෙකක් එක්ක අපි ගිවිසුම් අත්සන් තැබුවා. එකක් තමයි, JICA ආයතනය එක්ක එකතු වෙලා ලබා ගන්නා විශාල ණය මුදලක් සඳහා සියයට 0.1ක පොලී ප්‍රතිශතයක් සමඟ අවුරුදු 30ක බොහොම ලොකු සහනාධාරයක් ලැබෙනවා. අවුරුදු 12ක grace period එකක් ලැබෙනවා. කිසිවක් ගෙවන්න ඕනෑ නැහැ. මේක දීර්ඝ කාලයක් සාකච්ඡා වෙලා තිබෙන එකක්. අපි මේ ගිවිසුමට අත්සන් තබලා පොදු ප්‍රවාහනය දියුණු කරන්න, මේ රටේ light rail එක ඉදි කරන්න එය යොදවනවා. තව අවුරුදු 5කින් නාගරික ප්‍රදේශවල පොදු ප්‍රවාහනයේ විශාල වෙනසක් වෙනවා. ඇමෙරිකන් ඩොලර් බිලියන 1.7ක් ලබාගෙන මේ නවීන පොදු ප්‍රවාහනය අපි ඇති කරනවා. අපි මෙවැනි ප්‍රවාහන ක්‍රම අනෙක් රටවලත් දකිනවා. විශේෂයෙන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත්ව තිබෙන පොදු ප්‍රවාහන ක්‍රමයක් අපි ලංකාව තුළ ඇති කරනවා.

මම මෙන්න මේ කාරණය ගැන විශේෂයෙන් කරුණු දක්වන්නට කැමතියි. මොකද, සමහරවිට කරුණු නොදැනුවත්ව වෙන්න ඇති බොහෝ අසත්‍ය දේවල් සඳහන් වෙනවා මා දැක්කා. විශේෂයෙන්ම Millennium Challenge Corporation එකෙන් කරන ක්‍රියාවලිය පිළිබඳව කිව්වා. එම නිසා මම ඒ ගැන විශේෂයෙන් කරුණු දක්වන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ Millennium Challenge Corporation එකත් සමඟ කරන සාකච්ඡාව අද ඊයේ පටන් ගත් එකක් නොවෙයි. මෙය 2004, 2005 වර්ෂවලත් තිබුණු සාකච්ඡාවක්. ඊට පසුව නැවතත් 2016 දෙසැම්බර් මාසයේදී මේ සාකච්ඡාව ආරම්භ කළා. ආරම්භ කරලා, මෙයින් අපි ඩොලර් මිලියන 480ක් ලබා ගන්නවා. මේ මුදල ලබා ගන්නේ මොකටද? මේ මුදලෙන් වැඩි ප්‍රමාණයක් -ඩොලර් මිලියන 480න් ඩොලර් මිලියන 350ක්ම - ලබා ගන්නේ පොදු ප්‍රවාහනය දියුණු කරන්නයි.

අපි මේ පොදු ප්‍රවාහනය දියුණු කරන්නේ කොහොමද? පොදු ජනතාව තමයි මේ පොදු ප්‍රවාහන සේවය පාවිච්චි කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මෙන්න මේ කාරණය අහන්නට කැමතියි. අපි නම් වායු සමීකරණය කළ වාහනවල යන පුද්ගලයන්. නමුත් පොදු ජනතාව වායු සමීකරණය කළ එවැනි වාහනවල යන්නේ නැහැ. ජනතාව වායු සමීකරණය කළ බස්වල යනවාට විරුද්ධ වන්නේ කවුද කියා මම අහන්න කැමැතියි. මෙමඟින්, විද්‍යුත් වාහන කළමනාකරණයක් තමයි කරන්නේ; එයට, "electronic traffic management" කියා කියනවා. බස් නැවතුම් පොළට යන්නට ඉස්සර වෙලා, ඊළඟ බස් රථය කීයටද බස් නැවතුම් පොළට එන්නේ, ඊට පස්සේ එන බස් එක කීයටද එන්නේ කියා මගේ අතේ තිබෙන දුරකථනයෙන්ම මට සොයන්නට පුළුවන්. බස් නැවතුම් පොළ දක්වා මට පයින් යන්න තිබෙනවා නම්, ඒ සඳහා පැය භාගයක් යනවා නම් හරියටම කාලය කළමනාකරණය කර ගෙන මට එතැනට යන්නට පුළුවන්. මේ විධියට ප්‍රවාහනය දියුණු ක්‍රමයකට ගෙන යන සැලැස්මක් වෙනුවෙන් තමයි මේ ඩොලර් මිලියන 350 පාවිච්චි වෙන්නේ. විද්‍යුත් apps මඟින් ඒ විස්තර ලබා ගන්නට පුළුවන්. මේ වාගේ දියුණුවකට ඇයි මේ විරුද්ධ වන්නේ කියලා මම අහන්නට කැමතියි. මේවා නොදැනුවත්කම නිසා කියන දේවල් වෙන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශය, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, මිණුම් දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය, ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලය, හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශයේ තක්සේරු දෙපාර්තමේන්තුව කියන මේ සියලුම රජයේ ආයතන සම්බන්ධවෙලායි මේ කාර්ය භාරය ඉටු කර ගෙන තිබෙන්නේ. මේවා සඟවා කරන දේවල් නොවෙයි, විවෘතව කරන දේවල්. මෙය සෑහෙන කාලයක් අරගෙන, විද්‍යාත්මක පදනමකින් කරන දෙයක්ය කියන එක මම මෙහිදී සඳහන් කළ යුතුයි.

මේ MCC එකට ලංකාවේ කාර්යාලයක් නැහැ. මේවා ක්‍රියාත්මක කිරීමේ කාර්යාංශයක් අපි මේ රටේ ඇති කරනවා. මේක තමයි, ප්‍රවාහන සේවාවේ යටිතල පහසුකම් දියුණු කරන්න කරන වැඩ පිළිවෙළ. මේ ප්‍රවාහන වැඩ පිළිවෙළේදී, විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අපි මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා. විද්‍යුත් ක්‍රමයෙන් මංසන්ධි 132 ක් - 132 junctions - කොළඹ අවට ප්‍රදේශවල හදා ගෙන යනවා. ඇත්තටම මේ ක්‍රමයෙන් මොකක්ද සිද්ධ වෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "සහසර බස්" කියා වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි දන්නවා, අද රජයේ - SLTB - බස් තිබෙන බව; පෞද්ගලික අංශයේ බස් තිබෙන බව. අපි පාරට ගියාම දකිනවා, මේ දෙගොල්ලන්ම -එකක් අනෙක් එකත් එක්ක- තරග කරන ආකාරය. එසේ විය යුතු නැහැ. මේ "සහසර බස්" ක්‍රමය මේ අංශ දෙකම එකතු කරලායි ක්‍රියාත්මක කරන්නේ. මේකෙන් මොනවාද වෙන්නේ? මේ සහසර ප්‍රවාහන ක්‍රමය තුළ ගෙවීම් සිදු වෙන්නේ smart card එකක් හරහායි. හැම දාම purse එක ඇරලා, "බස් ගාස්තුව ගෙවන්න ඕනෑ, ඉතිරිය ලැබෙයිද?" කියා අපි හිතනවා. නමුත් මේකෙදි එහෙම සිතන්න ඕනෑ නැහැ. අපි උදාහරණයක් ගනිමු. බස් එකක රුපියල් 25ක දුර යනවා නම්, රුපියල් 30ක් දුන්නාම, "ඉතිරිය දෙන්න මාරු සල්ලි නැහැ" කියනවා. හැබැයි මේ ක්‍රමය තුළ එවැනි කිසි දෙයක් සිදු වෙන්නට බැහැ. Smart card එක පාවිච්චි කර, ගෙවිය යුතු මුදල හරියටම ගෙවන්නට පුළුවන්. ඒ වාගේම schedule එක හදනවා; ඒ කියන්නේ මේ "සහසර බස් සේවාව" අනුව schedule එක හදනවා. ඒ වාගේම මේ තුළ කාන්තාවන්ට ආරක්ෂාව තිබෙනවා. මොකද මේ සඳහා විද්‍යුත් මාර්ගයි පාවිච්චි කරන්නේ. දැන් තිබෙන පොදු ප්‍රවාහන සේවය තුළ, කාන්තාවන්ට හිංසා, පීඩා සිද්ධ වෙනවාය කියා සමීක්ෂණවලින් පෙන්නුම් කරනවා. කාන්තාවන් දහදෙනෙක් ගත්තොත්, අටදෙනෙක් කියනවා, පොදු ප්‍රවාහන සේවාවල ගියොත් යම්කිසි බලපෑමක් ඇති වෙලා තිබෙනවාය කියා. සමීක්ෂණ අනුවයි මේවා කියන්නේ. එයට විද්‍යාත්මක පදනමක් තිබෙනවා. නමුත් මේ වාගේ ක්‍රමයක් හැදුවාම, කාන්තාවන්ට පොදු ප්‍රවාහන සේවාවකින් ගමන් කරනකොට ආරක්ෂාවක් තිබෙනවා. අද මේ රටේ වැඩ කරන ජනතාවගෙන් සියයට 36ක් පමණයි, labour force එකට කාන්තා නියෝජනය ඇතුළත් වෙලා ඉන්නේ. අපි මේ ක්‍රමය දියුණු කළොත්, ඒ අයට හිරිහැරයක් නොමැතිව වැඩපොළට ඇවිත් යන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ඒ අයව අපි උනන්දු කරවනවා. අපි මේ දේවල් කරන්නේ කාන්තාවන්ගේ ආරක්ෂාව සඳහායි.

අන්තර් පළාත් මාර්ග සඳහාත් අපි මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. කොළඹ විතරක් නොවෙයි, මධ්‍යම පළාත, සබරගමුව පළාත, ඌව පළාත සහ නැඟෙනහිර පළාත තුළත් මේ සහසර ක්‍රමය යටතේ විද්‍යුත් ප්‍රවාහන පහසුකම් ඇති කිරීමට අප කටයුතු කරනවා. MCC එකෙන් ලැබෙන ඩොලර් මිලියන 480න් 350ක්ම වියදම් කරන්නේ ඒ සඳහායි.

ඊට පසුව තව ඩොලර් මිලියන 67ක් අපි වියදම් කරනවා. විශේෂයෙන්ම මේ ඩොලර් මිලියන 67 අපි වියදම් කරන්නේ land project එකක් සඳහායි; spatial data and land rights information maximization project එකක් කරනවා. මේක ඉඩම් පිළිබඳ දත්ත එකතු කිරීමේ වැඩ පිළිවෙළක්. අද ඉඩමක අයිතිය තිබුණත්, එය කොළයකට සීමා වෙලා තිබෙන බව අපි දන්නවා. එය deed එකකයි තිබෙන්නේ. මේක අපි deed එකෙන් dataවලට හරවනවා. මේකෙන් තව හොඳ දෙයක් වනවා. රජයට අයිති ඉඩම් මොනවාද කියා අද හරියටම හොයා ගන්නට බැහැ. ඒ කටයුත්ත පෞද්ගලික අංශයට භාර දීලා තිබෙනවා නම් ඒ අය එම මුදල් ගෙවනවාද, නැද්ද කියන එක හරියට සොයා ගන්න අමාරුයි. අනික් ව්‍යාපාර වාගේම තමයි, මේවා වැඩි වැඩියෙන් electronic මාර්ගයට දමන එකෙන් මම හිතන විධියට ප්‍රශ්න සැහෙන්න අඩු වනවා; අපිට මේ ක්‍රම සහ විධි යෙදීමෙන් දූෂණය අවම කරන්න පුළුවන්. සමහර වෙලාවට deed එක හොයා ගන්න කච්චේරියට ගියාම deed එක නැහැය කියනවා; පුච්චලාය කියනවා. හුඟක් වැරැදි දේවල්, දූෂිත දේවල් සිදු වෙනවා. මේවා අවම කරන්න අපි කටයුතු කළ යුතුයි.

විශේෂයෙන්ම මේක රජයේ ආදායමට අදාළ වෙනවා. ඒ වාගේම digitization එක හරහා අපිට වංචාව අඩු කරන්න පුළුවන්. කාලය මදි නිසා මම ඒ ගැන විස්තර කියන්න යන්නේ නැහැ. ඒ ක්‍රමය ඇති කරන්නට ඩොලර් මිලියන 67ක් වැය වනවා. ඊට අමතරව ඩොලර් මිලියන 63ක් ඒකේ තාක්ෂණික සහායට වෙන් කර තිබෙනවා; ශක්‍යතා අධ්‍යයනයට වෙන් කර තිබෙනවා; නිර්මාණයට වෙන් කර තිබෙනවා; ව්‍යාපෘති පරිපාලනයට වෙන් කර තිබෙනවා. ඩොලර් මිලියන 480න්, ඩොලර් මිලියන 350ක් පොදු ප්‍රවාහනයටයි යන්නේ. ඉතිරි කොටසෙන් ඩොලර් මිලියන 67ක් යන්නේ digital Land Registry එක හදන්නයි.

මේක හදන්නේ සුද්දන්ට ඉඩම් විකුණන්නය කියා කථාවක් යනවා. මේක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. අපි මේවා ගැන බය වෙන්න ඕනෑ නැහැ. මේ කටයුතු කරන එකෙන් විනිවිදභාවය වැඩි වනවා. සුද්දන්ට ඉඩම් විකුණනවාද, නැද්ද කියන එක මේවා තිබුණත් නැතත් සිදු වෙන්න පුළුවන්. ඒවා ප්‍රතිපත්තිමය තීරණයි. ගන්න තීරණ අනුව ඒවා වෙනස් වනවා. නමුත් මේකෙන් ඒ කටයුත්ත සිදු වෙන්නේ නැහැ. මේ තුළින් විනිවිදභාවය වැඩි වනවා, කාර්යක්ෂමතාව වැඩි වනවා, පොදු ජනතාවට විශාල ලාභයක් ලැබෙනවාය කියන කාරණයත් මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා.1.32]

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ, "මහ හිටියොත් තෝ නසී - ගෙදර ගියොත් අඹු නසී" කියන තත්ත්වයටයි. අද එක් පැත්තකින් මේ රටේ ජාතික ආරක්ෂාව කඩා බිඳ දමලා, විනාශ කරලා අවසානයි. අනික් පැත්තෙන්, බොරු පොරොන්දු රාශියක් දීලා, මේ රටේ ජනතාවගේ ආර්ථික මට්ටම විනාශ කර දමලා අවසානයි. ආර්ථිකය කාබාසිනියා කරලා, මේ රටේ ජාතික ආරක්ෂාව කාබාසිනියා කර දමලා, අලුත් පනත් ගෙනැල්ලා, ස්වෛරී බැඳුම්කරවලට පිට රට මිනිසුන්ට මුදල් ගෙවීමේ හැකියාව තවත් ශක්තිමත් කිරීමේ පනත් තමයි මේ ගෙන එනු ලබන්නේ. ඒ තුළින් අද රටේ ජනතාවට එක් පැත්තකින් ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙනවා. අනික් පැත්තෙන්, එදා වේල හොයා ගෙන කන්න බැරි තත්ත්වයකට පත් වනවා. කම්කරු රස්සාවක් කරලා දරුවන්ගේ කුස පුරවා ගැනීමට නොහැකි තත්ත්වයකට අද මේ රටේ ජනතාව පත් වෙලා ඉන්නවා. පාරේ ඉඳලා වෙඩි කනවාද, ගෙදර ගිහිල්ලා කුසගින්නේ මැරෙනවාද කියන තත්ත්වයට අද අපේ රටේ ජනතාව පත් වෙලා අවසානයි. මේ ස්වෛරී බැඳුම්කර කථාව කෙසේ වෙතත්, බැඳුම්කර ගනුදෙනුව ගැන කථා කරද්දී ඇගේ මාළු ගහේ නටන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මේ රටේ ජනතාවට පොරොන්දු රාශියක් ලබා දීලා, බොරු කප්පරක් කෙළලා, බලයට පත් වෙලා මාස දෙකෙන් මහ බැංකුව හිල් කරලා, මේ රටම, ජාතියම විනාශ කර දැම්මා. පික්පොකට් ගැහුවා. අනික් පැත්තෙන්, ස්වෛරීත්ව බැඳුම්කර ගැන කථා කරනවා. මේ ආණ්ඩුව මෑතක ඉඳලා ලොකු බොරු ටිකක් කෙළිනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4ක ණයක් ගන්නවාය කියා. ගත්තේ ණයක් තමයි. ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් තමයි මේ මුදල් සපයා ගන්නේ.

එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ කිව්වේ, "ගිනි පොලියට ණය ගන්නවා." කියා. අපි එදා වසර පහක කාලයකට ස්වෛරීත්ව බැඳුම්කර ගත්තේ, 5.125 පොලියට. මේ ආණ්ඩුව මේ වසර හතර ඇතුළත අරගෙන තිබෙන්නේ, 7.825 ගිනි පොලියට. මේ වසර හතර තුළ වැඩි පොලියකට තමයි ස්වෛරීත්ව බැඳුම්කර අරගෙන තිබෙන්නේ. අඩුම තරමේ මේ ආර්ථික ඔස්තාර්ලාට හැකියාවක් නැහැ, මහින්ද රාජපක්ෂ යුගයේ ගත්ත පොලී අනුපාතයටවත් ස්වෛරීත්ව බැඳුම්කර ටික ලබා ගන්න.

මේ රටේ ණය බර අඩු කරනවා කියායි ආණ්ඩුව බලයට ආවේ. ණය බර අඩු කරනවා කියා ඇවිල්ලා, 2015 - 2019 කාලයේ විතරක් බැඳුම්කර නිකුතුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 10,050ක මුදලක් මේ ආණ්ඩුව ගන්නවා. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු නවයට ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ගත්තාට වඩා, සියයට 71කින් වැඩි වෙලා තිබෙනවා. මෙන්න ආර්ථික ඔස්තාර්ලාගේ කෙරුවාව. "ණය බර අඩු කරනවා." කියා බලයට ආවට, අද අපි විශාල ණය කන්දරාවක් මතයි ඉන්නේ. "අපි ආවම ණය ගන්නේ නැහැ. අපි ආවාම මිනිසුන්ගේ අත මිට සරු කරනවා. සාක්කු පුරවනවා." කිව්වා. හැබැයි, 2015 - 2019 කාල පරිච්ඡේදය තුළ මේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව බිලියන 6,600ක් ණය ලබාගෙන තිබෙනවා. අපි අවුරුදු නවයටම අරගෙන තිබෙන්නේ, බිලියන 5,000යි. හැබැයි, අපි මේ රටේ ඇහැට පෙනෙන සහ ඇඟට දැනෙන දැවැන්ත සංවර්ධනයක් කළා. විශාල සංවර්ධනයක් කළා. නමුත්, පසු ගිය වසර හතර තුළ ඊට වඩා වැඩි ප්‍රමාණයක් ණය අරගත්තාට මේ රටේ ජනතාවට ඇඟට දැනෙන සහ ඇහැට පෙනෙන කිසිම දෙයක් වෙලා නැහැ. අද රටේ ජනතාව කබලෙන් ළිපට ඇද දමන තත්ත්වයට පත් කර ඉවරයි. ඒකයි මේ ආණ්ඩුව කරපු වැඩේ. ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව තුළින් පමණක් -පොලී අනුපාතය වැඩි වීම නිසා පමණක්- පසු ගිය කාලයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 834ක් අපට පාඩු වෙලා තිබෙනවා. ගත් විදේශ ණය වෙනුවෙන් වැඩිපුර ගෙවන්න අපට සිදු වෙලා තිබෙනවා. එය රුපියල්වලින් ගත්තොත්, රුපියල් බිලියන 151ක්. මේ අදක්ෂ පාලනය නිසා, ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණය නිසා තමයි පසු ගිය අවුරුදු හතර ඇතුළත ඇමෙරිකානු ඩොලර් මිලියන 834ක් -රුපියල් බිලියන 151ක්- ගෙවන්න වෙලා තිබෙන්නේ. ඔන්න ස්වෛරීත්ව බැඳුම්කරවල තත්ත්වය. එදා මහ බැංකු බැඳුම්කර වංචාව නිසා සිදු වූ පාඩුව බිලියන 145යි. මේකෙන් බිලියන 151යි. දුර්වල ආර්ථික කළමනාකරණය නිසා රුපියලේ අගය කඩා වැටුණා. රුපියල මස්තබාල්දු වීම තුළ, ඩොලරයේ අගය ස්ථාවර නොවීම තුළ විතරක් මේ වනකොට මිලියන 1,497ක් ගෙවන්න වෙලා තිබෙනවා.

ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණය නිසා විතරක් පසු ගිය අවුරුදු හතර ඇතුළත රුපියල් බිලියන 2,073ක් මේ රටට

[ගරු ප්‍රසන්න රණවීර මහතා]

අහිමි කර තිබෙනවා. මේ රටේ ජනතාව ණයකාරයෝ බවට පත් කර තිබෙනවා. රුපියල් බිලියන 2,073ක මුදල වසරක දළ ජාතික නිෂ්පාදනය හා සමානයි. හැබැයි කියන්නේ, "ණය බර. ණය බර. මහින්දගේ ණය බර." කියායි. මේ වසරට විතරක් ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් ගෙවන්න වෙලා තිබෙනවා. එය රුපියල්වලින් ගෙව්වොත් බිලියන 1,073යි. හැබැයි, මේ ආණ්ඩුව රටට කරපු විනාශය, මේ ආර්ථික ඔස්තාර්ලා රටට කරපු විනාශය, බිලියන 2,073යි. එදා අපට හම්බන්තොට වරාය හදන්න ගියේ, මිලියන 151යි. මේ ආර්ථික ඝාතකයෝ විනාශ කළ මුදලින් හම්බන්තොට වරාය වාගේ වරායන් 15ක් හදන්න තිබුණා.

මේ ආර්ථික ඝාතකයෝ රට විනාශ කරපු ප්‍රමාණයට කොළඹ-කටුනායක වැනි අධිවේගී මාර්ග සිය ගුණයක් හදන්න තිබුණා. මේ ආර්ථික ඔස්තාර්ලා විනාශ කරපු මුදල ඉතිරි කර ගත්තා නම්, විනාශ කළේ නැත්නම් කොළඹ-මාතර වාගේ අධිවේගී මාර්ග තිහ, හතළිහක් විතර හදන්න තිබුණා. ආර්ථිකය නිසියාකාරව කළමනාකරණය කළා නම්, ණය බර, ණය බර කියා අද අඬන්න ඕනෑ නැහැ. මේ ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණය තුළ විතරක් රුපියල් බිලියන 2073ක් පාඩුයි. මේ අවුරුද්දේ ඩොලරය රුපියල් 180ට තිබෙන නිසා බිලියන 1073ක් ගෙවන්න ඕනෑ. එදා මහින්ද රාජපක්ෂ යුගයේ වාගේ ඩොලරය රුපියල් 131ට තිබුණා නම්, අද ගෙවන්න තිබෙන්නේ බිලියන 873යි. ණය ගෙවන එක මහ ලොකු ප්‍රශ්නයක් නොවෙයි. තමන්ගේ නොහැකියාව ගැන අද ප්‍රකාශ කරන්නේ නැහැ. ආර්ථික සැලැස්මක්, වැඩ පිළිවෙළක් නැති එක ගැන කියන්නේ නැහැ. අද මුදල් ඇමති එකක් කියනවා. අගමැති තව එකක් කියනවා. එක එක්කෙනාට ඕනෑ විධියට තමයි ආර්ථික ප්‍රතිපත්ති නිකුත් කරන්නේ. එක ප්‍රතිපත්තියක ඉඳලා මේ රටේ ආර්ථිකය කළමනාකරණය කළා නම්, මේ රටට මේ විත්නැහිය සිදු වෙන්නේ නැහැ. කලින් කිව්වා වාගේ එක පැත්තකින් අපේ රටේ ජාතික ආරක්ෂාව විනාශ වෙලා. ජාතික ආරක්ෂාව බිඳ වැටිලා මහ භයකින් ජීවත් වෙන යුගයක්. අනෙක් පැත්තෙන් ආර්ථිකය කඩලා, විනාශ කරලා එක වේලක් කාලා එක වේලක් නොකා සිටින තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. මේ රටේ ජාතික ආරක්ෂාවවත් තිබුණා නම් එහෙම වුණාට කමක් නැහැ. මහ ලොකුවට විදේශ සංචාරකයින් එනවා කිව්වා. අද ලංකාවේ සංචාරකයන් 1,700යි ඉන්නේ. ලක්ෂ ගණන් සංචාරකයන් ගෙනෙනවා කියායි කිව්වේ. සංචාරකයන් ලක්ෂ ගණන් ගෙනෙනවා කිව්වත්, ජාතික ආරක්ෂාව සම්බන්ධව වැඩ පිළිවෙළක් තිබුණේ නැති නිසා අපේ රට ජාතික ආරක්ෂාව පැත්තෙන්, ආර්ථිකමය වශයෙන් සහ ව්‍යාපාරික වශයෙන් විනාශ වෙලා ඉවරයි. මේ රටේ ඇමතිවරුන්ගේ ආරක්ෂාව වෙනුවට ජනතාවාදී ආරක්ෂක වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්, රටේ ජනතාව නැවත නහා සිටුවන්න පුළුවන් ආණ්ඩුවක් හැදීමට අපිත් සමඟ එකතු වෙන්න කියන ආදරණීය ඉල්ලීම කරමින්, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. අඩුත්තු, கௌரவ ஏ.எல்.எம். நசீர் அவர்கள்.

[பி.ப. 1.42]

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கௌரவமான இந்தச் சபையிலே நிதி அமைச்சினுடைய இந்தப் பிரேரணையின்மீது பேசுவதற்குச் சந்தர்ப்பம் வழங் கியமையையிட்டு நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, இந்த நாட்டிலே நிதி ஒதுக்கீடுகள் மட்டுமல்லாமல் அபிவிருத்தி சம்பந்தப்பட்ட எல்லா விடயங்களும் நிதி அமைச்சினூடாகத்தான் மேற்கொள்ளப் படுகின்றன என்பதை நான் இந்தச் சந்தர்ப்பத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். கடந்த 2015க்குப் பிறகு இந்த நல்லாட்சியினூடாக நாட்டிலே பரவலாக அபிவிருத்தி கள் இடம்பெறுவதை நாங்கள் பார்க்கின்றோம். அதிலும் குறிப்பாக 2017இல் இந்த அரசாங்கத்தால் அறிமுகப்படுத்தப் பட்ட 'கம்பெறளிய' வேலைத்திட்டத்தின்மூலம் பல்வேறு கிராமிய அபிவிருத்தி வேலைத்திட்டங்கள் இலங்கையிலுள்ள எல்லாப் பாகங்களிலும் இடம்பெறுவதை நாங்கள் பார்க்கின்றோம். RIDP என்றும் REDP என்றும் RRDP என்றும் கிராமிய வேலைத்திட்டங்களினூடாக எல்லாப் பாகங்களிலும் அபிவிருத்திகள் மிகவும் நன்றாக மேற்கொள்ளப்படுவதை நாங்கள் பார்க்கின்றோம். இருந்தாலும், நிதி அமைச்சினூடாக வழங்கப்படும் நிதி முழுமையாகக் கிடைக்கவில்லை என்ற ஒரு குறைபாடு இருப்பதைப் பற்றி இந்த நாட்டிலே பரவலாக எல்லா இடங்களிலும் பேசப்படுகின்றன.

குறிப்பாக, கடந்த வரவு செலவுத் திட்டத்திற்கு முன்னர் 200 மில்லியன் ரூபாய் ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் அந்தந்தப் பிரதேசங்களில் இருக்கின்ற ஆசனங்களின் அடிப்படையில் 'கம்பெறளிய' வேலைத்திட்டத்தினூடாக ஒதுக்கீடு செய்யப்பட்டது. அந்த வகையில், எனது பொத்துவில் தொகுதிக்கும் 200 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டது. ஆனால், அதில் 163 மில்லியன் ரூபாய்தான் வழங்கப்பட்டிருந்தது. மீதி 37 மில்லியன் ரூபாய் வழங்கப்பட வேண்டும். வரவு செலவுத் திட்டத்திற்குப் பிறகு ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் 100 மில்லியன் ரூபாய் கொடுத்ததாக நான் கேள்விப்படுகின்றேன். கௌரவ நிதியமைச்சர் அவர்களே, இந்த நிதிகள் இன்னும் அந்த வேலைத்திட்டங்களைச் செய்த ஒப்பந்தக்காரர்களுக்கு வழங்கப்படாத நிலையில், இன்று பரவலாக அபிவிருத்தி வேலைத்திட்டங்கள் முடங்கிக் கிடக்கின்றன. அதாவது, நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி மற்றும் பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சினாலும் எங்களுடைய கௌரவ றவுப் ஹகீம் அவர்களுடைய Minister of City Planning, Water Supply and Higher Education அமைச்சினாலும் நாங்கள் பல அபிவிருத்திகளைச் செய்தபோது, அவற்றுக்குரிய நிதிகள் நிதியமைச்சினூடாக வழங்கப்படாமையால் இன்று அந்த அமைச்சுக்களிலிருக்கின்ற நிர்வாகங்கள் முடங்கியிருக்கின்ற ஒரு நிலையினை நான் பார்க்கின்றேன். குறிப்பாக, எங்களுடைய பிரதேசங்களிலே கௌரவ அமைச்சர் றவுப் ஹகீம் அவர்களுடைய அமைச்சினூடாக நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, அந்த வேலைத்திட்டங்கள் முன்னெடுக்கப் பட்டபோதிலும், நிதியமைச்சினூடாக அதற்குரிய நிதி உரிய அமைச்சுக்கு வழங்கப்படாத காரணத்தினால் அந்த ஒப்பந்தக்காரர்கள் மிகவும் சிரமப்படுகின்ற நிலைமையையும் அவர்கள் மீண்டும் மீண்டும் வேலைத்திட்டங்களை எடுத்துச் செய்வதற்குப் பின்னிற்கின்ற ஒரு நிலைமையையும் நாங்கள் பார்க்கின்றோம்.

மேலும், அண்மையில் நாட்டிலே ஏற்பட்ட பிரச்சினைகள் சம்பந்தமாக சமகால அரசியலிலே எங்களுடைய முஸ்லிம் சகோதரர் ஒருவர்மீது குற்றஞ்சாட்டப்பட்ட நிலையில், இன்று எல்லோரும் எங்களனைவரையும் சந்தேகக் கண்கொண்டு

பார்க்கின்ற ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. அந்த நிலைமையினை நாங்கள் முற்றாக இல்லாமற்செய்ய வேண்டும். ஏனென்றால், எங்களுடைய எண்ணங்களில் "இது எங்களுடைய நாடு" என்றொரு விடயத்தில் நாங்கள் எல்லோரும் திடசங்கற்பத்துடன் இருக்கின்றோம். இந்தப் பாராளுமன்றத்தில் 22 முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கின்றார்கள். "இது எங்களுடைய நாடு; இதில் எல்லா மதத்தவர்களும் ஒன்றாக இருக்க வேண்டும்" என்பதில் நாங்கள் எல்லோரும் மிகவும் தெளிவாக இருக்கின்றோம். அண்மையில் கௌரவ நிதி அமைச்சர் மங்கள சமரவீர அவர்கள் நல்லதொரு கருத்தைத் தெரிவித்திருந்தார். அது என்னவென்றால், "இந்த நாடு சிங்களவர்களுக்கு மாத்திரமல்ல, எல்லோருக்கும் உரித்தானது; சட்டத்தின் முன் எல்லோரும் சமம்" என்ற விடயத்தை அவர் மிகவும் தெளிவாகக் கூறியிருந்தார். எனவே, வளமான இந்த நாட்டிலே மூன்று சமூகங்களும் ஒன்றாக அமர்ந்து பேசி சில விடயங்களை மேற்கொள்கின்றபோது, இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற பிரச்சினைகள் இனி ஒருபோதும் ஏற்படாது.

கௌரவ அமைச்சர் அவர்களே, நான் இங்கு குறிப்பிட்ட வாறு இந்த நாட்டிலே அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுத்த ஒப்பந்தக்காரர்களுக்கு வழங்கப்படவேண்டிய நிதி இன்னமும் வழங்கப்படாமல் தாமதப்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்ற ஒரு நிலைப்பாட்டில், நாட்டில் எவ்வாறு அபிவிருத்திகளைச் செய்வது என்ற கேள்வி எழுந்திருக்கின்றது. இதை நிவர்த்தி செய்யவேண்டுமென்றால், நீங்கள் உங்களுடைய அமைச்சினூடாக இது தொடர்பில் துரித நடவடிக்கைகளை முன்னெடுக்கவேண்டும். அவ்வாறு நடவடிக்கை எடுக்கின்றபோதுதான், எங்களால் இந்த நாட்டிலே எந்தவோர் அபிவிருத்தித் திட்டத்தையும் சரியாகச் செய்யமுடியும் என்பதை இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். எனவே, 2017 - 2018ஆம் ஆண்டு காலப்பகுதியில் அபிவிருத்தி வேலைத்திட்டங்களை மேற்கொண்ட ஒப்பந்தக்காரர்களுக்குக் கொடுக்கப்படாமல் இருக்கின்ற நிலுவைக் கொடுப்பனவுகளை உடனடியாக கௌரவ நிதி அமைச்சர் அவர்கள் வழங்கவேண்டும் என்பதில் நான் உறுதியாக இருக்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)

நாங்கள் எங்களுக்குள்ளேயே பிரிவுகளை வைத்துக் கொண்டு இந்தப் பாராளுமன்றத்திலே பேசுகின்றோம். வாக்களிக்கின்ற மக்கள் எங்களை வேறொரு கோணத்திலே பார்க்கிறார்கள். நேற்றுக்கூட பாராளுமன்றத்திலே அப்படியான விடயங்கள் பேசப்பட்டன. எங்களுக்குள் பரிமாறப்படுகின்ற விடயங்கள் மக்களுடைய பார்வையிலே எவ்வாறு இருக்கின்றது என்று சொன்னால், கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கூறியதுபோன்று, எதிர்வருகின்ற தேர்தலில் ஏன் இவர்களுக்கு வாக்களிக்கவேண்டும்? என்றதொரு நிலைப்பாட்டை மக்களிடத்திலே ஏற்படுத் துமளவுக்கு நிலைமைகளை உருவாக்கியிருக்கின்றது. அவ்வாறில்லாமல், எங்களுடைய அமைச்சர்கள், பிரதி அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் இந்தப் பாராளுமன்றத்திலே நல்ல கருத்துக்களைப் பரிமாறுகின்றபொழுது, எங்கள்மீதான மக்களுடைய பார்வை மிகவும் நல்ல கண்ணோட்டமுடையதாக இருக்குன்று நான் நினைக்கின்றேன். நாங்கள் எங்களுக்குள்ளே நல்ல பண்புகளை, நல்ல பண்பாடுகளை வளர்த்துக் கொண்டால் தான் இந்தப் பாராளுமன்றத்தை நாட்டுக்குத் தேவையான சட்டங்களை, சட்டவிதிகளை உருவாக்குகின்ற கௌரவமான ஒரு சபையாக மக்கள் பார்ப்பார்கள். கௌரவ சபாநாயகர் அவர்களே, இந்தச் சட்டமன்றத்தின் தலைவராக இருக்கின்ற நீங்கள் இதனைக் கருத்திற்கொண்டு உறுப்பினர்களைக் கண்ணியமாக வழிப்படுத்தி, நெறிப்படுத்த வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்கின்றேன். விசேடமாக, கௌரவ அமைச்சர் மங்கள சமரவீர அவர்களுக்கு நான் இந்தச் சந்தர்ப்பத்தில் நன்றியைக் கூறுகின்றேன். ஏனென்றால், கிராமிய அபிவிருத்தி வேலைத்திட்டம் என்கின்ற அடிப்படைத் திட்டத்தினை அவர் செயற்படுத்தியிருக்கின்றார். அதிலும் பலவிதமான பிரிவுகள் இருக்கின்றன. அதற்கான நிதியை நிதி அமைச்சுக்கூடாக பரவலாக எல்லா அமைச்சுக்களுக்கும் வழங்குகின்றபோது மக்களுடைய தேவைகள் மிகவும் சிறப்பாகப் பூர்த்தியடையும் என்று இந்தச் சந்தர்ப்பத்தில் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.1.50]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලැබී තිබෙන වෙලාව සීමිත නිසා ඉතාම කෙටියෙන් මගේ කථාව කරන්න බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන් මේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ඒ කියන්නේ Sovereign Bonds අද හැම රටකම පාහේ ආර්ථිකයේ එක්තරා අංශයක් බවට පත්වෙලා තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, වෙනත් රටවලත් විශේෂයෙන්ම තමන්ගේ විදේශ විනිමය සහ විදේශ අය වැය සකස් කර ගැනීමට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කරනවා. බැඳුම්කර නිකුත් කිරීම සහ ලබා ගැනීම දීර්ඝ කාලයක් තිස්සේ අපේ ආර්ථිකයේ ස්වරූපයක් බවට පත්වෙලා තිබෙනවා. මීට පෙරත් විවිධ රජයන් ණය ගත්තා. මේ රජයත් ණය ගන්නවා. නමුත් අපි මෙහි අභ්‍යන්තරය බැලුවාම විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතු කාරණා කිහිපයක් තිබෙනවා.

පළමුවන ප්‍රශ්නය තමයි, අපි මේ බැඳුම්කර ගන්නේ ඇයිද කියන එක. අපි ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහින් එක්තරා වෙනස් වන පොලී අනුපාතයක් මුල් කරගෙන ලංකාවට ඒ සල්ලි ගන්නේ ඇයි? ඒ ප්‍රශ්නය තමයි ඉතාමත් වැදගත්. ඒ බැඳුම්කරවලට යෑම නිරූපණය කරන්නේ අපේ ආර්ථිකයේ අර්බුදයක්; crisis එකක්. මොකක්ද, ඒ crisis එක? අපේ ආදායම විශේෂයෙන්ම අපේ විදේශ විනිමය ඉපැයීම අපේ අවශ්‍යතාවලට සාපේක්ෂිතව ඉතාම අඩුයි; මදි. රටක් හැටියට අපි යම් ආයෝජනයන් කරන්න ඕනෑ නම්, යම් වැඩසටහනකට යන්න ඕනෑ නම් අපේ රටින්ම ඇති කර ගන්නා විදේශ විනිමය ඒ කටයුතුවලට මදියි කියලා අපට පෙනෙනවා. ඒ කටයුතු මොනවාද? එකක් තමයි, අපි කලින් ලබාගත් ණයවලට වාර්ෂිකව ආපසු ගෙවන්න අවශ්‍ය විදේශ විනිමය ලබා ගැනීම. රටේ ආර්ථිකය ශක්තිමත් නම් බොහෝ අවස්ථාවලදී අපට භය නැතුව ණය අරගෙන, කලින් වැඩි පොලියකට ගත්ත විදේශ ණයක් තිබෙනවා නම් එය ගෙවා දමන්නත් පුළුවන්. ඒ කාරණය මේකේ හොඳ පැත්තයි. මේකේ නරක පැත්ත තමයි, අපේ ආර්ථිකය ශක්තිමත් නැත්නම් අපි වෙළෙඳ පොළට යනකොට මෙවර අපට ගෙවන්න තිබෙන පොලී අනුපාතය කලින් තිබුණු අනුපාතයට වඩා වැඩි වීම. එතකොට අපට ප්‍රශ්නයකට මුහුණ පාන්න සිද්ධ වෙනවා. මා ඒ පිළිබඳව පසුව විස්තර කරන්නම්.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

දැනට එක කාරණයක් කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් රටක ආරක්ෂාවට එවැනි විදේශ විනිමය සංචිතයක් තිබෙන්න ඕනෑ. දළ වශයෙන් අඩු ගණනේ මාස 6කට මේ රටේ ජනතාවට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා විදේශ රටවලට ගෙවන්න අවශ්‍ය මුදල් ප්‍රමාණයක සංචිතයක් මේ රටේ තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපේ ජනතාවට ඒ සුරක්ෂිතභාවය ලබාදෙන්න බැහැ.

දෙවන කාරණාව මෙයයි. මේ රටේ සංවර්ධනයට අවශ්‍ය උපකරණ හා භාණ්ඩවලටත්, අපේ සංවර්ධන වේගය ලබාගන්න තිබෙන භාණ්ඩවලටත් මුදල් වැය කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා ඒ මුදල් ගන්න කටයුතු කිරීම ඉතාම හොඳයි. නමුත් මෙතැන සිද්ධවෙලා තිබෙන්නේ ඒ මුදල් ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මෙතැන සිද්ධවෙලා තිබෙන්නේ ප්‍රශ්න දෙකයි. එකක් තමයි, අපේ ආර්ථික කළමනාකරණය දුර්වල වුණාම, ඒ ගත්ත මුදල්වලින් මීට පෙර ගත්ත ණය ගෙවන්න ශක්තියක් නැති වීම. එතකොට අපට තව තවත් ණය වෙන්න වෙනවා.

පරණ ණය ගෙවන්න අලුතින් ණය ගන්න වෙනවා. නමුත් භයානක තත්ත්වය වන්නේ, අර පරණ ණයවල තිබුණු පොලී අනුපාතයට වඩා ඉහළ පොලී අනුපාතයකට අපට අලුත් ණය ගන්න වෙන එකයි. එතකොට එන්න, එන්නම අපි අර්බුදයෙන් අර්බුදයට යනවා.

මෙතැනදී අපි අවධානය යොමු කරන්න අවශ්‍ය දේ තමයි පොලී අනුපාතය. අපිට ණය ගන්න පුළුවන්. ඒක එච්චර ලොකු ප්‍රශ්නයක් නොවෙයි. නමුත් අපි ණය ගන්නේ මොන පොලියටද කියන ප්‍රශ්නයට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ලෝක බැංකුව වේවා, IMF එක වේවා, ස්වෛරී බැඳුම්කර ගන්න වෙන පෞද්ගලික බැංකු වේවා මේ හැම එකක්ම ඇත්තවශයෙන් තමන්ගේ මුදල් වෙන රටකට දෙන්නේ ඒකෙන් මුදල ආපසු ගන්නයි, පොලිය ආපසු ගන්නයි. ඒ රටට ඒ විධියට ගෙවන්න බැරි තත්ත්වයක් පෙනී ගෙන එනවා නම්, ඒ මිනිසුන් කියනවා, "උඹලා වැඩියෙන් තව පොලියක් ගෙවපල්ලා" කියලා. එතකොට ඒ පොලී අනුපාතය වැඩි වෙනවා. අපිට තිබෙන භයානක තත්ත්වය තමයි, අපේ රටේ ආර්ථිකය ගැන විශ්වාසය නැති නිසා දැනට අපට පෙනෙන පොලී අනුපාතය එන්න එන්නම වැඩි වීම.

මෙතැනදී කියන්න ඕනෑ ඉතාම වැදගත් දේ තමයි, අපේ විදේශ විනිමය සම්බන්ධව අපිට තවත් භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියන එක. අපිට ස්වභාවයෙන් විදේශ විනිමය ලැබෙන්නේ මොන මොනවායින්ද? පළමුවැනි එක තමයි, විදේශ රටවල සේවය කරලා මේ රටට මුදල් එවන අයගේ මුදල් සංචිතය. දෙවැනි එක තමයි, ඇඟලුම් කර්මාන්තයෙන් අපට ලැබෙන විදේශ විනිමය. තුන්වැනි එක තමයි, සංචාරක ව්‍යාපාරයෙන් අපට ලැබෙන විදේශ විනිමය. හතරවැනි එක තමයි, තේ, රබර්, පොල් වාගේ පැරණි අපනයන භෝගවලින් ලැබෙන සංචිතය. පස්වැනි එක තමයි, මැණික් සහ වෙනත් ඛනිජ ද්‍රව්‍යවලින් අපට ලැබෙන සංචිතය. අපි මේ ක්‍රම පහ ගත්තොත්, මේවාටත් විශාල අර්බුදයක් තිබෙන බව අපට පෙනෙන්න තිබෙනවා. පිටරටවල සේවය කරන අයගෙන් ලැබෙන මුදල අඩු වී ගෙන එනවා. සංචාරක ව්‍යාපාරය හොඳටම බැහැලා තිබෙනවා. අපේ තේ, පොල්, රබර්වලට ලැබෙන මිලත් අපට හෙට්ටු කරන්න වෙනවා. අපිට හුභාක් කල්පනාවෙන් කටයුතු කරන්න සිද්ධ වෙනවා.

මේ අවස්ථාවේදී අපි සියලු දෙනාම මතක් කරගත යුතු දෙයක් තිබෙනවා. එනම්, මේ රටට මුදල් ආයෝජනය කරන, මේ රටට මුදල් එවලා මේ රටේ විදේශ විනිමය සංචිතය වැඩි කරන ඒ හැම දේකටම අපි උදවු කරන්න ඕනෑ; ආධාර කරන්න ඕනෑ කියන එක. දැන් ඉතාම භයානක දෙයක් අපට පෙනෙන්න තිබෙනවා. මේ රටේ විදේශ විනිමය උපදවන හොඳ ආයතන තිබෙනවා. විශාල කැපවීමක් කරලා, මේ රටේ ජනතාවගෙන් විශාල සංඛ්‍යාවකට රැකියා දෙන එවැනි ආයතනවලට පවා නොයෙක් විධියේ කටකථාවලින් තර්ජන කරලා තිබෙනවා. මම හොඳටම දන්නා ආයතනයක් තමයි "හේමාස්" කියන ආයතනය. ඇත්තවශයෙන්ම එම ආයතනය විශාල ආයෝජනයක් කරලා තිබෙනවා, මේ රටේ සංචාරක කර්මාන්තයට, සෞඛ්‍ය අංශයට. එම ආයතනයේ වැඩියෙන්ම සේවය කරන්නේ, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් මිනිස්සු. දැන් ඒකට පහර ගහනවා. මාස් හෝල්ඩින්ග්ස්, බ්‍රැන්ඩික්ස් වැනි මේ රටට විදේශ විනිමය ලබා දෙන ආයතනත් මේ වේලාවේ අපි රැක ගන්නට ඕනෑ. මොකද, මේ ජාතිවාදය මේ අංශයට ගෙනාවොත්, ජාතිවාදය අපේ ආර්ථික ක්ෂේත්‍රයට ආවොත්, මේ රටට ලොකු විනාශයක් වෙනවා. එතකොට එක පැත්තකින් මේ කියන විධියේ බැඳුම්කර ලබාගන්න අමාරු වෙනවා. දෙවනුව, බැඳුම්කර ලබා ගත්තත් රටට දරා ගන්න බැරි විශාල පොලියකට තමයි ඒ මුදල් ගන්න සිද්ධ වෙන්නේ.

රටක් වුණාම, අය වැයක් හැදුවාම, ඒක අතහැර දමන්න බැහැ. ඒකට අවශ්‍ය මුදල් කොහෙන් හරි හොයාගන්න ඕනෑ. බැංකුවලින් ගන්න පුළුවන්. නමුත් අපට ආර්ථික ශක්තියක් නැත්නම්, අපේ එකමුතුකමක් නැත්නම්, සටනක් දෙන්න තරම් අපට හයියක් නැත්නම් අපේ ආර්ථිකය ගොඩනඟන්න ඒ විධියේ වාතාවරණයක් අපට හදාගන්න බැරි වුණොත් සිදුවෙන්නේ, අනිවාර්යයෙන්ම ඒ පොලී අනුපාතය ඉහළ යන එකයි. ඒ නිසා අපි සියලු දෙනාම මේ වේලාවේ කරන්න තිබෙන්නේ, එම අංශ ගොඩනඟන එකයි. මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා, සංචාරක ව්‍යාපාරය භාරව කටයුතු කරන මගේ හිතවත් ජෝන් අමරතුංග ඇමතිතුමාත් මේ වේලාවේ සභාවට ඒම ගැන. මොන කැපවීමක් කරලා හෝ මේ රටට විදේශ විනිමය ගෙනෙන ඒ ආයතන අපි ගොඩනඟන්න ඕනෑ. එහෙම නේද, ඇමතිතුමා?

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development, Wild Life and Christian Religious Affairs)

ඔබතුමා කියන හැටියට දැන් අපි පසුබාලා ඉන්න හැමදෙනාටම සහන දෙන්න ඔක්කොම ලෑහැස්ති කරලා තිබෙන්නේ. හැම බැංකුවකටම දැනුම් දීලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

බොහොම හොඳයි. සංචාරක ව්‍යාපාරය, ඇඟලුම් ව්‍යාපාරය, මේ රටට විදේශ විනිමය ගෙනෙන සෑම ආයතනයක්ම රැකගෙන, අපි මේ අවස්ථාවේ පක්ෂ භේදයෙන් තොරව අත්වැල් බැඳගෙන හොඳ සටනක් දී අපේ ආර්ථිකය නැවතත් වර්ධනය කර ගත යුතු බව ප්‍රකාශ කරමින්, ඔබතුමාට ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා.

[අ.භා.2.00]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විවාදය පැවැත්වෙන්නේ ගරු මුදල් ඇමතිතුමා යෝජනා කරපු ජාත්‍යන්තර බැඳුම්කර -sovereign bonds- සහ ඒ මාර්ගයෙන් මුදල් උපයා ගැනීම සම්බන්ධ රෙගුලාසි හා විධිවිධාන සැලසීම සඳහායි. විශේෂයෙන්ම වාර්ෂික අය වැය සඳහා අවශ්‍ය වන්නා වූ විදේශ විනිමය, රටේ ආනයන සඳහා අවශ්‍ය වන්නා වූ විදේශ විනිමය සහ ණය පොලී ගෙවීම සඳහා අවශ්‍ය වන්නා වූ විදේශ මුදල් ප්‍රමාණය සොයා ගැනීම සඳහා වූ විධිවිධාන සලස්වන්නයි. විදේශ බැඳුම්කර අපට ගන්න සිදු වෙලා තිබෙන්නේ ඇයි? ප්‍රධානම කාරණය වශයෙන් පසුගිය වසර කිහිපය තුළ අපි දැක්ක දේ තමයි අපේ රටේ ආනයන අපනයන අතර තිබෙන්නා වූ පරතරය. දළ වශයෙන් ගත්තොත්, ඩොලර් බිලියන 20ක පමණ ප්‍රමාණයක ආනයන අපේ රටට අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු වෙනවා. රටට අවශ්‍ය ඛනිජ ද්‍රව්‍ය -තෙල්- ආනයනය සඳහා දළ වශයෙන් ඩොලර් බිලියන 4ක් 5ක් පමණ වැය වෙනවා. ඊළඟට ඖෂධ, පොහොර, අමුද්‍රව්‍ය ආදී වශයෙන් ගත්තාම ඩොලර් බිලියන 20ක් පමණ අවශ්‍ය වෙනවා.

දැන් අපේ අපනයනයන්ගෙන් ලැබෙන ආදායම - export income - ගත්තොත් දළ වශයෙන් ඩොලර් බිලියන 10ක් පමණ වනවා. මේ අතර තිබෙන්නා වූ වෙළෙඳ පරතරය - trade deficit - අවසාන වශයෙන් රටේ විදේශ විනිමයට බලපානවා. විදේශ විනිමය උපයා ගන්න නම්, අපේ රට තුළට එන්නා වූ ප්‍රේෂණ - remittances - ගැන බලන්න අපට සිදුවනවා. අද වනකොට ශ්‍රී ලාංකිකයෝ විශාල ප්‍රමාණයක් විදේශ රැකියාවල යෙදෙනවා. විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ ශ්‍රී ලාංකිකයෝ මිලියන 1.2ක් පමණ සිටිනවා. ඒ අයගෙන් එන ප්‍රේෂණ සංඛ්‍යාව මීට අවුරුදු 4කට, 5කට කලින් ඩොලර් බිලියන 8 දක්වා වැඩි වෙලා තිබුණා. ඒක ක්‍රමානුකූලව ඩොලර් බිලියන 7ක ප්‍රමාණයට, 7.2ක ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා. නමුත්, දැන් ඒ ප්‍රමාණය ඉහළ යන්නේ නැහැ.

ඊ ළඟට, අපනයනය - exports - ගැන අපි බලමු. අපනයනය වැඩිවන්න නම්, අපේ ගුණාත්මකභාවය වැඩිවන්න ඕනෑ, අපනයන පරිමාව වැඩිවන්න ඕනෑ. අද ඒක සිද්ධවන්නේ නැහැ. ඊ ළඟට, සේවා අංශය ගැන බලමු. අපේ රටෙන් සේවාවන් ලබා ගන්නා නොයෙක් ක්ෂේත්‍ර තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, වෙනත් අංශයක් වෙන්න පුළුවන්. සංචාරක ව්‍යාපාරය කියන්නේ ප්‍රධාන වශයෙන්ම අපට විදේශ විනිමය උපයන තවත් අංශයක්. ඊ ළඟට, අපේ රට තුළට ගලා එන්නා වූ ආයෝජන ගන්න පුළුවන්. දැන් මේ අංශ සියල්ලම ගත්තොත් මේ වසර හතර හමාර තුළ මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා, ඒ නියමිත ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර ගන්න. විශේෂයෙන්ම පසුගිය අප්‍රේල් මාසයේ එල්ල වූ පාස්කු ඉරු දින ප්‍රහාරත් එක්ක සංචාරක ව්‍යාපාරයේ බරපතළ අර්බුදයක් මේ වෙනකොට ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා, ඒ හෝටල් වෙනුවෙන් ණය ගත් අයට විවිධ සහන සපයනවා කියලා. නමුත්, ප්‍රධානම ප්‍රශ්නය තිබෙන්නේ රටේ ආරක්ෂාව පිළිබඳවයි. ඒ ප්‍රශ්නයත් එක්කයි මේ අර්බුදය පැන නඟින්නේ. අපට මතකයි, යුද්ධය අවසන් කළ අවුරුද්ද වූ 2009 අවුරුද්ද වනකොට ලංකාවට පැමිණි සංචාරකයින් ප්‍රමාණය කොපමණද කියලා. 450,000යි. පසුගිය මාසය වන තෙක් වර්ෂයකට ලක්ෂ 20කට වැඩි සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට ආවා. ඔවුන් නිකම් ආවේ නැහැ. ඔවුන් ආවේ මේ රට පිළිබඳව ලෝකයේ දරන්නා වූ මතයත් එක්කයි. ඒ මතයත් එක්ක රටේ ආරක්ෂාව තිබුණා. නමුත්, මේ වනකොට රටවල් කීයකින් travel advisories නිකුත් කළාද, අපේ රටේ සංචාරය කරන්න එපාය කියලා? ඇමෙරිකානු රාජ්‍යයෙන් ඒ නිවේදනය නිකුත් කළා, කිසිම ඇමෙරිකානු පුරවැසියෙකුට ලංකාවේ සංචාරය කරන්න එපාය කියලා. චීනයෙන් ඒ නිවේදනය නිකුත් කළා, ඉන්දියාවෙන් ඒ නිවේදනය නිකුත් කළා. මේ වාගේ රටවල් 33කින් travel advisories දැම්මා. සංචාරක ව්‍යාපාරය නැවත යථා තත්ත්වයට ගේන්න නම්, අපේ ආයෝජකයින්ට, දේශීය ව්‍යාපාරිකයින්ට, හෝටල් කර්මාන්තකරුවන්ට යම් යම් සහන දෙන්න ආණ්ඩුවට පුළුවන්. නමුත්, සංචාරකයින් රට තුළට ගෙන්වා ගැනීම සඳහා තවත් විශාල වැඩ කොටසක් කරන්න වනවා. ඒ සඳහා රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්න වනවා. එහෙම නම්, මෙයින් පැහැදිලි වන එක් කාරණයක් තිබෙනවා. අන් සියල්ලටම වඩා අද දවසේ වැදගත් වෙලා තිබෙන්නේ ජාතික ආරක්ෂාවයි. මෙන්න මේ ජාතික ආරක්ෂාව තමයි 2015 ජනවාරි 8වෙනි දායින් පස්සේ මේ ආණ්ඩුව පරදුවට තැබුවේ. අපි දැක්කා, සමහර ඇමතිවරු බලයට පැමිණියාට පස්සේ 2015 ජනවාරි 8වෙනි දා පාරේ ගිහිල්ලා පොලිස් මාර්ග බාධකවලට පයින් ගහපු ආකාරය. එසේ පයින් ගසා ඒ පොලිස් මාර්ග බාධක ඔවුන් පැත්තකට දැම්මා. ඒවාට පයින් ගසා පැත්තකට දැමූ අයට අද ඒවා ගෙනැල්ලා පාරේ තියන්න සිද්ධ වෙලා තිබෙනවා; අද ඔවුන්ට කුඩාරම් ගහන්න සිද්ධ වෙලා තිබෙනවා. අද හැම තැනම පාසල්වල ගේට්ටු මුර කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ රටේ ජනතාවට මේවා අමතක වෙලා තිබුණා. ඒ කාලයේ දෙමව්පියන් rotation එකට පාසල්වලට ගියා. එහෙම ගිහිල්ලා අවුරුදු 10ක් මේ රට සාමකාමීව තිබුණා. නමුත්, 2015 ඉඳලා ගෙවී ගිය මේ අවුරුදු හතර හමාරට ජාතික ආරක්ෂාව පරදුවට තැබුවා. UNHRC එකේ යෝජනා, රාජ්‍ය නොවන සංවිධානවල යෝජනා, වෙනත් බටහිර බලවේගවල යෝජනා තමයි මේ රටේ ක්‍රියාත්මක කළේ. ඒකේ ප්‍රතිඵලය වුණේ මොකක්ද? ජාතික ආරක්ෂාව පරදුවට තැබුවා. ජාතික ආරක්ෂාව නැති වනකොට ආර්ථිකය ගොඩ ගන්න බැහැ; සංහිඳියාව ඇති කරන්න බැහැ. දැන් ජන වර්ග අතර සැකය වැඩි වෙලා තිබෙනවා. දැන් මම සරල ප්‍රශ්නයක් අහනවා. මේ ආණ්ඩුවට මේ සඳහා තිබුණු දැක්ම මොකක්ද? දැක්මක් නැහැ, සැලැස්මක් නැහැ, වැඩ පිළිවෙළක් නැහැ. පාස්කු ඉරිදා බෝම්බ ගැහුවා, එහෙත් තවමත් ඒ සඳහා වැඩ පිළිවෙළක් නැහැ. අද වනතුරු මාසයක් ගත වෙලා අවසානයි. විපතට පත් වූ අයට සහන සලසන්නේ කොහොමද, කැඩී බිඳී ගිය දේවල් ගොඩ නඟන්නේ කොහොමද, ජන ජීවිතය නැවත යථා තත්ත්වයට ගේන්නේ කොහොමද යනාදී දේවල් පිළිබඳව සැලැස්මක් හෝ වැඩ පිළිවෙළක් නැහැ. මෙන්න මේක තමයි ප්‍රශ්නය. අද මළ ගෙයකට ගියත්, මඟුල් ගෙයකට ගියත්, වෙන උත්සවයකට ගියත්, ජනතාව රැස් වෙලා කථා කරන්නේ "අපට මේ මොකක්ද වෙලා තිබෙන්නේ" කියායි. දැන් දමිළ ජනතාවට කිව්වා, බලය බෙදා, තිබෙනවාට වඩා දීලා, අලුත් ව්‍යවස්ථාවක් ගෙනැල්ලා ලොකු ලොකු දේවල් කරනවාය කියලා.

අද TNA එකට උතුරට යන්න බැහැ. දැන් ජනාධිපතිවරණයකට යන්න වෙනවා දෙසැම්බර් 08ට කලින්. ඔක්තෝබර් මුල වෙන කොට මැතිවරණය ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. දැන් උතුරේ දමිළ ජනතාව, නැඟෙනහිර දමිළ ජනතාව TNA එකෙන් අහයි "අර දෙනවායි කිව්ව ව්‍යවස්ථාව කෝ, සංශෝධනය කෝ" කියලා. ඒ අයට මොනවාද ලැබුණේ? කිසිම දෙයක් ලැබුණේ නැහැ, කාලය නාස්ති කළා පමණයි. ඒ ජනතාවට ඒ ප්‍රශ්නය තිබෙනවා.

ඊළඟට, මුස්ලිම් ජනතාවට ප්‍රශ්නයක් ඇති වුණා, පසුගිය දිනවල ඇති වුණු තත්ත්වයත් එක්ක. අප්‍රේල් 21වැනි දා ප්‍රහාරය වළක්වා ගත්තා නම්, කිසි සේත්ම අද මේ තත්ත්වය ඇති වෙන්නේ නැහැ. ඒක වළක්වා නොගැනීම ගැනයි අපි සාකච්ඡා කරන්න ඕනෑ. නමුත්, ඒක පැත්තකට දමනවා. මම ඒ ගැන තව දුරටත් කියන්නම්.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

දැන් මහ බැංකු බැඳුම්කර සිද්ධිය අමතකයි නේ. මහ බැංකු බැඳුම්කර සිද්ධිය වුණාම නීතිඥයන් තුන්දෙනකු දාලා කමිටුවක් පත් කරලා කිව්වා, "දැන් ඔක්කෝම හරි" කියලා. ඊට පස්සේ දැම්මා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන්. මාත් එහි සාමාජිකයෙක්. මාස හතරක් ගිහිල්ලා ඒ රිපෝට් එක දෙන දවසේ, ඒ තේරීම් කාරක සභාවේ වාර්තාව එන දවසේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඊට පස්සේ අලුත් පාර්ලිමේන්තුව පත් වුණාට පස්සේ හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් COPE එක ඒ ගැන පරීක්ෂණයක් ගෙන ගියා. එහිදී footnotes ගැහුවා. අවුරුද්දක් ගිහිල්ලා ඒ රිපෝට් එකත් දැම්මා. නමුත් අද වන කොට වෙච්ච දෙයක් නැහැ. ජනාධිපති කොමිසමෙන් වැරදිකරු වෙලා, විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාම ඉල්ලා අස් වුණු ඇමතිවරයාට අද ඊට වඩා හොඳ අමාත්‍යාංශයක් දීලා තිබෙනවා. අද ඒකයි වෙලා තිබෙන්නේ. දැන් ඒ පළමුවැනි වග උත්තරකරු ලංකාවේ නැහැ, සිංගප්පූරුවේ ඉන්නේ. දැන් ඒ කටයුතු මහ හැර තිබෙනවා. අද බැඳුම්කර සිද්ධිය මතක නැහැ. දැන් මේ පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන ආණ්ඩුව මොනවාද කියන්නේ? ආණ්ඩුව කියනවා, අටදෙනකු මරාගෙන මැරිලා කියලා. විදේශිකයනුත් එක්ක අහිංසක ජනතාව දෙසියපණහකට අධික පිරිසක් මිය ගියා. හාරසියයක් පමණ තුවාල ලැබුවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හොඳයි.

දැන් කෝ ඒ වග උත්තරකාරයෝ, විත්තිකාරයෝ? දැන් මේ ආණ්ඩුව කියයි "විත්තිකාරයෝත් මැරිලා" කියලා. ඇත්තනේ. නඩුවට අදාළ විත්තිකාරයෝත් මිය ගිහිල්ලා. ඒ කියන්නේ, ඒ ඝාතන සිදු කළ අය. ප්‍රහාරයට ලක් වුණු අයත් මිය ගිහිල්ලා. විත්තිකාරයෙක් -වග උත්තරකාරයෙක්- නැහැ. ඒක තමයි මේ ආණ්ඩුව කියන්නේ. මම කියනවා විත්තිකාරයා -වග උත්තරකාරයා- වෙන කවුරුවත් නොවෙයි, මේ ආණ්ඩුවයි කියලා. මේ ආණ්ඩුවයි අද විත්ති කූඩුවේ ඉන්නේ.

විශේෂ මහාධිකරණ දෙකක් දාලා තිබෙනවා. මොන නඩුද ඒකේ අහන්නේ? ඊයේ ඒකට ගෙනාවා දොස්තර මහත්මයෙක් අල්ලසක් ගත්තාය කියලා. ඒ නඩුව අහන්න විනිශ්චයකාරවරු තුන් දෙනකුගේ කාලය නාස්ති කරනවා. ඒ විශේෂ මහාධිකරණ තිබුණදෙන්. ඒක බොහොම හොඳයි. ඒවාට ගෙනෙන්න ඕනෑ අය ඉන්නේ ඔය පැත්තේ. තව වැඩි කල් යන්නේ නැහැ, ඒ විශේෂ මහාධිකරණවලට එන්නේ මනුෂ්‍ය ඝාතන කිරීමේදී, අපරාධවලට සහය වුණු අය. නොසැලකිලිමත්කම නිසා රටේ ජනතාවට, රටට වෙච්ච හානිය සම්බන්ධයෙන් අපරාධ එක පෙළට නඩු ගෙනෙන්න පුළුවන් ඔය විශේෂ මහාධිකරණවලට ඊළඟ මාස කිහිපය ඇතුළත. අද ජනතාව ඒකට සූදානම්. ආණ්ඩුව මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් විපක්ෂයට දමන්නේ ලොකු පාට්. විවාද ඉල්ලුවාම "අපට ඕනෑ දවසටයි දෙන්නේ" කියනවා. ඔවා කිය කිය ඉන්න පුළුවන් තව මාස හතරයි. එක්සත් ජාතික පක්ෂයේ පම්පෝරි ගහන මැති ඇමතිවරුන්ට අපි අභියෝග කරනවා, පුළුවන් නම් security නැතිව තනියම මිනිත්තු 10ක් පාරේ ඇවිදින්න කියලා. ගුටි කාලා තමයි එන්න වෙන්නේ. එහෙම නැති වුණොත් කෙළ ගහනවා මිනිස්සු. අද එතැනට වැටිලායි ඉන්නේ. ඒක මතක තියා ගන්න. Your days are numbered. Keep it in your mind.

මේ බැඳුම්කර ගන්නේ අධික පොලියකට. මේක වෙලා තිබෙන්නේ නිසි ආර්ථික කළමනාකරණයක් නැති නිසායි. රටේ ආර්ථික කළමනාකරණයක් නැහැ; ජාතික ආරක්ෂාව නැහැ. රජයේ කිසිදු කළමනාකරණයක් නැහැ. මෙන්න අද රට පත් කරලා තිබෙන තත්ත්වය!

ආනන්ද සංගරී හිටපු මන්ත්‍රීතුමා හොඳ කථා ටිකක් කියලා තිබුණා. අද පත්තරේ ඒවා පළ වෙලා තිබුණා මම දැක්කා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හොඳයි, මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ. අපි ඉතා පැහැදිලිව කියනවා, මේ රටට වැඩ පිළිවෙළක් නැහැ, සැලැස්මක් නැහැ කියන එක. තවත් මේ රට අගාධයට පත් කරන්නේ නැතිව ව්‍යවස්ථානුකූලව නිශ්චිත දවසේදී මැතිවරණයට සූදානම් වෙන්න. මේ රටේ ජනතාව සියලුදෙනාම ඒකට සූදානම් වෙලා අවසානයි. ඒ නිසා එක දවසකින් හෝ මේවා කල් දමන්න ලෑස්ති වෙන්න එපා. එහෙම වුණොත් අන්න එදාට තමයි මේ රටේ ජනතාව පෙළ ගැහිලා පාරට බහින්නේ කියන කාරණය මතක් කර දෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.2.11]

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development, Wild Life and Christian Religious Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන. සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කළා. මට තේරෙන්නේ නැහැ, මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Anura Sidney Jayarathne to the Chair?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
I propose that the Hon. Anura Sidney Jayarathne do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කියනවා, රටේ ආරක්ෂාව නැහැ කියලා. අද ළමයි ඔක්කෝම ඉස්කෝලවලට යනවා. දැක්කේ නැද්ද? තමුන්නාන්සේ කොහේ ඉඳලා ආවාද දන්නේ නැහැ. [බාධා කිරීම්] ආරක්ෂාව ගැන බුද්ධි අංශයට කථා කරලා බලන්න. බුද්ධි අංශයට කථා කරලා අහන්න, මොකක්ද ආරක්ෂක තත්ත්වය කියලා. තමුන්නාන්සේ කථා කරලා අහලා නැහැ නේ. අහන්න කෝ IGP මහත්තයාගෙන්. එහෙම නැත්නම් හමුදාපතිතුමාගෙන්. ඒ ගැන හොඳ විස්තරයක් දෙයි. මම මේ කියන්නේ තමුන්නාන්සේ නොදන්න නිසා. ඒක දැන ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කථා කරන්න නැඟිට්ටේ සංචාරක ක්ෂේත්‍රය ගැන. මේ ප්‍රශ්නයෙන් සංචාරක ක්ෂේත්‍රයට තමයි ලොකුම පහර වැදුණේ. ගිය අවුරුද්දේ සංචාරක ක්ෂේත්‍රයෙන් ඩොලර් බිලියන 4.5ක ආදායමක් ලැබුණා. තුන්වෙනි තැනට වැඩිම ආදායම ලැබුණු ක්ෂේත්‍රය බවට සංචාරක ක්ෂේත්‍රය අපට පරිවර්තනය කර ගන්න පුළුවන් වුණා. අවාසනාවකට මේ සිද්ධිය වුණා. අපි මේ අවුරුද්දේ ඩොලර් බිලියන 5 දක්වා ආදායම වැඩි කර ගන්න බලාපොරොත්තු වුණා. දැන් ඒ ඉලක්කය කරා යන්න අමාරු වෙනවා. ඒ සඳහා අපට විශාල සටනක් දෙන්න වෙලා තිබෙනවා. මේ රටේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත වෙලා හිටිය හැම කෙනෙකුට -හෝටල් අයිතිකාරයන්ට, ඒ සේවා සැපයූ අයට- දැන් සහනාධාර, ණය ආධාර දෙන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒක අපි කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරගෙන මහ බැංකු අධිපතිතුමා මඟින් හැම බැංකුවකටම දැනුම් දීලා තිබෙනවා, ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය වෙනතුරු මේ සහනාධාර වහාම දෙන්න කියලා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

නැහැ, නැහැ. බැංකුවලට දැනුම් දීලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඔබතුමිය ඒක දන්නේ නැතුව ඇති. ඒක තමයි වෙලා තිබෙන්නේ. ඔබතුමිය ගිහිල්ලා ලංකා බැංකුවෙන් අහලා බලන්න. ඔක්කෝම බැංකු ශාඛාවලට දැනුම් දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමිය බැංකුවට ගියේ නැහැ නේ, තිබෙනවාද නැද්ද කියලා බලන්න.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

මමත් ණය අරගෙන තිබෙනවා. මම ඇහුවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

බය වෙන්න එපා. ණය අරගෙන තිබෙනවා නම් ඒකට සහනය ලැබෙනවා. ඒ ණය අරගෙන තිබෙන්නේ අපේ ක්ෂේත්‍රයට අදාළව නම් ලැබෙනවා. [බාධා කිරීමක්] බය වෙන්න එපා. මම ඇප වෙනවා ඔබතුමියට අරගෙන දෙන්න. මොකද, මම ඔබතුමියට බොහොම ගරු කරනවා නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

ඉතින් මේ හැම කෙනෙකුටම ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය වෙනතුරු ණය වාරික ගෙවීම නවත්වලා, පොලිය අඩු කරලා ඒ අවස්ථාව ලබාදීලා තිබෙනවා නැවත වරක් සංචාරක ක්ෂේත්‍රය ඉදිරියට ගෙන එනතුරු. ඒ විතරක් නොවෙයි, වැට් එක සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරලා තිබෙනවා. මා ළඟ ඒ ගැසට් එක තිබෙනවා. ඒ වාගේම අපි මුලින් කිව්වේ ඒ සඳහා අපේ අමාත්‍යාංශයේ ලියාපදිංචි වෙලා ඉන්න ඕනෑ කියලායි. නමුත් දැන් ඒකත් අවශ්‍ය නැහැ. ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ එහෙම නැත්නම් මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් ආයතනයක ලියාපදිංචි වෙලා තිබෙනවා නම්, ඒ අයටත් අයිතිය තිබෙනවා මේ සහනය ලබා ගන්න. ඔබතුමියටත් ලැබෙයි. ඔබතුමිය ණය අරගෙන තිබෙන්නේ හෝටලයට නම්, මම වගකීමකින් ඒ ගැන කියනවා. අනිද්දා මම පොළොන්නරුවට යනවා. අපි මේ ක්ෂේත්‍රයට සම්බන්ධ හැම හෝටල් හිමියෙක්ම, ඒ වාගේම ඔය Homestay කරන හැම කණ්ඩායමක්ම කැඳවා තිබෙනවා. ඒ වාගේම බැංකු කළමනාකරුවන් කැඳවලා තිබෙනවා. එහිදී මේ සහනය කොහොමද ගන්නේ කියන එක විස්තර කරලා දෙනවා. ඒ නිසා බයක් වෙන්න එපා, ඒක ලැබෙනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු ඇමතිතුමනි, සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි අයට පමණයි දෙන්නේ කියලා,-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

නැහැ, නැහැ. මා ළඟ තිබෙනවා චක්‍රලේඛය. මම ඒක අද සභාගත කරන්නම්. අපි මුලින් එහෙම කිව්වා. පස්සේ අපි කිව්වා, එහෙම හරි යන්නේ නැහැ. මේ ක්ෂේත්‍රයට සම්බන්ධ පොඩි මිනිස්සු ප්‍රාදේශීය සභාවල, නගර සභාවල මහනගර සභාවල ලියාපදිංචි වෙලා. ඒ අයටත් මේ සහනය ලබා දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අනුරාධපුරය නේද අයිති වෙන්නේ? ඔබතුමා 25 වෙනි දාට එන්න. අනුරාධපුරයේ ඔක්කෝම හෝටල් හිමියන් කැඳවා තිබෙනවා. ඒ වාගේම ජීප් රථ පදවන අය කැඳවලා තිබෙනවා. ඒවාට leasing අරගෙන තිබෙන අයටත් මේ සහනය ලබා දෙනවා. ඒ වාගේ නගරයෙන් නගරයට ගිහිල්ලා මේ කරුණු විස්තර කර දීලා මේ සහන ලබා ගන්න වුවමනා කරන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක පැහැදිලි කරලා දෙන්න කටයුතු කරනවා. ඒ නිසා ඒ අයට බයක් වෙන්න වුවමනාවක් නැහැ. ඒ අයගේ ඉඩකඩම්වලට බැංකුව අත තියන්න යන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, ලබන අවුරුද්ද වෙනකොට මේ ක්ෂේත්‍රය නැවත නගා සිටුවන්න පුළුවන් වෙයි කියලා.

ඒ නිසා මෙතැන දේශපාලනයක් නැහැ. කවුරු ආණ්ඩු කළත් මේ ක්ෂේත්‍රය තමයි අපේ රටට ගොඩ එන්න පුළුවන් ක්ෂේත්‍රය. තව අවුරුද්දක කාලයක් තිබුණා නම් අපට පුළුවන් වෙනවා, මේ රටට විදේශ විනිමය වැඩියෙන්ම උපදවන ක්ෂේත්‍රය බවට මෙම ක්ෂේත්‍රය පරිවර්තනය කරන්න. අපේ කරුමයට මේ සිදුවීම වුණා. ඒ ගැන අපි කනගාටු වෙනවා. කාගේ අතින් මේ අඩු පාඩුව වුණාද

[ගරු ජෝන් අමරතුංග මහතා]

කියන එක මට කියන්න බැහැ. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත්, මේ ක්ෂේත්‍රය නැවත ගොඩනඟන්න අපට පුළුවන් වෙනවා.

මේ වන විට යුරෝපා රටවල්වලින්, ඒ වාගේම චීනය, ඉන්දියාව, මැද පෙරදිග රටවල් කිහිපයකින් ඒ රටවල ජනතාවට තහංචියක් දාලා තිබෙනවා, ශ්‍රී ලංකාවේ සංචාරය කරන්න එපා කියලා. මම බොහෝ තානාපතිවරු හම්බවෙලා තිබනෙවා, ඒ අයත් එක්ක කථා කරලා තිබෙනවා. ඒ අය පිළිගෙන තිබෙනවා, දැන් මේ රට තුළ යම් කිසි ආරක්ෂාවක් ඇතිවෙලා තිබෙනවා කියලා. ඉස්සෙල්ලා තිබුණු ප්‍රශ්නය තමයි, ළමයි ඉස්කෝලෙට යන්නේ නැති තත්ත්වයක් තුළ අපි කොහොමද සංචාරකයින්ට ශ්‍රී ලංකාවට යන්න කියන්නේ කියන තර්කය ඔවුන් ඉදිරිපත් කළා. අද වෙනකොට හැම ඉස්කෝලෙකටම ළමයින්ගෙන් සියයට 80ක්, 90ක් පැමිණෙනවා. ඒ පැත්තෙන් විශාල වෙනසක් අපට දකින්නට ලැබෙනවා. බුද්ධි අංශ විසින් තානාපතිවරුන්ට පැහැදිලිව සහතික කරලා කිව්වා, මින් ඉදිරියට මේ රටේ එවැනි බෝම්බ පිපිරීම් ඇති වෙන්නේ නැහැයි කියලා.

පසුගිය දවස්වල මුස්ලිම් ජනතාවගේ ව්‍යාපාරවලට, ගෙවල්වලට පහර දීමක් සිදු වුණා. කාගේ අතින්ද ඒක ක්‍රියාත්මක වුණේ කියලා අපි දන්නවා. මොන අරමුණකින් එය ක්‍රියාත්මක වුණාද කියන එක අද මුළු රටම දන්නවා. කරපු අය මෙතැන ඉන්නවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. කෙසේ වෙතත්, ජාතික සමඟිය විනාශ කරන්න මේ වගේ උත්සාහයක් දරන්නේ ඇයි කියන එක පිළිබඳව අපි කනගාටු වෙනවා.

මේ සහන මල්ල පිළිබඳවත් මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ. ඒ සම්බන්ධ ලිපි ලේඛන මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා.

ඒක සිංහල භාෂාවෙන් විතරක් නොවෙයි, ඉංග්‍රීසි භාෂාවෙනුත් තිබෙනවා. ඒ වාගේම එකතු කළ අගය මත බද්ද සියයට 5ක් අඩු කරපු එක සඳහන් වන ගැසට් පත්‍රයේ පිටපතකුත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පොළොන්නරුවේ සිටින ශ්‍රේෂ්ඨ මන්ත්‍රීවරයෙක්. 25වැනිදාට ඔබතුමාත් එන්න. අපි ඒ රැස්වීම සංවිධානය කරලා තිබෙනවා. මම ඒ පිළිබඳ ලිපියක් එව්වා. එම රැස්වීම තිබෙන ස්ථානය එහි සඳහන් කරලා තිබෙනවා. අපි බැංකු කළමනාකරුවන්ටත් එන්න කියලා තිබෙනවා. ජීප් රථ හිමියන්ටත් එන්න කියලා තිබෙනවා. හෝටල් අයිතිකරුවන් සියලුම දෙනාටත්, ඒ වාගේම නවාතැන් පහසුකම් සපයන එවැනි හැම කෙනෙකුටමත් එන්න කියලා තිබෙනවා. ඒ අය එතැනදීම ලියා පදිංචි කිරීමේ වැඩ පිළිවෙළකුත් අපි ක්‍රියාත්මක කරනවා. ඊට පස්සේ මේ සහන මල්ල වහාම ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එතකොට, තමන්ගේ ප්‍රශ්නවලට ටික කාලයක් මුහුණ දීලා, තමන්ගේ දේපළ සහ ව්‍යාපාරය රැක ගන්න ඒ අයට පුළුවන් වෙනවා කියන එක අපි මතක් කරනවා. මහ බැංකුවේ අධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි මුදල් ඇමතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන්ටත්, ගරු අගමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මේ හැම දේකටම නායකත්වය දීලා ජනතාවට සහන මල්ල ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව. අද ඊයේ නොවෙයි, එල්ටීටීඊ යුද්ධය පැවැති කාලයේත් මේ වාගේ තත්ත්වයක් ඇති වුණා. එවකට පැවැති ආණ්ඩුව මේ හා සමානව සහන ලබා දුන්නා. අද අපි එතැනිනුත් එහාට ගිහිල්ලා, සංචාරක ක්ෂේත්‍රය ආරක්ෂා කරගන්න ඊට වඩා වැඩිපුර සහන ලබා දෙනවා. මේ රටට නැවත වරක් සංචාරකයින් ගෙන්වා ගන්නා වැඩ පිළිවෙළ අපි බොහොම වුවමනාවෙන් ක්‍රියාත්මක කරගෙන යනවා. "අපේ රට දැන් සුරක්ෂිතයි, ඕනෑම පුරවැසියෙකුට භය නැතිව ලංකාවට එන්න පුළුවන්" කියන එක රටවල් කිහිපයකට ගිහිල්ලා ඔවුන්ට පැහැදිලි කර දීලා නැවත වරක් මේ ක්ෂේත්‍රය දියුණු කරන්න මම බලාපොරොත්තු වෙනවා.

තායිලන්තයේ භික්ෂූන්වහන්සේලා සිය නමකට වඩා වැඩි පිරිසක් අද ඇවිල්ලා ඉන්නවා. උන්වහන්සේලා පොළොන්නරුව පැත්තට ගිහිල්ලා ඉන්නවා. උන්වහන්සේලා මේ රට බලාගෙන යන්න භය නැතිව ඇවිල්ලා ඉන්නවා. අන්න ඒ විධියට අපි පුළුවන් තරම් පිරිස් ගෙන්වාගෙන නැවත වරක් මේ ක්ෂේත්‍රය දියුණු කරමු. මේ ක්ෂේත්‍රයෙන් ජීවත් වුණු හැම කෙනෙකුටම නැවත තමන්ගේ ජීවිතය හොඳින් පවත්වාගෙන යන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරනවාය කියමින් මා නිහඬ වෙනවා. මට වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.21]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் வெளிநாட்டுச் செலாவணிச் சட்டத்தின் கீழான கட்டளை மற்றும் ஒதுக்கீட்டுச் சட்டத்தின் கீழான பிரேரணைகள் தொடர்பிலான விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

வெளிநாட்டுச் செலாவணி தொடர்பில் கதைக்கின்ற போது, அதுவும் தற்போதைய நிலையில் கதைக்கின்றபோது, இந்த நாட்டின் எதிர்கால எழுச்சியினைப் பொருளாதார அடிப்படையில் கட்டியெழுப்புவதில் மிகவும் கடுமையான உழைப்பினை நேர்மையான தன்மையுடன் தொடர்ச்சியாக முன்னெடுக்க வேண்டியதன் அவசியமே முன்னிற்கின்றது என்றே கூற வேண்டும். அந்நியச்செலாவணி ஈட்டலுக்கான வழிவகைகள் ஏற்கனவே விரிவாக்கம் பெறாது இருந்து வந்துள்ள நிலையில், கடந்த ஏப்ரல் மாதம் 21ஆம் திகதி

தற்கொலைத் தாக்குதல் இடம்பெற்றதன் பின்னர், விரிவாக்கம் பெறவேண்டியிருந்த அந்த வழிவகைகளும் இன்று இறுக மூடப்பட்டுக் கிடக்கின்ற ஒரு நிலை ஏற்பட்டுள்ளது. எனவே, ஒரு பக்கம் நாட்டிற்கான அந்நியச் செலாவணிக்குரிய மார்க்கங்களைப் பலப்படுத்த வேண்டிய அதேநேரம், மறுபக்கத்தில் 'பயங்கரவாதத்துக்கு எதிரான யுத்தம்' என்பதும் முன்னெடுக்கப்பட்டுக்கொண்டிருக்கும் நிலைமையில், பொருளாதார நெருக்கடியின் சுமையினை ஏழை மக்கள்மீதும், தொழிலாளர்கள்மீதும் திணிக்காது இருக்கக்கூடிய நிலைமைகள் இங்கே தோற்றுவிக்கப்பட வேண்டியதன் அவசியத்தை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்குத் தற்போது வாய்ப்புகள் குறைவாகவுள்ள நிலையில், 'பயங்கரவாதத்துக்கு எதிரான நடவடிக்கைகள்' என்கின்ற மகுடத்தை வைத்துக்கொண்டு, மக்களது சமூக மற்றும் வாழ்க்கைக்குரிய தேவைகளின்மீது ஒடுக்குதல்கள் மேற்கொள்ளப்படாதிருத்தல் வேண்டும். தற்போதைய பயங்கரவாதத்தின் ஒருங்கிணைந்த அழுத்தமானது, பொருளாதாரத்தைச் சீர்குலைப்பதும் பொருளாதாரத்தின் வளர்ச்சி வேகத்தைக் குறைப்பதுமாகும் என்றே சுட்டிக்காட்டப்படுகின்றது. இது, செலுத்தவேண்டிய நிலுவைகள், அந்நிய நிதி நிலைமை மற்றும் நிதி மானியங்கள் தொடர்பில் பாதிப்புமிக்க அழுத்தங்களைப் பிரயோகிக்கும் என்பதுடன், இதனூடாக வெளிவாரிப் பாதுகாப்பற்ற தன்மை அதிகரிப்பதானது இதன் மிகப் பாரிய பாதிப்பாக அமையும் என்றும் சுட்டிக்காட்டப்படுவதை அவதானத்தில் கொள்ள வேண்டியுள்ளது.

கடந்த ஒரு தசாப்த காலத்திற்குள் வர்த்தக ரீதியிலான நம்பிக்கையானது இந்த நாட்டில் மிகப் பாரிய வீழ்ச்சி நிலையை கடந்த ஏப்ரல் மாதத்திலேயே கண்டுள்ளதாகப் புள்ளிவிபரங்கள் கூறுகின்றன. இது, பின்னரான காலங்களில் மேலும் வீழ்ச்சி நிலையினை அடையக்கூடுமெனச் சுட்டிக்காட்டப்படுகின்ற நிலைமையில், அரசாங்கம் மிக அவதானமான முன்னெடுப்புக்களை, வீழ்ச்சியுற்ற மற்றும் ஸ்தம்பித்துள்ள துறைகள் சார்ந்து - குறிப்பாகப் பொருளாதாரத்தின் முக்கிய துறைகள் சார்ந்து மேற்கொள்ள வேண்டிய தேவையிருக்கின்றது.

2018ஆம் ஆண்டின் மத்திய வங்கியின் வருடாந்த அறிக்கையின் பிரகாரம், 2017ஆம் ஆண்டில் நூற்றுக்கு 3.4 வீதமாக இருந்துள்ள பொருளாதார வளர்ச்சியானது கடந்த வருடத்தில் 3.2 வீதம் வரையில் வீழ்ச்சி கண்டிருப்பதை அவதானிக்க முடிகின்றது. அத்துடன், கடந்த ஆண்டில் 4.4 டொலர் பில்லியனாக இருந்துள்ள உல்லாசப் பிரயாணத்துறையின் வருமானமானது இந்த வருடத்தில் 1.5 டொலர் பில்லியன்களால் வீழ்ச்சியுறக்கூடுமென எதிர்வுகள் கூறப்படுகின்றன. அந்நியச் செலாவணியை ஈட்டித் தருகின்ற மூன்றாவது முக்கிய துறையான உல்லாசப் பிரயாணத் துறையின் வீழ்ச்சியானது அந்நியச் செலாவணி ஈட்டலில் பெரும் பாதிப்பினை உண்டுபண்ணக்கூடும். தற்போது கிடைத்திருகின்ற தகவல்களைப் பார்க்கின்றபோது, அநேகமாக ஹோட்டல்கள் மற்றும் விடுதிகளை ஒதுக்கீடு செய்கின்ற ஏற்பாடுகள் எதிர்வரும் ஒக்டோபர் மாதம் வரையில் இரத்துச் செய்யப்பட்டுள்ளதாகத் தெரியவருகின்றது. அதேநேரம், வெளிநாட்டு முதலீடுகளிலும் பாரிய வீழ்ச்சி நிலையே காணப்படுகின்றது. மத்திய வங்கி அறிக்கையின் பிரகாரம் கடந்த ஏப்ரல் 21ஆம் திகதி தற்கொலைத் தாக்குதலின் பின்னர் 3.3 பில்லியன் ரூபாய் நாட்டுக்கு வெளியில் சென்றுள்ளதாகத் தெரியவருகின்றது. அதையும் இணைத்துப் பார்க்கின்றபோது, இதுவரையில் சுமார் 10 பில்லியன் ரூபாய் ஆவணமய முதலீடுகள் வெளியில் சென்றுள்ளதாகவே தகவல்கள் தெரிவிக்கின்றன.

இதேவேளையில், இந்த வருடத்தின் வெளிநாட்டுக் கடன்கள், 5 பில்லியன் டொலர்களாக அதிகரித்துள்ள நிலையில், அதில் 1.5 பில்லியன் டொலர்களைச் செலுத்துவதற்காக இந்தியாவிடமிருந்தும், சீனாவிடமிருந்தும் கடன்கள் பெறப்பட்டுள்ள நிலையில், சிதைவடைந்து செல்கின்ற வெளிநாட்டுச் சொத்துக்களுக்கு முண்டுகொடுப் பதற்கெனக் கடந்த மார்ச் மாதம் மேலும் 2.4 டொலர் பில்லியன் அரச பிணைமுறிகள் விற்பனை மூலமாகப் பெறப்பட்டுள்ளதாகவும் தெரியவருகின்றது. அந்தவகையிற் பார்க்கின்றபோது, மிகவும் அவதானமானதொரு பயணத்தின் தேவையையே நாடு எதிர்கொண்டிருக்கின்றது என்றே கூறவேண்டும். ஒரு பக்கத்தில் கடன் செலுத்துகைகளுக்காக மேலும் கடன் பெற வேண்டிய நிலையே இருந்து வருகின்ற நிலையில், தேசிய உற்பத்திகளை அதிகரிப்பது தொடர்பிலான முயற்சிகளை வலுப்படுத்துவதன் அவசியம் குறைவாகவே உணரப்பட்டிருக்கின்றது. அந்நியச் செலாவணியின் பிரதான வழியான உல்லாசப் பிரயாணத்துறையின் வீழ்ச்சியென்பது பெரும் பாதிப்பினை உண்டுபண்ணிக் கொண்டிருக்கின்ற அதேநேரம், வெளிநாட்டு முதலீட்டார்களது பங்களிப்புக்கள் தொடர்பிலும் வலுவான எதிர்பார்ப்புகளைக் கொள்ள இயலாது என்றே தற்போதைக்குக் கூறவேண்டியுள்ளது. எனினும், காலப்போக்கில் இத்துறைகள் விருத்திபெற வேண்டுமாயின், அதற்குரிய ஏற்பாடுகள் இப்போதிருந்தே துரிதகதியில் மேற்கொள்ளப்பட வேண்டியிருக்கின்றது என்பதை அவதானத்திற் கொள்ளவேண்டும் என்பதையும் வலியுறுத்தி விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.28]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව අද දවසේදී මා කථා කරන්නේ බොහෝ කාලයකට පසුවයි. පසුගිය දවස්වල කථා කරන්න මට වෙලාවක් ලැබුණේ නැහැ. අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් කථා කරන අද දවසේ, පසුගිය 21වන දා සිදුවුණු සිද්ධිය ගැනත් කනගාටුව ප්‍රකාශ කරමින්, මගේ කථාව පටන් ගන්න මම ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සිදුවීම ගැන අද දිනයේ මා සඳහන් කරන්නේ ඉතාම කනගාටුවෙන් හා ලජ්ජාවෙන්. අප්‍රේල් 21වන දින එල්ල වූ ඒ ම්ලේච්ඡ ප්‍රහාරයෙන් මිය ගිය කිතුනු, සිංහල, මුස්ලිම් ජනතාවගේ පවුල්වලටත්, මිය ගිය විදේශීය ජාතිකයන්ගේ පවුල්වලටත් මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා. ඒ ප්‍රහාරයෙන් තුවාල වූ ජනතාවට ඉක්මන් සුවය ලැබේවායි කියාත් මම ප්‍රාර්ථනා කරනවා. අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් රටේ සාමය, සමඟිය ඇති කිරීමට විශේෂ කර්තව්‍යයක් කළා. ඒ වාගේම මල්වතු පාර්ශ්වයේ, අස්ගිරි පාර්ශ්වයේ, අටමස්ථානයේ නායක ස්වාමීන් වහන්සේලා ඇතුළු ස්වාමීන් වහන්සේලා ද, සියලු මුස්ලිම් පූජකවරුන් සහ සියලු මුස්ලිම් නායකවරුන් ද, හින්දු පූජකවරුන් ද, අපේ රටේ ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා, විපක්ෂ නායකතුමා, අනුර

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

දිසානායක මැතිතුමා ඇතුළු අනෙක් මැති ඇමතිවරුන් ද මේ රටේ සාමය, සමගිය ඇති කරන්න දුන් සහයෝගය වෙනුවෙන් ඒ සියලුදෙනාට මගේ ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මිලියන 22ක ජනතාවක් ඉන්නවා. ඒ අතරින් මුස්ලිම් ජනතාව මිලියන දෙකක් පමණ ඉන්නවා. මෙය බෞද්ධ රටක්. මේ බෞද්ධ රට ඒ මිලියන දෙකක් වූ මුස්ලිම් අපට සියලු අයිතීන් ලබා දීලා තිබුණා. අපේ සියලු කටයුතු කර ගන්න අයිතිය අපට ලබා දීලා තිබුණා. නමුත් අවාසනාවකට, පසුගිය දා මේ සිදුවීම වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ISIS කියන සංවිධානය ප්‍රහාර එල්ල කරන්න පටන් ගත්තේ මුළු මුස්ලිම් ලෝකයම විනාශ කරන්නයි. ඒ අය පළමු ප්‍රහාරය පටන් ගත්තේ ඉරාකයේ බැග්ඩෑඩ් නගරයෙන්. සදාම් හුසේන් මැතිතුමාව විනාශ කළා. එතැනින් පස්සේ ඒ අය ලිබියාව විනාශ කළා. දැන් සිරියාවත් විනාශ කරනවා. මට මතක් වෙනවා, 2017 වසරේදී මක්කම වන්දනාවේ ගිය බැතිමතුන්ට එල්ල කළ ප්‍රහාරය. ඒ කාලයේ මමත් මක්කම ගිහින් සිටියා. මම සිටි හෝටලයේ ඉඳලා මීටර් 100කට එහායින්, ISIS කියන සංවිධානයේ 10 දෙනකුගෙන් යුත් මරාගෙන මැරෙන කණ්ඩායමක් ඇවිල්ලා එදා බෝම්බ පුපුරවලා අපේ මුස්ලිම් භක්තිකයෝ විනාශ කළා. ඒ වාගේම සිද්ධියක් තමයි අප්‍රේල් 21වන දා කිතුනු ජනතාව විනාශ කරපු එක. අපට ඒක අනුමත කරන්න බැහැ. මේ කණ්ඩායමට දෙන්න පුළුවන් උපරිම දඬුවම දෙන්න. ගරු ජනාධිපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමනි, මම ඔබ දෙපළගෙන්ම ඉල්ලීමක් කරනවා, ඔවුන්ට මරණ දඬුවම දෙන්නය කියා. ඔවුන් විනාශ කරන්න ඕනෑ. ඔවුන්ට ඉඩක් දෙන්න එපා. ඒ අන්තවාදීන්ට සහයෝගය දෙන කණ්ඩායම කවුරු වුණත් කමක් නැහැ, ඒ අයටත් දඬුවම් දෙන්න. අපි ඒ අය සම්පූර්ණයෙන්ම විනාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ආර්ථික අතින් දැන් අපේ රටට බොහොම අමාරු තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව. අපේ රටේ ආර්ථිකය බොහොම අමාරුවෙන් ගොඩ නඟාගෙන ආපු වෙලාවේදී තමයි මේ වාගේ අමාරු තත්ත්වයක් ඇති වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කර සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මේ ප්‍රහාර නිසා අපේ රටේ බස් කර්මාන්තයේ යෙදී සිටින අයට විශාල පීඩනයක් ඇති වෙලා තිබෙනවා. ඒ අයට leasing ගෙවා ගන්න විධියක් නැහැ.

ත්‍රිවීල් රස්සාව කරන අයටත් තමන්ගේ රැකියාව කර ගන්න විධියක් නැහැ. ඔවුන්ට විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මේ රටේ සාමය, සමගියට බරපතළ තර්ජනයක් එල්ල වෙලා තිබෙන වෙලාවක් මේක. මම මුස්ලිම් භක්තියෙක්. මේ වුණු සිදු වීම ගැන මම ලජ්ජා වෙනවා; කනගාටු වෙනවා. මම විතරක් නොවෙයි, ලක්ෂ 22ක් වුණු මුස්ලිම් ජනතාවම ඒ ගැන කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ උතුම් මාසය තමයි, මේ පෝය මාසය. ඒ වාගේම අපේ උතුම් මාසය තමයි, මේ නෝම්බි මාසය. අපට මේ නෝම්බිය සතුටින් ගත කරන්න බැරි වුණා. මම විතරක් නොවෙයි, මේ ලක්ෂ 22ක ජනතාවම අඬනවා; කඳුළු වක්කරනවා. ඒ ඇයි? කිතුනු ජනතාවට කළ මේ කැත වැඩේ ගැන අපට හරිම වේදනාවයි. මීට පෙර, අපේ මවුලවි පූජකතුමා කියන්න පුළුවන් ඉහළම නිලධාරීන්ට කිව්වා, "මේ අයට දඬුවම් දෙන්න, මෙහෙම කණ්ඩායමක් ඉන්නවා" කියා. ඒක අතපසු වුණේ ඇයි කියා මම දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක ඉල්ලීමක් කරනවා. බටහිර රටවලට වුවමනා විධියට කටයුතු කරන ISIS කියන කණ්ඩායම් අල්ලන්න. මේ රටේ ඉන්න අහිංසක, බෞද්ධ ජනතාව අපට දුන් නිදහස මුස්ලිම් ජනතාවට ලෝකයේ කොයි රටකින්වත් ලැබිලා නැහැ. සියලුම නායක හිමිවරුන්ට, ඒ වාගේම සියලුම බෞද්ධයන්ට මුස්ලිම් භක්තිකයෙක් වශයෙන් මම ස්තුතිවන්ත වෙනවා.

මුලින්ම ලංකාවේ මුස්ලිම් අය එක්දහස් ගණනක් තමයි ඉඳලා තිබෙන්නේ. සිංහල ජනතාව අපට උපරිම සහයෝගය දීලා තිබෙනවා. අපට බිම් අඟලක්වත් අඩු කරලා නැහැ. ආගමික කටයුතු, ව්‍යාපාර කටයුතු, දේශපාලන කටයුතු කරන්න සියලුම දේවල් දීලා තියෙද්දී, බටහිර රටවල වුවමනාවට මුස්ලිම් රටවල් විනාශ කරන්න ආපු කණ්ඩායමක් තමයි ලංකාවේ ඉන්න විසි දෙලක්ෂයක් වූ මුස්ලිම් ජනතාවගේ නිදහස විනාශ කරන්න කටයුතු කළේ. ISIS කණ්ඩායමක වැඩ නිසා අද අපට ඒ නිදහස නැති වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

නෝම්බි මාසයේ අපේ සියලුදෙනා අඬ අඬා ඉන්නවා. මෙතැනින් එහාටවත් මේ රටේ කිසිම ජාතියකට හානියක් නොවන විධියට, මේ ISIS කියන බටහිර රටවලින් ආපු කණ්ඩායමට මෙවැනි දේවල් කරන්න ඉඩ නොදෙන විධියට අපේ පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාම මේ දවස්වල උනන්දුවෙන් කටයුතු කරන එක අපට ඉතාම සතුටක්. මේ ISIS කියන කණ්ඩායම මේ රටින් නැත්තටම නැති කරන්න ඕනෑය කියා හැම එක්කෙනාම කියනවා. මම ඒක අගය කරනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න සහෝදර මන්ත්‍රීවරුනුත්, මමත්, ඒ වාගේම අනෙක් මුස්ලිම් මන්ත්‍රීවරුනුත් එකට එකතු වෙලා මේ ISIS කණ්ඩායම විනාශ කරන්න සහයෝගය දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.36]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අවාසනාවන්ත පාලකයෝ පිරිසක් අපේ රට බරපතළ අවාසනාවන්ත තත්ත්වයකට පත් කරලායි තිබෙන්නේ. 2015 ජනවාරි 08වන දායින් පස්සේ අපේ රටේ පාලන බලය භාර ගත්ත පිරිස අද මේ රටට කර තිබෙන දේ ගැන කවුරුත් දන්නවා. මූලාසනයේ ඉන්න ඔබතුමාගේවත්, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේවත්, මේ කථාවට සවන් දීගෙන ඉන්න එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නු යම් පොදු මහ ජනතාවක් වෙත් නම් ඒ පිරිසගේවත් අභිලාෂයන් නොතකා ඉතා කුඩා කල්ලියක්; අවාසනාවන්ත කල්ලියක් -ඒ වචනය ඉතාම නිවැරැදියි.- විසින් මේ රට තව තවත් අවාසනාවන්ත තත්ත්වයකට ඇදගෙන යනවා. ඒ වාගේම අසත්‍ය, මිථ්‍යා ප්‍රචාරක ජාලය පමණක් ඔවුන්ගේ ජීවිකා වෘත්තිය බවට පරිවර්තනය කරගෙන තිබෙනවා. ජනතාව දන්නවා, අද අපේ රටේ ආර්ථිකය දවසින් දවස කඩා වැටෙන බව.

2019 මාර්තු මාසයේ ඉඳලා අද දක්වා අපේ රටේ ජනයාට ජීවත් වීමට ස්ථිර ආදායමක් නොමැතිව ආර්ථිකය බරපතළ කඩා වැටීමකට ලක් වෙලා තමයි තිබෙන්නේ. ඔබතුමා දන්නවා, 2019 මාර්තු මාසයේ විදුලි බලය කපා හැරිය බව. විදුලි බලය කපා හැරීම තුළින් අරමුණු කර ගත්තේ මොකක්ද? රට විනාශයට පත් වුණත්, විදුලිබල ඇමතිවරයා හොරකම නවත්වලා නැහැ. තුර්කි නැවකින් විදුලිය ලබා ගැනීම සඳහා අතිවිශාල නාස්තිකාර මුදලක් වියදම් කරනවා. මේ රටේ ජනයා දන්නවා, මේ රටට මොන තරම් අපරාධයක් මේ නරුම පාලකයෝ සිදු කරනවාද කියා. අගමැතිතුමා වෙන්න පුළුවන්, මලික් සමරවික්‍රම වෙන්න පුළුවන්, මංගල සමරවීර වෙන්න පුළුවන්, රවි කරුණානායක මහත්තයා වෙන්න පුළුවන්. ඒ කවුරුන් හෝ කමක් නැහැ. ඒ හදා ගත්තු කල්ලි කණ්ඩායම විසින් රට දවසින් - දවස අභාග්‍යයට පත් කර තිබෙනවා.

පසු ගිය අවුරුදුවල රටේ සංවර්ධන වේගය සියයට 3.1කට කඩා වැට්ටුවා. 2015 මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව කාලයේ ආසියාවේ ඉහළම සංවර්ධනය වුණු සියයට හතක වර්ධනය ඉක්මවා ගියා. ඒ වර්ධන වේගය සියයට 3.1 දක්වා වැට්ටුවා. පුරසාරම් දොඩනවා. අපි කියනවා, 2019 වර්ෂයේ අපේක්ෂිත ආර්ථික වර්ධනය සියයට හතර නොව සෘණ අගයක් කරා ගමන් කරනවා කියා. මේ රටට කරන්න පුළුවන් අපරාධය මේ නරුම පාලකයෝ විසින් සිදු කර තිබෙනවා. මේ කථාවට සවන් දෙන එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නු හෘදය සාක්ෂියක් තිබෙන මිනිසුන්ට අපි කියනවා, මේ නරුම පාලකයෝ විසින් අපේ රටට ඇති කරපු විනාශය දෙස බලන්න කියා. දළ දේශීය නිෂ්පාදනය දවසින් - දවස අඩු වෙලා තිබෙනවා. අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සියල්ල සෘණ අගයක් දක්වා ගමන් කරමින් පවතිනවා. රටේ ණය සහ ණය පොලී අනුපාතිකය එන්න - එන්න වැඩි කර තිබෙනවා. රටේ කොටස් වෙළෙඳ පොළ දවසින් - දවස කඩා වැටෙනවා. විදේශ ආයෝජකයෝ රටේ මුදල් ටික අරගෙන යනවා. 2014 වර්ෂයේ ලෝකයේ සංචාරකයන්ගේ ආකර්ෂණීය නගරය බවට කොළඹ නගරය පත් වුණා. MasterCard Global Destination Cities Index - 2014 වාර්තාවේ සඳහන් වෙනවා, ලෝකයේ ශීඝ්‍රයෙන්ම වර්ධනය වෙන නගර 14 අතරට කොළඹ නගරය පත් වෙනවා කියා. ඒ සියල්ල අපේ රටට අහිමි කරමින් මේ අවාසනාවන්ත පාලකයෝ මේ රට අවාසනාවන්ත තත්ත්වයට පත් කර තිබෙනවා.

අද විනිමය පාලනය පිළිබඳ යෝජනා රාශියක් ඉදිරිපත් කරනවා. අපි මේ පිළිබඳව අධිකරණයේ නඩු පැවරුවා. ඒක නිසා මේ දේශන කිසි දෙයක් වැඩක් නැහැ. මේ නරුම පාලකයන් සිටින තුරු, මේ අවාසනාවන්ත පාලකයෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා තමයි පසු ගිය වකවානුව තුළ විදේශ විනිමය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළේ. 2015 ජනවාරි 08වැනි දා ඉඳලා මේ රටේ තිබුණු මූල්‍ය බුද්ධි ඒකකය අකර්මණ්‍ය බවට පත් කළා. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අකර්මණ්‍ය බවට පත් කර අපේ රටේ ගොඩ නැඟෙමින් තිබුණු යහපැවැත්ම ඒ වාගේම ජාතීන් අතර ඇති මෙතෙක් කල් ඇති නොවුණු විරසකය මොවුන් විසින් උත්පාදනය කළා. ත්‍රස්තවාදීන්ට නිදහසේ මුදල් ලබා ගැනීම සඳහා ඉඩකඩ රාජ්‍ය අනුග්‍රහය සහිතව සිදු කළා. ආර්ජන්ටිනාවේ බුවෙනොස් අයිරිස් ගැන නොවෙයි මම මේ කියවන්නේ; මම කියවන්නේ 2017 අපේ මහ බැංකු වාර්තාවෙන් -අපේ නොවෙයි, ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා සභාගත කරපු, ආණ්ඩුව කොහොම වුණත් මහ බැංකුවේ නිලධාරින් විසින් මේ රට පිළිබඳව කරන ලද පරීක්ෂණය පිළිබඳව ඉදිරිපත් කරපු වාර්තාවෙන් -තමයි මම මේ කාරණය කියන්න හදන්නේ. එය, අපේ නොවෙයි, මුදල් අමාත්‍යාංශයේ වාර්තාවක්.

එහි සඳහන් වෙනවා, "මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට ක්‍රමෝපායන්ගේ දුර්වලතාවන් සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධන බලකායේ අනුකූලතා ලේඛනයේ ලැයිස්තුගත කරන ලද අතර, අළු ලේඛනයට ඇතුළත් වූ ලෙස හඳුන්වයි." කියා. අළු ලේඛනයට ඇතුළත් කරනවා; ත්‍රස්තවාදීන්ට මුදල් සපයන රටක් බවට අපේ රට පත් කර තිබෙනවා. මේ මුදල් ඇමතිලා, මේ අගමැතිලා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය දුර්වලභාවයට පත් කරමින් ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ මාර්ගය හදලා තිබෙනවා. අපි දන්නවා, පසු ගිය වකවානුව තුළ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ සැකකටයුතු ගනු දෙනු දහසකට වැඩි ප්‍රමාණයක් වාර්තාගත වුණ බව. එයින් 330කට වඩා අඩු ප්‍රමාණයකටයි පරීක්ෂණ කළේ. රටේ ජාතික ආරක්ෂාව කුමක්ද?

අපි දන්නවා මේ රටේ වුණු මහ පොළොව නුහුලන අපරාධය, - එයින් මේ රටට වුණු විනාශය හෘදය සාක්ෂියක් තිබෙන මහ බැංකුවේ නිලධාරින් දන්නවා. - මහ බැංකු බැඳුම්කර හොරකම බව. ඒ හොරකම කර රටට පාඩු කළ මේ ආණ්ඩුව අර්ජුන් මහේන්ද්‍රන්ව පිට රට පැන්නුවා. අර්ජුන් මහේන්ද්‍රන්ව පිට රට පැන්නුවා වාගේ, මේ රටේ ජාතික ආර්ථිකයට ඒ හානිය කළ තැනැත්තා -පළමුවෙනි වග උත්තරකාරයා- පිට රට පැන්නුවා වාගේ, ඒ සිංගප්පූරු ජාතිකයා හෙට අනිද්දා වෙනකොට පිට රට පැන්නීමේ තවත් උත්සාහයක් තිබෙන බව ඉතා වගකීමෙන් කියනවා. DIG නාලක ද සිල්වා කියන නියෝජ්‍ය පොලිස්පතිවරයාව පිට රට යැවීමේ සැලැස්මක් තිබෙනවා. අපි දන්නවා, හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් ඝාතනය කිරීමට සැලසුම් කිරීම පිළිබඳ චෝදනාවක් DIG නාලක ද සිල්වාට තිබුණා. ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වූවා. ඒ කරුණු හෙළිදරවු කළ නාමල් කුමාර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නවා. DIG නාලක ද සිල්වා එළියට එනවා.

අපි අධිකරණ නියෝග ගැන කථා කරන්නේ නැහැ. ඒවා අපට අවශ්‍ය නැහැ. නමුත්, අපි දන්නවා කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයත්, කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයත් කියන අධිකරණ දෙක තමයි අත් අඩංගුවට ගත්ත බුද්ධි අංශ නිලධාරින් වැඩිම පිරිසක් සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වැඩිම පිරිසක් සිරගත කළේ කියා. අවුරුද්ද, අවුරුදු එකහමාර වාගේ කාලයට මේ රටේ බුද්ධි අංශ නිලධාරින්ව සිරගත කළේ කළේ ඔය

[ගරු සිසිර ජයකොඩි මහතා]

අධිකරණ දෙක විසිනුයි. හැබැයි, DIG නාලක ද සිල්වාට ඇප ලැබෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නාමල් කුමාර අත් අඩංගුවට ගන්නවා. දැන් පැමිණිලිකාරයා තමයි හිරේ ගිහිල්ලා තිබෙන්නේ, විත්තිකරු තමයි එළියට ඇවිල්ලා තිබෙන්නේ. ජනාධිපතිතුමා කිව්වා, "ඝාතන කුමන්ත්‍රණයක් තිබෙනවා. ඉදිරි කාලයේදී එළි කරනවා." කියා. ඒ කුමන්ත්‍රණය එළි කරන්න කියා ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එම නිසා අපි විශේෂයෙන් පාර්ලිමේන්තුවේ අද කියනවා, අර්ජුන් මහේන්ද්‍රන්ව පිට රට යැව්වා වාගේම, පිට රට පැන්නුවා වාගේම, මහ බැංකු බැඳුම්කර හොරකම ඒ මඟින් යට කරන්නට උත්සාහ කළා වාගේම DIG නාලක ද සිල්වාත් පිට රට යවලා ඒ ඝාතන කුමන්ත්‍රණය යටපත් කරන්නට හදනවා. ඒක නොවෙයි ප්‍රශ්නය. අහිංසක මුස්ලිම් ජනතාවට අපි කියන්නේ මේකයි. අහිංසක මුස්ලිම් ජනතාව සහ සිංහල ජනතාව අතර ගැටුමක් ඇති කරන්නට එක්සත් ජාතික පක්ෂයට ඕනෑකම තිබුණා. මේ පිළිබඳව නාමල් කුමාර කට උත්තරයක් දෙනවා. DIG නාලක ද සිල්වා සහ නාමල් කුමාර අතර ප්‍රකාශ රාශියක් හුවමාරු වෙනවා. ඒ ප්‍රකාශවලින් පැහැදිලිව කියනවා, දිගන සිදුවීම වාගේ සිද්ධි ඇති කර මුස්ලිම් ජනතාවට පහර දෙන්නට එක්සත් ජාතික පක්ෂය සැලසුම් සහගතවයි මේක කරන්නේ කියා.

දැන් පළාත් සභාවල කාලය අවසානයි. දැන් පළාත් සභා 8ක්ම විසුරුවලා තමයි තිබෙන්නේ. පළාත් සභා මැතිවරණ තියන්නට කියා දැන් මහජන උද්ඝෝෂණයක් එන්නට ඕනෑ. උද්ඝෝෂණ නැහැ. අද සියල්ල යටපත් කර තමයි තිබෙන්නේ. බලයට කෑදර බලලෝභී මූසල පාලකයන්ගෙන්, මේ රටට ද්‍රෝහී වුණු පාලකයන්ගෙන් රටට යහපතක් බලාපොරොත්තු වෙන්නට බැහැ; ආර්ථිකයට යහපතක් බලාපොරොත්තු වෙන්නට බැහැ.

මංගල සමරවීර විදේශ කටයුතු ඇමතිවෙලා ජිනීවා නුවරට ගිහිල්ලා 30/1 යෝජනාවට අත්සන් කර කියනවා, "අපි යුද අපරාධ කළා." කියා. "අපි යුද අපරාධ කළා." කියා අපේ රට පිළිගන්නවා. මේ වාගේ කාලකණ්ණි නරුම පාලකයින් ත්‍රස්තවාදීන්ට මුදල් ලැබෙන්නට සලස්වලා ඒ පිළිබඳව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පරීක්ෂණ කරන්නේ නැතිව, පරීක්ෂණ කළ නිලධාරින්ව හිර භාරයට දමන ද්‍රෝහී ආණ්ඩුවකින්, ද්‍රෝහී නායකයින්ගෙන් රටට යහපතක් වෙනවාද කියා හෘදය සාක්ෂියක් තිබෙන එක්සත් ජාතික පාක්ෂිකයන්ගෙන් අපි අහනවා.

අපි එය හෘදය සාක්ෂියක් තිබෙන මුස්ලිම් ජනතාවගෙන් අහනවා; හෘදය සාක්ෂියක් තිබෙන ද්‍රවිඩ ජනතාවගෙන් අහනවා. මේ රට දවසින් දවස මේ ගෙනියන්නේ අභාග්‍යය කරා. මේ දවස්වල රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙන බව අපි දන්නවා. ගරු කථානායකතුමනි, මීට පෙර මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැතිතුමා විධියට කටයුතු කරපු දින 31ක, 2ක කාලය සම්බන්ධයෙන් අපට මතකයි. එදා මේ පාර්ලිමේන්තුවේ කථානායක ගැලරියේ ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, ඇමෙරිකාව ඇතුළු බටහිර තානාපති කාර්යාලවල නිලධාරින් වාඩිවෙලා අත්පුඩි ගසමින් බලාගෙන සිටියදී තමයි, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහත්මයා එදා මන්ත්‍රීවරුන් පෙරළාගෙන දුවගෙන ඇවිල්ලා විශ්වාස භංග යෝජනාව බාර දුන්නේ. මීට කලින් ජනතා විමුක්ති පෙරමුණේ හිටපු අපේ මිත්‍රයෙක් කිව්වා, ඒ "විජිත හේරත්" නොවෙයි, "යටත්විජිත හේරත්" කියලා. ඒ වෙලාවේ එම විශ්වාස භංග යෝජනාවට ඡන්දය විමසුවා. ඒ නිසා මේ රටේ මහා නායක හාමුදුරුවරුන්ගෙන් අපි ඉල්ලීමක් කරනවා. ඊයේ දවසේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බෞද්ධ ස්වාමීන් වහන්සේලා විශාල පිරිසක් යෝජනාවක් සම්මත කරලා තිබුණා. ඒ තමයි රිසාඩ් බදියුදීන්ට එරෙහි විශ්වාස භංග යෝජනාවට සහාය නොදුන්නොත්, මන්ත්‍රීවරුන්ට පන්සල් තහනම් කියන එක. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, එවැනි මන්ත්‍රීවරුන්ට පන්සල් තහනම් කරන්න කියලා. මේ විශ්වාස භංග යෝජනාව ගන්නේ නැතිව මහ පුටුවල ඉන්න, ගන්න ඉඩ දෙන්නේ නැති අයට යම් සම්මාන දුන්නා නම්, ගරු නම්බුනාම දුන්නා නම්, ඒ ගරු නම්බුනාම ආපසු ගන්න කියලා අපි කියනවා.

මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන් සහයෝගයෙන් සිටියේ. මැතිවරණවලට භය ආණ්ඩුව මැතිවරණ කල් දැමීම සඳහා මේ රට නැවත බටහිර ගැති රූකඩ පාලනයක් ඇති කිරීම සඳහා වූ සැලැස්ම, න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරනවා. මේ ද්‍රෝහී පාලකයන්ට ඕනෑ වෙන්නේ මේ රටේ ජාතීන් අතර ගැටුම් ඇති කරන්නයි. ඒ නිසා මේ රටේ ජනයාගෙන් අපි ඉල්ලනවා, ඒ ගැටවලට අසු වෙන්න එපා කියලා. මේ රටේ බෞද්ධ සම්ප්‍රදායත් එක්ක හැදිච්ච වැඩිච්ච, ජීවත් වෙච්ච සිංහල, දෙමළ, මුස්ලිම් කිසිවෙකුට කිසිම කෙනෙකුට වෛර කරන්න ඉඩක් නැහැ; හිංසා කරන්න ඉඩ කඩක් නැහැ. අපි විශ්වාස කරන්නේ නැහැ, ලෝකයේ කිසිම ආගමකින් හිංසාවට, වෛරයට ඉඩක් ඇති කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මතු ප්‍රයෝජනය සඳහා සොයා බැලිය යුතු කාරණයක් පිළිබඳව සඳහන් වන අද දිවයින පත්තරේ මුල් පිටුවේ තිබෙන මේ ප්‍රකාශය මම **සභාගත*** කරනවා.

එම පුවත් පතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"සිසේරියන් සැත්කම්වලින් පසු තව්හිද් ජමාත් දොස්තර සිංහල බෞද්ධ මව්වරුන් හාරදහසක් වඳ කරලා සාක්ෂි සහිතව තොරතුරු හෙළි වේ දොස්තර අල්ලන්න පුළුල් පරීක්ෂණ"

සිංහල බෞද්ධ මව්වරුන් හාරදහසක් වඳ කරලා කියලා සාක්ෂි තිබෙන බව කියනවා. මම මේ පුවත් විස්තර සභාගත කරනවා, මතු කවදා හරි දවසක කෙනෙකුට ප්‍රයෝජනවත් වෙන නිසා.

ඒ නිසා මේ ආකාරයෙන් මේ රටේ විවිධ අන්තවාදී කල්ලි කණ්ඩායම් අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සමස්ත ජනයාගේ විනාශය කරා ගමන් කරන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරයි; ඒ සමගිය බිඳීමේ උත්සාහයන් දරයි; අන්තවාදී, ජාතිවාදී, පටු හිංසාවාදී මාර්ග හරහා තමුන්ගේ ඉලක්කය කරා යාවි.

ඒ නිසා එය තේරුම් අරගෙන මේ උගුලට අහු වෙන්නේ නැතිව අපේ රටට විරුද්ධ මේ දේශද්‍රෝහී පාලකයන්ගෙන් මේ රට මුදා ගැනීමට පෙළ ගැහෙන්න කියලා ආයාචනය කරමින්, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි. මීළඟට, ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[අ.භා.2.50]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවේදී 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝග තමයි නිකුත් වෙන්නේ. විවාදය පැවැත් වෙන්නේ ඒ පිළිබඳව වුණත්, විවාදය විවිධ මාතෘකා ගණනාවක් ඔස්සේ පැවැත්වෙන බව තමයි අපට පේන්න තිබෙන්නේ.

කෙසේ වෙතත්, මේ රටේ විදේශ විනිමය තත්ත්වය ශක්තිමත් කර ගැනීමේ වගකීම සෑම රජයකටම තිබෙනවා. අද අපට ප්‍රශ්නය තිබෙන්නේත් විදේශ විනිමයේ හිඟකමයි. තවමත් අපේ රටට විදේශ විනිමය වැඩියෙන්ම ලැබෙන්නේ, මැද පෙරදිග රටවල්වල වහල් සේවයේ යෙදෙන අපේම කාන්තාවන්ගෙන්. ඒ අය මැද පෙරදිග ගිහිල්ලා විවිධ පීඩාවන්ට ලක්වෙලා, විවිධ ආකාරයේ අතවරවලට පවා ලක්වෙලා ඉතා මහන්සියෙන් සොයා ගන්නා මුදල තමයි මේ රටේ විදේශ විනිමය විධියට තිබෙන්නේ.

අපි ඒ විදේශ විනිමය මුදල් යොදා ගෙන තමයි සියලු කටයුතු කරන්නේ. යුද්ධය තිබෙන වෙලාවේ යුද්ධයට අවශ්‍ය අවි ආයුධ ගෙනෙන්න පවා වියදම් කළේ අපේ මේ කාන්තාවන් සොයා දෙන මුදලයි. අපි අද කල්පනා කළ යුතු වෙන්නේ අපේ කාන්තාවන් වහල් සේවයේ යොදවලා සොයා ගන්නා මුදලට අතිරේකව, වෙනත් අංශ කෙරෙහි අවධානය යොමු කරලා මුදල් සොයා ගැනීමේ වැඩපිළිවෙළක් දියත් කිරීමටයි. ඒ වගකීම තිබෙන්නේ රජයටයි. මා දන්නා තරමින් නම්, තවමත් ඒ පිළිබඳ නිසි ක්‍රමවේදයක් සකස් වෙලා නැහැ. විදේශ වෙළෙඳ පොළේ රැකියා පිළිබඳ ගත්තොත්, ගෘහ සේවයට කාන්තාවන් යවන්නේ නැතිව විදේශ වෙළෙඳ පොළේ ඇමෙරිකන් ඩොලර් 2,000ට, ඇමෙරිකන් ඩොලර් 3,000ට වඩා වැඩි වැටුපක් ගන්න පුළුවන් රැකියා විශාල ප්‍රමාණයක් තිබෙන බව පෙනෙනවා. ශ්‍රී ලාංකිකයන්ට ඒ රැකියා සඳහා විශාල ඉල්ලුමක් තිබෙනවා. නමුත්, ඒ ඉල්ලුමට සරිලන ආකාරයේ අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණයක් නිර්මාණය කරන්න තවමත් කිසිම රජයකට පුළුවන් වුණේ නැහැ. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, හෙදියන්ට විශාල ඉල්ලුමක් තිබෙනවා. අඩුම තරමේ විදේශ වෙළෙඳ පොළට තියා තවම ලංකාවේ අවශ්‍යතාවවත් සම්පූර්ණ කර ගන්න බැරි වුණා. කාර්මික ක්ෂේත්‍රය තිබෙනවා, තාක්ෂණික ක්ෂේත්‍රය තිබෙනවා, IT ක්ෂේත්‍රය තිබෙනවා, හෝටල් ක්ෂේත්‍රය තිබෙනවා. එවැනි විවිධ අංශවල තිබෙන පුරප්පාඩු සොයා බලා අඩුම තරමේ ඒවාට සරිලන උපාධිධාරීන් ප්‍රමාණයක් අපේ විශ්වවිද්‍යාලවලින් එළියට දාන්නවත් සැලැස්මක් නැහැ. අපේ උසස් තාක්ෂණ ආයතනවල ඒ පිළිබඳ යම් ප්‍රවේශයක් අරගෙන තිබෙනවා. නමුත්, ඒක ප්‍රමාණවත් වෙනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. දැන් එන්න එන්නම විදේශ විනිමයේ හිඟතාවක් රටේ ඇති වෙනවා. දැන් මේ යෝජනාවලියෙන් බොහෝ අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ කොටස් වෙළෙඳ පොළ පිළිබඳ, අපේ සංස්ථාපිත සමාගම් පිළිබඳ, ණය සුරැකුම්පත් පිළිබඳ, මූල්‍ය සමාගම් පිළිබඳ, කල්බදු සමාගම් පිළිබඳ යනාදී වශයෙන් ඒ කාරණා පිළිබඳ කථා කරනවා. දැන් කොටස් වෙළෙඳ පොළට වෙලා තිබෙන්නේ මොකක්ද? එන්න එන්නම කොටස් වෙළෙඳ පොළ පහළට යෑමක් තමයි අද අපට දකින්න ලැබෙන්නේ. ඒවායේ වර්ධනයක් නැහැ. අද වන විට විදේශ ආයෝජන එන්නේ නැහැ. අද රජයට විදේශිකයන්ගේ විශ්වාසය දිනා ගත යුතු වෙනවා. පළමුව මේක තමයි කරන්න ඕනෑ වන්නේ. ඒ විශ්වාසය නැති වුණේ මේ රජය බලයට පත් වෙලා ටික දවසක් යනකොටම මහ බැංකු බැඳුම්කර සිදුවීම හරහා අති දැවැන්ත මූල්‍ය වංචාවක් සිදුවීම නිසායි. ඒ නිසාවෙන්ම විදේශීය වාගේම, දේශීය ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටුණා; මූල්‍ය වෙළෙඳ පොළ පිළිබඳ තිබුණු විශ්වාසය බිඳ වැටුණා. අද ඒ තත්ත්වයට මුහුණ දෙන්න තවමත් පුළුවන්කමක් නැහැ. අද ඒක කරපු මිනිහා තවමත් හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. මේකට සම්බන්ධ වෙච්ච, සෘජුව දායක වෙච්ච පුද්ගලයා වන අර්ජුන මහේන්ද්‍රන් පිටරට සැපසේ ඉන්නවා. විවාහ කටයුතු-මඟුල්- සිදු කරනවා. ඒවාට අපේ ලංකාවේ ඉන්න දේශපාලනඥයොත් සම්බන්ධ වෙනවා; නායකයෝත් සම්බන්ධ වෙනවා. ඔහුව අත් අඩංගුවට ගන්න, මේ රටට ගෙනෙන්න තවමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා නැහැ. ඉතින් එතකොට මේ රටට විදේශ ආයෝජන එයිද? බංකොළොත් වෙන රටකට විදේශ ආයෝජන ගෙනෙන්නේ නැහැ. මේ රට ටිකෙන් ටික බංකොළොත් වෙන බව පෙනෙනනවා. පසුගිය දවස්වල ඇති වෙච්ච සිද්ධියත් එක්ක තවත් ඒ තත්ත්වය ඇති වුණා. ඒ වාගේම දැන් විදේශ ණය ගන්න වෙලා තිබෙන්නේ වැඩි පොළියටයි. දැන් මේ රජයට කටයුතු කරන්න වෙලා තිබෙන්නේ, ගිනි පොලියට ණය අරගෙනයි. ණය ගෙවන්න, ණය ගන්න රටක් බවට පත් වෙලා තිබෙනවා. ගිනි පොලියට ණය ගන්න රටක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම රටක විදේශ වත්කම් වැඩි කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

දැන් ඇති වෙලා තිබෙන අලුත් අර්බුදකාරී තත්ත්වය නිසා මේ රටට විදේශ විනිමය ආපු තවත් ප්‍රධාන මාර්ගයක් ඇහිරිලා තිබෙනවා. ඒ තමයි සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරය හරහා මුදල් විශාල ප්‍රමාණයක් එමින් තිබුණා. ලෝකයේ හොඳම ගමනාන්තය බවට ලංකාව පත් වෙලා තිබුණා. දැන් ඒක සම්පූර්ණයෙන් අනෙක් පැත්තට හැරිලා තිබෙනවා. දැන් ලංකාවට ඒම තහනම්, එහෙමත් නැත්නම් ආරක්ෂිත නොවන රටක් බවට ලංකාව නම් කරලා තිබෙනවා. මේ තත්ත්වය අනෙක් පැත්තට හරවා ගන්න පුළුවන්වන පරිදි ප්‍රමාණවත් වැඩ පිළිවෙළක්, දායකත්වයක් තිබෙනවාද කියන එක අපට පෙනෙන්නේ නැහැ. ඒ සඳහා අදාළ බලධාරීන්, අදාළ නිලධාරීන්, ඒ ඒ රටවල තානාපති නිලධාරීන් ඒ අදාළ අය දැනුවත් කරලා කටයුතු කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. අපේ රට නියෝජනය කරන තානාපතිවරුන් විවිධ රටවල ඉන්නවා; සංචාරකයින් වෙන රටවල ඉන්නවා. ඒ අය ඒ රටවලට ගිහිල්ලා තම විශ්‍රාම සුවය විඳිමින්, බෙහෙත්-හේත් ගන්න එක, ළමයින්ට උගන්වන එක නොවෙයි ඒ අයගේ යුතුකම වගකීම වෙන්නේ.

ඒ තානාපතිවරුන්ගේ වගකීම වන්නේ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා මැදිහත් වීම; මේ රටට විදේශ ආයෝජන ගෙනෙන්න මැදිහත් වීම. අපේ තානාපති සේවයේ ඉන්න බහුතර පිරිසක් ඒ කටයුතුවල නියැළෙනවා කියලා මට පෙනෙන්නේ නැහැ. ඒ පිළිබඳව දැනුම තිබෙන කණ්ඩායමක් ඉන්නවා කියාත් මට දැනෙන්නේ නැහැ. දේශපාලන හිතවත්කම් මත, වෙනත් හිතවත්කම් මත ගිහිපු අය තමන්ගේ කටයුතුවලට මැදිහත් වනවා හැරෙන්න රට පිළිබඳව මැදිහත් වන බවක් අපිට පෙනෙන්නේ නැහැයි කියන කාරණයත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

අද මේ රටේ සංචාරක ක්ෂේත්‍රය සාර්ථක වෙලා තිබුණා නම් අපේ විදේශ විනිමය තත්ත්වය හොඳ මට්ටමට හැරෙනවා. ඒ එන සල්ලි හැම තැනටම විහිදිලා -බෙදිලා- යනවා. දැන් රජය සංචාරක හෝටල් පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන බව කිව්වා. ඒවා බොහොමයක් තරු හෝටල්වලට, මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට ලැබෙයි. සුළු පරිමාණ මට්ටමෙන් මේ කර්මාන්තයේ යෙදුණු විශාල පිරිසක් ඉන්නවා. Homestay කියලා ක්‍රමවේදයක් තිබෙනවා; ගෙවල්වල කාමරයක් සංචාරකයන්ට දීලා, ජීවත් වෙච්ච පිරිසක් ඉන්නවා. ඒ අය ගැන බලන ක්‍රමවේදයක් තවම නැහැ. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයට අනුබද්ධ වෙච්ච ආයතන -අංශ- ගොඩක් තිබෙනවා. විදේශිකයන්

[ගරු මහින්ද අමරවීර මහතා]

ප්‍රවාහනය කරන, lease කරලා අරගෙන තිබෙන වාහනවලට මේ සහනය ලැබෙන්නේ කොහොමද? ඒ වාගේම මේ සංචාරකයන්ට මඟ පෙන්වන්නන් - guidesලා - ඉන්නවා. ඒ අයගේ ජීවන තත්ත්වය උසස් කරන්න මොකක්ද කරන්නේ? නොයෙක් ස්ථාන නරඹන්න සංචාරකයන් විවිධ ප්‍රදේශවලට ගෙන යන වාහනවල සේවය කරන රියැදුරන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. උදාහරණයක් විධියට ගත්තොත් තිස්සමහාරාමයේ යාල,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
තිස්සමහාරාමයේ යාල ජාතික වනෝද්‍යානය නරඹන්න යන විදේශිකයන් විශාල ප්‍රමාණයක් හිටියා. දැන් ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම නැවතිලා තිබෙනවා. ඒ ජීප් රථ හිමිකරුවන්, ඒවායේ වැඩ කරන රියැදුරන්, ඒ ආශ්‍රිතව ජීවත් වන පිරිස් අද අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. මේ අය නඟා සිටුවන වැඩ පිළිවෙළක් තවම පෙනෙන්න නැහැ. මේ අයට ආධාරයක් දීම විතරක් ප්‍රමාණවත් වන්නේ නැහැ. පළමුවෙන් කළ යුතු වන්නේ මේ කඩා වැටුණු සංචාරක ව්‍යාපාරය නැවත වර්ධනය කර ගැනීම සඳහා රජය විසින් නිසි මැදිහත් වීමක් කිරීමයි. ජාත්‍යන්තර ත්‍රස්තවාදයක් වන ISIS සංවිධානය අපේ රටට ඇවිල්ලා, බෝම්බ පුපුරුවලා මහා විනාශයක් සිදු කළා. හැබැයි, මාසයක් වාගේ කෙටි කාලයක් ඇතුළත මේ ත්‍රස්තවාදී සංවිධානයේ හිටපු සියයට 99ක්ම අත් අඩංගුවට ගන්න හැකියාව ලැබුණු බව තමයි ආරක්ෂක අංශ ප්‍රකාශ කරන්නේ. තව එක සිදුවීමක්වත් ඇති නොවන මට්ටමට ඒ කටයුතු කිරීම පිළිබඳව අපි සතුටු වනවා. දැන් අවශ්‍ය වන්නේ විශ්වාසයයි. අපේ රටේ -දේශීය- මිනිසුන්ගේ විශ්වාසය පළමුවෙන්ම ගොඩ නඟන්න ඕනෑ. "දැන් මේ රට ආරක්ෂිතයි. නැවත මේ රටට එන්න" කියලා ආරක්ෂක අංශ ඇතුළු රජය විසින් ජාත්‍යන්තරයට සහතිකයක් ලබා දිය යුතු වනවා. එවැනි තත්ත්වයක් ඇති වුණොත් විවිධ ක්ෂේත්‍රවල අපහසුතාවට පත් වෙච්ච අයට සහන ලබා ගන්න පුළුවන්කම ලැබෙනවාය කියන කාරණයත් මම සඳහන් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් සඳහන් කරන්න කැමතියි. අනාගතයටත් ගැළපෙන ආකාරයට අපේ රටට ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. අද තවම එහෙම කිසිම ක්‍රමවේදයක් සකස් කරලා නැහැ. ඒ නිසා තමයි අප්‍රේල් 21වැනි දා ප්‍රහාරය වාගේ ප්‍රශ්න පවා නිර්මාණය වන්නේ. ඒ නිසා අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට යෝජනාවලියක් ඉදිරිපත් කරලා තිබෙනවා. සියලු පක්ෂවල නායකයන් එක්ක අපි සාකච්ඡා කළා. අපි යෝජනා කළා පමණයි. ඒ සඳහා අවශ්‍ය සංශෝධන ගෙනෙන්න. ඒ සඳහා අවශ්‍ය අදහස් ගෙනෙන්න. එලෙස අදහස් ගෙනැල්ලා අපි මේ 225 දෙනාගේම වැඩ පිළිවෙළක් විධියට මෙය ඉදිරිපත් කරමු. රටේ නැවත මෙවන් තත්ත්වයක් ඇති නොවන වැඩ පිළිවෙළකට තමයි අපි යා යුතු වන්නේ. අඩුම ගණනේ ජාතික ප්‍රතිපත්තියක් හදා ගන්න බැරි වෙච්ච අපට, රටේ ආරක්ෂාව පිළිබඳ ජාතික වැඩ පිළිවෙළකට යන්න මේක අවකාශයක් වෙයි. ඒ සඳහා සියලු දෙනාගේ කැපවීමත් අපේක්ෂා කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි. ඊළඟට, ගරු එස්.එම්. චන්ද්‍රසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා.3.00]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආර්ථිකයට විශාල වශයෙන් හානි සිදු වුණු මෙම ඛේදවාචකය නවත්වා ගන්න තිබුණාය කියලා අද මුළු රටේම ජනතාව කියන බව අපි දන්නවා.

අප්‍රේල් 21වැනි දා ඛේදවාචකය සිදු වුණේ, ආරක්ෂක අංශවල හා රජයේ දුර්වලකම නිසා බවයි ඔවුන් කියන්නේ. ඒ ඛේදවාචකය නිසා අපේ රටේ ආර්ථිකය විශාල ලෙස පරිහානියට ලක් වුණා කියන එක අපි කවුරුත් දන්නවා. දැන් දරුවෝ ඉස්කෝලේ යන බව අපි දැක්කා. ඒකටත් උනන්දු කළා, අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ එක්කම දෙමව්පියන්ගේ තිබුණු භය, දරුවන්ගේ තිබුණු භය ටිකක් මඟ හැරුණාය කියන එක අපට පෙනෙනවා. හැබැයි, රට යථා තත්ත්වයට පත් වුණා කියලා අපට සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, අපේ ආර්ථිකය ඉතා බරපතළ ලෙස කඩා වැටිලායි තිබෙන්නේ. එය යථා තත්ත්වයට පත් වෙන්න තව සෑහෙන කාලයක් යයි. "ජනතාව දැන් පාරේ ගැවසෙනවා, ළමයින් ඉස්කෝලේ යනවා" කියලා, ඔක්කෝම යථා තත්ත්වයට පත් වුණා කියලා හිතලා හරියන්නේ නැහැ.

අද සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. අපේ සංචාරක ඇමතිතුමා ප්‍රකාශ කළා "සහන දෙනවා" කියලා. "සහන දෙනවා" කිව්වාට ඒ සහන කාටද ලැබෙන්නේ කියන එක පැහැදිලි නැහැ. එය පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. සංචාරක මණ්ඩලයේ ලියා පදිංචි හෝටල්වලට යම් යම් සහන දෙනවාය කියලා කියනවා. සහන දුන්නාය කියලා, ඉක්මනින් යථා තත්ත්වයට පත් වෙන්නේ නැහැ. මම දන්නා නුවර ප්‍රධාන හෝටල් දෙකක් තිබෙනවා. එකක කාමර 97ක් තිබෙනවා. අනික් එකේ කාමර 92ක් තිබෙනවා. ඒ කළමනාකරු මට කිව්වා, "එක හෝටලයක කාමර දෙකක විතරයි සංචාරකයෝ ඉන්නේ. අනෙක් හෝටලයේ කාමර තුනක විතරයි සංචාරකයෝ ඉන්නේ. එක හෝටලයක පමණක් සේවකයෝ 350ක් ඉන්නවා. දැන් ඒ සේවකයින්ට පඩි-නඩි ගෙවන්න විධියක් නැහැ. රැකියාවෙන් ඉවත් කරන්න වනවා" කියලා. ඔබතුමන්ලා පොඩි පොඩි සහන දෙයි. නමුත්, මෙය බරපතළ කඩා වැටීමක්. අද-හෙට යථා තත්ත්වයට පත් වන දෙයක් නොවෙයි. අවුරුද්දක් ණය පොලී කපනවා, අවුරුද්දක් යනතෙක් ණය ගෙවීම අත්හිටුවනවා කිව්වාට එතැනින් එහාට ගිය බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා මේ පිළිබඳව විශේෂයෙන්ම සලකා බැලිය යුතුයි.

අද බුලත්විට විකුණන වෙළෙන්දාගේ ඉඳලා මහා පරිමාණ ව්‍යාපාරිකයා දක්වා ව්‍යාපාර සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. අද ව්‍යාපාරිකයෝ කියනවා, "විකුණු භාණ්ඩ වෙනුවෙන් ලැබුණු චෙක්පත් අගරු තත්ත්වයට පත් වෙලා. ඒ නිසා අද සම්පූර්ණයෙන්ම වෙළෙඳාම කඩා වැටිලා" කියලා. මේකට සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා නැහැ. සමාජයේ සියලුම දෙනා අද මේ අර්බුදයට මුහුණ දීලා තිබෙනවා. ව්‍යාපාර සියල්ලම අද කඩා වැටිලා තිබෙන බව පැහැදිලිවම කියන්න ඕනෑ. දැන් බැංකුවලින් සහන දෙනවා කියනවා. හැබැයි, බැංකුත් මේ පවතින තත්ත්වය නිසා විශාල කඩා වැටීමකට ලක් වෙනවා. අද බැංකුවල

පවතින තත්ත්වය පිළිබඳව ඒ නිලධාරින්ගෙන් අහපුවාම, ඉතාම ශෝකජනක තත්ත්වයක් තිබෙන බව පෙනී යනවා. බැංකු ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබුණා. ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව වැනි රජයේ බැංකුත්, කොමර්ෂල් බැංකුව, සෙලාන් බැංකුව වාගේ පෞද්ගලික බැංකුත් ලාභ ලබපු බැංකු. ඒ සියල්ලම අද කඩා වැටිලා. බැංකු ටික කඩා වැටෙනවාය කියන්නේ, රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා කියන එකයි. එදා ලෝක ආර්ථිකය කඩා වැටුණු වෙලාවේත් අපේ ආණ්ඩුව අපේ බැංකු ටික කඩා වැටෙන්න දුන්නේ නැහැ. අද බැංකු ටික කඩා වැටිලා. එම නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව අපි මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ.

කෘෂි කර්මාන්තයේ යෙදුණු ගොවීන් අද සම්පූර්ණයෙන්ම අනාථ වෙලා. අද දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට ගිහින් බලන්න. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට එන ගොවියාගේ එළවලු ටික, පලතුරු ටික ගන්න අද වෙළෙන්දෝ එන්නේ නැහැ. හේතුව මොකක්ද? අප්‍රේල් 21 ප්‍රහාරයටත් වඩා ප්‍රධානම දේ තමයි, ජනතාවට මිලදී ගැනීමේ හැකියාවක් නැහැ. ජනතාවට මුදල් නැහැ. මුදල් සංසරණය වෙන්න කිසිම ව්‍යාපෘතියක් නැහැ. සංවර්ධන ව්‍යාපෘති නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. අවුරුදු 30ක් මේ රටේ යුද්ධයක් තිබුණු බව අපි දන්නවා. අපි යුද්ධය අවසන් කරලා, මේ රට නිදහස් හා සාමකාමී රටක් බවට පත් කළා.

පාරවල් ටික හදලා, මුළු රටටම විදුලිය දීලා, මහා වාරිමාර්ග, වරායයන්, ගුවන් තොටුපොළවල්, අධිවේගී මාර්ග හදලා මේ රට සංවර්ධනයේ ඉහළටම එන වෙලාවක තමයි තමුන්නාන්සේලාට ආණ්ඩුව භාර දුන්නේ. අපේ කථාවක් තිබෙන විධියට අපි කේක් ගෙඩිය කපාගෙන කන්න කියලා තමයි තමුන්නාන්සේලාට දුන්නේ. ඒක කර ගන්න බැරුව තමයි මේ රට විනාශ කරලා තිබෙන්නේ.

අවසාන වශයෙන් මම තව එක කරුණක් ප්‍රකාශ කරන්නම්. මට වවුනියාව සර්ව ආගමික නායකයන්ගේ සංවිධානයෙන් ලිපියක් එවලා තිබෙනවා. මට පුද්ගලිකවත් දුරකථනයෙන් දැනුම් දුන්නා, පාකිස්ථානයේ සහ ඇෆ්ගනිස්ථානයේ අනාථයන් පිරිසක් පුත්තෝට්ටම් පුනරුත්ථාපන කඳවුරට ගෙනැත් දමලා තිබෙනවා කියලා. දැන් මුළු වවුනියාවම, එම ප්‍රදේශයම කලබැගෑනියට පත් වෙලා තිබෙනවා. මේ වන විට ජනතාව කලබලයට පත් වෙලා තිබෙනවා, එම කඳවුරේ ඉන්න අනාථ පිරිස කවුද කියලා දැන ගන්න. ජනතාවට හොරෙන් ගිහින් තමයි ඒ වැඩ කරන්නේ. අවුරුදු 30ක යුද්ධයක් තිබුණු, එල්ටීටීඊ ත්‍රස්තවාදයට යට වෙලා හිටපු උතුරේ ජනතාව අතරට මේ විධියට හොරෙන් ගිහින් අනාථයන් දැම්මාම, ඒක ලොකු ප්‍රශ්නයක් වෙන බව අපි දන්නවා. මේ පිළිබඳව ගරු ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, කථානායකතුමාට, විපක්ෂ නායකතුමාට, විදේශ කටයුතු ඇමතිතුමාට, ආණ්ඩුකාරතුමාට, නියෝජ්‍ය පොලිස්පතිට, ආඥාපතිට යන හැමදෙනාටම ලියුම් යවලා තිබෙනවා. නමුත් DIG මහත්මයාවත්, යුද හමුදාවේ නිලධාරියෙක්වත් කිසිම වගකිව යුතු කෙනෙක් මේකට උත්තරයක් දීලා නැහැ. දිසාපතිතුමාවත් පිළිතුරක් දීලා නැහැ. ඉතින් ඒ නිසා අපි විශේෂයෙන් වගකිව යුත්තන්ගෙන් ඉල්ලා සිටිනවා වවුනියාවේ පුත්තෝට්ටම් පුනරුත්ථාපන කඳවුරට ගෙනැත් දමා තිබෙන-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
-ඇෆ්ගන් සහ පාකිස්ථාන අනාථයන් කවුද, කොපමණද, මොකටද එතැනට අරගෙන ගියේ කියන කාරණය පිළිබඳව වහාම ජනතාව දැනුවත් කරන්න කියලා. එහෙම නැත්නම් හෙට නැත්නම් අනිද්දා පාරවල් වහලා මහා උද්ඝෝෂණයක් කරන්න පක්ෂ භේදයකින් තොරව, ආගම් භේදයකින්, ජාති භේදයකින් තොරව වවුනියාවේ සර්ව ආගමික නායකයන් එකතු වෙලා ඉන්නවා. තවත් සිද්ධියක් ඇති වෙන්න කලින් මේ පිළිබඳව සොයා බලන්න. අප්‍රේල් 21 සිදුවීම වෙන්න කලින් යම් දෙයක් කළේ නැහැ. එම නිසා මේ රට විශාල විනාශයකට පත් වුණා. ඒ නිසායි අපි මේ කාරණය කලින් දැනුම් දෙන්නේ. මේ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි වගකිව යුත්තන්ගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එස්. වියාලේන්දිරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ දී ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

[பி.ப. 3.09]

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதமானது வெளிநாட்டுச் செலாவணிச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் பற்றியதாகும். இன்று

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

சுற்றுலாத்துறை பாரிய வீழ்ச்சியைக் கண்டிருப்பது உங்களுக்குத் தெரியும். அண்மையில் இடம்பெற்ற கொடூரமான பயங்கரவாதத் தாக்குதல் காரணமாகச் சுற்றுலாத்துறை வீழ்ச்சியடைந்திருக்கின்றது. சுற்றுலாத்துறை மட்டுமல்ல, அதனோடு தொடர்புபட்ட பல துறைகள் வீழ்ச்சியடைந்திருக்கின்றன. இந்தத் தாக்குதலினுடைய முக்கிய சூத்திரதாரியான முஹமட் சஹ்ரான் என்பவருடைய பிரதான தளமாக இருந்தது கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு மாவட்டமாகும். அந்த மாகாணத்திலே பாடசாலை மாணவர்கள் இன்னும் இயல்பு வாழ்க்கைக்குத் திரும்பவில்லை. அவர்களால் பாடசாலைக்குச் செல்லமுடியாத நிலை காணப்படுகின்றது. பாடசாலைகளின் அதிபர்கள் தினம் தினம் எங்களுக்குத் தொலைபேசி அழைப்பினை எடுத்து, மாணவர்களின் வருகை மிகமிகக் குறைவாக இருப்பதாகச் சொல்லிக்கொண்டிருக்கின்றார்கள். பாடசாலைகளில் மாணவர் களின் வருகையே குறைவாக இருக்கின்றபொழுது, இந்த நாட்டுக்கு எவ்வாறு உல்லாசப் பயணிகள் வருவார்கள்? என்பதை நாங்கள் சிந்துத்துப் பார்க்க வேண்டும்.

இந்தச் சம்பவம் நடைபெற்று ஒரு மாதம் கடந்திருக்கின்ற இவ்வேளையிலே, சுற்றுலாத்துறையிலே ஈடுபட்டிருக்கின்ற முதலாளிமாருடைய நலனைக் கருத்திற்கொண்டு, அவர்களைப் பாதுகாக்கும் வகையிலே, அவர்கள் தங்களுடைய கடனை இலகுவான முறையில் செலுத்தக்கூடிய வகையிலே, அதுவும் காலந்தாழ்த்திச் செலுத்தக்கூடிய வகையிலே அரசு சில மானியத் திட்டங்களைக் கொண்டுவந்திருக்கின்றது. 2020 ஏப்பிரல் வரை அதற்கான கால அவகாசம் வழங்கப் பட்டிருக்கின்றது. 15 வீத 'வற்' வரி 5 வீதமாகக் குறைக்கப் பட்டிருக்கின்றது. இதனை நாங்கள் வரவேற் கின்றோம். ஆனால், இன்னொருபுறம் நாங்கள் ஒரு விடயத்தைப் பார்க்க வேண்டும். கடந்த 3 தசாப்த காலகட்டத்திலே வடக்கிலும் கிழக்கிலும் எத்தனையோ தொழில்முயற்சிகள் பாதிக்கப் பட்டன; அழிக்கப்பட்டன. ஆனால், அதற்கான எந்த நிவாரணங்களும் 30 - 35 வருடங்கள் தாண்டியும் வழங்கப்படாத நிலையிருக்கின்றது.

மலையகத்தை எடுத்துக்கொண்டால், மலையகத் தோட்டத் தொழிலாளர்கள் 200 வருடங்களாக இந்த நாட்டினுடைய அபிவிருத்திக்கு முதுகெலும்பாக இருந்திருக்கின்றார்கள். ஆனால், அவர்களுக்குப் பல்வேறுபட்ட பிரச்சினைகள் இருக்கின்றன. அவர்களுடைய சம்பளப் பிரச்சினையாக இருக்கலாம் அல்லது இன்னோரன்ன பிரச்சினைகளாக இருக்கலாம், கடந்த காலங்களிலே அவர்கள் பாதிக்கப்பட்ட நேரங்களிலே அவர்களுக்குரிய நஷ்டஈடுகள், மானியம் போன்ற விடயங்களைக்கூட மிகவும் கஷ்டப்பட்டுப் போராடியும் பெறமுடியாத சூழல் காணப்பட்டது. இந்த 200 வருட காலகட்டத்திலே மாறிமாறி ஆட்சிக்கு வந்த அரசுகள் அவற்றை இழுத்தடித்துக்கொண்டே வந்திருக்கின்றன. இங்கே மலையகத் தமிழ்ச் சகோதர அரசியல்வாதிகளும் இருக்கின்றார்கள். இந்த விஷயத்தில் அனைத்து அரசியல் கட்சிகளும் ஒன்றிணைந்து தீவிரமாகச் செயற்படவேண்டும். நிச்சயமாக இதற்காக இணைந்து செயற்பட, எங்களது கூடுதலான ஆதரவைத் தர நாங்கள் எப்பொழுதுமே தயாராக இருக்கின்றோம்.

அது மாத்திரமல்ல, அரச ஊடகங்களை எடுத்துக் கொண்டால், குறிப்பாக வசந்தம் TV, Channel Eye, ரூபவாஹினி, ITN போன்ற அரச ஊடகங்களிலே, பாதிக்கப் பட்டிருக்கின்ற எமது சமூகம் சார்ந்த பல்வேறுபட்ட விடயங்கள் பேசப்படுகின்ற, வெளிவருகின்ற தன்மை மிகக் குறைவாகவே காணப்படுகின்றது. குறைவென்பதைவிட, "இல்லை!" என்று சொல்லக்கூடியளவில்தான் இருக்கின்றன. கடந்த காலத்திலே எங்களுடைய ஆலயங்களிலே, எங்களுடைய பகுதிகளிலே பலர் உயிர் இழந்தார்கள்; பலர் பாதிக்கப்பட்டார்கள். அது தொடர்பாகப் பல்வேறு விழிப்புணர்வுப் பேரணிகள், கண்டன ஆர்ப்பாட்டங்கள் நடந்தன. அண்மையில்கூட, கிழக்கின் கல்விப் பாதிப்புக்கள் தொடர்பாக நாங்கள் பாரிய பேரணிகளை ஒழுங்கு செய்திருந்தோம். அவ்வாறான செய்திகளுக்கு அந்த அரச ஊடகங்களிலே முக்கியத்துவம் அளிக்கப்படவில்லை. இன்று ஒரு சில அரச ஊடகங்களிலே வேலை செய்கின்ற அல்லது அந்த ஊடகத்துறை சார்ந்த சிலர், "திகன மற்றும் தர்கா நகரிலே நடைபெற்ற தாக்குதலுக்குப் பழிவாங்குகின்ற ஒரு செயற்பாடாக இந்தச் செயற்பாடு இருக்கலாமா?" என்று கேட்கிறார்கள். எதை எதனோடு முடிச்சுப்போடுகின்றார்கள் என்பதைப் பாருங்கள்! கொழும்பிலும் சரி, நீர்கொழும்பிலும் சரி அல்லது மட்டக்களப்பிலும் சரி, இறந்தவர்கள் அப்பாவி மக்களாவர். ஏப்பிரல் 21ஆம் திகதி ஈஸ்டர் பண்டிகையைக் கொண்டாடுவதற்காகச் சென்ற பச்சிளம் குழந்தைகள் உட்பட 250க்கும் மேற்பட்டவர்கள் பரிதாபமாக உயிரிழந்தார்கள்; 500க்கும் மேற்பட்டவர்கள் காயமடைந்தார்கள்; பலர் இன்றும் உயிருக்குப் போராடிக்கொண்டு இருக்கிறார்கள். இன்று சிலர் முஹமட் சஹ்ரானை மௌலவி என்று சொல்கின்றார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முஹமட் சஹ்ரான் என்பவர் மௌலவியா, அல்லது பயங்கரவாதியா? என்று நான் கேட்க விரும்புகிறேன். இன்று அவரைக்கூட நியாயப்படுத்துகின்ற நிலைமையை நாங்கள் பார்க்கக் கூடியதாக இருக்கின்றது. எனவே, இந்த அரச ஊடகங்கள் உண்மையாகப் பாதிக்கப்பட்ட எமது சமூகம் சார்ந்த விடங்களை இருட்டடிப்புச் செய்யாமல் வெளிக்கொணர வேண்டும் என்ற தயவான வேண்டுகோளை இந்த இடத்தில் நான் முன்வைக்கிறேன்.

கடந்த 3 தசாப்த காலத்திலே யாழ்ப்பாணத்திலே, முல்லைத் தீவிலே, மன்னாரிலே, வவுனியாவிலே, கிளிநொச்சியிலே, மட்டக்களப்பிலே, அம்பாறையிலே, திருகோணமலையிலே எங்களுடைய தமிழ்ச் சமூகத்தைச் சார்ந்த எவ்வளவோ அப்பாவி மக்கள் கொன்று குவிக்கப்பட்டபோது அரச ஊடகங்கள் அந்த விடயங்களை வெளிக்கொணர்ந்ததா? என்ற கேள்வியை நாங்கள் கேட்கின்றோம். ஆகவே, அரச ஊடகங்கள் சரியான முறையிலே நடந்துகொள்ள வேண்டும். பாதிக்கப்பட்ட ஒரு சமூகம் அல்லது அழிக்கப்பட்டிருக்கின்ற ஒரு சமூகம் சார்ந்த விடயங்களைச் சில ஊடகங்கள் வெளிக்கொணர்கின்றபோது அதனை இனவாத ஊடகமாக அல்லது அவற்றைப் பற்றிப் பேசுபவர்களை இனவாதியாகக் காட்டுகின்ற தன்மை இருக்கின்றது. இந்த நாட்டிலுள்ள அப்பாவி முஸ்லிம் மக்களை நாங்கள் நேசிக்கின்றோம்; ஆதரிக்கின்றோம். நாங்கள் அவர்கள்மீது குற்றம் சுமத்தவில்லை. குற்றம் சுமத்தப்படுகின்றவர்களை அல்லது குறித்த சம்பவத்தோடு தொடர்புபட்டவர்களைப் பற்றிப் பேசுகின்ற சில அரசியல்வாதிகள், ஒட்டுமொத்தச் சமூகத் தையும் குற்றஞ்சாட்டி, அந்தச் சமூகத்தைப் பற்றிப் பேசுகின்ற எங்களை இனவாதிகளாகவும் அந்தச் செய்திகளை வெளியிடுகின்ற ஊடகங்களை இனவாத ஊடகங்களாகவும் காட்டுகின்ற ஒரு வங்குரோத்து அரசியலைச் செய்வது மிகவும் வேதனையான விடயமாகும். அதற்குச் சில அரச ஊடகங்கள் துணைபோவது மிகவும் வேதனையான விடயமாக இருப்பதை நான் இந்த இடத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

உண்மையிலே, இன்று உற்பத்திப் பொருளாதாரம் அழிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்த நல்லாட்சி

அரசாங்கத்திலே 450 கோடி ரூபாய் செலவிலே வாழைச்சேனையில் 'எதனோல்' factory அமைக்கப்படுகின்றது. இந்த factory தொடர்பாக எத்தனையோ ஜனநாயகமயப் படுத்தப்பட்ட மக்கள் போராட்டங்களை மக்கள் முன்னெடுத் தார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
ஆனால், இன்று இந்த அரசாங்கத்தின் இரண்டு திணைக்களங்களுக்கூடாக 100% வரிச் சலுகையைக் கொடுத்து அந்த 'எதனோல்' factory கட்டப்பட்டுக் கொண்டிருக் கின்றது. இன்று எத்தனையோ படித்த இளைஞர்கள் வேலைவாய்ப்பின்றி இருக்கின்றார்கள். 2015ஆம் ஆண்டு 09ஆம் மாதம் பத்து இலட்சம் இளைஞர், யுவதிகளுக்கு வேலை தருவதாக இந்த நல்லாட்சியின் பிரதமர் கூறினார். இந்த அரசாங்கத்தின் ஆட்சிக் காலம் முடிகின்ற தறுவாயும் நெருங்கியிருக்கின்றது. அவ்வாறு பத்து இலட்சம் பேருக்கு வேலை கொடுக்கப்பட்டதா? என்பது இங்கு கேள்வியாக இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்திலே கிழக்குப் பிராந்தியத்திலே 4,000 பேர் வேலை செய்த வாழைச்சேனை காகித ஆலை இன்று இழுத்து மூடப்பட்டிருக்கின்றது. அதைத் திறந்து வேலைவாய்ப்புக் களைக் கொடுப்பதற்கான எந்த முஸ்தீபுகளும் முன்னெடுக்கப்படவில்லை. ஓட்டுத் தொழிற் சாலைகள், அரச காகித ஆலை, முறக்கெட்டாஞ்சேனை தேவபுர அரிசி ஆலை என்று எத்தனையோ தொழிற்சாலைகள் மூடப்பட்டிருக் கின்றன. இந்த விடயங்களைப் பற்றி நாங்கள் சொல்கின்றவை எல்லாமே இந்த நான்கு வருடங்களிலே 'செவிடன் காதில் சங்கு ஊதுவது' போன்ற செயற்பாடாகத் தான் இருக்கின்றது. ஆகவே, இந்த விடயத்திலே அரசாங்கம் கூடுதலான கவனத்தைச் செலுத்த வேண்டும்.

இன்று அர்ஜுன் மகேந்திரன் அவர்கள் சிங்கப்பூரிலே கலியாண வைபவங்களிலே கலந்துகொள்கின்றார். அவரின் அழைப்பிலே சில அரசியல்வாதிகளும் கலந்துகொள்கிறார்கள். சிங்கப்பூரிலே அர்ஜுன் மகேந்திரன் அவர்கள் -

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - State Minister of Agriculture, Irrigation and Rural Economic Affairs)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is your point of Order, Hon. State Minister?

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
கௌரவ உறுப்பினர் அவர்களே, இவ்வளவு பிரச்சினை பற்றிக் கதைக்கிறீர்கள். நாங்கள் ஒன்றும் செய்யவில்லை; அதாவது, Factory புனரமைக்கவில்லை; அது செய்யவில்லை, இது செய்யவில்லையென்று சொல்கிறீர்கள்! நீங்கள் பிரதி அமைச்சராக இருந்த அந்த 52 நாட்களில் அதைச் செய்திருக்கலாம்தானே! *[இடையீடு]*

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
அதே விடயத்தை இப்படி நான் கேட்கிறேன். நல்லாட்சி அரசின் இந்த 4 வருடங்களிலும் நீங்கள் எதையுமே செய்யவில்லை என்ற விஷயத்தை நீங்கள் ஒத்துக் கொள்ளுங்கள்! நீங்கள் அதை விளங்கிக்கொள்ள வேண்டும். நீங்களும் அந்த மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்தவர்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அங்கு சனத்தொகை வீதத்துக்கு மேலதிகமாக மதுபான நிலையங்கள் இருக்கின்றன. ஆனால், 450 கோடி ரூபாயிலே அர்ஜுன் மகேந்திரனுடைய மருமகன் அலோசியஸ் அவர்கள் 'எதனோல்' factory இனை அங்கு அமைக்கின்றார். இன்று மத்திய வங்கி ஊழல் பற்றிப் பேசுகின்றோம். அதுபோல இந்த 'எதனோல்' factory தொடர்பான விசாரணைகள் முன்னெடுக்கப்பட வேண்டும். இன்று அதற்கு நூறு வீத வரிச்சலுகை வழங்கப்பட்டிருக்கின்றது. இன்று எத்தனையோ அப்பாவிகள் தொழிலை இழந்து, வாழ்வாதாரத்தை இழந்து நடுத்தெருவிலே நிற்கின்ற நிலையிலே, இவ்வாறான முதலாளிகளைப் பாதுகாக்கின்ற வகையிலே அந்த factory நிர்மாணம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. குறிப்பிட்ட சில காலம் நிறுத்தப்பட்டிருந்த அந்த factory மீளவும் கட்டப்படுகின்றது. சற்றுச் சிந்தித்துப் பாருங்கள்! இன்று மிகவும் பணம் படைத்தவர்களையும் முதலாளிகளையும் பாதுகாப்பதிலும் அவர்களுக்கான நிலபுலங்களை வழங்கு வதிலும் செலுத்தப்படுகின்ற கவனத்தை, ஏன் இந்த அப்பாவி மக்களைப் பாதுகாக்கின்ற விஷயத்திலே செலுத்தவில்லை? என்ற கேள்வியை நான் கேட்டு நிற்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. (Dr.) Harsha De Silva, please.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ මෙම ගරු සභාවේ ගණපූරණය නැහැ. එම නිසා ගණපූරණය සම්පූර්ණ කරන ලෙස ඉල්ලා සිටිනවා.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present-*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා ඇමතිතුමනි. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා.3.21]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Non Cabinet Minister of Economic Reforms and Public Distribution)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනට නියමිත මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්න කලින් අද "දිවයින" පුවත් පතේ පළවෙලා තිබුණු කාරණාවක් සම්බන්ධයෙන් මා වචනයක් කියන්න කැමතියි. ගරු කථානායකතුමාත් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉල්ලා තිබෙනවා කියලා අපට දැන ගන්න ලැබුණා. තවුහීද් ජමාත් සංවිධානයට සම්බන්ධ වෛද්‍යවරයකු විසින් සිංහල -බෞද්ධ මවුවරුන් 4,000ක් වඳ කරන්නට කටයුතු කරලා තිබෙනවා කියලා එහි සඳහන් වෙලා ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි කාරණා පිළිබඳ මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කරනකොට මේවායේ ඇත්ත, බොරු පිළිබඳ සොයා බැලීමට විශාල වගකීමක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමා හෝ දැනුවත් නැති බව තමයි අපට ආරංචි වෙන්නේ. ඒ නිසා මේ තත්ත්වයට මේ විධියට යන්න දුන්නොත්, මාධ්‍ය විසින් මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයක් ඇති කරන තැනට තල්ලු කිරීමක් තමයි සිදු වන්නේ.

එම නිසා කථානායකතුමාගේ වාර්තාව ලැබෙන කල් මමත් ඉතාමත්ම ඕනෑකමින් බලාගෙන ඉන්නවා. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතුයි කියා මා විශ්වාස කරනවා.

ඊයේ පෙරේදා ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කියා තිබුණා මා දැක්කා, අපව Grey List එකට දමා තිබෙනවා, මෙයට හේතුව මේ රජයේ වැඩ පිළිවෙළයි, terrorist financing and money laundering සම්බන්ධයෙන් අපි හරිහැටි ක්‍රියාත්මකවෙලා නැහැයි කියලා. මා ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, ලංකාව Grey List එකට දමා තිබෙන්නේ 2014 සිද්ධි සම්බන්ධයෙන්ය කියලා. එම නිසා අපි රටේ ජනතාව දැනුවත් කරන්න ඕනෑ, ඇත්ත මොකක්ද, බොරුව මොකක්ද කියලා. දිවයින පත්‍රයේ පළ වුණා වාගේ වැඩක් තමයි මෙතැනත් සිද්ධ වෙන්නේ.

Sir, I would like to read from a note that I got from the Central Bank on what we are doing to get Sri Lanka out of the Grey List of the FATF. This note states,

"The Financial Action Task Force , the global policy-setter has introduced 40 recommendations on Anti-Money Laundering and Countering the Financing of Terrorism in order to combat money laundering/terrorist financing and other related offences globally. The Asia Pacific Group on Money Laundering functions as the FATF's regional affiliated body and monitors the level of compliance with the FATF recommendations in the region through Mutual Evaluations".

This is important because in today's context, where we are talking about terrorist financing coming from various parts of the world and where we have seen what had happened here in this country just over a month ago, we must be doubly vigilant and must ensure that we have all the safeguards in place to counter such terrorist financing taking place. We were reading in the newspapers reports referring to some of the investigations that were going on and they were, in fact, pointing towards cryptocurrency, how a person's e-wallet, using cryptocurrency, was used before the blast took place.

This note further states that Sri Lanka was subjected to its first Mutual Evaluation in 2006 and the second one was done during 2014/2015. The second Mutual Evaluation Report on Sri Lanka, which was adopted in July, 2015, recommended Sri Lanka to initiate a number of actions to rectify the Anti-Money Laundering and Countering the Financing of Terrorism deficiencies identified during the Mutual Evaluation. The point that I am trying to make here is that this Evaluation, which ended up with Sri Lanka being listed in the Grey List, was based on what happened in 2014/2015. So, the Evaluation was in 2014/2015, which looked at what happened since 2006 to 2014/2015. Therefore, when people say that Sri Lanka was put on the Grey List and make allegations against this Government, those allegations, I am trying to show you, are unfounded and baseless.

The note goes on to state, "Accordingly, Sri Lanka implemented a series of measures to address the deficiencies including adoption of National AML/CFT Policy, issuance of Customer Due Diligence Rules for financial institutions and introduction of risk-based AML/CFT Supervision for financial institutions". So, to summarize, we have undertaken to implement some 15 recommendations based on the Mutual Evaluation that took place. Then the note states, "In October, 2016, the FATF informed that Sri Lanka will be subject to a review of the International Cooperation Review Group of the FATF to assess the progress of AML/CFT effectiveness.

After several discussions and progress reports, the FATF informed that Sri Lanka has not made sufficient progress in four areas, namely, International Cooperation, Supervision, Legal Persons and Arrangements and Targeted Financial Sanctions on Proliferations (North Korea & Iran). As a result, the FATF, .............in October 2017, listed Sri Lanka as a jurisdiction with strategic AML/CFT deficiencies in the FATF's Compliance Document, which is more commonly identified as 'the Grey List'." So, this is what happened.

It further states, "Upon listing, a time-bound action plan to address the strategic deficiencies identified was provided to Sri Lanka.

Since .......... November 2017, the Financial Intelligence Unit together with other stakeholders has taken a series of effective and tangible steps to implement the FATF Action Plan. Few of the major actions taken are as follows:

- Issue of Customer Due Diligence Rule No. 1 of 2018 and other necessary guidelines for Designated Non-Finance Businesses and Professions
- Issue of regulations, directives and guidelines implementing United Nations Security Council Resolution on Iran and North Korea
- Passing the amendments to the Mutual Legal Assistance in Criminal Matters Act,............"

People were criticizing that also in this very House. But, not having legislation on mutual legal assistance in criminal matters is one reason why we ended up in the Grey List. So, there is really no reason to criticize the Government when we are trying to introduce these legislations so that we can get out of the Grey List and show the world that we have taken precautions to prevent these terrorist financing activities going on in this country. According to this note, actions of passing the necessary amendments to the Trust Ordinance requiring to obtain all necessary information including beneficial owners and so on were also taken. Anyway, what I want to say is, with regard to the actions that I just mentioned, the necessary political commitment remains in place to sustain their implementation in the future.

A decision was taken by the FATF Plenary held in February, 2019 to consider taking Sri Lanka out of the Grey List. So, as per the decisions taken by the FATF, a team of evaluators will be vising Sri Lanka during the coming months. In fact, they were supposed to come, but due to the difficulties in travelling, I understand, it had to be postponed for a little while. But, they will be coming here to meet all the relevant stakeholders including the private sector and the highest political authorities to verify the implementation of the FATF Action Plan and to ascertain Sri Lanka's political commitment towards implementing Anti-Money Laundering and Countering the Financing of Terrorism. The onsite team will make their recommendations to the FATF Plenary, which could result in Sri Lanka exiting the Grey List soon.

So, the point that I am making is that we got into the Grey List because of what had not happened during the Mutual Evaluation that took place in 2014/2015 and that was long before this Government was effectively in office. Based on those recommendations, we have now undertaken to implement a bunch of changes, reforms, bring amendments to the law and so on and are confident that we will be taken off the Grey List very soon and our country will be back as an accepted, credible player in the global financial markets. Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා.3.31]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය පනත යටතේ නියෝගයක් හා විසර්ජන පනත යටතේ වූ යෝජනා කිහිපයක් පිළිබඳව තමයි අද දිනයේ මේ විවාදය පැවැත්වෙන්නේ. ඒ වුණත්, මේ අවස්ථාවේ මගේ අවධානය යොමු කරන්නේ වෙනත් කාරණයකටයි. රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයාට එරෙහිව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව සඳහා කඩිනමින් දිනයක් ලබා දෙන්නය කියා ඊයේ දවස පුරාම විපක්ෂය ඉල්ලීමක් කළා. අද උදේ පක්ෂ නායක රැස්වීමක් කැඳවා මේ විශ්වාස භංග යෝජනාව විවාද කිරීම සඳහා කඩිනමින් දිනයක් ලබාදෙන බවට එහිදී සභානායකතුමා, අග්‍රාමාත්‍යතුමා, ඒ වාගේම විපක්ෂනායකතුමා ඇතුළු සියලුදෙනා එකඟතාවකට ආවා. කඩිනමින් දිනයක් දෙනවාය කිව්වත්, දැන් තමුන්නාන්සේලා ලබන මාසයේ 18වන දාට තමයි ඒ සඳහා දින දීලා තිබෙන්නේ. මේ විධියට ලබන මාසයේ 18වන දාට දින දීලා තිබෙන්නේ, තමුන්නාන්සේලා තේරීම් කාරක සභාවක් පත් කරලා, රිසාඩ් බදියුදීන් ඇමතිවරයා ශුද්ධ කරලා ඊට පසුව විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ මේ පාර්ලිමේන්තුවේදී තමුන්නාන්සේලා විශ්වාස භංග යෝජනා ගෙන ආ හැටි අපි දැක්කා නේ. උදේට විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා, දවල් ඡන්දය අරගෙන සම්මත කරලා, එදින හවස් වෙනකොට හැමදෙයක්ම කියලාත් අවසන් කරනවා. තමන්ගේ ඇමතිකම් ටික නැති වෙනකොට, තනතුරු නැති වෙනකොට, තමුන්නාන්සේලාට මේ පාර්ලිමේන්තුවේ වෙන නීතියක් තිබෙන්නේ. තමුන්නාන්සේලා ඒ දවස් ටිකේ විශ්වාස භංග යෝජනා කීයක් ගෙනාවාද? තමුන්නාන්සේලා ඒ විශ්වාස භංග යෝජනා ගෙනැත් පැය 24ක් යන්න කලින් සම්මත කරගත්තා. ඒ ඇයි? තමන්ගේ ආණ්ඩුව, තමන්ගේ ඇමතිකම් ටික නැති වෙන නිසායි එහෙම කළේ.

මේ රට දැවැන්ත අර්බුදයකට මුහුණ දුන්, රටේ ජීවිත සිය ගණනක් නැති වුණු මේ සිද්ධිය සම්බන්ධයෙන් සැකයට භාජන වෙලා ඉන්නා අමාත්‍යවරයකු පිළිබඳව මේ වනවිට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඊයේ රිසාඩ් බදියුදීන් ඇමතිවරයා කිව්වා, එතුමාගේ කිසි කෙනෙක් අත්අඩංගුවට අරගෙන නැහැය කියා. අපි එතුමාට වගකීමකින් කියනවා, පුළුවන් නම් විවාදයකට එන්න කියලා. එතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් ඩෙටනේටර් සමඟ අත්අඩංගුවට ගත්තා. ඔහු ඇප පිට මුදා හැරියා. ඒ විතරක් නොවෙයි, වනාතවිල්ලුවේ තිබී අවි ආයුධ හම්බවුණු අවස්ථාවේදී, පසුගිය දා තමන්ගේ ඇඟේ බෝම්බ බැඳගෙන මිය ගිය ඉම්රාන්ගේ පුතා අත්අඩංගුවට ගත්තා. ඒ අවස්ථාවේදී ඔහු නිදහස් කරගන්නත් රිසාඩ් බදියුදීන් ඇමතිවරයා බලපෑම් කළා. එදා වනාතවිල්ලුවේදී අත්අඩංගුවට ගත් අයට දඬුවම් දුන්නා නම් මෙහෙම වන්නේ නැහැ. හමුදාපතිතුමා පසුගිය ඉරිදා කළ සම්මුඛ සාකච්ඡාව තමුන්නාන්සේලා බලන්න. ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. එදා වනාතවිල්ලුවේදී අවි ආයුධ එක්ක අත්අඩංගුවට ගත් කට්ටියට නීතිය ක්‍රියාත්මක කළා නම්, එදා රිසාඩ් ඇමතිවරයා ඒවාට මැදිහත් නොවුණා නම්, මේ ව්‍යසනය මේ රටේ සිද්ධ වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, හමුදාපතිවරයා කිව්වා, රිසාඩ් බදියුදීන් ඇමතිවරයා එතුමාට කථා කළාය කියා. ඕනෑ නම් මේක බලපෑමක් හැටියටත් ගන්න පුළුවන්ය කියා එතුමා කිව්වා. ඒ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

විතරක් නොවෙයි, මේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ පියා රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයාගේ සහෝදරයාත් එක්ක, මේ රටේ සුළු අපනයන භෝග හිමියාට අසාධාරණයක් වුණු, ගම්මිරිස් වංචාව පිළිබඳ ඒ සිද්ධියට සම්බන්ධ වුණා. මේ සියල්ල පිළිබඳව තොරතුරු තිබෙනවා.

රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට එරෙහිව තිබෙන තව චෝදනා රැසක් අපට මේ විශ්වාස භංග යෝජනාව තුළින් ගෙනෙන්න තිබුණා. නමුත් අපි ඒවා ගෙනාවේ නැහැ. මෙවැනි අවස්ථාවක රටේ මිනිසුන් මේ දේවල් දිහා බලාගෙන ඉන්නවා. තමුන්නාන්සේලා ගමට ගිහින් බලන්න. "රිසාඩ්ට විරුද්ධව ඡන්දය නොදී ගමට එන්න එපා" කියා අද ගම්වල පෝස්ටර් ගහලා තිබෙනවා. අද පන්සල්වලින් කියනවා, "රිසාඩ්ට විරුද්ධව ඡන්දය නොදී පන්සල් එන්න එපා" කියා. එවැනි මතයක් රටේ ගොඩනැඟිලා තිබෙනවා. මේ වාගේ තීරණාත්මක අවස්ථාවක තමුන්නාන්සේලා මේ විශ්වාස භංග යෝජනාවේ විවාදය දින ගණනකින්, සුමාන ගණනකින්, මාසයකින් කල් දැම්මා.

තමුන්නාන්සේලා මේක කල්දමන්නේ ඇයි කියා අපි දන්නවා. සුමාන දෙකෙන් තේරීම් කාරක සභාවේ වාර්තාව දෙන්නය කියා අගමැතිතුමා කියනවා. තේරීම් කාරක සභා වාර්තාව ගෙනැල්ලා රිසාඩ් බදියුදීන් ඇමතිවරයාව නිර්දෝෂ කරන්න, ඔහු ශුද්ධ කරන්න තමයි තමුන්නාන්සේලා මේ වැඩ පිළිවෙළ කරන්නේ. ඒ නිසා අපි කියන්නේ මේකයි. රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට නිවැරදි වෙන්න අවස්ථාවක් තිබෙනවා. ඇයි, තමුන්නාන්සේලාට මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න බැරි? එතුමාගේ පාර්ලිමේන්තු කණ්ඩායම ඇවිල්ලා කෑ ගැසුවාය කියලා, ආණ්ඩුවෙන් යනවා කිව්වාය කියලා, ආණ්ඩුව වට්ටනවා කිව්වාය කියලා ආණ්ඩුව රැක ගන්න, තනතුරු රැක ගන්න තමුන්නාන්සේලා රටේ ජාතික ආරක්ෂාව පාවා දෙන්න එපා. ඊයේ අමීර් අලි රාජ්‍ය ඇමතිතුමා කිව්වා, මේක සමස්ත මුස්ලිම් ජනතාවටම කරන අසාධාරණයක් බව.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல்லா மஹரூப் - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை பிரதி அமைச்சர்)
(The Hon. Abdullah Mahrooff - Deputy Minister of Ports and Shipping)
ඒක තමයි ඇත්ත.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ. තමුන්නාන්සේලාට වඩා අපි මුස්ලිම් ජනතාවත් එක්ක ඉන්නවා. [බාධා කිරීමක්]

තමුන්නාන්සේ අවුරුදු තුනහමාරක් ආණ්ඩුවට වෙලා කට වහගෙන ඉඳලා, - [බාධා කිරීමක්] - තමුන්නාන්සේලා අවුරුදු තුනහමාරක් ආණ්ඩුවට වෙලා කට වහගෙන ඉඳලා කිසි වැඩක් කර ගන්න බැරි වුණා. [බාධා කිරීමක්] දැන් මුස්ලිම් ජනතාවගේ ඡන්දය ගන්න තමුන්නාන්සේලා කියනවා, මේක මුස්ලිම් ජනතාවට විරුද්ධව ගෙනාපු දෙයක්ය කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] තමුන්නාන්සේලා පල්ලියට කඩු ගෙනාවේ තණකොළ කපන්නද? [බාධා කිරීමක්] පල්ලියට කඩු ගෙනාවේ තණකොළ කපන්නද? [බාධා කිරීමක්] මේක මුස්ලිම් ජනතාවට විරුද්ධව ගෙනාවාය කියා තමුන්නාන්සේලා මුස්ලිම් ජනතාව ගොනු කරගන්න හදනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගෙන් ඈත් වුණු මුස්ලිම් ජනතාව තමුන්නාන්සේලා ගොනු කරගන්න හදනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතුමාට බාධා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ මතක තබා ගන්න. තමුන්නාන්සේලා කෑ ගහනවා. තමුන්නාන්සේලා ජාතිවාදය අදිනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා වාගේ මිනිසුන් තමයි හිරේ දමන්න ඕනෑ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා වාගේ මිනිස්සු තමයි අන්තවාදියෝ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා තමයි මුස්ලිම් ජනතාවට අසාධාරණයක් කරන්නේ. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් නියෝජ්‍ය ඇමතිතුමනි, එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අහිංසක මුස්ලිම් ජනතාව අසාධාරණයට ලක් කරන්නේ තමුන්නාන්සේලා. ඒ නිසා අපි වග කීමකින් කියනවා, - [බාධා කිරීමක්] අපට දැන් තේරෙනවා. මේ ගැටුම තිබෙන්නේ මුස්ලිම් ජනතාවත් සමඟ නොවෙයි. මුස්ලිම් ජනතාවගෙන් සියයට 99ක් මේවාට සම්බන්ධ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා වාඩිවෙන්න. [බාධා කිරීමක්] එතුමාගේ කාලය. ඒ නිසා කරුණාකරලා වාඩිවෙන්න. [බාධා කිරීමක්]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, I rise to a point of Order.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් ජනතාව මෙයට සම්බන්ධ නැහැ. අපි පැහැදිලිව කියනවා, මුස්ලිම් ජනතාව මෙයට සම්බන්ධතාවක් නැහැයි කියා. [බාධා කිරීමක්]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ point of Order එක මොකක්ද කියා කියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වගන්තිය මොකක්ද?

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
අද උදේම මේ සභාවේ කිව්වා, 18 වන දා දිනය දෙනවාය කියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉඳගන්න, ඉඳගන්න. දැන් ඉඩ දුන්නා හොඳටම ඇති.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඡන්ද 22,000ක් ගත්ත

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මෙතැන කථා කරනවා.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
කවුද? මමද? [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මා පැහැදිලිව ඔබතුමාට කියනවා, සමස්ත මුස්ලිම් ජනතාව ආරක්ෂා කරන්න නම්, සමස්ත මුස්ලිම් ජනතාවගේ ඡන්ද ආරක්ෂා කරගන්න ඕනෑ නම් - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමනි, කරුණාකරලා බාධා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කියනවා, මුස්ලිම් ජනතාවට අපි ගරු කරනවාය කියා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකර බාධා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි මේ චෝදනාව ගරු රවුෆ් හකීම් ඇමතිතුමාට එල්ල කරන්නේ නැහැ. අපි මේ චෝදනාව එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්තුමාට එල්ල කරන්නේ නැහැ. [බාධා කිරීමක්] එක්සත් ජාතික පක්ෂයේ රිසාඩ් බදියුදීන් ඇමතිතුමා හොරකම් කරපු සල්ලිවලින් මාස්පතා පඩි ගන්න කෙනෙක් මෙතුමා. මෙතුමාට මාස්පතා පඩියක් ගෙවනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකර වාඩිවෙන්න. එතුමාගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඉම්රාන්ගේ ගම්මිරිස් හොරා. මේ තමයි ඉම්රාන්ගේ ගම්මිරිස් හොරා.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-තමයි හොරා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගම්මිරිස් ටික හොරකම් කරන කෙනා. නිකම් බොරුවට කෑ ගහන්න එපා.

ජාතිවාදය අදින්නට එපා. තමුන්නාන්සේලා තමයි මේ රටේ ජාතිවාදය, අන්තවාදය හදන්නේ. [බාධා කිරීමක්] එතැනට ගෙනියන්න එපා නියෝජ්‍ය ඇමතිතුමා. [බාධා කිරීමක්] එම නිසා අපි කියනවා, - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර, ගරු නියෝජ්‍ය ඇමතිතුමා වාඩි වෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේ විශ්වාසභංග යෝජනාව 18 වැනිදා වනතුරු ගෙන යන්න එපා. රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධව තිබෙන චෝදනා පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න පුළුවන්. මේක විවාදයට ගන්න පුළුවන්. මම නැවතත් කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුස්ලිම් මන්ත්‍රීතුමන්ලා කෑගැහුවාට වැඩක් නැහැ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කියා. කෑ ගහන එකෙන් ප්‍රශ්න තව වැඩි වෙනවා. මතක තියා ගන්න. තමුන්නාන්සේලා කෑ ගහන එකෙන් තව ඇවිස්සෙනවා. ඔහොම කරන්න එපා. ඔබතුමා එතැනට ගෙන යන්න එපා. නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමන්ලාට දැනෙන්නේ නැහැ.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
ඇත්ත කියනවා - [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේ රට ඔතැනට ගෙන යන්න එපා. අහිංසක මුස්ලිම් ජනතාව වෙනුවෙන් අපි ඔබතුමන්ලාට බොහොම ගෞරවයෙන් කියනවා, මේ රට ඔතැනට ගෙන යන්න එපා කියා. තමුන්නාන්සේලා ඔය විධියට කථා කළොත් අහිංසක මුස්ලිම් ජනතාවයි ඒකේ ප්‍රතිඵල ලබන්නේ. එතැනට ගෙන යන්න එපා. තමුන්නාන්සේගේ කථාව ගැන මම කනගාටු වෙනවා. ඔබතුමාට විරුද්ධව චෝදනාවක් තිබෙනවා නම් එය හය නැතිව ඔප්පු කරන්න. අපිට විරුද්ධව චෝදනා තිබුණා. නඩු දැම්මා. අපි උසාවියට යනවා. අපි ඒවාට මුහුණ දෙනවා. තමුන්නාන්සේ රිසාඩ් බදියුදීන් ඇමතිවරයා ගැන ඔපමණ කථා කරනවා.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
ලංකාවේ ඉන්න එකම නායකයා, මුස්ලිම් ජනතාවගේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතකොට හකීම් මැතිතුමා කවුද? [බාධා කිරීමක්] එතකොට හකීම් සිංහල ද? [බාධා කිරීමක්] එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසාන වෙනවා. තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගේ වෙලාව ගත්තේ - [බාධා කිරීමක්] රිසාඩ් බදියුදීන් ඇමතිවරයා මාසයකට ලක්ෂ 5 ගණනේ පඩි දෙන මන්ත්‍රීවරු ටිකක් සිටිනවා. මාසයකට ලක්ෂ පහයි. සතොස සීනිවලින් commission ගහලා - පඩිය ලක්ෂ පහයි.- ඒ ලක්ෂ පහේ පඩියට කථා කරන මන්ත්‍රීවරු සිටිනවා. ගම්මිරිස් ආනයනය කරන මන්ත්‍රීවරු සිටිනවා. තමුන්නාන්සේලා උදේ සිට පල්ලියට යන අය මේ වාගේ වැඩ කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට කියන්නේ, මේ විශ්වාසභංග යෝජනාව කල් දැමීම වැරදියි කියායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අවසාන කරන්නම්. මේක සමස්ත මුස්ලිම් ජනතාවට කරපු දෙයක් නොවෙයි. මුස්ලිම් ජනතාව තමුන්නාන්සේලාට වැඩියෙන් අපිත් සමඟ සම්බන්ධයි. මේක මුස්ලිම් ජනතාවට කරපු අසාධාරණයක් නොවෙයි. මුස්ලිම් ජනතාව ආරක්ෂා කරන්න ගෙනා දෙයක්. එම නිසා මුස්ලිම් ජනතාවට අසාධාරණයක් වෙන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. ගරු රවුෆ් හකීම් ඇමතිතුමා සභා ගැබට එනවා. ඇමතිතුමනි, මෙතුමා කියනවා, මේ රටේ සිටින එකම මුස්ලිම් නායකයා රිසාද් බදියුදීන් විතරලු. වෙන මුස්ලිම් නායකයෝ නැහැයිලු. එකම නායකයා රිසාඩ් බදියුදීන් ඇමතිවරයා විතරලු. හකීම් නායකයෙක් නොවෙයිලු. තමුන්නාන්සේ ගෞරවනීය මුස්ලිම් නායකයෙක්. අපි රවුෆ් හකීම් ඇමතිතුමාට ගරු කරනවා. රවුෆ් හකීම් ඇමතිතුමා බොහොම හොඳ මුස්ලිම් නායකයෙක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසාන කරන්න. ඔබතුමාට විනාඩි ගණනක් වැඩියෙන් දී තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමා මහනුවර දිස්ත්‍රික්කයේ ලක්ෂ ගණනක් ඡන්ද ගත්තා. ඡන්ද විසිදාහක් ගත්ත

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නොවෙයි. බොහොම වැදගත් විධියට ඡන්ද ගත්ත ඇමතිවරයෙක්. මාසයේ පඩියට කෑ ගහන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නොවෙයි. ගම්මිරිස් සොරකම් කරපු මිනිස්සු නොවෙයි. එම නිසා- [බාධා කිරීම්] පුත්තලමේ Identity Cards සොරකම් කරපු මිනිස්සු නොවෙයි. [බාධා කිරීම්] ගෞරවනීය මුස්ලිම් ඇමතිවරු සිටිනවා. ගරු කබීර් හෂීම් මැතිතුමා වාගේ ගෞරවනීය මුස්ලිම් ඇමතිවරු සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා. [බාධා කිරීම්]

[අ.භා.3.42]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය පනත යටතේ නියෝගයක් සහ විසර්ජන පනත යටතේ යෝජනා තමයි මේ සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත්ව තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න, සභාවේ වැඩ කටයුතු ගෙන යන්න. කථාව අවසාන වුණාට පස්සේ ඔබතුමන්ලා කථා කරන්න අවශ්‍ය නැහැ නේ. Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා ]මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. WIJEPALA HETTIARACHCHI *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මාන්නප්පෙරුම රාජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න. [බාධා කිරීමක්] කරුණාකර, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වාඩි වෙන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් මූල්‍ය පනතක් වන 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වැනි වගන්තියට අදාළව ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධව නියෝග නිකුත් කිරීම සඳහා අදාළ ගැසට් පත්‍රයේ නියෝගයට ගරු සභාවේ අනුමතිය ලබා ගැනීමටයි අද ඉදිරිපත් වී තිබෙන්නේ.

මේ, මීට පෙර විනිමය පාලන අධිකාරිවරයෙකුට පවරන ලද බලතල වර්තමාන මුදල් අමාත්‍යවරයාට පැවරීම සඳහා සභාවේ අනුමැතිය ගන්න අවස්ථාවක්. හැබැයි, මෙතැනදි වෙනදා වාගේම වැරදි අර්ථකථන දෙන්න පුළුවන්. මෙය මුදල් අමාත්‍යවරයාගේ බලතල යටතේ කියලා කිව්වාට, ඒ සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඊට පස්සේ කැබිනට් මණ්ඩලයේත් අනුමැතිය ලැබීමට යටත්ව තමයි මුදල් අමාත්‍යවරයාට කටයුතු කරන්න පුළුවන් වන්නේ. ඒ වාගේම මෙම යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා. මේ වෙලාවේදී sovereign bonds එහෙම නැත්නම් ස්වෛරීත්ව බැඳුම්කර අනේවාසික ආයෝජනයක් වෙලා තිබෙනවා නම්, ඒ සඳහා විවිධ නීති ලිහිල් කරලා තිබෙනවා. ඒ අනුව, විදේශිකයන්ට තව දුරටත් මේ රටේ ආයෝජනය කරන්න පුළුවන් විධියට යම් සහන ලබා දී තිබෙනවා. ඒ, මේ රට තුළ ලේසියෙන්ම සියයට 50ක් ආයෝජනය කරන්න පුළුවන් වන විධියටයි. මොකද, මේ වෙලාව විශේෂයෙන්ම අපට විදේශ ආයෝජන අවශ්‍ය වෙලා තිබෙන වෙලාවක් බව අපි දන්නවා. එහිදීත් විනිවිදභාවයක් තුළ තමයි මේ ආයෝජනය කළ හැකි වන්නේ. ඒ හින්දා බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් inward investments හරහා තමයි මේ ආයෝජන කරන්නත්, මුදල් ප්‍රේෂණය කිරීම සඳහාත් මේ නියෝගය නිකුත් වෙලා තිබෙන්නේ. මෙතෙක් කල් අපි ත්‍රස්තවාදය ගැන කථා කළා. ඒ වාගේම ප්‍රශ්නයක් තමයි, මූල්‍ය ණය අරගෙන බැඳුම්කර සිද්ධීන්වලින් මේ රට මුළා කරලා වංචා කරලා මේ රටේ ජාතික මුදල් නැති කරපු එක. එවන් ඉතිහාසයක් අපට තිබෙනවා. ජනාධිපති කොමිෂන් සභා වාර්තා තුළින් අතිගරු ජනාධිපතිතුමා කිව්වා, 2008 සිට මේ විධියටම මහ බැංකුව කොල්ල කාලා තිබෙන බව. මේවා වහගෙන සිටියා. මාධ්‍යවේදියෙකු මේවා පළ කළා නම්, ඒ මාධ්‍යවේදියාට වෙඩි තබා මරා දමනවා. එහෙම නැත්නම්, මාධ්‍ය ආයතනයකින් මේක පැහැදිලි කළා නම්, ඒ මාධ්‍ය ආයතනයට බෝම්බ ගසා ගිනි තබා මේ කටවල් බැඳ, මාධ්‍යයේ අත් බැඳ තමයි එදා ඉඳන් බැඳුම්කර සිද්ධි, මහ බැංකු මංකොල්ලකෑම් සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත්, වර්තමාන රජය බලයට පත් වුණාම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත වාගේ පනත් නිර්මාණය කර රාජ්‍ය නිලධාරියාට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් හැකියාව නිර්මාණය කරලා ස්වාධීන කොමිෂන් සභා පිහිටුවූවාම මේ කොහේ හරි වංචා දූෂණ සිද්ධ වනවා නම් ඒවා පෙනෙන්න පටන් ගත්තා. ඒ දේවල් පෙනීම තුළින් තමයි 2015 දී අවසාන වශයෙන් බැංකු මංකොල්ලයක් සිදු වුණාය කියන එක තේරුම් අරගෙන, ඒ වාගේම කෝප් කමිටු වාගේ ඒවායේදී එම සිද්ධීන් විමර්ශනයට භාජන වෙලා පාර්ලිමේන්තුවේ වාද විවාද කරලා අපට මේක රටට හෙළිදරව් කරන්න පුළුවන්කම ලැබුණේ. සමහර වෙලාවට හිතනවා ඇති, 2015 දී මහ බැංකු බැඳුම්කරය හෙළිදරව් කිරීම නිසා අපේ රජය අපවාදයට ලක් වුණාය කියලා. නමුත්, අප එලෙස අපවාදයට ලක් වෙමින් වුණත්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, අපේ ජාතික ධනය නැති වීම වැළැක්වීම වෙනුවෙන් කෝප් කමිටුව විපක්ෂයට භාර දීලා අදාළ ආයතන පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මේ සිද්ධීන් සම්බන්ධයෙන් වාද විවාද කරලා විනිවිද පෙනෙන විධියට කටයුතු කළා. අපට මොන අපවාද කළත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත වැනි පනත් සම්මත කරලා කටයුතු කිරීම තුළින් 2008 සිට තිබුණු මහ බැංකු බැඳුම්කර හොරකම 2015 වනකොට නවත්වන්න අපට හැකියාව ලැබුණා. වර්තමානය වනකොට අපට දැන් පිරිසිදුයි කියලා කියන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම ඒ ගැන හොයා බලන්න පුළුවන්කම ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වනකොට ඒ අවාසනාවන්ත සිද්ධිය සිදුවෙලා දින 30ක් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මම මෙතැනදි නැවතත් ස්තුතිවන්ත වනවා, කාදිනල්තුමාට. එතුමා, මේ රටේ කුපිත වූ ජනතාව සන්සුන් කරලා වෛරය දිනන්න පුළුවන් වන්නේ මෛත්‍රියෙන්ය කියන එක ඒ අයට පෙන්වා දීපු නිසා අපටත් මේ රට සන්සුන් කර ගෙන පසුගිය සති දෙක තුන වනකොට මේ ත්‍රස්තවාදී පුද්ගලයන් අත් අඩංගුවට ගන්නවා විතරක් නොවෙයි, ත්‍රස්තවාදී ක්‍රියා සඳහා කරපු සැලසුම් සියල්ල හෙළි කර ගන්නත්, ඒ සඳහා ගෙනා ආයුධ, ඒ සඳහා ගෙනා වෙඩි බෙහෙත්, ඒ සඳහා ගෙනා බෝම්බ සියල්ලම අත් අඩංගුවට අරගෙන රටට සහතිකයක් දෙන්නත් අපට පුළුවන්කම ලැබුණා. ඒ අනුව, හමුදාපතිවරයාට පුළුවන්කම ලැබුණා, "භය වෙන්න එපා, ආරක්ෂාව ස්ථිරයි. දරුවන් ඉස්කෝලවලට යවන්න. කවුරු කට කතා කිව්වත් භය වෙන්න එපා. මමයි මේක කියන්නේ" කියන එක කියන්න. ඒ සම්බන්ධයෙන් අපි සතුටුවනවා.

වර්තමානය දිහා බැලුවාම පෙනෙනවා, මේක විපක්ෂයට දිරවන්නේ නැහැයි කියලා. විපක්ෂය එක පැත්තකින් රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා. රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට නොවෙයි, ඕනෑම ඇමතිවරයෙකුට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාට ප්‍රශ්නයක් නැහැ. ඒක අපි එපා කියන්නේ නැහැ. ඒක විපක්ෂයේ අයිතියක්. හැබැයි, ඒ සඳහා අරමුණක් තිබෙන්න ඕනෑ. නමුත්, එක පැත්තකින් පාර්ලිමේන්තුවට විපක්ෂය විශ්වාස භංග යෝජනාව ගේනකොට විපක්ෂ නායකවරයා රෑට call කරලා ඇමතිවරයාට කියනවා, "එන්න, අපේ පැත්තට ඔබ බේරා දෙන්නම්" කියලා.

මේකේ "රෑ දනියෙල් දවල් මිගෙල්" වාගේ කථාවක් තිබෙන්නේ. විපක්ෂ නායකවරයා විශ්වාස භංග යෝජනාවට අත්සන් කළේ නැහැ. ගෝලයින් ලවා අත්සන් කරවා විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා එතුමා රෑට බදියුදීන් ඇමතිතුමාට කථා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කරලා කියනවා, "එන්න අපේ පැත්තට. අපි ඔයා බේරා ගන්නම්" කියලා. ඒ තරම් නින්දිත විධියට මේ අවස්ථාව බල අරගළයකට යොදා ගෙන තිබෙනවා. ආණ්ඩු බලය ගන්න තිබෙන කෑදරකමට මේ රටේ ඉදිරි ගමන නවත්වන්න කටයුතු කිරීම නින්දිත දෙයක්.

අද වන කොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ තිබෙන හැම ව්‍යාපාරික සංගමයකටම ලියුම් යවා තිබෙනවා, රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධව කටයුතු කරන්න කියලා. ඒ වෙනුවෙන් නගරවල පෙළපාළි තියන්න, උද්ඝෝෂණ කරන්න කියලා අද නිර්නාමික විධියට ලංකාවේ හැම වෙළඳ සංගමයකටම ලියුම් යවා තිබෙනවා. ගම්පහටත් ඊයේ පෙරේදා යවා තිබුණා. අපි කියන්නේ මේකයි. රිසාඩ් නොවෙයි, වංචා කළ, දූෂණ කළ, ත්‍රස්තවාදයට උදව් කළ කවුරුන් හෝ ඇමතිවරයකු ඉන්නවා නම් ඒ අය පළවා හැරිය යුතුයි; නෙරපිය යුතුයි. ආණ්ඩුවේද, විපක්ෂයේද කියලා බලන්නේ නැතිව අපිත් අත් දෙකම උස්සලා ඒකට සහයෝගය දෙනවා. ඒකේ දෙකක් නැහැ. හැබැයි, අද විපක්ෂය කරන්නේ මොකක්ද? විපක්ෂ නායකයා අත්සන් කරලා නැති විශ්වාස භංග යෝජනාව මොකක්ද? පොඩි පැටවු දාලා අත්සන් කරවලා විපක්ෂ නායකයා අත වනන්නේ ඇයි?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය ඇමතිතුමා ඉතාම ද්වේශ සහගතව සහ අසත්‍ය ආකාරයට කරුණු ඉදිරිපත් කරනවා, විපක්ෂ නායකතුමා විසින් රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට "මේ පැත්තට එන්න. අපි බේරා ගන්නම් "කිව්වායි කියලා. අපි ඉතා පැහැදිලිව කියනවා,- [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම වගකීමෙන් කියනවා, එතුමා ඒක කිව්වායි කියලා. රිසාඩ් බදියුදීන් ඇමතිවරයා ඒක ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. " 'අපේ පැත්තට එන්න' කියලා විපක්ෂ නායකවරයා මට කථා කරනවා" කියලා එතුමා කිව්වා. එහෙම නැත්නම් ඇයි විශ්වාස භංග යෝජනාවට අත්සන් කරන්න බැරි? නාමල් රාජපක්ෂට අත්සන් කරන්න බැරි ඇයි? පොඩි පැටවු දාලා අත්සන් කරවලා ලොක්කා අත වනනවා. "ඊ දනියෙල් දවල් මීගෙල් " කථාවක් මේකේ යන්නේ.

මේ රටේ ජනතාව කුපිත කරන්න එපා. ජනතාව බෙදන්න එපා. අද අපට මඩකලපුවේ, මන්නාරමේ, මුලතිව්වල මුස්ලිම් ජනතාවගේ සහයෝගය ලැබිලා තිබෙනවා, මේ ත්‍රස්තයන් මර්දනය කරන්න; අල්ලා ගන්න. ඔබතුමන්ලාට දැන් ඒක ගැන ඊර්ෂ්‍යායි. බලාගෙන හිටියේ මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් වේවි කියලයි. අද ඔබතුමන්ලා මුළු මුස්ලිම් සමාජයම ත්‍රස්තවාදී ගොඩට දාලා සතුටු වෙන්න බලනවා. ඒකට ගහපු තුරුම්පුවක් තමයි මේක කියලා අපි දන්නවා. නමුත්, මම ගරු අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දැන ගත්තා, මේක දේශපාලන කුමන්ත්‍රණයක් කියලා. අපි තේරීම් කමිටුවක් හැදුවා. තේරීම් කමිටුවක් හදලා පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරු එකතු කරලා, ත්‍රස්තවාදයට සම්බන්ධ ඇමතිවරයා කවුද, මහ ඇමතිවරයා කවුද, මන්ත්‍රීවරයා කවුද කියලා හොයලා සති දෙකකින් මේ පාර්ලිමේන්තුවට හෙළි කරන්න ඕනෑ කියලා තේරීම් කමිටුවට බලය දීම ගැන අපි සතුටු වනවා.

අපි වැරදි කරන මිනිස්සු ඇතුළට ගත්තත් නිවැරදි මිනිසුන්ට අත උස්සන්න දෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ වුවමනාව මොකක්ද? ත්‍රස්තවාදීන් අල්ලන්නද? දැක්කේ නැද්ද? රිසාඩ් ගස් කැපුවේ ඒ කාලයේ බැසිල් රාජපක්ෂ කැලේ දීලා. [බාධා කිරීම්] අපි දීලාද? නමුත්, අත දිගු කළේ අද. අත දිගු කළේ මේ ආණ්ඩුව ආවාට පස්සෙයි. 2013 බැසිල් රාජපක්ෂ තමයි ගස් ටික කපන්න අනුමැතිය දුන්නේ. අක්කර දෙදාහක් දීලා තිබෙනවා, බැසිල් රාජපක්ෂ කැලේ ශුද්ධ කරන්න කියලා. එදා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ලේකම්, කමිටුවේ සභාපතිවරයා- [බාධා කිරීම්] පරිසර රාජ්‍ය ඇමතිවරයා විධියට වගකීමෙනුයි මේ කියන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ඔබතුමා අවසාන කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
නමුත්, එදා ගස් ටික කප්පවලා, කැලේ කපලා කොට දීලා තිබෙන්නේ කීයද? කියුබික් මීටර් 12.5යි. අක්කර දෙදාහක ගස් කපලා දැව සංස්ථාවට කොට දීලා තිබෙන්නේ කියුබික් මීටර් 12.5යි. කැලේ කැපුවා, කට්ටිය ගස් ටික ඇද ගත්තා. එතකොට "මීක්" කිවුවේ නැහැ. බලු පැටවුන් වාගේ හිටියා, 2014 ගස් ටික කපන කොට. 2015 න් පස්සේ ආණ්ඩුවේ තිබෙන යහ පාලනය පාවිච්චි කරලා, විනිවිදභාවය පාවිච්චි කරලා, මාධ්‍ය නිදහස පාවිච්චි කරලා අපට ඇඟිල්ල දිගු කරනවා. ෂරියා විශ්වවිද්‍යාලවලට අනුමැතිය දුන්නේ කවුද? කවුද, එදා අනුමැතිය දුන්නේ? එදා ෂරියා විශ්වවිද්‍යාලවලට අනුමැතිය දෙනකොට මේ මන්ත්‍රීතුමන්ලා ටික

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ ඉඳලා -[බාධා කිරීම්] ඔව්. හෝද හෝදා ඉඳලා ඊට පස්සේ අපේ ආණ්ඩුව ආවාට පස්සේ ෂරියා විශ්වවිද්‍යාල ගැන කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, දැන් කථාව අවසාන කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
සයිටම් එකට අනුමැතිය දුන්නේ කවුද? සයිටම් එකේ වෛද්‍ය උපාධිය ගන්න ළමයින්ට ශිෂ්‍යත්ව දුන්නා. එතකොට සද්ද නැතුව

ඉඳලා අද කථා කරනවා. විපක්ෂය කටයුතු කරන්නේ මැරිලා ඉපදුණා වාගෙයි. මේ රටේ කඩා වැටිච්ච කුණු කන්ද හැදුවේ කවුද? මීතොටමුල්ලේ කුණු කන්ද හැදුවේ කවුද? එදා කුණු කන්ද හදලා එය කඩා වැටුණාම, ඒක අපේ ඇඟට කඩා වැටෙන්න ගහනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, කථාව අවසාන කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
කවුද තවිහිත් ජමාත් සංවිධානය හැදුවේ? පඩි ගෙව්වේ කවුද? කවුද කළේ? අපිද? [බාධා කිරීම්] ඒක හදලා කිරි පොවලා නයෙක් බවට පත් කරලා, ඊට පස්සේ දෂ්ට කරන්න එනකොට අපිව අල්ලනවා. කිරි පෙව්වේ කවුද? [බාධා කිරීමක්] සහරාන්ට කවුද සල්ලි දුන්නේ? බඩු දුන්නේ කවුද? හිස්බුල්ලාව ශක්තිමත් කළේ කවුද? අද ඇඟිල්ල දිගු කරනවා-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, කරුණාකරලා කථාව අවසාන කරන්න. අපට කාලය නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එක ඇඟිල්ලක් අපට දිගු කරනකොට ඇඟිලි තුනක් අනික් පැත්තට දිගු වෙලා තිබෙන්නේ කියන එක මතක තියා ගන්න; ඇඟිලි තුනක් දිගු වෙලා තිබෙන්නේ තමුන්ගේ පැත්තට කියලා මතක තියා ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමා, කථාව අවසාන කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කියනවා, අපි බොහොම දුක් විඳලා, බැණුම් අහලා විනිවිදභාවය ඇති කරලා, මේ රට ගොඩනඟන්න හදනකොට කකුලෙන් අදින්න එපා කියලා. [බාධා කිරීම්] යථාර්ථය තේරුම් අරගෙන කටයුතු කරන්න කියලා මම කියනවා. බොරුවට මිනිස්සු කුපිත කරවලා, මිනිස්සු පිළිගන්නේ නැති වෙනකොට -[බාධා කිරීම්] ඉස්කෝල දැන් සුරක්ෂිතයි කියා මිනිස්සු පිළිගන්නකොට මහින්ද රාජපක්ෂ ගිහිල්ලා, ළමයින්ව ඉස්කෝලේ අරගෙන යනවා. [බාධා කිරීම්] විහිළුවක්. මහින්ද රාජපක්ෂ ළමයින්ව ඉස්කෝලේ අරගෙන යනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විසර්ජන පනත: යෝජනාව
## ஒதுக்கீட்டுச் சட்டம் : தீர்மானம்
## APPROPRIATION ACT: RESOLUTION

# I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in the Order No. 35 hereto, be approved:-

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 35 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No.30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 21302 "Printing, Publishing and Marketing of Books Advance Account - Department of Educational Publications" of the Third Schedule to that Act.

| | Item | Revision |
|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | Not Revised |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | From Rs. 4,800,000,000<br>To Rs. 4,363,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | Not Revised |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in the Order No. 36 hereto, be approved:-

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 36 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No.30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 22302 "Stores Advance Account (Explosive items) - Sri Lanka Navy" of the Third Schedule to that Act.

| | Item | | | Revision |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 470,000,000<br>540,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 500,000,000<br>545,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 220,000,000<br>230,000,000 |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in the Order No. 37 hereto, be approved:-

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 37 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No. 30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 24702 "Seized and Forfeited Goods Advance Account - Sri Lanka Customs" of the Third Schedule to that Act.

| | Item | | | Revision |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 12,000,000<br>27,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 1,500,000<br>4,000,000 |
| (ii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 39,000,000<br>61,000,000 |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# IV

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in the Order No. 38 hereto, be approved:-

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 38 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No.30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 25003 "Miscellaneous Advance Account - Department of State Accounts" of the Third Schedule to that Act.

| | Item | | | Revision |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | | | Not Revised |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 2,500,000<br>530,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | | | Not Revised |

| | | |
|---|---|---|
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | Not Revised |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## V

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in the Order No. 39 hereto, be approved:-

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 39 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No.30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 30602 "Stores Advance Account - Department of Sri Lanka Railways" of the Third Schedule to that Act.

| | Item | | | Revision |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 2,000,000,000<br>2,200,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 1,800,000,000<br>1,300,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VI

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in Order No. 40 hereto, be approved:-

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 40 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No. 30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 31002 "Stores Advance Account - Government Factory" of the Third Schedule to that Act.

| | Item | | | Revision |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 120,000,000<br>180,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 120,000,000<br>150,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 40,000,000<br>75,000,000 |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 40,000,000<br>60,000,000 |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VII

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in Order No. 41 hereto, be approved:-

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

**ORDER**

**Appropriation Act, No. 30 of 2017**

**Order No. 41 under Section 8**

By virtue of powers vested in me by Section 8 of the Appropriation Act, No. 30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 31003 "Work Done Advance Account - Government Factory" of the Third Schedule to that Act.

| | Item | | | Revision |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the Third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 350,000,000<br>410,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the Third Schedule to that Act. | | | Not Revised |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the Third Schedule to that Act. | | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the Third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2018)

Eran Wickramaratna,
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VIII

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 30 of 2017 and specified in the schedule hereto, be approved:-

(These Orders are valid up to 31.12.2018)

**SCHEDULE**

**Appropriation Act, No. 30 of 2017 Order under Section 8**

Schedule of variation of limits of Advance Accounts pertaining to Advances to public officers authorized by the Minister of Finance under Section 8 of the Appropriation Act, No. 30 of 2017 in respect of Finance year 2018.

**Group Order No.01**

By virtue of the powers vested in me under Section 8 of the Appropriation Act, No 30 of 2017, I, Eran Wickramaratna, Acting Minister of Finance with the approval of the Government do by this order alter / vary the maximum limits specified in column II and IV of the Third Schedule to that Act, and the minimum limits specified in column III of that Schedule being the limits corresponding to item Numbers 00101, 02001, 02501, 14001, 14701, 15501, 16501, 19201, 20101, 20501, 20901, 21501, 22201, 22301, 22401, 22501, 22601, 23101, 24801, 25101, 25801, 25901, 26301, 26601, 27001, 27301, 27701, 28101, 28201, 28401, 28901, 30601, 32401 and 33301 relating to Advances to Public Officers in the manner set out in the Schedule hereto.

| *Sri No.* | *Ministry/Department* | *Item No.* | *Maximum Limit of Expenditure in Column II (Rs)* | | *Minimum Limit of Receipts in Column III (Rs)* | | *Maximum Limit of Debit Balance in Column IV (Rs)* | | Order No. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | From | To | From | To | From | To | |
| 1 | His Excellency the President | 00101 | | | | | 100,000,000 | 120,000,000 | 1 |
| 2 | Elections Commission | 02001 | | | | | 85,000,000 | 95,000,000 | 2 |
| 3 | Delimitation Commission | 02501 | | | 250,000 | 150,000 | | | 3 |
| 4 | Minister of Hill Country New Villages, Infrastructure and Community Development | 14001 | 15,000,000 | 16,675,000 | | | | | 4 |
| 5 | Minister of Regional Development | 14701 | | | | | 7,000,000 | 7,300,000 | 5 |
| 6 | Minister of Provincial Councils and Local | 15501 | | | | | 35,000,000 | 40,400,000 | 6 |
| 7 | Minister of National Integration and | 16501 | 3,000,000 | 3,030,000 | | | | | 7 |
| 8 | Minister of Law and order and Southern | 19201 | | | 108,000,000 | 80,000,000 | | | 8 |
| 9 | Department of Buddhist Affairs | 20101 | | | 21,000,000 | 19,400,000 | | | 9 |
| 10 | Department of Public Trustee | 20501 | | | 2,200,000 | 2,130,000 | | | 10 |
| 11 | Department of National Archives | 20901 | | | 4,000,000 | 3,400,000 | | | 11 |
| 12 | Department of Technical Education and Training | 21501 | | | 55,000,000 | 48,000,000 | | | 12 |
| 13 | Sri Lanka Army | 22201 | | | 3,028,000,000 | 2,565,000,000 | | | 13 |
| 14 | Sri lanka Navy | 22301 | | | 570,000,000 | 480,000,000 | | | 14 |
| 15 | Sri Lanka Air Force | 22401 | | | 460,000,000 | 396,000,000 | | | 15 |
| 16 | Department of Police | 22501 | | | 1,200,000,000 | 1,145,000,000 | | | 16 |
| 17 | Department of Immigration and Emigration | 22601 | | | | | 145,000,000 | 158,000,000 | 17 |
| 18 | Department of Dedt Conciliation Board | 23101 | | | 400,000 | 349,133 | | | 18 |
| 19 | Department of Excise | 24801 | | | 37,000,000 | 36,000,000 | | | 19 |
| 20 | Department of Valuation | 25101 | | | | | 90,000,000 | 90,500,000 | 20 |
| 21 | District Secretariat , Kandy | 25801 | | | 65,000,000 | 63,000,000 | | | 21 |
| 22 | District Secretariat , Matale | 25901 | | | 38,000,000 | 34,000,000 | | | 22 |
| 23 | District Secretariat, Hambantota | 26301 | | | 51,000,000 | 43,000,000 | | | 23 |
| 24 | District Secretariat/ Kachcheri-Vauniyawa | 26601 | | | 13,000,000 | 10,000,000 | | | 24 |
| 25 | District Secretariat - Ampara | 27001 | | | 47,000,000 | 45,000,000 | | | 25 |
| 26 | District Secretariat,Puttalam | 27301 | | | 41,000,000 | 39,500,000 | | | 26 |
| 27 | District Secretariat, Monaragala | 27701 | | | 34,000,000 | 33,000,000 | | | 27 |
| 28 | Department of Agrarian Development | 28101 | 295,000,000 | 295,320,000 | | | | | 28 |
| 29 | Department of Irrigation | 28201 | 260,000,000 | 240,000,000 | 165,000,000 | 145,000,000 | | | 29 |
| 30 | Department of Wildlife Conservation | 28401 | | | | | 168,000,000 | 204,000,000 | 30 |
| 31 | Department of Export Agriculture | 28901 | | | | | 110,000,000 | 115,000,000 | 31 |
| 32 | Department of Sri Lanka Railways | 30601 | | | | | 1,500,000,000 | 1,520,000,000 | 32 |
| 33 | Department of Management Audit | 32401 | | | 2,200,000 | 2,150,000 | | | 33 |
| 34 | Comptroller General's Office | 33301 | | | | | 3,500,000 | 6,000,000 | 34 |

Eran Wickramaratna
Acting Minister of Finance

09.05.2019
Colombo

(Cabinet approval signified)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

* *මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.*
* *இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.*
* *[This annexe is also placed in the Library.]*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තැබීමේ යෝජනාව, ගරු බිමල් රත්නායක මහතා.

## 2019 අප්‍රේල් 21වන දින ප්‍රහාරයට පෙර හා පසු එළඹ ඇති ගිවිසුම්
## 2019 ஏப்பிரல் 21ஆம் திகதிய தாக்குதலுக்கு முன்னரும் பின்னரும் செய்யப்பட்ட உடன்படிக்கைகள்
## AGREEMENTS ENTERED INTO BEFORE AND AFTER THE ATTACK ON 21ST APRIL, 2019

[අ.භා. 3.57]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ලෝක බලවතුන් අතර පවතින වෙළඳ, යුධ හා දේශපාලන තරගය නිසාත්, 2019 අප්‍රේල් මස 21 දින සිදුවූ ප්‍රහාරය නිසා රට තුළ ඇති වූ අනාරක්ෂිත තත්ත්වයත්,
>
> එම ප්‍රහාරය ජාත්‍යන්තර ත්‍රස්ත සංවිධාන සමඟ ඇති සම්බන්ධතාවයත් යොදා ගනිමින් හා හුවාදක්වමින්,
>
> අප රටේ ස්වෛරීත්වයට හා මහජන ආරක්ෂාවට දිගුකාලීනව හානි විය හැකි මට්ටමින් යම් යම් විදේශ රාජ්‍යයන් හා සමහර ජාත්‍යන්තර ආයතන රට තුළ ක්‍රියාත්මක වන බවට දැනට විවිධ පාර්ශ්වයන් මඟින් හෙළිදරව් කර තිබේ.
>
> රටේ ස්වෛරීත්වයට හා මහජන ආරක්ෂාවට හානිකර විය හැකි, රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමට ඉඩකඩ නිර්මාණය කරන ගිවිසුම් හා එකඟත්වයන්ට විදේශ රටවල් හා ආයතන සමඟ නොපැමිණිය යුතු බවත්, අප්‍රේල් 21 වන දින ප්‍රහාරයට පෙර හා පසු එසේ එළඹ ඇති ගිවිසුම්, එකඟතාවයන් පිළිබඳ සියලුම කරුණු පාර්ලිමේන්තුවට ආණ්ඩුව මඟින් ඉදිරිපත් කළ යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටියි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප්‍රේල් 21වන දින ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසුව මා ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවේ කථා කරන අවස්ථාව මෙය නිසා ප්‍රථමයෙන්ම එයින් ජීවිත හානි වූ අපේ රටේත්, වෙනත් රටවල ජනතාවටත්, ඒ වාගේම විවිධාකාර පීඩාවන්ට ලක්වෙච්ච, තුවාල වෙච්ච තමන්ගේ අම්මලා, තාත්තලා, දරුවන්, දැරියන් නැති වෙච්ච සියලුම ජනතාවට අපේ හෘදයාංගම කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම අපේ ආදරණීය මාතෘභූමිය නැවත වතාවක් ඉතාම දුක්ඛිත ඉතාම දුෂ්කර වකවානුවකට ඇද වැට්ටවීම සම්බන්ධවත් අපි ඉතාම කනගාටු වෙනවා. ඒ වාගේම අපි විසින් ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංගයේත් සඳහන් කර තිබෙන පරිදි මේ අන්තවාදී, ත්‍රස්තවාදී ප්‍රහාර වළක්වා ගැනීමට ඇති තරම් ඉඩ කඩ රටේ ජනාධිපතිවරයාට තිබියදී, රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයාට තිබියදී, අගමැතිවරයාට තිබියදී, කැබිනට් මණ්ඩලයට තිබියදී, ආරක්ෂක ප්‍රධානීන්ට තිබියදී එය වළක්වා නොගෙන මේ මහා විශාල ජීවිත හානියට වගකීම මේ ආණ්ඩුව ගත යුතුයි කියන එකත් සමහර ආරක්ෂක ප්‍රධානීන් ගත යුතුයි කියන එකත් මම සඳහන් කරනවා.

ඒ වාගේම එම ප්‍රහාරයටත් වඩා රටක් වශයෙන් අපි අන්ත පහළ මට්ටමට වට්ටලා, හැම පැත්තකම අන්ත ජාතිවාදය රටේ මුදුනටම ගේන්න ඉඩ හැරීමේ ඒ දේශපාලන පාපයෙන් මේ ආණ්ඩුවට කවදාවත් ගැලවෙන්න බැහැ. ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ප්‍රමුඛ මේ අමාත්‍ය මණ්ඩලය අද මොන බොරු කිව්වත්, ඔවුන්ට මේ දේශපාලන පාපයෙන් ගැලවෙන්න බැහැ. මොකද, මෙය වළක්වාගත හැකිව තිබුණු ප්‍රහාරයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත නැවත කියනවා, පහර දෙනවා කියලා කිව්වේ ඇමතිවරයෙකුගේ ගෙදරකට නම්, පහර දෙනවා කිව්වේ ජනාධිපතිවරයාගේ ගෙදරකට නම්, ආරක්ෂාව සම්බන්ධයෙන් සිටින හැම කෙනාගේම මැදිහත්වීම මීට වඩා වෙනස් වන බව අපි හොඳින්ම දන්නවා කියන කාරණය. පහර දෙනවා කිව්වේ සාමාන්‍ය මිනිසුන් යන පල්ලිවලට නිසා තමයි මෙතරම් දැනුවත්ව තිබියදීත් එය වළක්වා ගත්තේ නැත්තේ.

අපි අද විවාද කරන පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවට අදාළ මාතෘකාවට ආවොත්, අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මරාගෙන මැරෙන ප්‍රහාරයෙන් පස්සේ රට තුළ ඇති වෙලා තිබෙන බරපතළ අනාරක්ෂිත භාවය, අස්ථාවර භාවය මාසයකට වැඩි කාලයක් තිස්සේ ගමන් කරමින් තිබෙනවා. එක පැත්තකින් එය භාවිත කරමින් අන්තවාදී, ජාතිවාදී දේශපාලන ආගමික කණ්ඩායම් අද එය ඉහගෙන කන්න හදනවා. ඒ වාගේම සමහර ව්‍යාපාරික කණ්ඩායම්, ගොඩනැඟී තිබෙන මෙම ජාතිවාදී, අන්තවාදී තත්ත්වය, අනාරක්ෂිත භාවය තමන්ගේ ව්‍යාපාර සාර්ථක කර ගන්න පාවිච්චි කරමින් ඉන්නවා. ඒ වාගේම සමහර වෘත්තිකයෝ, ගොඩනැඟී තිබෙන මේ තත්ත්වය තමන්ගේ වෘත්තිය ශක්තිමත් කර ගන්න යොදා ගනිමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජාතිවාදී, අන්තවාදී ප්‍රහාරයෙන් පස්සේ දේශපාලන වාසි ගන්න හදන්නේ දේශපාලනඥයෝ පමණක් කියන තැනට මම නම් සීමා වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ජාතිවාදයෙන් පෝෂණය ලබන දේශපාලනයක් තිබෙනවා. ඒක මේ බෝම්බවලින් පටන් ගත්ත එකක් නොවෙයි. නමුත්, බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ ජනමාධ්‍ය ආයතන ජාතිවාදයෙන් තමන්ගේ ratings වැඩි කර ගන්නවා අපට ඉතා පැහැදිලිව පෙනෙනවා. මේ ජාතිවාදී, මේ අන්තවාදී ප්‍රහාරයෙන් පස්සේ ව්‍යාපාරිකයෝ තමන්ගේ ව්‍යාපාර ශක්තිමත් කර ගන්න කටයුතු කරමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තමයි මෙම ප්‍රහාරයෙන් පස්සේ අපේ රට පත් වෙලා තිබෙන මෙම බලවත් අනාරක්ෂිත, අසරණ භාවය පාවිච්චි කරමින් විදේශීය රාජ්‍යයන්, විශේෂයෙන්ම එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදී රටවල්, කලාපීය බලවතුන් සහ ජාත්‍යන්තර සංවිධාන මේ රටට ඉතා දැඩිව මැදිහත් වීමට පටන් අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, එම ප්‍රහාරයෙන් දිනකට දෙකකට පසු අග්‍රාමාත්‍යවරයා, ඒ වාගේම විවිධ ඇමතිවරු මේ පාර්ලිමේන්තුවට කිව්වා, මේ ප්‍රහාරය සම්බන්ධ කටයුතු සඳහා, ආරක්ෂක කටයුතු සම්බන්ධ පරීක්ෂණ සඳහා මේ වන විටත් විදේශ රාජ්‍යයන් 8කින් විවිධාකාර ආරක්ෂක නිලධාරීන්, විශේෂඥයන් පැමිණ සිටින බව. එම නිසා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුරු කථාවේදී මම දැන ගන්න කැමැතියි, ඒ රාජ්‍යයන් මොනවාද, කොපමණ නිලධාරීන් ප්‍රමාණයක් ඇවිල්ලා ඉන්නවාද, ඔවුන් කොපමණ කාලයක් මේ රට තුළ කටයුතු කරනවාද, ඔවුන්ට ආරාධනා කළේ ජනාධිපතිද, ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ඔබතුමාද, නැත්නම් අගමැතිතුමාද, කැබිනට් මණ්ඩලය ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තාද සහ දැනට ඔවුන් විසින් සපයා දී තිබෙන විශේෂ සේවාවන් මොනවාද කියලා. මොකද, අපි හොඳාකාරවම දන්නවා, ලෝකයේ රටවල් අතර විවිධ දේශපාලන, ආර්ථික, යුදමය ගනු දෙනු තිබෙන බව. ඒ ගැන විවාදයක් නැහැ. ඒ සමස්තය ප්‍රතික්ෂේප කරන රටවල් ලෝකයේ ඇත්තේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරියටම පෙබරවාරි මාසයේ 22වැනි දා මම මේ පාර්ලිමේන්තුවට කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. මා එහි සඳහන් කළේ, ලංකාව -අපේ රට- විශේෂයෙන්ම එක්සත් ජනපදයත් සමඟ විවිධාකාර ආරක්ෂක ගිවිසුම්වලට යමින් තිබෙන බවත්, ඒවා පාර්ලිමේන්තුවට හෙළිදරව් කරන්න කියන එකත්, ඒ වාගේම ලංකාව එක්සත් ජනපදයට බැඳ තබන, අපේ ස්වෛරීත්වය උදුරා දමන මෙවැනි පාවාදීමේ, රටේ ආරක්ෂාව දශමයකින්වත් ශක්තිමත් නොවන ගිවිසුම්වලට යන්න එපා කියන එකත්.

ඒ පිළිබඳ හැන්සාඩ් වාර්තාව මා සතුව තිබෙනවා. මේ ගැන නැවත නැවත කියන්න අවශ්‍ය නැති නිසා මා ඉතා කෙටියෙන් මේ කාරණය කියන්නම්. රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ, 2007 මාර්තු මාසයේ 5වන දා, ගෝඨාභය රාජපක්ෂ කියන ඇමෙරිකානු

[ගරු බිමල් රත්නායක මහතා]

පුරවැසියා විසින් -ඒ මොහොතේ ඇමරිකානු පුරවැසියකු වූ එතුමාගේ අද තත්ත්වය මොකක්ද කියන්න මා දන්නේ නැහැ- ලංකාවේ කැබිනට් මණ්ඩලයට පවා නොදන්වා ආරක්ෂක ලේකම් විධියට ශ්‍රී ලංකාව සහ ඇමෙරිකාව අතර Acquisition and Cross-Servicing Agreement එක අත්සන් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගිවිසුම අනුව ඇමෙරිකාව කරන්නා වූ සෑම යුද්ධයකදීම ලංකාව බැඳී සිටිනවා, විවිධාකාර සේවා සපයන්න. මේ තිබෙන්නේ, ඒ ගිවිසුම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ ප්‍රයෝජනය සඳහා මා එය අද නැවතත් **සභාගත*** කරනවා.

ඒ ගිවිසුම මඟින් අපි බැඳී සිටිනවා, ඇමෙරිකානු හමුදාවලට යුද්ධවලදී අවශ්‍ය කරන විවිධාකාර සේවා සපයන්න; අපේ ගුවන් තොටුපොළවල්, වරායවල්, ඉඩ කඩම්, තෙල් පහසුකම් ආදිය ලබා දෙන්න. එදා ඒ ගිවිසුම අත්සන් කළේ හොරෙන්. අපි මාස හයක් මේ පාර්ලිමේන්තුවේ කෑ ගහලා තමයි එවකට පැවති රාජපක්ෂ ආණ්ඩුවෙන් ඒ ගිවිසුමේ පිටපතේ කොටසක් ඉල්ලා ගත්තේ. සම්පූර්ණ ගිවිසුම දුන්නේ නැහැ, ඒ වෙලාවේ. ඒ ගිවිසුම 2017 මාර්තු මාසයේ 5වන දා අවසන් වන නිසා අපි 2017 පෙබරවාරි මාසයේදී පාර්ලිමේන්තුවේදී අගමැතිවරයාගෙන් විමසා සිටියා, "මේ ගිවිසුමේ කාලය දැන් අවසන් වේගෙන යනවා. මේ ගිවිසුමේ කාලය දීර්ඝ කරනවා ද? එහෙම නැත්නම් එය අහෝසි කරනවා ද, ඒ ගැන අපට දැන ගන්න ඕනෑ" කියලා. අගමැතිතුමා කිව්වා, "එවැනි සාකච්ඡාවක් නැහැ. එහෙම කරනවා නම්, පාර්ලිමේන්තුවට කියනවා" කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව අපි අවස්ථා කීපයකදී ඒ ගැන ඇහුවාම ආණ්ඩුව කිව්වා, "එහෙම දෙයක් ගැන දන්නේ නැහැ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විසින් 2019 පෙබරවාරි මාසයේ 22වන දා ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදයෙන් පසුව රුවන් විජේවර්ධන ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබුවා, Acquisition and Cross-Servicing Agreement - ACSA - කියන ගිවිසුම. මේ කැබිනට් මණ්ඩලය එම ගිවිසුම අනුමත කරලා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ එකඟතාව මත, උපදෙස් මත, ඒ වෙලාවේ එතුමාගේ ආරක්ෂක ලේකම්ව සිටි කපිල වෛද්‍යාරත්න මහතා ඇමෙරිකානු තානාපති අතුල් කෙශාප් මහතා සමඟ 2017 අගෝස්තු මාසයේ 4වන දා නැවත වතාවක් අත්සන් කළා. එදා අග්‍රාමාත්‍යවරයා රටට බොරු කිව්වා. අද දේශ ප්‍රේමයේ සළු ඇඳගෙන විවිධාකාර නන්නත්තාර ප්‍රකාශ කරන ජනාධිපතිවරයා රටට හොරෙන් තමන්ගේ ආරක්ෂක ලේකම් ලවා මේ පාවා දීමේ ගිවිසුමට ලංකාව අත්සන් කරවූවා. ඒ කොපමණ කාලයකට ද ගරු කථානායකතුමනි? ගෝඨාභය රාජපක්ෂ උන්නැහේ ඇමෙරිකානු පුරවැසියකු වශයෙන් එය අත්සන් කළේ, අවුරුදු 10කට. මෛත්‍රීපාල සිරිසේන මහතා, රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය ඒ ගිවිසුමට අත්සන් කළේ කොච්චර කාලයකට ද? ඒ, සදාකාලයටයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු ගිවිසුමේ එය සඳහන් කර තිබෙනවා. Acquisition and Cross-Servicing Agreement - ACSA - ගිවිසුමට සදාකාලිකවයි බැඳිලා තිබෙන්නේ. එය අවසන් වන දින වකවානුවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, බලගතු රාජ්‍ය සමඟ කොන්දේසි රහිත ගිවිසුම්වලට ගියාම මොකද වෙන්නේ කියලා. ඒවා ඊළඟට පත් වන ආණ්ඩුවකටවත් ඉවත් කර ගන්න බැහැ. අකැමැති වුණත් අදත් අපට පිළිගන්න වෙනවා, ලෝකයේ දැනට තිබෙන ශක්තිමත්ම යුද බලය ඇත්තේ ඇමෙරිකාවටයි කියන කාරණය. එදා ඒ පාවා දීම කළා. අප එය හෙළිදරව් කරන කල් මේ රටේ කිසි කෙනෙක් එය හෙළිදරව් කළේත් නැහැ.

මම එදාම මගේ කතාවේදී කරුණු ඉදිරිපත් කරමින් ගරු ඇමතිතුමාගෙන් ඇහුවා, මේ ගිවිසුමට අමතරව ලංකාව ඇමෙරිකාව සමඟ Status of Forces Agreement - SOFA - කියන තවත් ආරක්ෂක ගිවිසුමක් අත්සන් කරන්න යනවා ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මට දුන් උත්තරය තමයි, "එවැනි ගිවිසුමක් නැහැ. ඒ ගැන දන්නේ නැහැ" කියන එක. අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මේ ගැන ප්‍රශ්න කරලා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මා ඉල්ලා ගත් පිළිතුර මා 2019 පෙබරවාරි මාසයේ 22වන දාත් මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩගත කළා. මොකද, අපිත් මේවා ගැන ඇහැ ගසාගෙන ඉන්න නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ස්වෛරීත්වය කියන්නේ, රටට ආදරය කිරීම කියන්නේ දේශපාලන ප්‍රතිපත්තියක් පමණක් නොවෙයි. ඒක අපේ පුද්ගලික ප්‍රතිපත්තියක්. දැන් සමහරු හිතනවා දේශප්‍රේමී වෙන්න ජාතිවාදී වෙන්න ඕනෑය කියලා. දේශප්‍රේමී වනවා සහ ජාතිවාදී වනවා කියන්නේ දෙකක්. ඒ වාගේම, ජාත්‍යන්තරවාදී වනවා සහ ජාත්‍යන්තරය ඉස්සරහා දණ ගහනවා කියන්නේ තවත් එකක්.

ලෝකයේ රටවල් එක්ක ගනු දෙනු කරන එකයි, ලෝකයේ රටවල් ඉස්සරහ දණ ගහන එකයි, දෙකක්. ඒ නිසා අපි ඇහුවා මේ SOFA එක ගැන. අපි ඒ ගැන හෙව්වා. මේ පාර්ලිමේන්තුවේදී ඔබතුමා කිව්වා එහෙම ගිවිසුමක් නැහැ, දන්නේ නැහැ කියලා. නමුත් විදේශ අමාත්‍යාංශයේ ආංශික අධීක්ෂණ කාරක සභාව අපට දීපු විස්තරයේ තිබෙනවා, "The United States and Sri Lanka concluded an agreement by exchange of diplomatic notes in 1995 regarding the status of U.S. military personnel and civilian employees of the Department of Defense (DoD) who visit Sri Lanka for joint exercises or official duties." කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1995 මැයි 16වන දා තමයි ලංකාව මේ SOFA එකට අත්සන් කරලා තිබෙන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ. දැන් අවුරුදු 24ක් තිස්සේ මේ පාවාදීමේ ගිවිසුම ලංකාව තුළ ක්‍රියාත්මක වෙනවා. මම ඇයි මේකට පාවාදීමේ ගිවිසුම කියලා කියන්නේ? ගිවිසුමක දෙපැත්තක් තිබෙනවා. පාර්ශ්ව දෙකක් ගිවිසුමකින් බැඳුනාම දෙපාර්ශ්වයටම අයිතිවාසිකම් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් මේ SOFA එකෙන් බලය ලැබෙන්නේ ඇමෙරිකානු හමුදාවලට පමණයි. එදා මම කළ කථාව දැන් repeat කරන්නේ නැහැ.

1995දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ අත්සන් කළ ස්වෛරීත්වය බිලි දීමේ යුද ගිවිසුම අලුත් කරන්න කියලා ඇමෙරිකානු එක්සත් ජනපදයේ තානාපති කාර්යාලයෙන් 2018 අගෝස්තු 28 හෝ ඊට කලින් දිනයක ඔබතුමන්ලාට එවපු පිටපතක් එදාත් මා මේ පාර්ලිමේන්තුවේ සභාගත කළා. අදත් මා ඒ ගිවිසුමේ පිටපතක් **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එමඟින් ඔවුන් ඉල්ලා සිටි දේවල් මම එදා එකින් එකට කිව්වා. එම නිසා මම ඒවා නැවත

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කියන්නට යන්නේ නැහැ. ඔවුන් ඉල්ලා සිටියේ මොකක්ද? ඔවුන් ඉල්ලා සිටියේ ඇමෙරිකානු හමුදා භටයන්ට, ඇමෙරිකානු නිලධාරින්ට, ඇමෙරිකානු යුද දෙපාර්තමේන්තුවට සේවා සපයන කොන්ත්‍රාත්කරුවන්ට වියානා ගිවිසුම අනුව ලංකාව තුළ රාජ්‍ය තාන්ත්‍රික වරප්‍රසාද ලබා දෙන්න කියලාත්, ඇමෙරිකානු හමුදාවට, එහි නිලධාරින්ට, එහි කොන්ත්‍රාත්කරුවන්ට ලංකාව තුළ ක්‍රියාත්මක වීමේදී ලංකාවේ නීතිය නොවෙයි අමෙරිකානු නීතිය ක්‍රියාත්මක වෙන විධියට අවසර ලබා දෙන්න කියලාත්, කිසිදු පරීක්ෂාවකින් තොරව ඇමෙරිකානු හමුදාවේ නැව්වලට, ගුවන් යානාවලට ලංකාවට එන්නත්, යන්නත් අවසර දෙන්න කියලාත්, ඇමෙරිකානු හමුදාවට සහ සිවිල් නිලධාරින්ට, පුද්ගලයන්ට ඔවුන්ගේ හැඳුනුම් පතින්, -පාස්පෝට් එකෙන්, වීසා මඟින් නොවෙයි- ලංකාවට යෑමේ සහ ඊමේ අවසර දෙන්න කියලාත්, ලංකාවට එන ඇමෙරිකානු හමුදා සහ සිවිල් පුද්ගලයන්ගේ කිසිම දෙයක්, -ලංකාවට ගෙනෙන දෙයක්, ලංකාවෙන් ගෙනයන කිසිදු දෙයක්- පරීක්ෂාවකින් තොරව ගෙන ඒමට සහ ගෙන යෑමට අවසර දෙන්න කියලාත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගිවිසුමේ මේ ඉල්ලීම් තිබෙනවා. මම කියන්නේ මෙහෙම ගිවිසුමක් ලංකාවේ ආණ්ඩුවට එව්වාට පස්සේ, ඒ තානාපති කැඳවලා, ප්‍රශ්න කරලා එළවන්න ඕනෑ, තමුසෙලාගේ වත්ත කියලා හිතලාද මෙහෙම ගිවිසුම් අපට එවන්නේ කියලා අහලා. එහෙම කොන්ද තිබෙන ආණ්ඩු අපට 1995දී තිබුණේත් නැහැ, දැනුත් නැහැ. මෙහෙම ගිවිසුමක් අපි ඇමෙරිකාවට නොවෙයි වෙනත් රටකට යැව්වොත් මොකද වෙන්නේ කියලා මම ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී දැනගන්න කැමැතියි. අපි යම්කිසි රටකට ගිවිසුමක් යැව්වොත් මොකද වෙන්නේ? අන්දමන් දූපත කියලා හිතන්නකෝ, අපට වඩා පුංචි රටක් තෝරා ගනිමුකෝ. අපි මාලදිවයිනට මෙහෙම ගිවිසුමක් යැව්වොත් මොකද වෙන්නේ ගරු ඇමතිතුමනි? මේක රටක, nation එකක ගරුත්වය බල්ලාට දාලා ලියලා තිබෙන ගිවිසුමක්. 1995දී චන්ද්‍රිකා බණ්ඩාරනායක නෝනා මේක එක දවසින් අත්සන් කරලා යවලා තිබෙනවා. එක දවසින්! ගරු ඇමතිතුමනි, දැන් 2018 අගෝස්තු මාසයේ 28වෙනි දා ඔබතුමන්ලාට එවලා තිබෙනවා ඒක update කරන්න කියලා. ඒ update කරපු තොරතුරුවලින් කොටසක් තමයි මම දැන් කියෙව්වේ.

ඒ විතරක් නොවෙයි. ඇමෙරිකානු හමුදාවට අවශ්‍ය නම් පුළුවන් මේ ගිවිසුමෙන් පසුව ලංකාව තුළ ආයුධ සහිතව යන්න එන්න පවා. මේකේ තිබෙන ඒවා මිසක් මම එක වචනයක්වත් වැඩි කරලා කියන්නේ නැහැ. මට එහෙම පටු අරමුණක් නැහැ. ඒ වාගේම ඔවුන්ට ලංකාවේ Customs එකට කිසිම බඩුදක් ගෙවන්නට අවශ්‍ය නැහැ කියලා මේ ගිවිසුම හරහා ඔවුන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, "The Government of Sri Lanka recognizes that it may be necessary for the U.S. Armed Forces to use radio spectrum. The U.S. Department of Defense shall be allowed to operate its own telecommunication systems. This shall include the right to utilize such means and services as required to ensure full ability to operate telecommunication systems. Use of the radio spectrum shall be free of cost to the U.S. Government." කියාත් සඳහන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බාබඩෝස්ද? අපි ඇමෙරිකාවේ ඊළඟ ප්‍රාන්තයක්ද? මෙහෙම ලියුමක් එවන්න ඇමෙරිකාවේ තානාපතිට කොන්දක් එන්නේ කොහෙන්ද? මේ අවුරුදු 30ක්, 40ක් තිස්සේ දීන භාවයේ පතුළටම අපේ රට ඇදලා දාපු නිසයි මෙහෙම වෙන්නේ. 2007දී පාර්ලිමේන්තුවට, කැබිනට් මණ්ඩලයට හොරෙන් ඇමෙරිකානු පුරවැසියන් දෙදෙනෙකුට ලංකාවේ ගිවිසුමක් අත්සන් කරන්න පුළුවන් වුණා කියලා ඇමෙරිකාව දැනගත්තාට පස්සේ, ඊට වඩා දීන භාවයට පත් කරන ගිවිසුම් ඔවුන් එවනවා. එහෙම තමයි. මොකද, බෙල්ල නැව්වාම කට්ටිය දන්නවා, කොන්දෙනුත් නවලා, දණ හිසෙනුත් නවලා ගන්න. අපි කවුරුත් දන්නවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දැඩි ඇමෙරිකානු ගැති පිළිවෙතක් අනුගමනය කරනවා කියන එක. ලෝකයේ බලවත් රාජ්‍යයන් තමන්ගේ ශක්තිය පාවිච්චි කරලා අනෙක් රටවල් යටත් කරගන්න උත්සාහ ගන්නා බව අපි දන්නවා. ඒකෙන් බේරෙන්න ලේසිත් නැහැ. නමුත්, මේක එහෙම නොවෙයි. මේ තිබෙන්නේ අත් දෙකම දිගු කරලා, "එන්න, එන්න මෙහේ ඕනෑ එකක් කරගන්න" කියන ආරාධනයයි. මම ඒකයි කිව්වේ, මේ SOFA ගිවිසුම අනුව ලංකාව ඇමෙරිකානු යුද කොලනියක් වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ළඟදී තිලක් මාරපන මහතා ඇමෙරිකාවේ ගියාට පස්සේ Associated Press කියන ඇමෙරිකානු ප්‍රධාන ප්‍රවෘත්ති ජාලය ඒ පිළිබඳව වාර්තා කළා. ඒ සාකච්ඡාවල එක ප්‍රධාන කරුණක් බවට පත් වුණේ මේ ගිවිසුම කියලා ඔබතුමා දන්නවා. ආණ්ඩුව එදා අපට පාර්ලිමේන්තුවේ දී බොරු කිව්වා. මෙහෙම ගිවිසුමක් නැහැ කිව්වා. හැබැයි, ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිවේදනවල තිබෙනවා, මෙන්න මේවා සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. අපි දැනගන්න කැමැතියි, ආණ්ඩුව කරපු මේ සාකච්ඡා මොනවාද කියලා. ඒ ගැන අපට සහතිකයක් දෙනවාද?

මේ 1995 ගිවිසුම හරිනම් අවලංගු කරලා දමන්න ඕනෑ. මම නැවතත් කියනවා, මේ ගිවිසුමට අනුව කිසිදු ඇමෙරිකානු සෙබළෙක්, සිවිල් පුද්ගලයෙක්, කොන්ත්‍රාත්කාරයෙක්වත් ලංකාවට පරීක්ෂා කරන්න බැරි බව. ලංකාවේ ජනාධිපති හැම අවුරුද්දකම දෙපාරක් ඇමෙරිකාවට යනවා. එතුමා UN General Assembly එකට නිව්යෝර්ක් යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ රාජ්‍ය නායකයා ගෙන යන භාණ්ඩ ඇමෙරිකාවේ ආරක්ෂක අංශවලින් පරීක්ෂා කරන්නේ නැද්ද කියලා මම දැනගන්න කැමැතියි. ලංකාවේ ජනාධිපතිට පුළුවන් ද, මම මෛත්‍රීපාල සිරිසේන කියලා Identity Card එක පෙන්නලා ඇමෙරිකාවට යන්න. Plane එකට board කරන්නේ නැහැ. හැබැයි, ඇමෙරිකාවේ සිටින ඕනෑම තක්කඩි කොන්ත්‍රාත්කාරයෙකුට අපේ රටට එන්න පුළුවන්. රුවන් විජේවර්ධන මැතිතුමනි, මේ ඉදිරිපත් කරපු ලියවිල්ල අනුව ඔබතුමා හෝ ඔබතුමාගේ ඇමතිතුමා වන මෛත්‍රීපාල සිරිසේන හෝ කියන්න තිබුණා, මෙහෙම ස්වෛරීත්වය හෙළා දකින තුට්ටු දෙකේ ලියැවිලි එවන්න එපා කියලා. අපි ලජ්ජා වෙනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ගැන. ඔබතුමන්ලා අපට මේක වසන් කළා. මෙහෙම දෙයක් නැහැ කියලා බොරු කිව්වා. අදත් හරියට කියලා නැහැ. ඒ නිසා තමයි අපි මේ ප්‍රශ්නය මතු කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකා එක්සත් ජනපදය 2015 ජනවාරි මාසයේ 16වැනි දා ඔවුන්ගේ පෙන්ටගන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් International Security Advisory Board කියලා එකක් ඔවුන්ගේ රටින් පත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ Board එකෙන් ඔවුන් යෝජනා කළා, ලෝකය පුරා තිබෙන ඇමෙරිකානු ගිවිසුම් 100කට වැඩි ප්‍රමාණයක් යාවත්කාලීන කරන්න කියලා. මම ඒ ලියැවිල්ල **සභාගත*** කරනවා.

මේ රටට ආදරය කරන, මාතෘභූමියේ ස්වෛරීත්වය ගැන හිතන මේ පාර්ලිමේන්තුවේ සිටින ජාතිවාදී නොවන සෑම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

මන්ත්‍රීවරයෙකුම මේක කියවන්න කියලා මා ඉල්ලා සිටිනවා. මොකද, ඇමෙරිකාවේ අද අවශ්‍යතාව මොකක්ද කියලා ඔවුන් පැහැදිලිව කියලා තිබෙනවා. ඔවුන් කියනවා, "Why We Need SOFA Protections" කියලා. ඔවුන් පැහැදිලිව යෝජනා කරනවා, ඇමෙරිකන් නීතිය අනුව වැඩ කරන නීතිමය බලතල ඇමෙරිකාවට අවශ්‍ය බව. ඔවුන් වැඩ කරන්න සූදානම් අද අපේ රටේ තිබෙන නීතිය අනුව නොවෙයි කියලාත් ඔවුන් කියනවා.

මා අවසාන වශයෙන් මෙම මාතෘකාවට අදාළව මේ කාරණය ගැනත් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ඇමෙරිකානු ගිවිසුමේ 56වැනි පිටුවේ තිබෙන්නේ මොකක්ද? ඔවුන් කියනවා, මේ SOFA ගිවිසුම යටත්විජිත ගිවිසුමක් ලෙස තමයි ලෝකයේ රටවල් හිතන්නේ කියලා. ලෝකයේ බොහෝ රටවල් මේ ගිවිසුම අත්සන් කරන්න පැකිළෙනවා. අන්න ඒ පැකිළීම වෙනස් කරන්න යොදා ගන්න ඕනෑ මොකක්ද කියලා ඇමෙරිකානු ආරක්ෂක ප්‍රධානීන් යෝජනා කරනවා. මම එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන්නම්. මේකේ 56වැනි පිටුවේ ඔවුන් කියනවා, මේ agreement එක negotiate කරද්දී පාවිච්චි කරන්න ඕනෑ tactics මොනවාද කියලා. ඔවුන් ඒ අතින් අවංකයි. ඇත්ත කියලා තිබෙනවා. මේක අහගන්න. "Adjust Negotiating Tactics. Even though it is asking for special privileges, the United States has leverage in SOFA negotiations, which derives in very important part from the value the host government attaches to a U.S. military presence. It is clear that negotiating a SOFA is easier when the host government sees a compelling need for the presence of U.S. forces and/or when bilateral relations are generally good. Problems emerge when public attitudes and/or concerns regarding incursions on sovereignty outweigh the perceived need for a U.S. presence".

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මේ කියන්නේ? "It is clear that negotiating a SOFA is easier when the host government sees a compelling need for the presence of U.S. forces.....". ඔවුන් ඒකට fine example එකක් කියනවා.

"The most obvious recent example is the change of position by the Iraqi government". ISIS එක බැග්ඩෑඩ්වල ගේට්ටුව ළඟට ආවාම - ඊට කලින් ඉරාකයේ Prime Minister Nouri al-Maliki මේ ගිවිසුම ප්‍රතික්ෂේප කළා. "With ISIS at the gates of Baghdad in 2014, Prime Minister Nouri al-Maliki, who had previously refused to agree to a SOFA proved willing to reconsider and afford status protections via diplomatic note so as to bring U.S. troops back". තවත් උදාහරණයක් තිබෙනවා, පිලිපීනය ගැන. පිලිපීනයෙන් කිව්වා, "US base එකේ කාලය දීර්ඝ කරන්න බැහැ" කියලා. එසේ කියලා මාසයකට පසුව මින්දනාඕවල අලුතෙන් ISIS attacks දෙකක් වුණා. ඔබතුමා දන්නවා, ඊට පස්සේ මොකක්ද වුණේ කියලා. පිලිපීනයට සිද්ධ වුණා නැවතත් එම agreement එක අත්සන් කරන්න. මෙම ඇමෙරිකන් දෙපාර්තමේන්තුව ලෝකයේම රටවල ඉන්නා ඒ ගොල්ලන්ගේ තානාපතිවරුන්ට කියනවා, "කුමන හෝ රටක් මේක අත්සන් කරන්න අමාරුයි කියනවා නම්, ඒ රට අමාරුවේ වැටුණු වෙලාවක් මේ වැඩය සඳහා යොදා ගන්න" කියලා. දැන් ඒකට නියම වෙලාව. ඒ නිසා තමයි මේක පාවිච්චි කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හිටියේ ණය උගුලේ. අපි තිස් අවුරුදු යුද උගුලක හිටියා. ඊට පස්සේ අපි ණය උගුලකට මාරු වුණා. දැන් අපි නැවත ආරක්ෂක උගුලකට මාරු වෙමින් තිබෙනවා. අද ඇමෙරිකාව පමණක් නොවෙයි, ලෝකයේ සිටින ආරක්ෂක බලවතුන්, ලංකාව ගැන ඇහැ ගහගෙන සිටින හැම ආරක්ෂක බලවතෙකුම මේ මහා විශාල විනාශය සහ මේ ආණ්ඩුවේ තිබෙන බරපතළ අසමත්කම පාවිච්චි කරමින් මේ අරාජිකත්වය අස්සෙන් රිංගනවා. රිංගලා ලංකාවේ පැලපදියම් වෙන්න පුළුවන් හැම තැනම penetrate කරනවා. ආණ්ඩුව ඇස් වහගෙන ඉන්නවා. අද විදේශ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය යනාදී මේ හැම එකක් අස්සේම මේක ගිහිල්ලා තිබෙනවා. පසුගිය අවුරුදු ගණනක් තිස්සේ තිබුණු එක දැන් trigger වෙලා තිබෙනවා. මේකෙන් ඒ ගොල්ලන්නට ලොකු අවශ්‍යතාවක්, අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා. අපි කියන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිව කියනවා, මෙම ACSA ගිවිසුම වහාම අහෝසි කරන්න කියලා. SOFA ගිවිසුම අත්සන් කරන්න එපා. මම ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේ දී මේ ගැන මේ රටට හෙළිදරව් කරන්න කියලා. ඔබතුමන්ලා භාරකාරයන් පමණයි. ඔබතුමන්ලාගේ ගිවිසුම් පමණක් නොවෙයි, විවිධ එකඟතාවන් තිබෙනවා. මා දැන ගන්න කැමතියි, බෝම්බ පිපිරිලා දවස් දෙකකින් රටවල් අටක ආරක්ෂක ප්‍රධානීන් මේ රටට එන්නේ කොහොමද කියලා. ඒ ගොල්ලන්ට තිබුණු අවශ්‍යතාව මොකක්ද? උන්නැහේලා ඇවිල්ලා අමුතුවෙන් කරන වැඩේ මොකක්ද? මම පිළිගන්නවා, ලෝකයේ යුද තාක්ෂණය ලංකාවට අවශ්‍යයි කියලා. සියලුම යුද තාක්ෂණය තිබෙන රටක් ලෝකයේ කොහේවත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් මේ රටේ හැම අස්සක් මුල්ලක් නැරම රිංගන එක රටේ වර්තමාන ආරක්ෂාවට පමණක් නොවෙයි, අනාගත ආරක්ෂාවටත් අහිතකරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊළඟ කරුණුවලට එන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටට මෙම ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කරපු ශ්‍රී ලංකා ත්‍රස්තවාදී කණ්ඩායම අයත් තවුහිද් ජමාත් සංවිධානයත්, ඔවුන්ගේ මව් සංවිධානය වශයෙන් හඳුන්වා දෙන ISIS සංවිධානය කියන්නේත් ජාත්‍යන්තර සංවිධානයක්. හැබැයි මේ ISIS එක, Al-Qaeda එක හැදුවේ ඇමෙරිකා එක්සත් ජනපදයයි කියන එක ගලේ කෙටූ අකුරක් වාගේ සනාථ වෙලා දැනට බොහෝ කාලයක් වෙනවා. ඇමෙරිකාවේ ප්‍රධාන දක්ෂිණාංශික නායකයකු වන ළඟදී මිය ගිය ජෝන් මැකේන්, 2012 වාගේ කාලයක අද Al-Qaeda එක නියෝජනය කරන ප්‍රධාන නායකයන් සමඟ සිටින ඡායාරූප ඕනෑ තරම් පළ වෙලා තිබෙනවා. මීට අවුරුදු ගණනකට කලින් WikiLeaks නිර්මාතෘ වන ජුලියන් අසාන්ජ් e-mails 1,700ක් හෙළිදරවු කළා, හිලරි ක්ලින්ටන් මහත්මිය ISIS එකට සල්ලි දුන්නේ කොහොමද කියලා. ඇමෙරිකාව මේ ලෝකය පුරාම ත්‍රස්තවාදී සංවිධාන හැදුවා කියන එකත්, ඔවුන්ට ආයුධ දුන්නා කියන එකත් නිශ්චිත සත්‍යයක්. අද ඇමෙරිකාවම ඒකෙන් පරිප්පුව කාලා, ඇමෙරිකාවම ඒකට විරුද්ධව සටන් කරනවා කියන එකත් සත්‍යයක්. හැබැයි, තෝරා බේරා ගත් තැන්වල විතරක්. අද සිරියාවට ගහන්නෙත් මෙම ISIS සංවිධානයමයි. හැබැයි, ඒ ISISලාට ඇමෙරිකාව උදව් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරියාවට ගහන හැම උපකරණයක්ම, හැම ආයුධයක්ම ඇමෙරිකානු නිෂ්පාදන. රුසියානු, චීන නිෂ්පාදන නොවෙයි. ඒ නිසා ISIS එකට ගහන රුසියන් හමුදාවේ ජෙට්වලට, planesවලට ගහලා වට්ටන්නේ කවුද? ඇමෙරිකානු හමුදාවයි. මම මේ කාරණය කිව්වේ වෙන මොකුත් නිසා නොවෙයි. ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක ත්‍රස්තවාදය හදලා, තමන්ගේ දේශපාලනය වෙනුවෙන් ඒ ත්‍රස්තවාදය පාවිච්චි කරනවා. තමුන්නාන්සේලා ලංකාවේ ත්‍රස්තවාදී උවදුර මර්දනය කරන්න ඒ රටේ FBI එක ගෙන්වනවා. තමුන්නාන්සේලා මොන

විධියේ ආණ්ඩුවක්ද? ඒ දේවල්වලට, බැහැය කියන්න තමුන්නාන්සේලාට නොහැකි වෙලා තිබෙන්නේ මොකද? තමුන්නාන්සේලා මේ ගිවිසුම් අත්සන් කර තිබෙන නිසා සහ ඒවා අත්සන් කරන්න බොහොම කැමැත්තෙන් ඉන්න නිසා තමයි තමුන්නාන්සේලාට එහෙම කියන්න බැරි වෙලා තිබෙන්නේ. මේක හරියට මෙන්න මේ වාගේයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එල්ටීටීඊ සංවිධානය හැදුණේ අපේ රටේ ජාතිවාදී, අන්තවාදී දේශපාලනය නිසා බව අපි කවුරුත් දන්නවා. හැබැයි, එල්ටීටීඊ සංවිධානය හැදුණාට පස්සේ දෙමළ නායකයන් ඒකට උදවු කළා. 'එල්ටීටීඊය තමන් කියන විධියට, තමන් කියන කට්ටියට විතරක් ගහලා එයි, ඒ අය තමන්ට control කර ගන්න පුළුවන්' කියා දෙමළ නායකයන් හිතුවා. ඒ එල්ටීටීඊ සංවිධානයට ඉන්දියාව උදවු කළා; ආයුධ දුන්නා; සල්ලි දුන්නා; ඔක්කොම කළා. අන්තිමට මොකද වුණේ? ඒ එල්ටීටීඊ සංවිධානය දෙමළ නායකයනුත් මරාගෙන, ඉන්දියාවේ නායකයනුත් මරාගෙන, දෙමළ ජනතාවටත්, රටටත් විරුද්ධ මහා බිල්ලෙක් බවට පත් වුණා. අපි තිස් අවුරුදු යුද්ධයකින් එල්ටීටීඊ ත්‍රස්තවාදය විනාශ කළ බව ඇත්තයි. හැබැයි, අපි ඔක්කොම නන්දිකඩාල්වලට ගිහින් නතර වුණාට පසුව තමයි එය අවසන් වුණේ කියන කාරණය අපි මතක තියා ගන්න ඕනෑ. දෙමළ මිනිසුන් පමණක් නොවෙයි, මුළු රටම නන්දිකඩාල්වලට ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012දී බොදු බල සේනා සංවිධානයටත්, තව්හිද් ජමාත් සංවිධානයටත් කියන දෙකටම දේශපාලනයේ සරණ ගිය සමහර බුද්ධි අංශවලින් පඩි ගෙව්වාය කියා දැන් බුද්ධි අංශ වාර්තා මඟින් හෙළිදරවු වෙලා තිබෙනවා. ඒක හරි ලස්සන වැඩක්. ඒ කියන්නේ, සිංහල - බෞද්ධ අන්තවාදයටත් සල්ලි දෙනවා; හදනවා. මුස්ලිම් - ඉස්ලාම් ත්‍රස්තවාදයටත් -අන්තවාදයටත්- සල්ලි දෙනවා; හදනවා. ඊට පසුව ඒ දෙකෙන්ම වැඩ ගන්නවා. ඒවා හදද්දි ඒ දෙගොල්ලන්ම හිතුවා, තමන්ට ඕනෑ විධියට කට්ටිය වැඩේ කරාවි කියලා. හැබැයි, තමන්ම හදපු බිල්ලා තමන්වත් ගිල ගන්නා තත්ත්වයට පත් වෙනවාය කියන කාරණය අපි දැනගන්න ඕනෑ.

අපි තමුන්නාන්සේලාට කියන්නේ මේකයි. අද මේ රටේ ඇති වෙලා තිබෙන අනාරක්ෂිත තත්ත්වය නිසා අපේ රටේ ආරක්ෂාව පමණක් නොවෙයි, ස්වෛරීත්වයත් බිල්ලට යනවා; මතු අනාගතයම බිල්ලට යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලෝකයේ බලගතු රාජ්‍යයන් අපේ මේ දුර්වලතාව පාවිච්චි කරලා දැන් පිනුම් ගහනවා. අපිට ආණ්ඩුවක් නැහැ. රටට ආණ්ඩුවක් නැහැ. ජනාධිපතිවරයා එක පැත්තකයි; අගමැතිවරයා තව පැත්තකයි; ඇමතිවරු තව පැත්තකයි. මේ සියලුදෙනාම දස අතේ විසරිලා ගිහින් තිබෙන්නේ. ඒ නිසා ආණ්ඩුව විකාර කියවනවා.

ඊළඟට, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ මන්ත්‍රී කණ්ඩායමේ සැලකිය යුතු කොටසක් අමු ජාතිවාදී ලෙස, ඉස්ලාම් අන්තවාදයට නොදෙවෙනි ජාතිවාදයක් මතු කරමින් මේ තත්ත්වයෙන් උපරිම දේශපාලන වාසි ලබා ගන්න උත්සාහ කරමින් ඉන්නවා.

තව්හිද් ජමාත් සංවිධානයට සම්බන්ධ මුස්ලිම් දොස්තර කෙනෙකු සිංහල බෞද්ධ අම්මලා හාරදහසක් වඳ කරලාය කියා අද "දිවයින" පුවත් පතේ පළ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ තිබෙන සාමකාමීම රටේ වුණත් මෙහෙම ප්‍රවෘත්තියක් ජාතික පුවත් පතක headline එක විධියට පළ වුණොත්, ඒ රටම ඇවිස්සෙනවා. ඒ නිසා ඉහගෙන කන්න පුළුවන් හැම එක්කෙනාම දැන් මේක ඉහගෙන කනවා. ඒක ඇමෙරිකාවත් කරනවා; චීනයත් කරනවා; ඉන්දියාවත් කරනවා; දේශපාලනයේ ඉන්න කට්ටියත් කරනවා; Media එකත් කරනවා; නිලධාරිනුත් කරනවා; බිස්නස්කාරයනුත් කරනවා; ගම්වල මිනිස්සුත් තමන්ට පුළු පුළුවන් විධියට ඒ කටයුත්ත කර ගන්නවා. දැන් මුස්ලිම් මිනිසුන් බයවෙලා ඉන්න නිසා, මේ තත්ත්වය පාවිච්චි කරලා මුස්ලිම් මිනිහාගේ ඉඩමේ කෑල්ලක් අල්ලා ගන්න පුළුවන් නම් මේ වෙලාවේ ඒකත් කර ගන්නවා. ණයක් ගෙවන්නේ නැතිව පොල්ලක් තියන්න පුළුවන් නම් මේ වෙලාවේ ඒ වැඩෙත් කරනවා.

මොසාඩ් ඔත්තු සේවයේ හිටපු නිලධාරියෙකු ලංකාව පිළිබඳව පොතක් ලිව්වා. ඔහු ඒ පොතේ එක කාරණයක් සඳහන් කළා. ඒ මොකක්ද? මොසාඩ් එක එකම වෙලාවේ, එකම කඳවුරක, එක කෙළවරක ශ්‍රී ලංකා හමුදාවත්, අනික් කෙළවරේ එල්ටීටීඊ එකත් පුහුණු කළාය කියා ඔහු ලංකාව ගැන ලියූ ඒ පොතේ සඳහන් කර තිබෙනවා. අද ලංකාව පත් වී තිබෙන්නේ අන්න එවැනි තත්ත්වයකටයි. තව්හිද් ජමාත් සංවිධානයට; ISIS එකට සල්ලි දෙන, ISIS එකට ආයුධ දෙන, උදවු කරන එක්සත් ජනපදය අපිට උපදෙස් දෙන්නත්, මේකෙන් අපිව බේරා ගන්නත් කටයුතු කරනවා. ආරක්ෂාව පැත්තෙන් එක්සත් ජනපදය අසාර්ථක රාජ්‍යයක්. එක්සත් ජනපදයේ ජීවත් වනවාය කියන්නේ බංකරයක ජීවත් වනවා වාගේ වැඩක් බව ඔබතුමා දන්නවා. මේකට උත්තරය මොකක්ද? මීට කලින්, විදේශීය රාජ්‍යයන් -අධිරාජ්‍යවාදී රටවල්- අපේ රටට ඇතුළු වුණේ අපේ රටේ ජාතිවාදී අන්තවාදය නිසා ඇති වුණු බෙදුම්වාදය පාවිච්චි කරගෙනයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එල්ටීටීඊ බෙදුම්වාදය පාවිච්චි කරලා තමයි, ඉන්දියාව හා ඇමෙරිකාව වැනි විදේශ රටවල් ලංකාවට ඇතුළු වුණේ. ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඒ වෙලාවේ දැක්කා, අධිරාජ්‍යවාදය ආවේ බෙදුම්වාදය අස්සේ බව. ඒ නිසා ජවිපෙ වශයෙන් අපි ජාතිවාදී වෙන්නේ නැතිව, රට බෙදීමට විරුද්ධව සටන් කළා. ඒ පිළිබඳව හිතේ කිසිදු සැකයක් නැති ප්‍රතිපත්තිමය ස්ථාවරයක් අපට තිබෙනවා. අපි, ජාතිවාදයට විරුද්ධයි. එදා අපි බෙදුම්වාදයටත් විරුද්ධ වුණා. අද ජාතිවාදයේ සරණ ගිහිල්ලා පක්ෂ අස්සේ ගිය සමහර පුද්ගලයන් මොනවා කිව්වත්, මේ රට ඒකට සාක්ෂි දරයි; මිනිසුන් සාක්ෂි දරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුළුවන් නම් මට තව විනාඩි තුන හතරක් දෙන්න.

අවුරුදු තිහක් තිස්සේ මේ රටේ තිබුණු යුද්ධය අපි කෙසේ හෝ අවසන් කර ගත්තා; ලේ ගංගාවක් ගැලුවාට පසුව හෝ අප ඒ යුද්ධය අවසන් කර ගත්තා. ටිකක් හෝ සාමකාමී තත්ත්වයක තිබෙන අපේ රට අධිරාජ්‍යවාදීන් ඇතුළු විදේශ රටවලට දැන් අවුල් කරන්න පුළුවන්කම තිබෙන්නේ කොහොමද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒක ආර්ථිකයෙන් විතරක් ඔවුන්ට අල්ලන්න බැහැ. ආර්ථිකයෙන් පමණක්, ණය උගුලෙන් පමණක් ලංකාව දණ ගස්සන්න බැහැ. දැන් ඔවුන්ට ඒ සඳහා අලුත් ප්‍රශ්නයක් ඕනෑ. ඒකට ඔවුන්ට එල්ටීටීඊ එක නැහැ; දෙමළ ජනයා නැවත යුද්ධයකට යන්නේ නැහැ. ඒ නිසා, අලුත් ගින්නක් හදන්නේ කොහොමද කියා ඔවුන් පසුගිය අවුරුදු හත-අට තිස්සේ බැලුවා. ඔවුන්ගේම ගෝලයෝ හදපු තව්හිද් ජමාත් එකයි, බොදුබල සේනා සංවිධානයයි පාවිච්චි කරලා උපරිම උත්සාහයක් දැරුවා, අපේ රට තුළ සිංහල සහ මුස්ලිම් ගැටුමක් හදන්න. අලුත්ගම ප්‍රදේශයේ ගැටුමක් ඇති කළා. දිගන ගැටුමක් ඇති කළා.

[ගරු බිමල් රත්නායක මහතා]

හැබැයි, ඒ අයට ඕනෑ ගණනට ඒක පත්තු වුණේ නැහැ. පත්තු වුණා, හැබැයි ඕනෑ ගණනට පත්තු වුණේ නැහැ. ඒ නිසා චීනය, ඇමෙරිකාව වැනි අධිරාජ්‍යවාදීන්ටත්, ඉන්දියාවටත් ඒක පාවිච්චි කරලා ලංකාව තුළට මැදිහත් වෙන්න බැරි වුණා. ඒ නිසා අද අපි තේරුම් ගන්න ඕනෑ මොකක්ද? අද ජාතිවාදය එන්නේ කොතැනින්ද? අද අධිරාජ්‍යවාදය එන්නේ මොකක් හරහාද? අද ඒක එන්නේ, අන්තවාදය හරහායි; ජාතිවාදය හරහායි. එහෙම නැතිව, ණය උගුලෙන් විතරක් ලංකාව වට්ටන්න අධිරාජ්‍යවාදී බලගතු රටවලට බැහැ. මේකට හොඳම විධිය තමයි, මේ ජාතිවාදී කලකෝලාහල, අන්තවාදය හා මේ ISIS ත්‍රස්තවාදය. මේ කථාව ඇති කර ගත්තාට පස්සේ, ඒ අධිරාජ්‍යවාදීන්ට නියම විධියටම තමන්ගේ ව්‍යාපෘතිවලට ලංකාවට එන්න පුළුවන්; NATO Project එකට එන්න පුළුවන්; American Project එකට එන්න පුළුවන්; China, Indian Projectsවලට එන්න පුළුවන්.

ඉන්දියානු ඔත්තු අංශ ඒ ප්‍රහාරය ගැන අප්‍රේල් 04වන දාට කලින් ලංකාව දැනුවත් කරලා, අපේ රට බේරා ගන්න උත්සාහ කිරීම පිළිබඳව අපි ඉන්දියාවට ස්තුතිවන්ත වනවා. ඒ ගැන කිසිදු සැකයක් නැහැ. ගරු රුවන් විජේවර්ධන රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මෙන්න මේ කාරණය දැනගන්න කැමැතියි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පහර දෙන තැන් අතර, ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය පිළිබඳවත් ඒ පොලිස් ප්‍රධානියාගේ නිවේදනයේ සඳහන් වෙලා තිබෙනවා; "ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයටත් ප්‍රහාර එල්ල කරන්න ඉන්නවා" කියා ඒ නිවේදනයේ තිබෙනවා. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ප්‍රහාර එල්ල කරන්න මරාගෙන මැරෙන බෝම්බකාරයෙක් ගියාද, ඔහුව අත් අඩංගුවට ගත්තාද කියා මා දැන ගන්න කැමැතියි. ඔබතුමන්ලාගේ පොලීසිය යටතේ, "තානාපති ආරක්ෂක කොට්ඨාසය" කියා අංශයක් තිබෙනවා. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල කරන්න ඉන්නවාය කියා දැන ගත්තාට පස්සේ ඔවුන් ඔබතුමන්ලාගෙන් ඒ සඳහා විශේෂ ආරක්ෂාවක් ඉල්ලුවාද? පල්ලිවලට ප්‍රහාර එල්ල කරනවාය කිව්වාට, අපි දැක්ක document එකේ "කොච්චිකඩේ පල්ලිය" කියන එක තිබුණේ නැහැ. හැබැයි, "ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය" කියන එක ඒ document එකේ හරියට සඳහන් වෙලා තිබෙනවා. මම ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඔබතුමන්ලාගෙන් විශේෂ ආරක්ෂාවක් ඉල්ලුවාද, නැත්නම් ඔවුන් විශේෂ ආරක්ෂාවක් පනවා ගත්තාද කියා. මම දන්නා තරමින්, ඔවුන් විශේෂ ආරක්ෂාවක් ඔබතුමන්ලාගෙන් ඉල්ලා නැහැ. ඇයි, එහෙම ඉල්ලුවේ නැත්තේ? එහෙම ඉල්ලුවා නම් ඔබතුමා කියන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මට හිතෙන දෙය මේකයි. ඉන්දියානු බුද්ධි අංශවලට මේ තොරතුර ආවා. ඔවුන් "ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය" කියලා එම ලැයිස්තුවට ඇතුළත් කළේ නිකම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකෙන් ඔප්පු වෙන්නේ මොකක්ද? ලංකාවේ බුද්ධි අංශවලට වඩා ඉන්දියාවේ බුද්ධි අංශ මේ රටේ ක්‍රියාත්මක වෙනවා; ඔවුන් ශක්තිමත් කියන එකයි ඒකෙන් පැහැදිලි වන්නේ. ඒක තමයි, මෙතැන තිබෙන කාරණය. ඒක ඉන්දියාවට කෙළින් කියන්න බැහැ. ඒ නිසා ඉන්දියාව ඒ ලැයිස්තුවට තමන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ නමත් ඇතුළත් කළා. එසේ හෝ කරපු එක ගැන ඉන්දියානු බුද්ධි අංශයට ස්තුතිවන්ත වෙමින් තමයි මම මේ කාරණය කිව්වේ.

අද බලගතු විදේශ රාජ්‍යයන් අපේ රටට එන්නේ අපේ ඒ බෙදීම්; අපි තුළ තිබෙන ජාතිවාදී හා අන්තවාදී විරසකය පාවිච්චි කරගෙනයි. නැත්නම් ඔවුන්ට මේ රටට එන්න ක්‍රමයක් නැහැ. ඒ කියන්නේ, අද අධිරාජ්‍යවාදීන් හා ලොකු බලවතුන් ලංකාවට shot එක දෙන්න එන්නේ, විනාශයක යෙදෙන්නේ ජාතිවාදය හරහායි. එහෙම නම්, අපි සමගියෙන් හිටියොත් ඔවුන්ට කියන්න විශේෂ ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා, මේ රටේ සිටින සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවගෙන් අපි ඉල්ලා සිටින්නේ එක දෙයයි. ඔබ සැබෑ ලෙසම මේ රටට ආදරෙයි නම්, අධිරාජ්‍යවාදීන් ඇතුළු විදේශ රටවල අනිසි මැදිහත් වීමට ඔබ සැබෑ ලෙසම විරුද්ධයි නම්, ඔබ ජාතිවාදයට විරුද්ධ විය යුතුයි. ඔබ ජාතිවාදයට පක්ෂ වුණොත්, අධිරාජ්‍යවාදය පරදවන්න බැහැ. අද ජාතිවාදය එන්නේ, අධිරාජ්‍යවාදී රටවල් විසින් හැදූ සහරාන්ලාත් එක්කයි; අද ජාතිවාදයට යොදා ගන්නේ, සහරාන්ලායි. දැන් සහරාන් මැරුණා. ලංකාව ඉවරයි. සහරාන් නිසා නේ, ඇමෙරිකාවට -FBI එකට- කැත නැතිව ලංකාවට බහින්න පුළුවන් වෙලා තිබෙන්නේ. සහරාන් නැත්නම් ඒක එහෙම වෙන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව ආරක්ෂා කිරීමේ න්‍යෂ්ටික අවිය ජාතික සමගියයි. අපේ මාතෘ භූමිය ආරක්ෂා කර ගන්න පුළුවන් වන්නේ ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා එකට හිටියොත් විතරයි. මුස්ලිම් දොස්තරලා සිංහල-බෞද්ධ අම්මලා 4,000ක් වඳ කළාය කියන දේවල්වලින් නොවෙයි, ලංකාව ආරක්ෂා වෙන්නේ. මුස්ලිම් මිනිහා තැති ගන්වලා, ඔහු මේ රට තුළ පහළට දමලා, සහරාන්ලාගේ පැත්තට තල්ලු කිරීමෙන් නොවෙයි ඒක වෙන්නේ. ඒ වාගේම ත්‍රස්තවාදය විනාශ කරන්න අවශ්‍ය ආරක්ෂක, යුධමය, නීතිමය පියවර ගත යුතුයි. ඒ ගැන සැකයක් නැහැ. නමුත්, ලංකාව ආරක්ෂා කිරීමේ න්‍යෂ්ටික අවිය වෙන්නේ හමුදා මෙහෙයුම් නොවෙයි. ඒ න්‍යෂ්ටික අවිය වෙන්නේ, අපි සමගියෙන් එක රටක් ඇතුළේ ජීවත් වෙන ගමන්, අන්තවාදය කොහෙන් ආවත් -ඒක ඉස්ලාමීය වශයෙන් ආවත්, වෙන විධියකට ආවත්- ඒකට විරුද්ධව සටන් කිරීමයි.

අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ අනාරක්ෂිතම රටවල් මොනවාද? ස්වීඩනය, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, භූතානය, ස්විට්සර්ලන්තය, කියුබාව, වියට්නාමය වැනි ඒවා තමයි අද ලෝකයේ තිබෙන ආරක්ෂිතම රටවල් වන්නේ. ඒ රටවල ප්‍රශ්න මොකුත් නැහැ. කියුබාව සහ වියට්නාමය තමයි ලෝකයේ මිනී මැරුම් අඩුම රටවල්. කියුබාව, වියට්නාමය, ඩෙන්මාර්කය, ස්වීඩනය වැනි රටවල් තමයි ජාතිවාදී ගැටුම් නැති රටවල් වන්නේ. ඒකට හේතුව මොකක්ද? ඔවුන් න්‍යෂ්ටික අවිවලින් සන්නද්ධ වීමද? නැහැ. නූතන ලෝකයේ ත්‍රස්තවාදයට පදනම වන ජාතිවාදය, අන්තවාදය ඒ රටවල නැහැ. ඒක එංගලන්තයේ තිබෙනවා; ඕස්ට්‍රේලියාවේ තිබෙනවා; ඇමෙරිකාවේ තිබෙනවා; ප්‍රංශයේ තිබෙනවා; නයිජීරියාවේ තිබෙනවා; ඊජිප්තුවේ තිබෙනවා; ඉන්දියාවේ තිබෙනවා; පාකිස්තානයේ තිබෙනවා. ඒ හැම තැනම යුද්ධ තිබෙනවා. හැබැයි, පුංචි රටක් වුණු භූතානයේ එය නැහැ. ජාතිවාදය නැති රටවල් තමයි අද ලෝකයේ ආරක්ෂිත රටවල් බවට පත්වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුස්ලිම් මිනිහාව මරාගෙන කන්න, දෙමළ මිනිහාව මරාගෙන කන්න හිටපු කට්ටියම, කතෝලික මිනිසුන්ගේ කතෝලික ආගම ඇදහීමේ අයිතිය ප්‍රතික්ෂේප කළ කට්ටියම අද කතෝලික ජනතාව 300කට ආසන්න පිරිසක් මැරීම පාවිච්චි කරලා තමන්ගේ ඡන්ද මලු පුරවා ගන්න, තමන්ගේ ව්‍යාපාර සාර්ථක කර ගන්න, තමන්ගේ mediaවල ratings වැඩි කර ගන්න උත්සාහ කරනවා. ඒ නිසා, අද අපි ඉල්ලා සිටින්නේ මෙපමණයි. පළමුව රටට අවශ්‍යයි, මහ ජනතාවගේ ආරක්ෂාව. දෙවනුව, රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් පාලනයක් අවශ්‍යයි. ඊළඟට රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන පාලනයක් රටට අවශ්‍යයි. කලින් ආරක්ෂාව කියන එක ලොකුවට තිබුණේ නැහැ. දැන් ආරක්ෂාව කියන ප්‍රශ්නයත් ඇතුළු වෙලා

තිබෙනවා. මේවා දෙන්න පුළුවන් කාටද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජපක්ෂ මහත්මයා බලයට පත් වුණොත්, එතුමා රටට ආරක්ෂාව දෙයි කියා බොහෝ අය කියනවා. එතුමාට එහෙම ආරක්ෂාව දෙන්න පුළුවන්ය කියා හිතුවා වුණත්, ජාතිවාදය හදන්නේ නැතිව එතුමාට ආරක්ෂාව දෙන්න බැහැ. එතුමාට මහජන ආරක්ෂාව හදන්න පුළුවන්ය කියා හිතුවාට, මොකක්ද වෙන්නේ? එතුමාට ඒක හදන්න වෙන්නේ ජාතිවාදය, අන්තවාදය, හොරකම විසින් ඇති කරන වටපිටාවකට නැවත විදේශ රටවල් කැඳවා ගැනීමෙන්. ඒ නිසා රාජපක්ෂ මහත්මයාට නැවත බලය යනවාය කියන්නේ, මේ රට හයිටිය වාගේ වෙනවාය කියන එකයි; පාකිස්තානය වාගේ වෙනවාය කියන එකයි.

වර්තමාන ආණ්ඩුවට ආරක්ෂාව හදන්නත් බැහැ; රටේ යහ පාලනයක්, ආර්ථිකයක් හදන්නත් බැහැ; ඔබතුමන්ලාට ජාතික සමගිය හදන්නත් බැහැ. එම නිසා ඔබතුමන්ලා බලයේ ඉන්නවාය කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා බලයේ ඉන්නවාය කියන්නෙත් රට හයිටියක් වෙනවාය කියන එකයි. ආරක්ෂාවත් නැහැ; පාලනයකුත් නැහැ; ආණ්ඩුවකුත් නැහැ. මේ රට සම්පූර්ණයෙන්ම විදේශීය ඒජන්තයන්ගේ තෝතැන්නක් වෙනවා.

දැන් රටට ඕනෑ වන්නේ, ජාතිවාදයෙන් තොරව මහජන ආරක්ෂාව හදන්න පුළුවන් ආණ්ඩුවක්; හොරකමින් තොරව, දූෂණයෙන් තොරව රටේ ආර්ථිකය හදන්න පුළුවන් ආණ්ඩුවක්; ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන ගමන්, මානව හිමිකම් ආරක්ෂා කරන ගමන්, ජාතික සමඟිය ආරක්ෂා කරන ගමන්, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න පුළුවන්, ඍජු පාලනයක් හදන්න පුළුවන් පාලනයක්. එහෙම නැතුව ජාතිවාදීන්ටයි, හොරුන්ටයි, ඇමෙරිකන් ගැත්තන්ටයි, චීන ගැත්තන්ටයි මේ රටේ ආරක්ෂාව හදන්නත් බැහැ; සමඟිය හදන්නත් බැහැ; ආර්ථිකය දියුණු කරන්නත් බැහැ. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, මේ ආකාරයෙන් ඔබතුමන්ලාගෙන් අත්සන් ගන්න බලාපොරොත්තු වන ගිවිසුම් අත්සන් කරන්න එපාය කියා. අත්සන් කරපු ගිවිසුම්, විශේෂයෙන්ම ආරක්ෂක ගිවිසුම් අවලංගු කරන්නය කියනවා. ඒ වාගේම මේ සිද්ධියෙන් පස්සේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් වර්තමානයේ ලංකාවට ඇවිල්ලා සිටින රටවල් මොනවාද, කොපමණ පිරිසක් ඇවිල්ලා තිබෙනවාද, කාගේ ආරාධනාවටද ඇවිල්ලා තිබෙන්නේ, ඔවුන් මොන මොන ක්ෂේත්‍රවලද කටයුතු කරන්නේ, කොපමණ කාලයක් ඔවුන්ට ඉන්න ඉඩ දීලා තිබෙනවාද කියන කරුණු පැහැදිලි කරන්නය කියමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වැඩිපුර කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ඉතාමත් ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට යෝජනාව ස්ථිර කරන්න පමණයි තිබෙන්නේ.

[අ.භා.4.39]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ඉතාමත්ම වැදගත් වූ මේ විශිෂ්ට යෝජනාව මා ස්ථිර කරනවා. එක කාරණයක් කියන්න මට තත්පර 5ක් දෙන්න. දේශ ප්‍රේමයේ සළුපිළි සියොළඟ -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තත්පර 5 නම් දැන් අවසානයි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
දේශ ප්‍රේමයේ සළුපිළි සිය ගත පුරාම පොරවා ගත්ත මේ මහත්වරුන් දෙගොල්ලන්ම වසර 71ක් පුරාම මේ රටේ ස්වාධීනත්වයත්, ස්වෛරීත්වයත් මුළුමනින්ම පාවා දෙමින්, රටේ ජනතාවත්, අනාගත පරම්පරාවත් මුළුමනින් පාවා දෙමින් කරපු මේ මහා දැවැන්ත අපරාධයට මේ රටේ අනාගත පරම්පරාව කවදා හෝ මේ දෙගොල්ලන්ටම ඉතාමත්ම වග කීමෙන් යුතුව උත්තර දෙනවාය කියා මා විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. (Mrs.) Shanthi Sriskandarasa. You have got eight minutes.

[பி.ப. 4.40]

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஶ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி. இன்று இங்கு கொண்டு வரப்பட்டிருக்கும் ஒத்திவைப்புவேளைப் பிரேரணையானது முக்கியத்துவம்வாய்ந்ததாகக் காணப்படு கின்றது. யுத்தம் முடிவடைந்து தற்போது 10 வருடங்கள் நிறைவடைந்திருக்கின்றன. நாம் அன்று தொடக்கம் இன்றுவரை, யுத்தக் குற்றவாளிகளைக் கண்டுபிடியுங்கள், அவர்களுக்குத் தண்டனை கொடுங்கள், இவ்வாறான குற்றங்கள் மீள நிகழாதிருப்பதை உறுதிப்படுத்துங்கள், நிலைமாறுகால நீதியின்கீழ் ஒரு சரியான நிலைப்பாட்டுக்கு இந்த நாடு வரவேண்டும் என்பது பற்றிய கோரிக்கைகளைத் தொடர்ந்து விடுத்துக்கொண்டிருந்தோம். ஆனால், அரசியல் இலாபத்துக்காகவும் தாங்கள் அரசியலில் நிலைத்து நிற்கவேண்டும் என்பதற்காகவும் இந்த அரசு யுத்தக் குற்றவாளிகளுக்கு முண்டுகொடுத்துக் கொண்டேயிருந்தது. இன்று அதனுடைய பலனை முழு நாடுமே அனுபவிக்கின்ற அசாதாரண நிலையை இந்த நாடு எதிர்கொண்டிருக்கின்றது. பயங்கரவாத நிகழ்வின் பின்பு அமெரிக்கா, சீனா, இந்தியா ஆகிய நாடுகளுடன் எவ்வாறான ஒப்பந்தங்கள் செய்துகொள்ளப்பட்டன? எவ்வாறான கடிதப் பரிமாறல்கள் இடம்பெற்றன? என்பன பற்றிய ஒரு விவாதத்திலே ஈடுபட்டுக் கொண்டிருக்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைக்கு இன்று நாங்கள் தள்ளப்பட்டிருக்கின்றோம்.

அண்மையில் தென்பகுதியில் அதிகளவு பயங்கரவாதக் குண்டுத் தாக்குதல்கள் இடம்பெற்றாலும், அதனுடைய பின்விளைவுகளை வட பகுதி மக்கள் அதிகமாக எதிர்கொள்வதைக் காணக்கூடியதாக இருக்கின்றது. அதாவது, அங்கு சோதனைச் சாவடிகள் ஏற்படுத்தப்பட்டுச் சோதனைகள் நடைபெறுகின்றன; வீடு வீடாகச் சென்று சோதிக்கின்ற நடவடிக்கைகள் தொடர்ந்து கொண்டிருக்கின்றன. அத்துடன், எங்களுடைய சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ சிறீதரன் அவர்களது வீட்டுக்குச் சென்று சோதனை செய்ததை இங்கு குறிப்பிட வேண்டியிருக்கின்றோம். அவர் வீட்டில் இல்லாதவேளையில், அவரது பெண் பிள்ளைகளும் அவரது

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය මහතා]

மனைவியும் இருந்த வேளையில், ஒரு பெண் பாதுகாப்பு உத்தியோகத்தர்கூட இல்லாது அவரது வீடு சல்லடைபோட்டுத் தேடப்பட்டிருக்கின்றது. இந்த விடயமானது ஏனைய சாதாரண மக்களை மிகவும் கவலைக்குள்ளாக்கியிருக்கின்றது. ஒரு கௌரவ பாராளுமன்ற உறுப்பினரின் குடும்பத்துக்கே பாதுகாப்பில்லாத நிலையிருக்கும்போது, சாதாரண மக்களது குடும்பங்களுக்கு, சாதாரண பெண்களுக்கு எவ்வாறு பாதுகாப்புக் கிடைக்கும்? என்றொரு கேள்விக்குறியை இந்தப் பயங்கரவாதச் செயற்பாடு ஏற்படுத்தியிருக்கின்றது. இந்தச் செயற்பாட்டினால் எமது கல்வி, பொருளாதாரம் என்பன வீழ்ச்சியடைந்திருக்கின்றன. குறிப்பாக, பாதுகாப்புப் படையினர் பாதுகாப்புத் தொடர்பான தங்களது செயற்பாட்டினை விடுத்து வன்னியிலே பண்ணைகளை அமைத்தல், முன்பள்ளிகளை நடாத்துதல், கிரிக்கெட் போட்டி நிகழ்வுகளை நடாத்துதல் போன்ற நடவடிக்கைகளில் ஈடுபட்டிருந்ததன் விளைவாகக்கூட இது தோற்றம் பெற்றிருக்கலாம். இப்பொழுது உஷார் நிலையில் இருக்கின்ற இந்தப் பாதுகாப்புப் படையினர் தமக்குப் பொருத்தமில்லாத இந்த வேலைகளை விடுத்து, நாட்டின் பாதுகாப்புத் தொடர்பில் அக்கறைகொண்டு செயற்பட்டிருந்தார்களேயானால், தங்களுடைய கடமைகளைச் சரியாகச் செய்திருந்தார்களேயானால் இவ்வாறான ஒரு துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டிருக்காது.

நீதிமன்றத்தை அவமதித்தார் என்ற குற்றச்சாட்டின்பேரில் 19 வருட காலச் சிறைத்தண்டனை விதிக்கப்பட்டிருந்த ஞானசார தேரரை பொதுமன்னிப்பின் அடிப்படையில் விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டு இருக்கின்றது. ஆனால், ஏன் நீங்கள் தமிழர்களை இரண்டாம் தரப் பிரசைகளாகப் பார்க்கின்றீர்கள் என்பதுதான் எங்களுடைய கேள்வியாக இருக்கின்றது. கிளிநொச்சியைச் சேர்ந்த ஆனந்த சுதாகரன் தனது மனைவியின் மரணச் சடங்கில் கலந்துகொள்வதற்கு வந்தபொழுது, அவரது பிள்ளைகள் அழுது புலம்பித் தகப்பனோடு செல்வதற்கு முற்பட்டதை ஊடகங்கள் வாயிலாக நாங்கள் கண்டோம். சுதாகரனை விடுவிக்குமாறு ஜனாதிபதிக்குப் பல கடிதங்கள் எழுதியும் அந்தப் பிள்ளைகள் நேரடியாகச் சென்று அவரைச் சந்தித்தும்கூட அவர்கள்மீது ஜனாதிபதிக்கு இரக்கம் ஏற்படவில்லை. இதேபோல், வவுணதீவில் நிகழ்ந்த கொலையின்போது குற்றஞ் சாட்டப்பட்டுச் சிறையிலே அடைத்து வைக்கப்பட்டிருந்த முன்னாள் போராளி, தற்பொழுது குற்றமற்றவர் என்று சொல்லப்பட்டு விடுதலை செய்யப்பட்டு இருக்கின்றார். இந்தக் குடும்பங்களுக்கு இந்த அரசு என்ன பதில் கூறப்போகின்றது? உங்களுக்கு ஒரு சட்டம், எங்களுக்கு ஒரு சட்டம் என்று இரண்டுபட்ட நிலையில் இவ்வாறு ஏன் நீங்கள் செயற்பட்டுக் கொண்டிருக்கின்றீர்கள் என்பதை இந்த இடத்திலே நான் கேட்க விரும்புகின்றேன்.

வடக்கிலே இப்பொழுது முளைகொண்டிருக்கின்ற சோதனைகளை நாங்கள் மறுக்கவில்லை. நாட்டில் பாதுகாப்புக்காகச் சோதனைச் சாவடிகள் அமைக்கப்பட வேண்டும், சோதனைகள் செய்யப்படவேண்டும் என்பதை ஏற்றுக்கொண்டாலும், அது தொடர்பில் ஒரு பொறிமுறையை வகுத்துச் சரியான முறையிலே செயற்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கவேண்டும். சில வீடுகளுக்குத் திடீரென இராணுவத்தினர், பொலிஸ் அதிகாரிகள் சோதனைக்காகச் செல்கின்றனர். வீட்டில் இருக்கின்றவர்களை ஒரு புறமாக இருக்கக் கூறிவிட்டு, அவர்களது வீட்டைச் சல்லடைபோட்டுத் தேடுகிறார்கள். வருகின்ற இராணுவத்தினரோ அல்லது பொலிஸாரோ எதைக் கொண்டுவந்து தங்களது வீட்டுக்குள் வைத்துவிட்டுச் செல்கின்றார்களோ தெரியாது என்றதொரு சந்தேகம் தங்களுக்கு இருப்பதாக சில தாய்மார் முறைப்பாடு செய்கின்றார்கள். எனவே, சோதனை நடவடிக்கைகளை மேற்கொள்கின்றபொழுது, பெண் பாதுகாப்பு உத்தியோகத்தர்களையும் அழைத்துச் செல்வதற்கு நீங்கள் நடவடிக்கை எடுக்கவேண்டும். 30 வருடகால யுத்தத்திலிருந்து மீண்டெழுந்திருக்கின்ற எமது மக்களை, மீண்டும் ஏற்பட்ட பயங்கரவாதச் செயற்பாடுகளினால் மேலும் பாதிப்படையச் செய்வது என்பது இந்த நாட்டைக் குட்டிச்சுவராக்குகின்ற ஒரு நிகழ்வாகவே காணப்படுகின்றது. இவ்வாறான ஒரு சூழலிலே இவை மீள நிகழாமையை நிலைமாறுகால நீதியின்கீழ் உறுதிப்படுத்துங்கள் என்று நாங்கள் தொடர்ந்து கேட்டுக்கொண்டு இருக்கின்றோம். அதைவிடுத்து, உண்மையான குற்றவாளிகள் அடையாளம் காணப்பட்டும், அவர்கள் குற்றம் செய்தவர்கள் என்று தெரிந்தும் அரசியல் இலாபத்துக்காக அவர்களைப் பாதுகாத்துவந்த பல அரசியல்வாதிகள் இன்றும் இந்தப் பயங்கரவாதத்துக்குத் துணைபோகிறார்கள். அவ்வாறான பல அரசியல்வாதிகளது பெயர்கள் குறிப்பிடப்பட்டு இருந்தும்கூட, அவர்களைப் பாதுகாக்கின்ற நடவடிக்கையிலேயே இந்த அரசு தொடர்ந்தும் ஈடுபட்டு வருகின்றது. இவ்வாறான நிலைமை தொடருமேயானால், இந்த நாடு மீண்டெழுவதற்கு எந்தவிதமான அறிகுறியும் தென்படாது. இந்த நிலைப்பாட்டைச் சாதகமாக வைத்துக்கொண்டு, வெளிநாடுகள் இந்த நாட்டுக்குள் புகுந்து எமது நாட்டைக் குட்டிச்சுவராக்குகின்ற செயற்பாடுகளில் ஈடுபடுவதற்கும் அவர்களது பொருளாதார இலாபத்துக்காகவும் அவர்களது பாதுகாப்புக் கருதியும் எமது நாட்டைப் பகடைக்காயாகப் பாவிப்பதற்குமான சூழலை நாமாகவே உருவாக்கிக் கொடுத்துவிட்டோமோ என்ற ஐயம் ஏற்படுகின்றது. இன்று சுற்றுலாத்துறை பாதிக்கப்பட்டு நாட்டினுடைய வருமானத்தின் பெரும்பகுதியை இழக்கவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைக்கு நாம் ஆளாகி இருக்கின்றோம். பெற்றோர்கள் தமது பிள்ளைகளைக் கேள்விக்குறியுடனேயே பாடசாலைக்கு அனுப்புகின்றார்கள். பயந்த சூழலிலே பிள்ளைகள் பாடசாலைக்குப் போகவேண்டி இருக்கின்றார்கள். 30 வருடகால யுத்தத்தின்போது இராணுவத்தின் கெடுபிடிக்கு மத்தியில் தாய்மார் தங்களது பிள்ளைகளை வளர்த்தெடுத்தனர். மீண்டும் எங்களது பிள்ளைகளை இவ்வாறான கெடுபிடிக்குள் நாங்கள் விட்டுவிட்டோமோ என்ற எண்ணத் தோன்றுகின்றது.

தென் பகுதியைவிட, வட பகுதியிலே அதிகமான சோதனைச் சாவடிகளை அமைத்து இருக்கின்றார்கள். அதுமட்டுமல்ல, யுத்தத்திலே பாதிக்கப்பட்டு தமது அங்க அவயவங்களை இழந்திருப்பவர்களைக்கூட போக்குவரத்தின்பொழுது, சோதனைச் சாவடிகளில் இறக்கி நடந்துபோகச் சொல்வதும் அவர்கள் கொண்டுசெல்கின்ற பொதிகள் அனைத்தையும் துளாவி ஆராய்வதும் அவர்களை மேலும் பாதிப்புக்குள்ளாக்குகின்றன. எனவே, இன்று நாட்டிலே ஏற்பட்டிருக்கின்ற இந்த அசாதாரண நிலைமையை அரசியல் இலாபத்துக்காகவோ அல்லது தங்களுடைய அரசியல் இருப்புக்களைத் தக்கவைத்துக் கொள்வதற்காகவோ பயன்படுத்தாது, சரியான முறையில் உரிய நிலைப்பாடுகளை எடுத்து, உண்மையைக் கண்டறிந்து, குற்றவாளிகளுக்குத் தண்டனை கொடுத்து, இவ்வாறான பயங்கரவாதச் சூழலிலிருந்து இந்த நாட்டை விரைவிலே விடுவிக்கவேண்டும். அதற்கான ஆக்கபூர்வமான செயற்பாடுகளில் அனைவரும் ஒற்றுமையாக ஈடுபடவேண்டும் என்று கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා.4.50]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලින්ම ප්‍රකාශ කරන්න කැමැතියි, අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ගිවිසුම් දෙකෙන් එකක්, එනම් පළමුවන ගිවිසුම ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ආරක්ෂක ලේකම් වශයෙන් සිටි කාලයේ 2007 දී තමයි අත්සන් කර තිබෙන්නේ කියලා. එය ACSA ගිවිසුමයි. එතුමා SOFA ගිවිසුම ගැන සඳහන් කළා. 1995 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේදී තමයි SOFA ගිවිසුම අත්සන් කළේ. මේකයි ඒකේ පසුබිම. ඒක අපි අත්සන් කරපු ගිවිසුමක් නොවෙයි. The ACSA was signed by Mr. Gotabhaya Rajapaksa in 2007 and the SOFA was signed in 1995. මේක තමයි මේකේ පසුබිම.

In responding to the Parliamentary Question, please note that we have no records to prove that any Agreements or Memoranda of Understanding have been signed by Sri Lanka with any country or institution that infringes on the sovereignty, affecting public security or interfering with the internal affairs of the country either before or after 21st April, 2019.

The Government of Sri Lanka signed the initial Acquisition and Cross Servicing Agreement - ACSA - with the USA in 2007. The signatories to the 5th March, 2007 Agreement were Ambassador of the US to Sri Lanka Robert Blake and Mr. Gotabhaya Rajapaksa. The Hon. Mahinda Rajapaksa said that two American citizens - Robert Blake and Gotabhaya Rajapaksa -have signed this Agreement, The validity of the Agreement is for a period of 10 years and the Agreement was due to expire on 6th March, 2017.

A new draft ACSA was proposed by the US side in July 2016. In general, in the new Agreement, the contents are similar and no major changes were observed on the text. However, a key difference with regard to timelines is that the proposed new ACSA will not require renewal, meaning it would continue to remain in force until either party gives 180 days' notice of its intention to terminate the Agreement.

This is not a military agreement. මේක military, එහෙම නැත්නම් යුද්ධමය ගිවිසුමක් නොවෙයි, logistics - සේවාවන්-සම්බන්ධ ගිවිසුමක්. It says "through increased logistic co-operation". The provision of logistics support, supplies and services as defined in the Agreement include the following:

"Food, water, billeting, transportation including airlift, petroleum, oils, lubricants, clothing, communication services, medical services, ammunition, base operations support and construction incident to base operations support, storage services, use of facilities, training services, spare parts and components, repair and maintenance services, calibration services, and port services. The term also includes the temporary use of general purpose vehicles and other nonlethal items of military equipment, where such lease or loan is permitted under the national laws and regulations of the parties. The term "Logistics Support, Supplies, and Services" refers to support, supply or services from any or all of the foregoing categories".

මේක යුද්ධමය ගිවිසුමක් නොවෙයි. සේවාවන් සැපයීම පමණයි කරන්නේ. මේ ගිවිසුම දැනට රටවල් 100ක් එක්ක අත්සන් කරලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතුව මම කාරණයක් අහන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභානායකතුමනි, මම ඔබතුමාට නිසි ගෞරව ඇතුව කියනවා, කරුණාකර අපි මේක හංගන්නේ නැතුව ඇත්ත කථා කරමු කියලා. දැන් මේ services සපයන්නේ, ඇමෙරිකාවේ ඉස්කෝලවලටද, ඇමෙරිකානු හමුදාවටද? ඒ පළමුවැනි කාරණය. මේ ගිවිසුම තිබෙන්නේ United States Department of Defence - USDOD එක යටතේද, නැත්නම් ඇමෙරිකාවේ වෙන දෙපාර්තමේන්තුවක් යටතේද? ලංකාවේ මේක අත්සන් කරලා තිබෙන්නේ, Secretary to the Ministry of Housing, Construction and Cultural Affairsද, නැත්නම් Secretary to the Ministry of Defenceද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැහැ, නැහැ. අපේ රටවලට සමහර අවස්ථාවලදී හමුදා එනවා. නමුත් එසේ එන්නේ යුද්ධමය කටයුතුවලට නොවෙයි. උදාහරණයක් වශයෙන් සුනාමි ව්‍යසනය ඇති වුණු වේලාවේ ඒ කට්ටිය ආවා. නමුත් ඒ ආවේ, යුද්ධමය කටයුත්තකට නොවෙයි. ඒ, එක උදාහරණයක්. That was only for logistics; it had nothing to do with military activities.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

දෙවැනි කරුණ විධියට මම ඔබතුමාගෙන් කාරණයක් දැන ගන්න කැමැතියි. මේ තිබෙන්නේ ඇමෙරිකාව කොහේ හරි යුද්ධ කරද්දී අපි ඔවුන්ට ලබා දෙන සේවා ගැනයි. එහෙම නැත්නම් ඔතැන "ammunition" කියලා සඳහන් කරන්න අවශ්‍ය නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැහැ, නැහැ. යුද්ධ කරද්දී කියන එක නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා කිව්වා, even "ammunition" කියලා. Logistic support for the US Army, not for any other organization. ගරු

[ගරු බිමල් රත්නායක මහතා]

ඇමතිතුමනි, මම ඔබතුමාගේ වෙලාව ගන්නේ. සමාවෙන්න. මට දැන ගන්න අවශ්‍ය මෙයයි. ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ කතන්දරය 2017.03.06වැනි දායින් ඉවර වුණා නේ. ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය මේක දීර්ඝ කරලා තිබෙනවා නේ, සදාකාලිකව. අන්න, ඒක ගැන දැන් කියන්න කෝ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

සදාකාලික නොවෙයි, දැන් තිබෙන Agreement එක අනුව renewal clause එකක් නැහැ. දින 180ක notice එකක් දීලා එක කණ්ඩායමකට අයින් වෙන්න පුළුවන් ඕනෑම වේලාවක; you can give 180 days' notice and leave. There is no renewal clause.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

තවම 180 days draft එකේ තිබෙනවා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා දැන් Agreement එක ගැන නේ, ඇසුවේ. මම කලින් කිව්වා වාගේ ACSA එක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අත්සන් කෙරුවේ. SOFA එකත් ඒ වාගේයි. ඒකත් චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේ අත්සන් කෙරුවේ. දැනට රටවල් 100ක් -

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගරු සභානායකතුමනි, ඔබතුමා කැමැති නම්, මට ඔබතුමාගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්න අවසර දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අහන්න.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමා ACSA එක අත්සන් කළා කියලා ඔබතුමා කිව්වා. ඒ, 2008දී.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

2007දී.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගරු සභානායකතුමනි, අපි දන්නා තරමින් ඒ ගිවිසුම පිටු 10ක ගිවිසුමක්. ඕනෑම රටක් එවැනි ගිවිසුම් අත්සන් කරනවා. හැබැයි, ඒ ගිවිසුම අවුරුදු 10කින් -2007-2017න්- පසුව ඔබතුමන්ලාගේ පාලන සමයේ දිගු කරලා තිබෙන්නේ. දිගු කළා විතරක් නොවෙයි, එය ගුණාත්මකව වෙනස් කරලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

වෙනස් කරලා තිබෙන්නේ.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

වෙනස් කරලා තිබෙන්නේ. අපි කියන්නේ ඒකයි. මේ ගිවිසුම, ඒ ගිවිසුමට වඩා දහදහස් ගුණයකින්, ලක්ෂ ගණනකින් නොවෙයි, කෝටි-ප්‍රකෝටි ගණනකින් රටේ නිදහසට, ස්වෛරීත්වයට, ස්වාධීනත්වයට හානි පමුණුවන ගිවිසුමක්. එවැන්නක් තමයි දැන් තමුන්නාන්නාසේලා ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක අත්සන් කරලා තිබෙන්නේ. SOFA එකත් ඒ වාගේමයි. තමුන්නාන්සේ ඒ නිසා මේක ඌනනය කරන්න හදන්න එපා, 2007ත් තිබුණා; අනුගණන්වලත් තිබුණා කියලා. තමුන්නාන්සේ කරුණාකරලා තමුන්නාන්සේලාගේ වර්තමාන ආණ්ඩුව අත්සන් කරපු ගිවිසුම් ඉදිරිපත් කරන්න කියලා අපි කියා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒවා තමයි මම ඉදිරිපත් කෙරුවේ. මම ඔබතුමාට මේ ගිවිසුමේ පිටපතක් දෙන්නම්. මේ ගිවිසුම අත්සන් කළේ, 2007දී. අනෙක් එක -

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

තමුන්නාන්සේලා ඒක දිගු කළා, 2018දී නව ගිවිසුමකට.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි "නැහැ" කියන්නේ නැහැ. අපි දීර්ඝ කළා. මොකද, කාලීන අවශ්‍යතා අනුව එහෙම කරන්න වෙනවා. අවුරුදු 12ක් වෙනවා, ඒවා අත්සන් කරලා. ඒ නිසා කාලීන අවශ්‍යතා අනුව ඒවා යාවත්කාලීන කරන්න ඕනෑ. [බාධා කිරීමක්] -

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

තමුන්නාන්සේලාගේ කාලීන අවශ්‍යතා අපට පැහැදිලියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

තමුන්නාන්සේලා අත්සන් කරපු එක සම්බන්ධව උත්තර දෙන්න බැරුව - [බාධා කිරීමක්]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
තමුන්නාන්සේලාගේ කාලීන අවශ්‍යතාව අපට පැහැදිලියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ගොල්ලන් අත්සන් කළේ ගිවිසුම. ඇමෙරිකානු පුරවැසියන් දෙදෙනෙක් අත්සන් කෙරුවේ. [බාධා කිරීමක්]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයත්, සභාවත් අභාග්‍ය සම්පන්න විධියට -[බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අභාග්‍ය සම්පන්න වෙන්න ඕනෑ නැහැ. ඔබතුමානේ, මට disturb කරන්නේ. Please sit down.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
අපි ආවේ කථා කරන්න. තමුන්නාන්සේ ඔහොම කියන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොල්ලන් මේක 2007දී අත්සන් කරලා, දැන් වමාරන්න බැරුව දඟලනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
2007දී අත්සන් කළ ගිවිසුම නොවෙයි, තමුන්නාන්සේලා 2018දී මේක ලක්ෂ, කෝටි ගණනකට - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම කියන්න.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඒක ඇත්ත.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බේරෙන්න එහෙම කියන්න, ඒකට කමක් නැහැ.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඒක තමයි ඇත්ත.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අත්සන් කරපු එක දරා ගන්න බැරිව මේ අය කෑ ගහනවා. ඔය ප්‍රශ්නය එදා විමල් වීරවංශ මැතිතුමාත් ඇහුවා. මම එතුමාට කිව්වා, 2007දී කියලා. 1994දී චන්ද්‍රිකා මැතිනිය SOFA ගිවිසුම අත්සන් කළා. ඒකත් රටවල් 100ක් පමණ අත්සන් කරලා තිබෙනවා.

"Brief on the US-Sri Lanka Status of Forces Agreement (SOFA)"හි "Background" නමැති කොටසින් මම කියවන්න කැමැතියි.

> "A SOFA does not constitute a security arrangement with a particular country. It establishes the rights and privileges of US personnel in a country, and address issues such as wearing of uniforms, exemption from taxes and fees, carrying of weapons, use of radio frequencies, licences, customs regulations, exemption from the criminal jurisdiction of the host country".

දැන් මේ අන්තිම කරුණ - "exemption from the criminal jurisdiction of the host country" - ගැන මම කියන්න ඕනෑ.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Please do not disturb my trend of thoughts.

Sir, the last Agreement signed by Her Excellency Chandrika Bandaranaike Kumaratunga had a clause which states "exemption from the criminal jurisdiction of the host country".

ඒ කියන්නේ අපේ රටේ අපරාධ නීතියට යටත් වන්නේ නැහැයි කියලා. ඒ ඇමෙරිකානු සොල්දාදුවෝ සුනාමිය කාලයේ ලංකාවට ආවා කියමු කෝ. එතකොට ඔවුන් මේ රටේ ඉන්න කොට අපේ රටේ තිබෙන අපරාධ නීතියට ඔවුන් යටත් වන්නේ නැහැයි කියලා චන්ද්‍රිකා මැතිනිය අත්සන් කරපු Agreement එකේ තිබුණා. නමුත්, තිලක් මාරපන මැතිතුමා මේ ගිවිසුම අලුත් කරන එක ගැන සාකච්ඡා කරන්න මේ වතාවේ ඇමෙරිකාවට ගියාම මොකද වුණේ? The Third USA-Sri Lanka Partnership Dialogue held on 16th May, 2019 in Washington was co-chaired by the Hon. Minister of Foreign Affairs of Sri Lanka and US Under Secretary of State for Political Affairs, Mr. David Hale. During the meeting, the Hon. Minister of Foreign Affairs informed the US delegation that Sri Lanka would find it difficult to grant immunity from criminal jurisdiction to US forces. තිලක් මාරපන මැතිතුමා පැහැදිලිව කිව්වා, ඇමෙරිකානු සොල්දාදුවෝ මේ රටේ ඉන්න කොට ඒ ගොල්ලන් අපරාධයක් කෙරුවොත් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ඒ අයට දඬුවම් කළ යුතුයි, ඒ අනුව අපරාධවලට දෙන දඬුවම් ඉවත් කරන්න අපි සූදානම් නැහැයි කියලා. It was also stated that it would be difficult to implement the 1995 SOFA, agreed through an exchange of Notes -ලියුම් හුවමාරු කර ගෙන තිබෙන්නේ- due to the coming into force of the Diplomatic Privileges Act, No. 9 of 1996, which sets the procedures for granting immunities and privileges. අපි ගිහිල්ලා කියා තිබෙනවා, ඇමෙරිකානු සොල්දාදුවෝ ලංකාවේ ඉන්න කොට යම් කිසි අපරාධයක් කෙරුවොත් මොකක්ද කරන්නේ කියලා. චන්ද්‍රිකා මැතිනිය අත්සන් කරපු Agreement එකේ තිබුණේ ඔවුන් ලංකාවේදී අපරාධයක් කෙරුවොත් ලංකාවේ නඩු දමන්න බැහැයි කියලායි. නමුත්, තිලක් මාරපන මැතිතුමා ගිහිල්ලා කිව්වා, "අපට

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඒක කරන්න බැහැ, ඇමෙරිකානු සොල්දාදුවෝ ලංකාවේ ඉන්න කොට යම් කිසි අපරාධයක් කෙරුවොත් ඒ අයට ලංකාවේ නීතිය යටතේ දඬුවම් ලැබෙනවා"ය කියලා. මේකයි තත්ත්වය. ප්‍රශ්න තිබෙනවා නම්, අපට සාකච්ඡා කරලා විසඳා ගන්න පුළුවන්. නමුත්, මේ අය කියන විධියට මේ ගිවිසුම බිල්ලෙකු නොවෙයි, රටවල් සියයක් විතර මේ ගිවිසුම් දෙකම අත්සන් කරලා තිබෙන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා දැන් පැහැදිලි කළා, immunity එක සම්බන්ධවයි, ඊට පස්සේ ලංකාවේ නීතිය අදාළ වන විධියටයි කථා කළා කියලා. නමුත්, ඔබතුමා ඊට කලින් ඉංග්‍රීසි භාෂාවෙන් කියවාගෙන ගිය එකේ තිබුණා, US හමුදාවේ අයට ලංකාව තුළ ඒ ගොල්ලන්ගේ telecommunication system එකක් පවත්වා ගෙන යන්න පුළුවන්, ආයුධ ගෙන යන්න පුළුවන් යනාදී වශයෙන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Logistics. සොල්දාදුවෙක් එනකොට තුවක්කුවක් අරගෙන එනවාම නේ. තුවක්කුවක් නැතිව සොල්දාදුවෙක් එනවාද? අපි සාධාරණ වෙන්න ඕනෑ. මේ, හමුදාවක් නොවෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එහෙම එකක් නැහැ. රටක් ඇතුළේ ආයුධ තබාගෙන ඉන්න පුළුවන් වන්නේ එක හමුදාවකටයි. ඇමෙරිකානු සොල්දාදුවා එන එකයි, ඒ සොල්දාදුවා ඔහුගේ නිල ඇඳුම ඇඳගෙන මෙහේ ඉන්න එකයි, ඔහුගේ ආයුධ මෙහෙට ගේන එකයි කියන්නේ එකක් නොවෙයි, දෙකක්. ඒක තේරෙන්න ඕනෑ. [බාධා කිරීමක්] හරි, පැහැදිලියි. ඔබතුමන්ලා දැන් වගන්ති දෙකකට බැහැයි කියලා තිබෙනවා නේ. අපි ඒක හොඳයි කියමු කෝ. එතකොට ඉතිරි ටිකට එකඟද? දැන් SOFA එකේ වගන්ති විශාල ප්‍රමාණයක් තිබෙනවා නේ? ඇමෙරිකානු ආණ්ඩුව යෝජනා කරපු එකේ තිබෙනවා, 15 paragraphs. ඒකෙන් දෙකක් නේ දැන් බැහැයි කියලා තිබෙන්නේ. ඒ කියන්නේ diplomatic immunity එක දෙන්න බැහැයි කියලා තිබෙනවා. දැන් ඔබතුමා කිව්ව විධියට ලංකාවේ නීතිය අදාළ වන්න ඕනෑය කියලා කියා තිබෙනවා. තව තිබෙනවා, මම මේකේ කියපු ඒ ගොල්ලන්ගේ vessels check කරන්න බැහැ, ඒ ගොල්ලන්ට මෙහේ සම්පූර්ණයෙන් tax free, ඒ ගොල්ලන්ට identity card එකෙන් එන්න යන්න පුළුවන්, ඒ ගොල්ලන්ට ඒ ගොල්ලන්ගේ හමුදා නිල ඇඳුමෙන් ලංකාවේ ගමන් කරන්න පුළුවන්, ආයුධ ගෙන යන්න පුළුවන්, telecommunication system එකක් ලංකාව ඇතුළේ ගෙන යන්න පුළුවන්ය කියලා. මේ ඔක්කෝම මේ Agreement එකේ තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කියන්නේ ඒ 15න් දෙකකට කැමැති නැහැ, 13කට එකඟයි කියලාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒවා සිවිල් සේවාවන්. යුදමය සේවාවන් නොවෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

No, no. ඒවා සිවිල් සේවාවන් නොවෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ, ඔබතුමාගේ අර්ථ නිරූපණය.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මගේ අර්ථ නිරූපණය නොවෙයි, මේක clear text එකක්. මේ ගිවිසුමේ සඳහන් වනවා, US Department of Defence එකේ military personnel and even civilian contractors කියලා. ඒ කියන්නේ, ඇමෙරිකාව hire කළොත් මාලදිවයින්කාරයෙක්ව, ඒ ගොල්ලන්ට කෑම දෙන්නේ මෙහෙන්. එයාට හම්බ වෙනවා, මෙහේ ඇමති කෙනකුට වඩා diplomatic immunity එකක්. ඒකයි මේකේ තිබෙන්නේ. ඒකයි ඒ ගොල්ලන් ඉල්ලන්නේ. මොකද, US Department of Defense යුද්ධ කරන්නේ ගොඩක් civilian contractorsලාත් එක්කයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේක කියවන්න. මේ කාරණා 15න්, 13කට එකඟයිද කියලා මම අහන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒවා සිවිල් සේවාවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

No, no. දැන් සහරාන්ලා telecommunication systems පාවිච්චි කළේ? එතකොට සිවිල්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මෙතැන තිබුණු ප්‍රධානම ප්‍රශ්නය මේකයි. ඇමෙරිකානු සොල්දාදුවෙක් ලංකාවේ ඉන්න කොට යම් කිසි අපරාධයක් කෙරුවොත්, චන්ද්‍රිකා මැතිනිය අත්සන් කරපු Agreement එකේ තිබුණු විධියට ඒ අපරාධයට ලංකාවේ දඬුවම් කරන්න බැහැ. නමුත්, අපි අත්සන් කරන්න යන Agreement එක - අපි තවම ඒක අත්සන් කරලා නැහැ - තවම discuss කරනවා. තවම මේකට agreement එකක් නැහැ. ලිපි හුවමාරුවක් - only an exchange of letters - පමණයි තිබෙන්නේ. ඒක අනුව ඇමෙරිකානු සොල්දාදුවෙක් ලංකාවේ ඉන්න කොට යම් කිසි වැරැද්දක් කෙරුවොත් ලංකාවේ අපරාධ නීතියට යටත් වෙනවායි කියන එක අපි පැහැදිලිව පෙන්වා දී තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.06ට, 2019 මැයි 24 වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 5.06 மணிக்கு பாராளுமன்றம், 2019 மே 24, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.06 p.m. until 10.30 a.m. on Friday, 24th May, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.